ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
වාර්ෂික වාර්තාව 2024

SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# ප්‍රගතියේ උත්ප්‍රේරක

# පටුන


උපාය මාර්ගික දිශාව ........ 02

විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය ........ 04
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය ........ 08
කොමිෂන් සභා සාමාජිකයින් ........ 14
අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන් ........ 19
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියන් ........ 20
කළමනාකරුවන්/කළමනාකාරිනියන් ........ 21
වසරේ විශේෂ අවස්ථාවන් ........ 22

මෙහෙයුම් සමාලෝචනය

උපායමාර්ගික අරමුණු 1 ........ 26
උපායමාර්ගික අරමුණු 2 ........ 44
උපායමාර්ගික අරමුණු 3 ........ 62
උපායමාර්ගික අරමුණු 4 ........ 66
උපායමාර්ගික අරමුණු 5 ........ 69
අතිරේක තොරතුරු ........ 72

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව ........ 78
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 83
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 84
සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ........ 85
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 86
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන ........ 87

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව ........ 103
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 107
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 108
සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය ........ 109
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 110
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ........ 111

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව ........ 117
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 121
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 122
වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ........ 123
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 124
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ........ 125

පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

විගණකාධිපති වාර්තාව ........ 131
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ........ 135
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 136
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය ........ 137
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ........ 138
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ........ 139
සාංගමික තොරතුරු පසුපිට කවරයේ ඇතුළු පැත්ත

# ප්‍රගතියේ උත්ප්‍රේරක

වේගයෙන් විකාශනය වන මූල්‍ය ක්ෂේත්‍රයක, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) නියාමන විශිෂ්ටත්වය, වෙළෙඳපොළ අඛණ්ඩතාව සහ තිරසාර වර්ධනය මෙහෙයවන ප්‍රගතියේ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරයි. නියාමන විශිෂ්ටත්වය, ආයෝජක ආරක්ෂාව, වෙළෙඳපොළ සංවර්ධනය සහ තාක්ෂණික නවෝත්පාදනය සඳහා අපගේ කැපවීම, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ගතික, ඔරොත්තු දෙන සහ අනාගතයට සූදානම් බව සහතික කරයි. අප ඉදිරිය දෙස බලන විට, අපගේ අවධානය ආයෝජකයින් බලගැන්වීම, තාක්ෂණය වැළඳ ගැනීම සහ තිරසාරභාවය සඳහා කැපවී සිටී. සෑම පියවරක් සමඟම, අඛණ්ඩතාව, නවෝත්පාදනය සහ වර්ධනය මත සමෘද්ධිමත් වන ප්‍රාග්ධන වෙළෙඳපොළක් ගොඩනැගීම සඳහා ප්‍රගතියේ උත්ප්‍රේරකයක් ලෙස අපගේ කාර්යභාරය අපි නැවත තහවුරු කරමු.

# උපායමාර්ගික දිශාව

තිරසාර ආර්ථික වර්ධනයට සහාය වන ශක්තිමත්, විනිවිදභාවයෙන් යුත් සහ ඔරොත්තු දෙන ප්‍රාග්ධන වෙළෙඳපොළක් බිහි කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) කැපවී සිටී. ඒ අනුව අපගේ උපායමාර්ගික දිශාව නියාමන විශිෂ්ටත්වය, ආයෝජක ආරක්ෂාව, වෙළෙඳපොළ සංවර්ධනය සහ තාක්ෂණික නවෝත්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තරඟකාරී සහ සියල්ල ඇතුළත් වන බව සහතික කරමින්, නව නිෂ්පාදන හඳුන්වා දීමට, වෙළෙඳපොළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ගෝලීය ආචාරධර්ම භාවිතයන් සමඟ පෙළගැසීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. මෙම වාර්ෂික වාර්තාව මගින් අපගේ උපායමාර්ගික සැලැස්මේ, උපායමාර්ගික තේමාවන් පහට අදාළ එක් එක් ක්ෂේත්‍රය තුළ අපගේ ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක් සපයයි.

## දැක්ම

කලාපයේ පදනම් ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයෙකුගේ තත්ත්වය ඉටු කිරීම

## මෙහෙවර

සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමවත් සහ විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

## උපායමාර්ගික තේමාවන්

- ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම
- ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනයට අනුබල දීම
- දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ ප්‍රාග්ධන වෙළඳපොළ කෙරෙහි උනන්දුව ප්‍රවර්ධනය කිරීම
- ආයතනික විශිෂ්ඨත්වය දියුණු කිරීම

## සාරධර්ම

- නවෝත්පාදනය, නිර්මාණශීලිත්වය සහ සංවර්ධනය
- අවංකභාවය, වාස්තවිකත්වය සහ විනිවිදභාවය
- පාර්ශ්වකරුවන්ගේ සහ පාරිභෝගික අවධානය යොමුකරගත් වගකීම්
- කාර්යක්ෂමතාව සහ නම්‍යශීලීභාවය
- කාර්ය සාධනය සහ ගුණාත්මකභාවය මත පදනම් වීම

## අපගේ ව්‍යවස්ථාපිත අරමුණු

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම;
- සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළඳපොළක් නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම
- දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම; සහ
- සුරැකුම්පත් වෙළඳපොළට අදාළ සේවා සැපයීමේදී ඉහළ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම.

# විධායක සමාලෝචනය

## තීක්ෂණ බුද්ධියේ උත්ප්‍රේරක

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නායකත්වය තීක්ෂණ බුද්ධිය සහ දූරදර්ශීභාවය යන දෙකෙන්ම හැඩගැසී ඇත. නියාමන ප්‍රමුඛතා සහ ජාතික අරමුණු සමඟ උපායමාර්ගික තීරණ පෙළගස්වා ගැනීමෙන්, අපි ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රගතිය ඉදිරියට ගෙන යමු, ආයෝජක විශ්වාසය ශක්තිමත් කරමු, සහ තිරසාර, ඉදිරි දැක්මක් සහිත වර්ධනයක් සහතික කරමු.

# සභාපතිතුමාගේ සමාලෝචනය



**ආර්ථික පුනර්ජීවනයේ මෙම අත්පත් කරගන ඇති දියුණුව තුළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ ආරක්ෂා කිරීම සහ ඉදිරියට ගෙන යාම යන දෙකටම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම කිසිදා මෙතරම් අදාළ වී නැත, මන්ද අපි එහි ආරක්ෂකයා සහ සක්‍රියව පවත්වාගෙන යන්නා ලෙස අපගේ ද්විත්ව භූමිකාවන් අතර ප්‍රවේශම්කාරීව සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සෑම විටම උත්සාහ ගන්නෙමු.**

සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට ගෞරවයක් ලෙස සළකමි. මෙම කාල පරිච්ඡේදය අපගේ ජාතියට සහ එහි ප්‍රාග්ධන වෙළෙඳපොළට කැපී පෙනෙන පරිවර්තනයක් සහ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති කාල පරිච්ඡේදයක් වී තිබේ. ශ්‍රී ලංකාව නිසැකවම එහි ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයෙන් එතෙර වී ඇති අතර, සාමූහික නොපසුබට උත්සාහය, උපායමාර්ගික ප්‍රතිසංස්කරණ සහ යථා තත්ත්වයට පත්වීම සඳහා නොසැලෙන කැපවීම තුළින්, අපගේ ජාතිය බොහෝ දෙනා අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වේගයකින් සහ ශක්තියකින් නැවත ගොඩනැගී ඇත.

ආර්ථික පුනර්ජීවනයේ මෙම අත්පත් කරගන ඇති දියුණුව තුළ, ප්‍රාග්ධන වෙළෙඳපොළ ආරක්ෂා කිරීම සහ ඉදිරියට ගෙන යාම යන දෙකටම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම කිසිදා මෙතරම් අදාළ වී නැත, මන්ද අපි එහි ආරක්ෂකයා සහ සක්‍රියව පවත්වාගෙන යන්නා ලෙස අපගේ ද්විත්ව භූමිකාවන් අතර ප්‍රවේශම්කාරීව සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සෑම විටම උත්සාහ ගන්නෙමු. එපමණක් නොව, අපගේ සියලු ක්‍රියාකාරකම් තුළ ඒකාබද්ධ තේමාවක් වී ඇත්තේ ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි ඇති විශ්වාසය සහ අවංකභාවය ශක්තිමත් කිරීම වෙත ගමන් කිරීමයි. අපගේ මූල්‍ය පරිසර පද්ධතිය වඩා යහපත්ව පවත්වා ගැනීම සඳහා පමණක් නොව, දිගුකාලීන, සියළු දෙනාට ප්‍රතිලාභ භුක්ති විඳිය හැකි සහ තිරසාර ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළවල් අර්ථවත් කාර්යභාරයක් ඉටු කරන බව සහතික කිරීම සඳහා ද මෙම අවධානය අත්‍යවශ්‍ය වේ.

## ආයෝජක විශ්වාසය වර්ධනය කිරීම සඳහා වෙළෙඳපොළ අවංකභාවය ශක්තිමත් කිරීම

ආයෝජකයින්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීම සඳහා වෙළෙඳපොළ අවංකභාවය මූලික වශයෙන් වැදගත්වේ. වසර

**සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2025 ජුනි මැද භාගයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත අති නවීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් නැස්ඩැක් වෙතින් ලබා ගෙන ඇත.**

තුළ, කොමිෂන් සභාව දැඩි විමර්ශන සහ තීරණාත්මක බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග, ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ පවතින විෂමාචාර වැළැක්වීම සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. මෙම පියවරයන් ආයෝජක විශ්වාසය ශක්තිමත් කරනවා පමණක් නොව, ප්‍රාග්ධන සම්පාදනය සඳහා ආරක්ෂිත, විනිවිදභාවයෙන් යුත් සහ විශ්වාසදායක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉහළ නැංවීමට සැලකිය යුතු ලෙස දායක වේ. සැලකිය යුතු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, ලයිස්තුගත සමාගමක කොටස් සම්බන්ධයෙන් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම, කුමන්ත්‍රණය කිරීම සහ විෂමාචාරයන්ට අනුබල දීම සම්බන්ධයෙන් 2020 දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනු කරන ලද නඩුවකට අදාළව සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් ගෙවන ලද අතිරික්ත රුපියල් මිලියන 231 ක මුදල නැවත ගෙවීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහසුකම් සැලසීය. 2024 අප්‍රේල් මාසයේදී, එම වැරදි සිදු කළ දා සිට ගත වූ කාලය තුළ , EPF අරමුදලට සිදු වූ පාඩුව පියවීමට විත්තිකරුවන් එකඟ වීම, මෙම නඩුවට සම්බන්ධ අනෙකුත් විභාග වෙමින් පවතින නඩු සහ පෙර වරදකරුවන් නොමැති වීම යන කරුණු සලකා බැලීමෙන් පසු කොමිසම මෙම වැරදි සමථයකට පත්කිරීමට අවසර දුන්නේය. මෙම යෝජනාව සැලකිය යුතු බලාත්මක කිරීමේ ජයග්‍රහණයක් පෙන්නුම්කරන අතර, ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම සහ වෙළෙඳපොළ අවංකභාවය පවත්වා ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරයි.

## තාක්ෂණික දියුණුව සහ වෙළෙඳපොළ ආවේක්ෂණය

වෙළෙඳපොළ ආවේක්ෂණය අපගේ නියාමන ක්‍රියාවලියේ අත්තිවාරම ලෙස පෙන්වාදිය හැකි අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට සහ ඒවාට විසඳුම් සෙවීමට අත්‍යවශ්‍ය පූර්ව ආරක්ෂණ යාන්ත්‍රණයක් ලෙස එය ඉතා වැදගත් වේ. මුල් අවධියේදී වෙළෙඳපොළ තුළ සිදුවන විවිධ විෂමාචාර සහ නුසුදුසු ගණුදෙනු හඳුනා ගැනීමෙන්, වෙළෙඳපොළ අවංකභාවය ආරක්ෂා කිරීම සහ ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා ඵලදායී ආවෙක්ෂණයන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ආවේක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා අපගේ අඛණ්ඩ උත්සාහයන්ට අනුකූලව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2025 ජුනි මැද භාගයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත අති නවීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් නැස්ඩැක් (Nasdaq) වෙතින් ලබා ගෙන ඇත. වෙළෙඳපොළ ආවේක්ෂණය සඳහා කෘතිම බුද්ධිය උපයෝගී කර ගන්නා මෙම දියුණු පද්ධතිය, තත්‍ය කාලීනව ගණුදෙනු (Real Time) ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට, වෙළෙඳපොළ අක්‍රමිකතා හඳුනා ගැනීමට සහ අවශ්‍ය අවස්ථාවලදී කාලෝචිත බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපගේ හැකියාව සැලකිය යුතු ලෙස ශක්තිමත් කරනු ඇත. වෙනස්වන අභියෝග හමුවේ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සාධාරණ, විනිවිදභාවයෙන් යුතු බව සහ ඕනෑම අභියෝගයකට ඔරොත්තු දෙන බව සහතික කිරීම සඳහා අපගේ නොසැලෙන කැපවීම එමගින් අවධාරණය කරයි.

## වැඩිදියුණු කළ වෙළෙඳපොළ අධීක්ෂණය සඳහා සුපිරි තාක්ෂණික නවෝත්පාදනයන් උපයෝගී කර ගැනීම

මූල්‍ය පද්ධති සංකීර්ණත්වයෙන් යුතුව අඛණ්ඩව වර්ධනය වන විට, අධීක්ෂණ තාක්ෂණය (සුප්ටෙක්) වැඩි වැඩියෙන් භාවිතා කිරීමට අවශ්‍ය වන අතර එය වෙනස් වෙමින් පවතින වෙළෙඳපොළ වාතාවරණය, වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අධීක්ෂණයට ඉඩ සලසයි. ගනුදෙනු සහ අනුකූලතා දත්තවල වැඩිවන පරිමාවන්ට අනුව වර්තමානයේදී කාලීන හා නිවැරදි තීරණ ගැනීම සහතික කිරීම සඳහා නවීන විශ්ලේෂණයන් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන්, දත්ත විශ්ලේෂණ, කෘතිම බුද්ධිය සහ ස්වයංක්‍රීයකරණය වැනි අති නවීන තාක්ෂණයන් ඒකාබද්ධ කරන සුප්ටෙක් පද්ධතියක් (cloud Base) අත්පත් කර ගැනීම සඳහා අපි ආයෝජනය කර ඇත්තෙමු. මෙම නව්‍ය වේදිකාව අපගේ අධීක්ෂණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනවා පමණක් නොව, අධීක්ෂණය සඳහා අවදානම් මත පදනම් වූ ප්‍රවේශයකටද සහාය වන අතර, වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ තක්සේරු කරන ලද අවදානම් තත්ත්වයන් මත පදනම්ව සම්පත් වඩාත් ඵලදායී ලෙස වෙන් කිරීමට අපට ඉඩ සලසයි.

## වෙළෙඳපොළ සංවර්ධනය සහ හරිත මූල්‍යකරණය දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීම සහ ගැඹුරු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වසර තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කරමින් හරිත සහ නිල් බැඳුම්කර සඳහා නියාමන රාමුවක් හඳුන්වාදීම ප්‍රධාන සන්ධිස්ථානයක් විය. මෙම ගමන ආරම්භ වී ඇත්තේ මෑතකදී වුවද, එවැනි උපකරණ දෙකක් සාර්ථකව ලයිස්තුගත කිරීම මගින් පාරිසරික වශයෙන් වගකිවයුතු ආයෝජන විකල්ප සඳහා ආයෝජකයින්ගේ තුළ ඇති කැමැත්ත ඉහළ යාම අවධාරණය කරයි.

ප්‍රාග්ධනය ගොඩනැගීමට සහාය වන සහ පුළුල් ආයෝජක පදනමක් ආකර්ෂණය කර ගන්නා ක්‍රියාකාරකම් වන සදාකාලික බැඳුම්කර, යටිතල පහසුකම් බැඳුම්කර, ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර, සුකුක්, කොටස් ණය ගැනීම සහ ණය දීම සහ නියාමනය කරන ලද හිඟ විකුණුම් හඳුන්වාදීමත් සමඟ අප වෙළෙඳපොළ තුළ ආයෝජනය කිරීමට ඇති ආයෝජන උපකරණ පරාසය පුළුල් කළෙමු.

වෙළෙඳපොළ සංකීර්ණතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, වෙළෙඳ භාණ්ඩ ව්‍යුත්පන්න වැනි නිෂ්පාදන ආවරණය වන පරිදි බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීම සඳහා වන යෝජනා අප ඇගයීමට ලක් කරමින් සිටින්නෙමු. මෙය වෙළෙඳපොළ මිල සොයා ගැනීම, ද්‍රවශීලතාවය සහ අවදානම් කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීමට උපකාරී වේ. ඊට අමතරව, අප සමාජ බැඳුම්කර සහ තිරසාරභාවයට සම්බන්ධ බැඳුම්කර සඳහා නියාමන රාමු අවසන් කරමින් සිටින අතර ඔරොත්තු දෙන, සියළුදෙනාට සහභාගී විය හැකි සහ අනාගතයට සූදානම් ප්‍රාග්ධන වෙළඳපොළක් සංවර්ධනය කිරීම සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරන්නෙමු.

## ඩිජිටල් යුගයේ මූල්‍ය දැනුම පුළුල් කිරීම

ඩිජිටල් සම්බන්ධතාවය උපරිම කිරීම සහ අපගේ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා අපි අපගේ ආයෝජක අධ්‍යාපන ක්‍රියාකාරකම් නැවත සකස් කර ඇත්තෙමු. ඩිජිටල් වේදිකා පරාසයක් භාවිතා කරමින්, අපි මූල්‍ය අධ්‍යාපනය වඩාත් ප්‍රවේශ විය හැකි, ආකර්ශනීය සහ ගැළපෙන ආකාරයෙන්

# සභාපතිතුමාගේ සමාලෝචනය

## මූල්‍ය අපරාධ මැඩපැවැත්වීම සහ ජාත්‍යන්තර නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වසර තුළ කැපවූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ (AML/CFT) ඒකකයක් ස්ථාපිත කරන ලදී.

පවත්වාගෙන යන අතර විශේෂයෙන් අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ අනාගත දියුණුවට අත්‍යවශ්‍ය තරුණ, තාක්ෂණික දැනුමැති කණ්ඩායම් සඳහා අවධානය යොමුකර ඇත. කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) සමග හවුල්කාරිත්වයෙන්, මුල් අවධියේ සිටම මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, 2023 දී අපි ශ්‍රී ලංකාව පුරා පාසල් 100 ක ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ දියත් කළෙමු. මෙම ක්‍රියාකාරකමට අනුපූරකව, මෙම පාසල්වල අධ්‍යාපනඥයින් අතර මූල්‍ය දැනුම වැඩි දියුණු කිරීම සඳහා ගුරු පුහුණු වැඩසටහන් හඳුන්වා දුන්නෙමු. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සිසුන්ගේ අවබෝධය අන්තර්ක්‍රියාකාරී හා ප්‍රබෝධමත් ආකාරයකින් පුළුල් කිරීම සඳහා නිර්මාණය කරන ලද "Capital Market Masters" නම් ප්‍රශ්න විචාරාත්මක තරගයක් සමගින් අපි අපගේ උසස්පෙළ පාසල් ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කරගත් ප්‍රයත්නයන් තවදුරටත් පවත්වාගෙන යන්නෙමු. මෙම අරමුණ තවදුරටත් ඉටු කරමින්, 2024 දී අපගේ නිල Linkedin සමාජ මාධ්‍ය පැතිකඩ දියත් කිරීමෙන් අපගේ ඩිජිටල් පැවැත්ම පුළුල් කළ අතර, මූල්‍ය ප්‍රජාව තුළ වෘත්තීය සහභාගීත්වය සහ දැනුම බෙදා ගැනීම සඳහා වටිනා වේදිකාවක් නිර්මාණය කළෙමු. මෙම උපායමාර්ගික උත්සාහයන් මගින් දැනුවත්, විශ්වාසදායක සහ අනාගතයට සූදානම් ආයෝජක පදනමක් ගොඩනැගීම සඳහා අපගේ කැපවීම අවධාරණය කරයි.

### මුදල් විශුද්ධිකරණය / ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියා පිටු දැකීමේ (AML/CFT) රාමු ශක්තිමත් කිරීම

මූල්‍ය අපරාධ මැඩපැවැත්වීම සහ ජාත්‍යන්තර නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වසර තුළ කැපවූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ (AML/CFT) ඒකකයක් ස්ථාපිත කරන ලදී. හරස් ක්‍රියාකාරී විශේෂඥතාවයෙන් සමන්විත මෙම ඒකකය, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ AML/CFT ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ 2026 දී ශ්‍රී ලංකාවේ ඉදිරි ජාතික අන්‍යෝන්‍ය ඇගයීමේ කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කිරීම අරමුණු කරමින් පිහිටුවන ලදී. මෙම ජාතික ප්‍රමුඛතාවයේ සම්බන්ධීකරණ උත්සාහයන් සහතික කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමග සමීප හවුල්කාරිත්වයක් ඇති කර ගෙන ඇත. වසර තුළ, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ ආශ්‍රිත රෙගුලාසි සමග වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ අනුකූලතා මට්ටම තක්සේරු කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීන් සමග ඒකාබද්ධ පරීක්ෂණ පවත්වන ලදී. කර්මාන්තයේ සූදානමට තවදුරටත් සහාය වීම සඳහා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සහ ඔවුන්ගේ අනුකූලතා නිලධාරීන් සඳහා සම්බාධක පිරික්සුම් මෙවලමක් භාවිතා කිරීම පිළිබඳව සජීවී වැඩසටහන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සංවිධානය කරන ලද අතර, එමගින් වැළැක්වීමේ රාමු ශක්තිමත් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී ප්‍රවේශයක් පිළිබිඹු කරයි.

### ජාත්‍යන්තර සහභාගීත්වය

කලාපීය ඒකාබද්ධතාවය සහ වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වැදගත් පියවරක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජූලි මාසයේදී මාලදිවයින් රාජ්‍යයේ මාලේහිදී ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අධිකාරිය (CMDA) සමග සන්ධිස්ථානීය අවබෝධතා ගිවිසුමකට (MoU) අත්සන් තබන ලදී. මෙම අවබෝධතා ගිවිසුම මගින් කොළඹ කොටස් හුවමාරුවෙහි මාලදිවයින් සමාගම් ද්විත්ව ලයිස්තුගත කිරීම සඳහා මග පාදනු ලබන අතර නියාමකයින් දෙදෙනා අතර නියාමන අධීක්ෂණය, ධාරිතා වර්ධනය සහ තොරතුරු හුවමාරුව සඳහා අඛණ්ඩ සහයෝගීතාවයක් ඇති කරනු ලබයි. ජාත්‍යන්තර සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජූනි මාසයේදී ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානයේ (IOSCO) සුළු පරිමාණ ආයෝජකයින් පිළිබඳ කමිටු (කමිටු 8) රැස්වීම පැවැත්වීය. මෙම අවස්ථාව ගෝලීය නියාමකයින්, ශාස්ත්‍රඥයින් සහ කර්මාන්ත විශේෂඥයින් අතර දියුණු සංවාදයකට පහසුකම් සපයන ලද අතර, ආයෝජක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී. මෙම සහයෝගී උත්සාහයන් මගින් වැඩි වශයෙන් අන්තර් සම්බන්ධිත ගෝලීය පරිසරයක් තුළ වෙළෙඳපොළ අවංකභාවය, රටවල් අතර සහයෝගීතාව සහ ආයෝජක ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරයි.

### අනාගත දැක්ම

ජාතික ආර්ථික සංවර්ධනයට අර්ථවත් ලෙස දායක වීමට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට ඇති හැකියාව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා අපගේ දැක්මෙහි කේන්ද්‍රීයව පවතී. නැගී එන අවස්ථා සහ අඛණ්ඩ අභියෝග යන දෙකෙන්ම හැඩගැසුණු පරිසරයක අපි සැරිසරන විට, ආයෝජකයින් සහ සුරැකුම්පත් නිකුත් කරන්නන් අතර විශ්වාසය ඇති කරන හොඳින් නියාමනය කරන ලද, විනිවිදභාවයෙන් යුත් සහ දියුණු ප්‍රාග්ධන වෙළඳපොළක් ගොඩනැගීම කෙරෙහි අපගේ අවධානය යොමු වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මගේ නායකත්වය සමබර ප්‍රවේශයක් තුළ පවත්වා ගනිමින් ශක්තිමත් නියාමන අධීක්ෂණයක් සහතික කිරීම සහ වෙළෙඳපොළ සංවර්ධනය ඉහළ නැංවීම කෙරෙහි යොදා ගන්නෙමි.

ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රකෘතිමත් වීමේ මාවතට පිවිසෙත්ම, තිරසාර සංවර්ධනයේ මුල් ගලක් වන ප්‍රාග්ධන සම්පාදනය සක්‍රීය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට සූදානමින් සිටී. රජයේ පුළුල් ආර්ථික න්‍යාය පත්‍රයට අනුකූලව, කෙටි, මධ්‍යම සහ දිගු කාලීන අරමුණු ගෙනහැර දක්වන පුළුල්, දේශීය සැළැස්මක් අපි සකස් කර ඇත්තෙමු.

මෙම උපායමාර්ගික රාමුවට කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය, සාංගමික ණය සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම වෙළෙඳපොළ පුළුල් කිරීම, නව මූල්‍ය උපකරණ හඳුන්වාදීම සහ බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීම ඇතුළු වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ඉහළ බලපෑමක් කළ හැකි ක්‍රියාකාරකම් 12 ක් ඇතුළත් වේ. මෙම උත්සාහයන්ගේ අරමුණ වන්නේ නියාමනය, ඩිජිටල් පරිවර්තනය, අවදානම් කළමනාකරණය සහ ආයෝජක අධ්‍යාපනය යන අංශවල ප්‍රතිසංස්කරණ මගින් විචිත්‍රවත්, සියල්ලන්ට සහභාගී විය හැකි සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රාග්ධන වෙළෙඳපොළක් ගොඩනැගීමයි.

වේගවත් තාක්ෂණික දියුණුව මගින් අර්ථ දක්වා ඇති යුගයක, අපගේ මූල්‍ය පරිසර පද්ධතිය නවීකරණය කිරීම සඳහා ඩිජිටල් වත්කම් සහ යටිතල පහසුකම් ඒකාබද්ධ කිරීම අත්‍යවශ්‍ය වේ. ප්‍රාග්ධන වෙළෙඳපොළවල නවෝත්පාදනයන් වෙත ළඟාවීමට, කාර්යක්ෂමතාව සහ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම පමණක් නොව, ආයෝජන සහ වර්ධනය සඳහා නව මංපෙත  විවර කිරීමටද එය අවශ්‍ය වේ. අපගේ අවසාන ඉලක්කය වන්නේ දිගුකාලීන ස්ථාවරත්වයක් ඇති කරන, ඉදිරි පරම්පරාවන් සඳහා තිරසාර සමෘද්ධිය සහතික කරන වෙනස්වූ සහ ඔරොත්තු දෙන වෙළෙඳපොළක් නිර්මාණය කිරීමයි.

## සාරාංශය

මෙම අභියෝගාත්මක, නමුත් පරිවර්තනීය කාල පරිච්ඡේදය තුළ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීම සහ විශේෂඥතාව ලබා දුන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මගේ සෙසු කොමිෂන් සභා සාමාජිකයින්ට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ කැපවූ කාර්ය මණ්ඩලයට මම මගේ අවංක කෘතඥතාව පළ කරමි. ශක්තිමත්, වඩා ඔරොත්තු දෙන සහ ගෝලීය වශයෙන් තරඟකාරී සුරැකුම්පත් වෙළෙඳපොළක් හැඩ ගැස්වීමේදී විශ්වාසය හා සම්බන්ධතාවය අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා සහාය ලබාදුන් ගරු ජනාධිපති සහ මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ අපගේ වෙළෙඳපොළ සහභාගිවන්නන්, ආයෝජකයින් සහ සියලුම කොටස්කරුවන්ටත් මම ස්තූතිවන්ත වෙමි.

ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය, අනාගතයට සූදානම් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ගොඩනැගීමට අද්විතීය අවස්ථාවක් ලබා දෙයි - එය නව්‍ය, විනිවිදභාවයෙන් යුත් සහ සියල්ලන්ට සහභාගී විය හැකි වෙළෙඳපොළක් නිර්මාණය කරන අතර එමගින් Z පරම්පරාව,  ඇල්ෆා පරම්පරාව සහ ඊළඟ පරම්පරාවන් සම්බන්ධ කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ඒ සඳහා අප සියළු දෙනා එක්ව, අපගේ වෙළෙඳපොළේ පවතින පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රයෝජනය සඳහා තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන්නෙමු.



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර**
සභාපති

2025 අප්‍රේල් 20

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**වෙනත් වචන වලින් කිවහොත්, අප ක්‍රියාත්මක වන්නේ සාම්ප්‍රදායික නියාමන ආකෘතියට අභියෝග කරන වේගවත් වෙනසක් සහිත පරිසරයක ය. වේගවත් තාක්ෂණික සංවර්ධනය, වෙනස් වන ප්‍රජාවිද්‍යාත්මක තත්ත්වයන් සහ වෙනස් වන ආයෝජක ආකල්ප අනුව බලන විට, අද ප්‍රාග්ධන වෙළෙඳපොළ මීට දශකයකට පෙර තිබූ තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් ලෙස පෙනේ.**

2024 වර්ෂයේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් සමාලෝචනය කිරීමට ලැබීම ගැන මම මහත් සතුටට හා තෘප්තියට පත්වෙමි.

## ඔරොත්තු දීමේ වසරක්: අනුවර්තනය වීම, පරිණාමය වීම සහ සමෘද්ධිමත් වීම

ජාතියක් ලෙස අප මුහුණ දුන් ආර්ථික අර්බුදයෙන් අඛණ්ඩව ගොඩ ඒමේදී, එය ඔරොත්තු දීමේ හැකියාව, අනුවර්තනය සහ ප්‍රගතියේ වසරක් බව පැවසිය හැකිය. පරිණාමය වෙමින් පවතින ගෝලීය ආර්ථික වාතාවරණය තුළ වේගවත් තාක්ෂණික වෙනස්කම්, පරිණාමය වන ආයෝජක අපේක්ෂාවන් සහ අස්ථාවර වෙළෙඳපොළ තත්ත්වයන් සමඟ ඒකාබද්ධ වූ ගෝලීය දේශපාලන අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයා ලෙස අපගේ කාර්යභාරය කිසිදා මෙතරම් වැදගත් වී නොමැත.

සළකා බලන කාල පරිච්ඡේදය තුළ, එක් අතකින් අප මුහුණ දුන් ආර්ථික අර්බුදය සහ අනෙක් පැත්තෙන් මූල්‍ය වෙළෙඳපොළවල සැලකිය යුතු වර්ධනයන් අපගේ වෙළෙඳපොළට දැඩි ලෙස බලපා ඇත. නැගී එන තාක්ෂණයන්, පාරිසරික, සමාජීය සහ පාලන (ESG) සලකා බැලීම්, ආයෝජක හැසිරීම්, අපේක්ෂාවන් සහ අවශ්‍යතා, සහ ඔන්ලයින් වංචා සහ වෙළෙඳපොළ හැසිරවීමේ ව්‍යාප්තිය සමඟ සංසන්දනාත්මක ගෝලීය වෙළෙඳපොළවල් පෙර නොවූ විරූ වේගයකින් පරිණාමය වෙමින් පැවතුනි. මෙම පසුබිම තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**අපගේ වගකීම දෙයාකාරය: එනම්, තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා වෙළෙඳපොළ සංවර්ධන ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යමින් ශක්තිමත් නියාමනය හරහා ප්‍රාග්ධන වෙළෙඳපොළවල අවංකභාවය, විනිවිදභාවය සහ ස්ථාවරත්වය සහතික කිරීමයි. මෙම ද්විත්ව වගකීම් එකිනෙකින් බැහැර නොවන අතර ඒවා දැඩි ලෙස බැඳී පවතී.**

මෙම සියලු ප්‍රවණතා නිරීක්ෂණය කරන අතර අපගේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කරන විට සහ අනාගතය දෙස බලන විට අපගේ වෙළෙඳපොළට ඇති විය හැකි අවදානම් ත්ත්වයන් ද සලකා බලයි.

ඒ සමගම, සාම්ප්‍රදායික බලධාරීන්, ආයතන සහ තොරතුරු නාලිකා කෙරෙහි විශ්වාසය අඩු වී ඇති බවත්, වඩාත් බෙදී ගිය මූල්‍ය හා මාධ්‍ය වාතාවරණයක් ඇති බවත් සැලකිල්ලට ගැනීම වැදගත්ය. අන්තර්ජාලය හරහා ගණුදෙනු කිරීමේදී සහ සමාජ මාධ්‍ය ඇතුළු නව උපදෙස් සහ තොරතුරු මූලාශ්‍ර මත විශ්වාසය තැබීමේදී ඒවා විශ්වාසදායක හෝ නොවිය හැකි නමුත් නිසැකවම ප්‍රභල බවත් සුළු පරිමාණ ආයෝජකයින් ඉතා ක්‍රියාකාරී වෙළෙඳපොළ සහභාගිවන්නන් බවට පත්ව ඇති බවත් කිව යුතුය.

වෙනත් වචන වලින් කිවහොත්, අප ක්‍රියාත්මක වන්නේ සාම්ප්‍රදායික නියාමන ආකෘතියට අභියෝග කරන වේගවත් වෙනසක් සහිත පරිසරයක ය. වේගවත් තාක්ෂණික සංවර්ධනය, වෙනස් වන ප්‍රජාවිද්‍යාත්මක තත්ත්වයන් සහ වෙනස් වන ආයෝජක ආකල්ප අනුව බලන විට, අද ප්‍රාග්ධන වෙළෙඳපොළ මීට දශකයකට පෙර තිබූ තත්ත්වයට වඩා බෙහෙවින් වෙනස් ලෙස පෙනේ.

අපගේ කාර්යයට සහාය වීම සඳහා, අපගේ අනාගත කාර්ය මණ්ඩලයට දත්ත මත පදනම් වූ පරිසරයක සිට වැඩ කිරීමට සහ දියුණු වීමට අවශ්‍ය කුසලතා අප අඛණ්ඩව හඳුනාගෙන ගොඩනගන්නෙමු. මූල්‍ය වෙළෙඳපොළවල් හරහා නියාමනය සඳහා පුළුල් වගකීමක් සහිත ව්‍යාපාර ඒකක අඩු ප්‍රමාණයක් පිළිබිඹු කිරීම සඳහා අප, අපගේ සංවිධානය විධිමත් කර ඇත්තෙමු.

තවද, මෙම ගැටළු වඩ වඩාත් උග්‍ර වෙමින් පවතින අතර, අප නියාමනය කරන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ උත්සාහයන්හි නියැලෙන විට අප වැඩි පරීක්ෂාවකට ලක් වන්නෙමු. මෙම නව වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යය, ව්‍යුහය සහ නියාමන න්‍යාය පත්‍රය ද සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත.

අපගේ වගකීම ඉටු කිරීම සඳහා ප්‍රමුඛතා සමතුලිත කිරීමක් අවශ්‍ය වේ - උදාහරණයක් ලෙස, ආයෝජකයින් ආරක්ෂා කිරීම සහ ප්‍රාග්ධන සම්පාදනය ඉහළ නැංවීම, ස්වාධීනව ක්‍රියා කිරීම සහ අපගේ නියාමන හවුල්කරුවන් සමඟ වැඩ කිරීම සහ විකල්ප ප්‍රවේශයන්ට ප්‍රතිචාර දක්වන අතරම සාම්ප්‍රදායික ආයෝජන උපකරණ සමඟ ශක්තිමත් බලාත්මක කිරීමක් ලබා දීම අවශ්‍ය වේ.

අපගේ වගකීම දෙයාකාරය: එනම්, තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා වෙළෙඳපොළ සංවර්ධන ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යමින් ශක්තිමත් නියාමනය හරහා ප්‍රාග්ධන වෙළෙඳපොළවල අවංකභාවය, විනිවිදභාවය සහ ස්ථාවරත්වය සහතික කිරීමයි. මෙම ද්විත්ව වගකීම් එකිනෙකින් බැහැර නොවන අතර ඒවා දැඩි ලෙස බැඳී පවතී. හොඳින් නියාමනය කරන ලද වෙළෙඳපොළක් ආයෝජක විශ්වාසය සහ පද්ධතිමය විශ්වාසය ඇති කිරීම සඳහා මූලික පහසුකම් සපයන අතර, එමගින් වෙළඳපොළ තරඟකාරිත්වය, අදාළ බව සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කරයි.

පසුගිය වසර පුරා, මෙම අරමුණු දෙක ඉටු කිරීමේදී අපි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත්තෙමු. නියාමන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල, අපගේ තත් කාලීන ආවේක්ෂණ (Real Time) ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම, අපගේ අධීක්ෂණ රාමු වැඩිදියුණු කිරීම, බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් තීව්‍ර කිරීම, බලපත්‍රලාභීන්ගේ සහ ලයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම් සහ සාංගමික පාලන ව්‍යුහයන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා අප ඉහළ මට්ටමේ වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් ලබා ගත්තෙමු. පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා පමණක් නොව, ආයෝජකයින්ගේ විශ්වාසය ඇති කිරීම සහ වෙළෙඳපොළ තුළ විනය ඉහළ මට්ටමකින් පවත්වාගනිමින් ඉදිරියට ගෙන යාම සඳහා ද මෙම පියවර හඳුන්වා දෙන ලදී.

ඒ සමගම, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය පුළුල් කිරීම, නව කොටස් නිකුත් කරන්නන් වෙළෙඳපොළ වෙත ආකර්ෂණය වැඩිදියුණු කිරීම, ආයෝජන උපකරණ විවිධාංගීකරණය, පුළුල් පදනමක් සහිත ආයෝජක සහභාගීත්වය සහ කොටස්කරුවන් අතර මූල්‍ය ගණුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන ක්‍රියාකාරකම් අප වේගයෙන් නිරීක්ෂණය කළෙමු. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අනවශ්‍ය බාධක අවම කිරීම සඳහා අපි නියාමන ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි විධිමත් කළ අතර, වෙළෙඳපොළ අවංකභාවය සහ විශ්වාසය ආරක්ෂා කරමින් ආයෝජක ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ ක්‍රම පවත්වා ගත්තෙමු.

අප විසින් තීරණයක් ගන්නා විට, එය නිවැරදි එකක් විය යුතු බවත්, සාක්ෂි මත පදනම් වූ, හොඳ විනිශ්චයක් සහ එහි නියෝගයන් සමඟ අනුකූලවීම අත්‍යවශ්‍ය බවත් මම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. මන්ද එහි ප්‍රතිවිපාක දීර්ඝ එකක් විය හැකිය. මූල්‍ය වෙළෙඳපොළවල, එක් වැරදි පියවරක් හෝ හදිසි තීරණයකින් පවා ආයෝජකයින්ගේ විශ්වාසය බිඳ දැමිය හැකිය. වෙළෙඳපොළ හැසිරීම විකෘති කළ හැකිය. එසේ නැතහොත් පද්ධතිමය අස්ථාවරත්වයක් ඇති කළ හැකිය. සුරැකුම්පත් වෙළෙඳපොළවල පදනම විශ්වාසය බව අපි විශ්වාස කරමු, වෙළෙඳපොළ සහභාගිවන්නන් අතර එය ස්ථාපිත කිරීමට අපොහොසත් වුවහොත්, අපට වෙළෙඳපොළ ඊළඟ පියවර වෙත ගෙන යාමට නොහැකි වනු ඇත.

හොඳින් නියාමනය වන සහ වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් අතර මනා සමතුලිතාවක් දක්නට ලැබෙන ප්‍රාග්ධන වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට අප සෑම විටම කැපවී සිටින අතරම, වෙළෙඳපොළ තුළ සියළු දෙනාට සමානව සහභාගී වියහැකි, ඉක්මන් සහ අනාගතයට සූදානම් බව සහතික කරමු. අපි තවදුරටත් අපගේ ප්‍රවේශය ඉදිරියට ගෙන යන අතර එය දත්ත මත ඉදිරියට යන,

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**අප විසින් තීරණයක් ගන්නා විට, එය නිවැරදි එකක් විය යුතු බවත්, සාක්ෂි මත පදනම් වූ, හොඳ විනිශ්චයක් සහ එහි නියෝගයන් සමඟ අනුකූලවීම අත්‍යවශ්‍ය බවත් මම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.**

අවදානම් පදනම් ක්‍රමවේදයන් සහ යුක්තිය හා සාධාරණත්වය යන මූලධර්මයන් මත පදනම් වෙමින් මෙහෙයවනු ලබයි. එසේ කිරීමෙන්, ආයෝජකයින් සවිබල ගැනවීමත්, ප්‍රාග්ධන සම්පාදනයට පහසුකම් සැපයීමත් සහ එමගින් තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කරන සක්‍රිය පරිසරයක් නිර්මාණය කිරීමත් අපගේ ඉලක්කයයි.

## අභියෝගාත්මක පරිසරය තුළ නැවත ගොඩ නැගෙන විශ්වාසය

2024 වසර, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි සැලකිය යුතු පිබිදීමක් සනිටුහන් කළ අතර, සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) 49.7% කින් ඉහළ ගොස් 15,945 ක් ලෙස වාර්තා වූ අතර, S&P SL20 කොටස් මිල දර්ශකය 58.5% ක ආකර්ෂණීය වර්ධනයක් වාර්තා කරමින් ඒකක 4,862 ක් විය. පසුගිය වසර කිහිපය තුළ රට මුහුණ දුන් අඛණ්ඩ ආර්ථික කැලඹීම් මධ්‍යයේ වුවද, තිරසාර ආයෝජක විශ්වාසය පිළිබිඹු කරමින්, පසුගිය වසර තුන තුළ මෙම කොටස් මිල දර්ශක දෙකම ශක්තිමත් කාර්ය සාධනයක් පවත්වා ගෙන ගොස් ඇත.

2024 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය 5% කින් වර්ධනය වූ අතර එය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කළ කැපී පෙනෙන ප්‍රකෘතිමත් වීමක් සනිටුහන් කළ වසරක් විය. රට මුහුණ දුන් ආර්ථික අර්බුදය මධ්‍යයේ 2022 වසරේදී ආර්ථිකය 7.3% කින් හැකිලුණු අතර 2023 වසරේදී එය 2.3% කින් හැකිළී ගියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහාය දක්වන ලද ආර්ථික වැඩසටහන මගින් ශ්‍රී ලංකා ආර්ථිකයට ශක්තියක් ලබා දුන් අතර එමගින් කෙටි කාලයක් තුළ ආර්ථිකයට නැවත නැගිටීමට හැකි විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සපයන ලද විශ්වසනීය රාමුව මගින් ශ්‍රී ලංකාවට ඉතිරි ණය මුදල කාර්යක්ෂමව ගෙවීමට ඉඩ සලසන අධිෂ්ඨානශීලී ප්‍රතිසංස්කරණ ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ස්ථාවර ආර්ථිකයක් වෙත ගමන් කරන ශ්‍රී ලංකාවේ මාවත රඳා පවතින්නේ ස්ථාවර ෆිස්කල් හා මුදල් ප්‍රතිපත්ති මත ය. සකස්කරන ලද ප්‍රතිපත්ති මගින් කෙටි කාලීනව සහ දිගු කාලීනව අභ්‍යන්තර වශයෙන් වර්ධනයක් ලබා දෙනු ඇත. ණය තිරසාරභාවය තීරණාත්මක අවස්ථාවක පවතින අතර, ප්‍රතිපත්තිමය වැරදි පියවරයන් සඳහා සුළු ඉඩක් දැකගත හැකිය. සමාජ සුභසාධන වැඩසටහන්, ජනගහනයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කොටස් සඳහා සහාය වීම සඳහා ඉලක්ක කර ඇති අතර තීරණාත්මක රාජ්‍ය සේවාවන් සඳහා අරමුදල් සැපයීම සඳහා ආදායම් පදනම පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ දිගුකාලීන වර්ධන හැකියාව සම්පූර්ණයෙන්ම අත්පත් කර ගැනීම සඳහා, මධ්‍යම හා දිගු කාලීන වර්ධනයට සහාය වන ප්‍රාග්ධන සම්පාදනයට, ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා පහසුකම් සැලසිය යුතුය.

වෙළෙඳපොළ වැඩිදියුණු වීම් තත්ත්වයන් සහ ආකර්ශනීය තක්සේරු කිරීම් මගින් සහාය වූ වෙළෙඳපොළෙහි මුළු වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් ට්‍රිලියන 5.69 ක් විය. දේශීය හා විදේශීය ආයෝජකයින් සඳහා අප වෙළෙඳපොළට පිවිසීමට ආකර්ශනීය ප්‍රවේශ අවස්ථා ලබා දෙමින්, කලාපීය තරඟකරුවන්ට සාපේක්ෂව අපගේ වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතිකය (PxE) 8.9x ක් ලෙස ආකර්ශනීය තත්ත්වයේ පැවතුනි. දිගුකාලීන ආයෝජකයින් සඳහා ආකර්ශනීය ප්‍රතිලාභ ලබා දෙමින් ලාභාංශ ඵලදාව 3.6% ක මට්ටමේ ස්ථාවරව පැවතුනි.

කෙසේ වෙතත්, කොටස් ලයිස්තුගත කිරීම් හරහා ප්‍රාග්ධන රැස්කිරීම් මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, මූලික මහජන නිකුතු (IPO) හරහා රැස් කරන ලද අරමුදල රුපියල් බිලියන 2.8 ක් පමණක් විය. ඊට වෙනස්වූ මඟක් ගනිමින්, දැනට පවතින ලයිස්තුගත සමාගම් ප්‍රාග්ධන වෙළෙඳපොළ ආකර්ශනීය ආකාරයකින් භාවිතා කරමින්, හිමිකම් නිකුතු හරහා රැස් කරන ලද අරමුදල රුපියල් බිලියන 63 ක් ලෙස වාර්තා වූ අතර එය පසුගිය වසර පහට සාපේක්ෂව සැලකිය යුතු දියුණුවක් ලෙස සඳහන් කළ හැකිය. තවද, ප්‍රාථමික ණය වෙළෙඳපොළ ක්‍රියාකාරීව පැවති අතර, නව ණයකර මූලික නිකුතු (IPO) මගින් රුපියල් බිලියන 94.8 ක් වාර්තා කරමින්, නිකුත් කරන්නන් අතර වඩාත් ස්ථාවර අරමුදල් සම්පාදන මාර්ගයක් බවට එය පත්විය. ආර්ථික ප්‍රකෘතිමත් වීමත් සමඟ පොලී අනුපාත පහත වැටීමක් නිරීක්ෂණය වූ වාතාවරණය තුළ, ප්‍රාථමික ණය වෙළෙඳපොළ නිකුත් කිරීම් පෙර වසරට සාපේක්ෂව තුන් ගුණයකින් පමණ ඉහළ ගියේය.

පසුගිය වසර තුන තුළ දක්නට ලැබුණු ප්‍රවණතාවයට සමානව, මෙම වසරේදී විදේශීය ආයෝජක සහභාගීත්වය සාමාන්‍ය මට්ටමක පසුවිය. රටවල පුළුල් සාර්ව ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් විදේශ ආයෝජක සහභාගීත්වය 10% ක් ලෙස පැවතුනි. එපමණක් නොව, ශුද්ධ විදේශ ක්‍රියාකාරකම් පසුගිය වසරේ දක්නට ලැබුණු රුපියල් බිලියන 4 ක ශුද්ධ ගලා ඒමට ප්‍රතිවිරුද්ධව, රුපියල් බිලියන 10 ක සෘණ පිටතට ගලා යාමක් වාර්තා කළ අතර, එය ජාත්‍යන්තර ආයෝජකයින් විසින් අනුගමනය කරන ලද අඛණ්ඩ අනතුරු ඇඟවීමේ ප්‍රවේශය ඉස්මතු කරයි.

සමස්තයක් වශයෙන්, වෙළෙඳපොළ ආකර්ෂණීය කාර්ය සාධන මිනුම් දඬු පෙන්නුම් කරන ලද අතර, ප්‍රධාන දර්ශකවලින් පෙනී යන්නේ සාර්ව ආර්ථික මට්ටමින් සිදු කරන ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ආයෝජක හැඟීම් හැඩගස්වන බවයි. අපි ඉදිරිය දෙස බලන විට, ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා සහාය වන ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් මෙම වර්ධනය පවත්වා ගැනීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ සම්පූර්ණ හැකියාවන් වෙත ගමන් කිරීමට ඉතා වැදගත් වේ.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගය: සංවර්ධනය හා නියාමනය සමබරව පවත්වාගෙනයාම

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ නව පරිවර්තනයක් ඇති කිරීම සහ ආයෝජකයින් අතර විශ්වාසය හා අවංකභාවය ගොඩ නැගීම සඳහා නිර්මාණය කර ඇති ප්‍රගතිශීලී සංවර්ධන සහ නියාමන පියවර මාලාවක් ඇතුළත් 2025-2035 ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගික සැළැස්ම සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව විසින් දියත් කරන ලදී. එය දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රධාන ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ දොළහකින් යුක්ත වේ. මෙම ප්‍රධාන ප්‍රතිසංස්කරණ දොළහ ශක්තිමත්, නව්‍යතාවයකින් යුත් සහ ගෝලීය වශයෙන් තරඟකාරී ප්‍රාග්ධන වෙළෙඳපොළක් බිහි කිරීම අරමුණු කර ගෙන ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ

**ස්ථාවර ආර්ථිකයක් වෙත ගමන් කරන ශ්‍රී ලංකාවේ මාවත රඳා පවතින්නේ ස්ථාවර ෆිස්කල් හා මුදල් ප්‍රතිපත්ති මත ය. සකස්කරන ලද ප්‍රතිපත්ති මගින් කෙටි කාලීනව සහ දිගු කාලීනව අභ්‍යන්තර වශයෙන් වර්ධනයක් ලබා දෙනු ඇත.**

ප්‍රතිසංස්කරණ තීරණය කිරීමේදී සහ එවැනි ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛත්වය දීමේදී, කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE), කොටස් තැරැව්කාර ප්‍රජාව, ඒකක භාර කර්මාන්තය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ආසියානු සංවර්ධන බැංකුව (ADB), ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමය වැනි බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් ඇතුළු විවිධ ප්‍රාග්ධන වෙළෙඳපොළ කොටස්කරුවන්ගෙන් අදහස් රැස් කරන ලදී.

දේශීය මූල්‍ය පරිසර පද්ධතියේ අත්තිවාරම ශක්තිමත් කිරීම සඳහා මෙම ප්‍රධාන ප්‍රතිසංස්කරණ දොළහ ඉතා වැදගත් බව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්වාස කරයි. මෙම ප්‍රතිසංස්කරණ ප්‍රාග්ධන වෙළෙඳපොළ නවීකරණය කිරීම සඳහා පැහැදිලි මඟ පෙන්වීමක් සපයයි. අඛණ්ඩ වෙනස්කම්, අවස්ථා සහ අවදානම් මධ්‍යයේ අපගේ වගකීම ඉටු කිරීම සඳහා අපගේ සම්පත් සහ විශේෂඥතාව නිසියාකාරව යෙදවීම සඳහා වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ උපකාරී වනු ඇත. එය උපායමාර්ගික ඉලක්ක මත කේන්ද්‍රගත වන අතර, ඒ සෑම එකක්ම අද අප නියාමනය කරන ආකාරයට වඩා වෙනස් මට්ටමක මුහුණුවරක් ගනිමින් වෙළෙඳපොළට ප්‍රතිචාර දක්වන සුවිශේෂී ප්‍රතිඵල කරා යොමු කරයි. නියාමනය සහ සංවර්ධනය යන මෙම ප්‍රධාන ක්ෂේත්‍ර දෙස අවධානය යොමු කිරීමෙන්, වඩාත් කාර්යක්ෂම, ප්‍රවේශ විය හැකි, සියල්ලන්ට සහභාගී විය හැකි සහ කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැලසුම් කරයි. මෙම ප්‍රතිසංස්කරණවලින් සමහරක් කලින් සාකච්ඡා කර තිබුණද, පෙර උත්සාහයන්හිදී ඒවා ක්‍රියාත්මක නොවීය. මෙම නව ප්‍රතිසංස්කරණයන්හි අරමුණ වන්නේ මෙම ප්‍රතිසංස්කරණ ප්‍රසිද්ධියට පත් කිරීම, නිශ්චිත කාලරාමු තුළ ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීමයි.

තාක්ෂණයන් පරිණත වී නව ඒවා මතුවන විට මූල්‍ය පරිසරය ඊටත් වඩා වේගයෙන් වෙනස් වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. සාම්ප්‍රදායික නියාමන ක්‍රමවේදයන් අවධාරණය කරන වගවීමේ මූලධර්මවලට නව නවෝත්පාදන ක්ෂේත්‍ර අභියෝග කරමින් සිටී.

ආයෝජකයින් සහ අපගේ වෙළෙඳපොළවල අවංකභාවය ආරක්ෂා කිරීම සඳහා අපගේ නව දත්ත මත පදනම් වූ පරිසරය තුළ වැරදි ක්‍රියා වැළැක්වීම, ඒවා සිදුවීමට ඇති ඉඩකඩ නැති කිරීම සහ දඬුවම් කිරීම අපි අඛණ්ඩව කරගෙන යා යුතුය. ආයෝජනයේ අනාගතය සඳහා තාක්ෂණය පරිණාමය වන විට එමඟින් ලබාදෙන ඇඟවුම් තේරුම් ගැනීමට සහ ඒ අනුව අපට ක්ෂණිකව හැඩගැසීමට හැකි විය යුතුය. අප ඉදිරිය දෙස බලන විට, වෙනස්වන ආර්ථික තත්ත්වයන් සහ භූ දේශපාලනික අවිනිශ්චිතතාවයන් තුළින් ප්‍රාග්ධන වෙළඳපොළ ක්‍රියාකාරකම් කෙරෙහි ඇති කරන බලපෑම ද සලකා බැලිය යුතු අතර අපගේ වෙළෙඳපොළ සඳහා මෙම බලවේගවල ඇඟවුම් තක්සේරු කිරීමට අප සූදානම් බවද සහතික කළ යුතුය.

## විවිධාංගීකරණය වූ වෙළෙඳපොළ නව ආයෝජන උපකරණ හරහා වෙළෙඳපොළ වර්ධනය පවත්වා ගෙනයාම

සාම්ප්‍රදායික නියාමන බලතල හරහා ගමන් කරන නව මූල්‍ය උපකරණ සහ සේවාවන් අප විසින් හඳුන්වාදෙනු ලබයි. ඩිජිටල් ක්‍රමවේද හරහා වැඩි වැඩියෙන් සූදුකරණය, නීතිරීතිවලට පටහැනි විවිධ ආයෝජන ක්‍රම සහ අනෙකුත් වැරදි හැසිරීම් ක්‍රම භාවිතා කිරීම් ඉහළයමින් තිබෙන අතර මෙම ක්‍රම අපගේ වෙළෙඳපොළට බලපානු ඇත. එමෙන්ම ඒවා ආයෝජකයින් අධික අවදානම් ගැනීමට සහ වෙනත් ආකාරයකින් ඔවුන්ගේම යහපතට එරෙහිව ක්‍රියා කිරීමට දිරිමත් කිරීම් විය හැකිය. මෙම ඩිජිටල් සම්බන්ධතා ශිල්පීය ක්‍රම මගින් නිවැරදි ආයෝජන සඳහා වන අපදෙස් බොඳකර දමන අතර ආයෝජක ආරක්ෂණ ගැටළුද මතු කරයි. මේ නිසා පැහැදිලිවම, නියාමකයින් ආයෝජකයින්ගේ හැසිරීම තේරුම් ගැනීමට සහ ඵලදායී ලෙස සම්බන්ධ වීමට නව ආයෝජන උපකරණ සොයා ගත යුතුය.

ආයතනික සහ සුළුපරිමාණ යන දෙඅංශයේම බොහෝ ආයෝජකයින්, ආයෝජන තීරණ ගැනීමේදී, පාරිසරික. සමාජීය සහ පාලන (ESG) ලේබලය යටතේ විස්තර කර ඇති හෝ නොවූ, පාරිසරික, සමාජීය සහ පාලන සාධක මගින් වැඩි වශයෙන් බලපෑමට ලක් වේ. පොදු සමාගම් දේශගුණික විපර්යාස සඳහා දායක වන ආකාරය සහ සූදානම් වන ආකාරය සහ වර්තමාන සමාජය වඩා හොඳින් පිළිබිඹු කරන සහ වඩා හොඳ තීරණ වලට මඟ පෙන්වන වඩාත් වෙනස්වූ පුවරුවක් සහ කළමනාකරණ කණ්ඩායමක් ගොඩ නැගීමට ඔවුන් ගන්නා පියවර පිළිබඳව ඔවුන් වැඩි විනිවිදභාවයක් ඉල්ලා සිටී.

වසර තුළ, ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව සහ කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන්, පුළුල් හරිත, සමාජීය සහ තිරසාර (GSS) බැඳුම්කර රාමුවක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යුහය හරිත, සමාජීය සහ තිරසාරභාවයට සම්බන්ධ බැඳුම්කර නිකුත් කිරීම සඳහා සහාය වන අතර පැහැදිලි දිශාවක්ද සපයන අතර, දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ගෝලීය ආචාරධර්ම සමඟ පෙළගැස්වීම සඳහා සැලකිය යුතු පියවරක් තබයි.

පළමු ලැයිස්තුගත හරිත බැඳුම්කර නිකුත් කිරීමේදී DFCC බැංකුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ අතර මෙම මුලපිරීම සඳහා වෙළෙඳපොළ ධනාත්මකව ප්‍රතිචාර දැක්වීම දිරිගන්වන සුළුය. විශේෂයෙන්, නව සුරැකුම්පත් නිකුත් කිරීම් සියල්ල සඳහා අධි ඉල්ලුමක් දැකගත හැකි වූ අතර, එය තිරසාර ආයෝජන අවස්ථා කෙරෙහි ආයෝජකයින් තුළ ඇති දැඩි රුචිය පිළිබිඹු කරයි. තිරසාර බැඳුම්කර නව නිකුත් කරන්නන්ට සහ ආයෝජකයින්ට වාසි රැසක් ලබා දෙයි. මෙම උපකරණ ධනාත්මක පාරිසරික හෝ සමාජීය ප්‍රතිඵල ජනනය කරන ව්‍යාපෘති සඳහා දිගුකාලීන අරමුදල් රැස් කිරීමට සහාය වන අතර එමඟින් තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීමේදී ප්‍රාග්ධන වෙළෙඳපොළේ කාර්යභාරය ශක්තිමත් කරයි.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීම සහ ආර්ථික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවන බලවේගයක් ලෙස බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් හඳුන්වාදීම

අනාගතයන්, වරණයන් සහ භාණ්ඩ ඇතුළත් බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුව හඳුන්වාදීම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යභාරය පුළුල් කිරීමේ පරිවර්තනීය සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මෙම කාර්යය පහසු කිරීම සඳහා, යෝජිත ව්‍යුත්පන්න හුවමාරුව සැලසුම් කිරීම,

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් පළපුරුදු හවුල්කරුවෙකු හඳුනා ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මහජන අදහස් ලබා ගැනීමේ ප්‍රකාශනයක් (EOI) නිකුත් කිරීමෙන් ක්‍රියාකාරී පියවර ගෙන තිබේ. බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුව නිර්මාණය කිරීම රටට පුළුල් පරාසයක ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන් කෘෂිකර්මාන්තය වැනි අංශවල ඵලදායී මිල සොයා ගැනීම සඳහා ආයෝජන උපකරණ හඳුන්වාදීමෙන් එය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇත. මෙම වේදිකාව නිෂ්පාදකයින්ට සහ ගැනුම්කරුවන්ට ඔවුන්ගේ මිල අවදානම අවම කර ගැනීමට පහසුකම් සපයන අතර වෙළෙඳපොළ සහභාගිවන්නන්ට බෙහෙවින් උපකාර වන ශක්තිමත් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණ සපයනු ඇති අතර එමඟින් විවිධ ක්ෂේත්‍ර අතර මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නංවයි.

මෙම හුවමාරුව වෙළඳපොළට නව මූල්‍ය උපකරණ හඳුන්වා දීමෙන් ආයෝජක සහභාගීත්වය පුළුල් කිරීමට තවදුරටත් පහසුකම් සපයනු ඇත. භාණ්ඩ පදනම් කරගත් හුවමාරුවක් මඟින් දේශීය ව්‍යාපාර සහ ගොවීන්ට ව්‍යුහගත, හොඳින් නියාමනය කරන ලද පරිසරයක් තුළ තම නිෂ්පාදන අලෙවි කිරීමට අවස්ථාව ලබා දෙන අතර එමඟින් ප්‍රතිලාභ ලබා ගැනීමට පහසුකම් සැලසේ. අනාගතයන් සහ වරණයන් වැනි ව්‍යුත්පන්න උපකරණ හඳුන්වාදීම හරහා ප්‍රාග්ධනය වෙන් කිරීම වැඩි දියුණු කිරීමට පහසුකම් සපයන අතර වඩාත් ඔරොත්තු දෙන සහ පරිසර හිතකාමී ප්‍රාග්ධන වෙළඳපොළ පරිසර පද්ධතියකට දායක වන ආයෝජන කළඹ විවිධාංගීකරණය සඳහා මාර්ග සපයනු ඇත.

තවද, යෝජිත බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුව ප්‍රතිපත්ති සම්පාදකයින්ට, වෙළෙඳපොළ සහභාගිවන්නන්ට සහ නියාමකයින්ට දැනුවත් තීරණ ගැනීමට සහ නව නිකුත් කරන්නන්ගේ සමස්ත සාංග මික යහපාලන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීමට ද පහසුකම් සපයනු ඇත. මෙම හුවමාරුව ශ්‍රී ලංකා ආර්ථිකය නංවාලීමට පමණක් නොව, ගෝලීය මූල්‍ය පරිසර පද්ධතියට ශ්‍රී ලංකාව ඒකාබද්ධ කිරීම වේගවත් කිරීමේදී උත්ප්‍රේරකයක් ලෙසද ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ආර්ථික සංවර්ධනයේ කුළුණක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ සාක්ෂරතාවය ඉහළ නැංවීම

ආයෝජක සහභාගීත්වය පුළුල් කිරීම සහ කොටස්කරුවන් අතර මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන්, පුළුල් පරාසයක ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.
ප්‍රාග්ධන වෙළෙඳපොළේ වත්මන් සහ අනාගත ආයෝජකයින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුමින් සන්නද්ධ කිරීම අරමුණු කරගත් සම්මන්ත්‍රණ මාලාවක්, වැඩමුළු සහ අන්තර් විශ්ව විද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟ මෙයට ඇතුළත් වේ. ඊට අමතරව, වෙළෙඳපොළ පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවත්, කොළඹ කොටස් හුවමාරුවත් එක්ව කලාපීය වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදි.

සිසුන් අතර මූල්‍ය අධ්‍යාපනය ඇති කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සමඟ එක්ව, 6 සිට 9 ශ්‍රේණි දක්වා මූල්‍ය සාක්ෂරතාව සහ ව්‍යවසායකත්වය යන නව විෂයයට ප්‍රාග්ධන වෙළෙඳපොළ ඇතුළත් කරමින් සිසුන්ගේ විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ගමනට සහයෝගය ලබාදීම ආරම්භ කර ඇත. මෙම මුලපිරීම නුදුරු අනාගතයේ දී සාර්ථක වනු ඇතැයි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ කොළඹ කොටස් හුවමාරුව එක්ව දිවයින පුරා තෝරාගත් පාසල් 100ක "ප්‍රාග්ධන වෙළෙඳපොළ සමාජ" ස්ථාපිත කිරීමට පියවර ගෙන තිබේ. මෙම ක්‍රියාවලිය තුළින් අරමුණු කරන්නේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය පිළිබඳව සිසුන් අතර මූලික අවබෝධය වර්ධනය කිරීමයි. මූල්‍යමය වශයෙන් බුද්ධිමත් සමාජයක් ගොඩනැගීම සඳහා ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතරම, ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම වර්ධනය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්ව විද්‍යාල සමඟ ද ක්‍රියාකාරීව සම්බන්ධ වේ.

**ආයෝජකයින් සහ අපගේ වෙළෙඳපලවල අවංකභාවය ආරක්ෂා කිරීම සඳහා අපගේ නව දත්ත මත පදනම් වූ පරිසරය තුළ වැරදි ක්‍රියා වැළැක්වීම, ඒවා සිදුවීමට ඇති ඉඩකඩ නැති කිරීම සහ දඬුවම් කිරීම අපි අඛණ්ඩව කරගෙන යා යුතුය.**

## වඩාත් පුළුල් හෙළිදරව් කිරීමේ සමාලෝචනයන් හරහා වෙළෙඳපොළ අවංකභාවය ප්‍රවර්ධනය කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෙළිදරව් කිරීම මත පදනම් වූ නියාමන රාමුවක් යටතේ ක්‍රියාත්මක වන අතර, එමඟින් වෙළෙඳපොළට වැදගත් තොරතුරු කාලෝචිත හා විනිවිදභාවයෙන් බෙදා හැරීමේ වැදගත්කම අවධාරණය කරයි. එය ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීමට පහසුකම් සපයයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ විනිවිදභාවය සහ වගවීම ආරක්ෂා කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කැපවී සිටී. නියාමන අධීක්ෂණයේ කොටසක් ලෙස, ලයිස්තුගත සමාගම් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්, සාංගමික යහපාලන ප්‍රමිතීන් සහ අනෙකුත් හෙළිදරව් කිරීමේ බැඳීම්වලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිතිපතා සමාලෝචනයන් සිදු කරනු ලබයි. අනුකූල නොවන හෝ වැදගත් අතපසුවීම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥාවන් හඳුනා ගැනීම සඳහා මෙම ක්‍රියාවලිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර එමඟින් ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම සහ වෙළෙඳපොළ අවංකභාවය ප්‍රවර්ධනය කරනු ලබයි.

ලයිස්තුගත සමාගම් වලින් පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ ක්‍රියාකරු සමඟ අඛණ්ඩව සම්බන්ධ වන අතර, අනාවරණය කිරීමේ පිළිවෙත් වැඩිදියුණු කිරීම නිර්දේශ කරමින්, එමඟින් ක්‍රියාශීලී නියාමන සංස්කෘතියක් පවත්වාගෙන යයි. සාධාරණ, ක්‍රමවත් සහ කාර්යක්ෂම වෙළෙඳපොළක් පවත්වාගෙන යාමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර ආචාරධර්ම වලට අනුකූලව හෙළිදරව් කිරීම පදනම් කරගත් නියාමනය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව උත්සාහ කරයි. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වාර්ෂික වාර්තා සියයකට අධික සංඛ්‍යාවක් සමාලෝචනය කළ අතර නව කොටස් නිකුත් කිරීම් සහ නව ණයකර නිකුත් කිරීම් වලට අදාළ සමාලෝචන සහ විශ්ලේෂණයන් සිදු කළේය.

## වෙළෙඳපොළ අවංකභාවය ආරක්ෂා කිරීම: තත්‍ය කාලීන (Real Time) වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අති නවීන, තත්‍ය කාලීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් අත්පත් කර ගැනීමට පියවර ගත් අතර එය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන සන්ධිස්ථානයක් වෙත ළඟාවීමක් සනිටුහන් කළේය. මෙම පද්ධතිය ගණුදෙනු විෂමතා හඳුනා ගැනීමට, වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම් හඳුනා ගැනීමට සහ නව තාක්ෂණයන් හරහා සමස්ත විශ්ලේෂණ හැකියාවන් වැඩි දියුණු කිරීමට පහසුකම් සපයනු ඇත. එය වෙළෙඳපොළ නව අභියෝග ජය ගැනීම සඳහා මෙන්ම වෙනස්වන ගණුදෙනු රටා හඳුනා ගැනීමට බෙහෙවින් වැදගත් වනු ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වසර තුළ ආවේක්ෂණ ක්‍රියාකාරකම් හරහා අවස්ථා 147ක් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා තවදුරටත් ඇගයීම අවශ්‍ය විය. එමෙන්ම ඒවා විසඳීමට බහුවිධ පියවර ගෙන ඇත. එම අවස්ථා අතරින්, ආවේක්ෂණ යොමු කිරීම් (Surveillance Referrals) එකොළහක් වසර තුළ සිදු කරන ලදී.

## ක්‍රියාශීලී බලාත්මක කිරීම තුළින් විශ්වාසය ආරක්ෂා කිරීම

සාධාරණ හා ක්‍රමවත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වාගෙන යාමේ ප්‍රධාන අංගය වන්නේ ස්ථාවර සහ විනිවිදභාවයෙන් යුත් බලාත්මක කිරීම් අනුගමනය කිරීමයි. වැරදිකරුවන් වගවීම මගින්, නියාමන රාමුව කෙරෙහි විශ්වාසය සහ අවංකභාවය ඇති කිරීම සහ ආයෝජක අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අපගේ කැපවීම ශක්තිමත් කිරීම අපගේ අරමුණයි.

විමර්ශනය සහ බලාත්මක කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වගකීමේ හදවත බඳුය. වසර පුරාම, අප කල් ඇතිව හඳුනා ගැනීම සහ කඩිනම් මැදිහත්වීම කෙරෙහි අවධානය යොමු කරමින්, බලාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රවේශයක් අනුගමනය කළෙමු. ප්‍රාග්ධන වෙළෙඳපොළේ අවංකභාවය ආරක්ෂා කරමින්, අනාරක්ෂිත ප්‍රදේශවලට අවදානම පැතිරීම වැළැක්වීම සඳහා "ගැටළු ආරම්භයේදීම එය ඉවත් කිරීම" අප දැඩි ලෙස විශ්වාස කරන්නෙමු. වසර තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැලකිය යුතු විමර්ශන නඩු සංඛ්‍යාවක් අවසන් කළ අතර හේතු දැක්වීමේ නිවේදන, අනතුරු ඇඟවීමේ ලිපි ආදිය ඇතුළු බහුවිධ ක්‍රියාමාර්ග ගන්නා ලද අතර වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවස්ථා අටකදී පියවර ගත්තේය.

ඉදිරිය දෙස බලන විට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වැරදිකරුවන්ට එරෙහිව ස්ථිර තීරණ ගැනීම දිගටම කරගෙන යනු ඇත. සුරැකුම්පත් විනිමය කොමිෂන් සභා පනත උල්ලංඝනය කරන්නන් සුදුසු නීතිමය සහ මූල්‍ය ප්‍රතිවිපාකවලට මුහුණ දෙන බව සහතික කිරීම පමණක් නොව, අනාගත වෙළෙඳපොළ විෂමාචාර වැළැක්වීම සඳහා වන පියවර ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ. අති නවීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතිය මේ සම්බන්ධයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත.

## අගය කිරීමේ සටහනක්

ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඔවුන්ගේ නොපසුබට උත්සාහය සහ නොසැලෙන කැපවීම වෙනුවෙන් සමස්ත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවක මණ්ඩලයට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ වෙහෙස මහන්සි වී වැඩ කිරීම, කැපවීම සහ වෘත්තීයභාවය බෙහෙවින් අගය කරන්නෙමි. ආයතනයේ වගකීම් සාක්ෂාත් කර ගැනීමේදී සැබෑ වෙනසක් ඇති කිරීමට ඔවුන්ගේ දායකත්වය ලබාදීම වෙනුවෙන් ඊටත් වඩා මා ස්තුති කිරීමට කැමැත්තෙමි.

අපගේ ගමන අඛණ්ඩව ඉදිරියට ගෙන යන අතරතුර, අප විසින් ගනු ලබන ඕනෑම තීරණයක හෝ නිර්දේශයක ඒවායේ වැදගත්කම සහ සමතුලිත බව සහතික කිරීම සඳහා අපට පැවරී ඇති කාර්යභාරයට අයත් සියලුම අංග සමස්තයක් ලෙස සලකා බැලිය යුතුය. ඉදිරි වසරවලදී අපගේ කටයුතු සමබරව පවත්වාගෙන යාම සඳහා, අපගේ සම්පත් නිසිලෙස යොද ගන්නේ කෙසේද යන්න සහ අවධානය යොමු කරන්නේ කෙසේද යන්න උපකාරී වන පැහැදිලි උපාය මාර්ගයක් සමඟ අප ඉදිරියට යා යුතුය.

මගේ කණ්ඩායම වෙනුවෙන්, ඉවත්ව යන සභාපති සාලී මහතාට සහ කොමිසමට ඔවුන්ගේ වටිනා මග පෙන්වීම සහ නායකත්වය වෙනුවෙන් අපගේ අවංක කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. ඔවුන් දැක්වූ දායකත්වය සහ කැපවීම වෙනුවෙන් අපි සැබවින්ම කෘතඥ වෙමු. ඒ සමගම, නව කොමිසම සහ නව සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හරින්ද්‍ර දිසාබණ්ඩාර මහතා අප උණුසුම් ලෙස සාදරයෙන් පිළිගන්නා අතර අප ප්‍රාග්ධන වෙළෙඳපොළ ඉහළ තලයකට නංවාලීම සඳහා අඛණ්ඩ සහයෝගීතාවයක් සහ කැපවීමක් බලාපොරොත්තු වෙමු. අප විසින් පුළුල් සහ ඔරොත්තු දෙන ප්‍රාග්ධන වෙළෙඳපොළ පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම අඛණ්ඩව අප කරගෙන යන අතර ඒ සඳහා ඔබ විසින් අපට ලබා දෙන නව දූරදර්ශී සහ උපායමාර්ගික මඟ පෙන්වීම් අප බලාපොරොත්තු වෙමු.



**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජනරාල්

2025 අප්‍රේල් 20

# කොමිෂන් සභා සාමාජිකයින්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර

හේෂණ කුරුප්පු මහතා

කේ. එම්. ඒ. ඒන් දවුලගල මහත්මිය

ලක්නාත් ජයවික්‍රම මහතා

දිලිප් සිල්වා මහතා

අරවින්දි ද සිල්වා මහත්මිය

නෙරංජිත් ගමගේ මහතා

කපුගේ අරුණ පෙරේරා මහතා

එම් පී ඒ කුමාර මහතා

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර

සභාපති

මහාචාර්ය හරීන්ද්‍ර දිසාබණ්ඩාර යනු මූල්‍ය, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ සාංගමික පාලනය යන ක්ෂේත්‍රවල කීර්තිමත් ශාස්ත්‍රීය, නියාමන සහ දූරදර්ශී නායකයෙකි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වත්මන් සභාපතිවරයා ලෙස, ඔහු උසස් අධ්‍යාපනය, මූල්‍ය නියාමනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ දශක තුනකට අධික බහුවිධ අත්දැකීම් ගෙන එයි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ඔහුගේ භාරකාරත්වය ආයතනික සංවර්ධනය, සදාචාරාත්මක නායකත්වය සහ උපායමාර්ගික ප්‍රතිසංස්කරණ සඳහා ජීවිත කාලය පුරාම කැපවීමෙන් තහවුරු වේ.

ඔහුගේ නියාමන වගකීම්වලට සමගාමීව, මහාචාර්ය දිසාබණ්ඩාර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මූල්‍ය හා සාංගමික පාලනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු ලෙස සේවය කරන අතර, එහිදී ඔහු පරම්පරා ගණනාවක් මූල්‍ය වෘත්තිකයන්ට මග පෙන්වූ අතර අධ්‍යයන හා පාලන ප්‍රතිසංස්කරණ සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ඔහුගේ අධ්‍යයන ගමන එම විශ්ව විද්‍යාලයෙන්ම ආරම්භ වී ජපානයේ චුක්යෝ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ගත් අතර එය කීර්තිමත් මොන්බුකගකුෂෝ ශිෂ්‍යත්වය යටතේ පිරිනමන ලදී.

මහාචාර්ය දිසාබණ්ඩාර මහතා ශ්‍රී ලංකා මූල්‍ය සංගමයේ සහ ශ්‍රී ලංකා සාංගමික පාලන පර්යේෂණ ආයතනයේ (GR, SL) සභාපති, සේජිස් කැම්පස් හි උපකුලපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ ජාතික ආර්ථික කවුන්සිලයේ නියෝජ්‍ය මහලේකම් (මූල්‍ය කටයුතු) ඇතුළු ප්‍රමුඛ නායකත්ව තනතුරු ගණනාවක් දරා ඇත. ඔහු මීට පෙර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන හා පුහුණු අංශයේ අධ්‍යක්ෂ සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙසද සේවය කර ඇති අතර මල්ටි ෆිනෑන්ස් පීඑල්සී සහ ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් වැනි මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩලවලට උපායමාර්ගික අවබෝධයන් ලබා දී ඇත.

මූල්‍ය කළමනාකරණය, සාංගමික පාලනය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය පිළිබඳ විශේෂඥයකු වන මහාචාර්ය දිසාබණ්ඩාර මහතා ආසියානු සංවර්ධන බැංකුවේ පැවරුම් ඇතුළු ජාතික හා ජාත්‍යන්තර උපදේශන ව්‍යාපෘතිවලට නායකත්වය දී ඇත. අධ්‍යාපන ප්‍රතිපත්තියට ඔහුගේ දායකත්වය සමානව වැදගත් වන අතර, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE), ව්‍යාපාර පිළිබඳ උසස් විද්‍යාල පාසල් (AACSB) සහ උසස් අධ්‍යාපනයේ උපායමාර්ගික සැලසුම්කරණය මගින් පවරා ඇති විශ්ව විද්‍යාල ප්‍රතිසංස්කරණ පිළිබඳ ජාතික ක්‍රියාකාරකම්වල සභාපතිත්වය දරයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ඔහුගේ සේවා කාලය තුළ, ඔහු වෙළෙඳපොළ නවීකරණය, ආයෝජක ආරක්ෂාව සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ ප්‍රධාන ප්‍රතිසංස්කරණවලට නායකත්වය දී ඇත. වෘත්තීය සුදුසුකම් රාමු හඳුන්වාදීම, පුළුල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සැළසුම් දියත් කිරීම සහ නියාමන යටිතල පහසුකම් ඩිජිටල්කරණය මෙයට ඇතුළත් වේ. ඔහුගේ නායකත්වය ඉදිරි දැක්මක් සහිත සහ සැමට පිලිගත හැකි ආකෘතියකින් යුත් එකක් වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සැකැස්ම නිසි ලෙස හැඩගැස්වීම අඛණ්ඩව කරගෙන යනු ලබයි.

දූරදර්ශී චින්තකයෙකු සහ අධ්‍යාපනඥයෙකු වන මහාචාර්ය දිසාබණ්ඩාරගේ දර්ශනය කේන්ද්‍රගත වන්නේ, ඔරොත්තු දෙන, නව්‍ය සහ නැගී එන අභියෝගවලට ප්‍රතිචාර දක්වන ආයතන නිර්මාණය කිරීම කෙරෙහි ය. ඔහු අධ්‍යාපන විශිෂ්ටත්වය සහ කර්මාන්ත ආශ්‍රිතභාවය එකට ගැළපවීමට ප්‍රසිද්ධියක් උසුලන්නෙකු වන අතර නියාමන ආයතන සහ අධ්‍යාපන ආයතන දෙකටම උපායමාර්ගික සැළසුම් හරහා මිනුම් කළ හැකි ප්‍රතිඵල ගෙනදීමට සහය වේ.

ඔහුගේ දායකත්වය ජාතික ගෞරව සම්මාන කිහිපයක් සමඟින් පිළිගෙන ඇති අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 25 වන සංවත්සර පිළිගැනීමේ සම්මානය සහ සමහර මූල්‍ය ආයතන පුනර්ජීවනය කිරීමේ ඔහුගේ කාර්යභාරය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් විශේෂ ඇගයීමක් සහ ඉගැන්වීමේ සහ පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා බහු සම්මානයක්ද ඊට ඇතුළත් වේ.

මහාචාර්ය දිසාබණ්ඩාර මහතා ගෞරවනීය මහජන බුද්ධිමතෙකු සහ චින්තන නායකයෙකු ද වේ. ඔහු උපාධි ප්‍රදානෝත්සව දේශන, ජාත්‍යන්තර සමුළුවල ප්‍රධාන දේශන, විශ්ව විද්‍යාල සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්මන්ත්‍රණ, ගණනාවක් පවත්වා ඇති අතර, මූල්‍ය, පාලනය සහ තිරසාර ආර්ථික සංවර්ධනය පිළිබඳ සමකාලීන ගැටළු පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡාවට ලක් කරයි. ඔහුගේ හඬ, ශ්‍රී ලංකාවේ මූල්‍ය අධ්‍යාපනයේ සහ මූල්‍ය නියාමනයේ අනාගතය හැඩ ගැස්වීමේදී මඟ පෙන්වන බලවේගයක් ලෙස පවතී.

## හේෂණ කුරුප්පු මහතා

හේෂණ කුරුප්පු මහතා වරලත් ගණකාධිකාරීවරුනගේ ආයතනයේ සාමාජිකයෙකි(FCA). කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (බැංකු සහ මූල්‍ය) හිමිකරගෙන ඇත. මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ විශේෂ පළමු පන්තියේ විද්‍යාවේදී උපාධියක්ද හිමිකර ගෙන ඇත. CA ශ්‍රී ලංකා හි ACMA සභාපති සහ ඩේවිඩ් පීරිස් සමාගම් සමූහයේ සමූහ මූල්‍ය අධ්‍යක්ෂ. කුරුප්පු මහතා දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සභාපති ලෙසද කටයුතු කරයි.

ඔහු 2023 දී දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) උප සභාපති ලෙසත්, 2020/2021 දී විනිවිදභාවය, වගවීම සහ පාලනය වැඩිදියුණු කිරීමේ කමිටුවේ (,TAG) කමිටු සභාපති ලෙසත් සේවය කළේය. ඔහු SAFA හී වෘත්තීය ව්‍යාපාර ගණකාධිකාරීවරුන්ගේ (PA,B) කමිටුවේ සාමාජිකයෙකු ලෙසත්, සාර්ක් රටවල ව්‍යාපාර සඳහා මූල්‍ය පාලන ක්‍රම සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා අධ්‍යයනය කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙසත් සේවය කළේය. කුරුප්පු මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ (SLAASMB) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුද වේ.

# කොමිෂන් සභා සාමාජිකයින්

## කේ. එම්. ඒ. එන් දවුලගල මහත්මිය

නෙළුමනී දවුලගල මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරිය ලෙස කටයුතු කරන අතර , ශ්‍රී ලංකා මහා බැංකුවෙහි වසර 32 ට වැඩි පළපුරුද්දක් ඇති ඇය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය කිරීම, සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කෙරෙන ආවේක්ෂණය, මූල්‍ය, ජාත්‍යන්තර මෙහෙයුම්, අවදානම් කළමනාකරණය, කලාපීය සංවර්ධනය සහ මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හී විවිධ තනතුරුවල දරා ඇත.

තවද, දවුලගල මහත්මිය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකාවක් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සභාපතිනිය ලෙස ද කටයුතු කරයි.

දවුලගල මහත්මිය එක්සත් රාජධානියේ එසෙක්ස් විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ඇය එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ හවුල්කාර සාමාජිකාවකි.

## ලක්නාත් ජයවික්‍රම මහතා

ලක්නාත් ජයවික්‍රම මහතා 2022 සිට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) පාලක මණ්ඩල සාමාජිකයෙකි. සුදුසුකම් සහිත වසර 22 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු ශ්‍රී ලංකාව, දකුණු අප්‍රිකාව සහ නැගෙනහිර ආසියාවේ ගෝලීය ගිණුම්කරණ සමාගමක් වන PricewaterhouseCoopers (PwC) සමඟ දශකයකට වැඩි කාලයක් කටයුතු කර ඇත. පසුව, ඔහු ඉන්දුනීසියාව, මැලේසියාව, සිංගප්පූරුව සහ ඉන්දියාව ඇතුළු රටවල් ගණනාවක බදු සහ නියාමන කටයුතු අධීක්ෂණය කරමින් සිංගප්පූරුව පදනම් කරගත් සමූහ ව්‍යාපාරයකට සම්බන්ධ විය. ස්වාධීන වෘත්තිකයෙකු ලෙස කටයුතු කිරීමට පෙර ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ නීති සමාගමක හවුල්කරුවෙකු ලෙස ද කටයුතු කර ඇත. ඔහුගේ පුහුණු ක්ෂේත්‍ර අතර මූල්‍ය, බදු, නීති සේවා සහ අධිකරණ වෛද්‍ය ගිණුම්කරණය ඇතුළත් වේ.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, SLTC පර්යේෂණ විශ්ව විද්‍යාලය, බදුකරණය පිළිබඳ වරලත් ආයතනය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මූල්‍ය, බදු සහ නීති විෂයයන් සඳහා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසද සේවය කර ඇත. දේශීය හා විදේශීයව පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණනාවක සම්පත්දායකයෙකු ලෙසද ඔහු කටයුතු කර ඇත. ජයවික්‍රම මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (B.Sc.) (ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය) විශේෂ උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකි. තවද, ඔහු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බදුකරණ පාසලේ වත්මන් සභාපතිවරයා වන අතර 2022-2023 කාලය තුළ එහි ව්‍යාපාරික පාසලේ සභාපතිවරයා ද විය. වර්තමානයේ ඔහු දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) බංකොලොත්භාවය පිළිබඳ කමිටුවේ සාමාජිකයෙකි.

වර්තමානයේ ඔහු සියපත ෆිනෑන්ස් පීඑල්සී හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර එහි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ගණනාවක සාමාජිකයෙකු ලෙස ද සේවය කරයි.

## දිලිප් සිල්වා මහතා

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන දිලිප් සිල්වා මහතා 2024 ඔක්තෝම්බර් 28 වන දින මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරයේ වැඩ භාර ගන්නා ලදී. ප්‍රාදේශීය පරිපාලනය පිළිබඳ ගණකාධිකාරීවරයෙකු ලෙස පුළුල් පළපුරුද්දක් ඇති ඔහු භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු කිහිපයක විවිධ තනතුරු දරමින් රාජ්‍ය සේවයෙහි කටයුතු කර වසර 34 කට ආසන්න පළපුරුද්දක් ඇත.

සිල්වා මහතා 1992 දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳුණු අතර පසුව මුදල් අමාත්‍යාංශයට අනුබද්ධ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව ආදී ප්‍රධාන දෙපාර්තමේන්තු කිහිපයක මූල්‍ය අංශයේ නියෝජිතයකු ලෙස සිය රාජකාරී ඉටු කර ඇත. 2020.11.11 දින සිට 2024.10.27 දින දක්වා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කර තිබූ ඔහු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස පත්වීමට පෙර එම තනතුරේ කටයුතු ඉතා සාර්ථකව ඉටු කළේය.

සිල්වා මහතා 1991 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් ද, 2011 දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් මහජන සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ද, 2016 දී එම ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත.

සිල්වා මහතා රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ වරලත් ආයතනය (ලන්ඩන්) සහ ශ්‍රී ලංකා ගිණුම් තාක්ෂණවේදීන්ගේ සංගමය වැනි කීර්තිමත් වෘත්තීය ආයතනවල සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතික කළ ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු ලෙස ලියාපදිංචි වී ඇත.

ඔහුගේ වෘත්තීය ජීවිතය පුරාවටම ජාත්‍යන්තර ආයතනවලින් සහ විශ්වවිද්‍යාලවලින් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය ණය කළමනාකරණය සහ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ මෙහෙයුම් පිළිබඳ පුළුල් විදේශ පුහුණුවක් ලබා ඇත. ඔහු අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත.

සිල්වා මහතා සංවර්ධන ලොතරැයි මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - විගණන හා කළමනාකරණ කමිටුව සහ ජාතික නවෝත්පාදන නියෝජිතායතනය ඇතුළු බොහෝ ව්‍යවස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස භාණ්ඩාගාරය නියෝජනය කර ඇත. තවද, ඔහු ආරක්ෂක අමාත්‍යාංශය, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි ප්‍රධාන අමාත්‍යාංශවල ප්‍රසම්පාදන කමිටුවල භාණ්ඩාගාර නියෝජිතයා ලෙසද කටයුතු කර ඇත.වර්තමානයේ ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ (SM,B), ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (RCSL), ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC), ශ්‍රී ලංකා ටෙලිකොම්

ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස භාණ්ඩාගාරය නියෝජනය කරන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

## අරවින්දි ද සිල්වා මහත්මිය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියක් වන අරවින්දි ද සිල්වා මහත්මිය, දැනට වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ලෙස සේවය කරයි.

ඇය 1995 දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳුණු අතර විදේශ කටයුතු අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය වැනි ප්‍රධාන අමාත්‍යාංශ ගණනාවක සේවය කර ඇත.

ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් දෙවන පෙළ සාමාර්ථයක් සමගින් වාණිජවේදී උපාධියක් ලබා ඇති අතර එය ඇය ලබාගත් පළමු උපාධි සුදුසුකම වේ.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

ඇය ශ්‍රී ලංකා වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ සාමාජිකාවක් ද වේ.

## නෙරංජිත් ගමගේ මහතා

නෙරංජිත් ගමගේ මහතා රෙදිපිළි, ඇඟලුම්, පාරිභෝගික භාණ්ඩ සහ බලශක්ති උත්පාදනය ඇතුළු විවිධ කර්මාන්තවල වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති කීර්තිමත් මූල්‍ය හා මෙහෙයුම් නායකයෙකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු ලෙස, මූල්‍ය උපාය මාර්ග, පිරිවැය ප්‍රශස්තකරණය, නිෂ්පාදන මෙහෙයුම් සහ නියාමන අනුකූලතාව පිළිබඳ පුළුල් විශේෂඥතාවක් ඔහු සතුව ඇත.

ඔහුගේ වෘත්තීය ජීවිතය පුරාම, ගමගේ මහතා බහුජාතික සහ දේශීය සමාගම් යන අංශ දෙකෙහිම ප්‍රධාන නායකත්ව තනතුරු දරා ඇති අතර, මූල්‍ය උපාය මාර්ග සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සාර්ථකව මෙහෙයවනු ලබයි. මහා පරිමාණ නිෂ්පාදන ව්‍යාපෘති, ඒකාබද්ධවීම් හා අත්පත්කර ගැනීම් සම්බන්ධ නිසි ක්‍රමවේදයන්, ව්‍යාපාර සම්පත් සැළසුම් ක්‍රියාත්මක කිරීම් සහ සිරස් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලීන් සඳහා ඔහුගේ දායකත්වය උපකාරී වී ඇත. ඔහුගේ ප්‍රවීණතාවය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන හරහා භාණ්ඩාගාර කළමනාකරණය, අයවැයකරණය, බදු අනුකූලතාව සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය දක්වා විහිදී ඇත.

ගමගේ මහතා විදේශීය මූල්‍ය, මෙහෙයුම්, සැපයුම් දාම කාර්යයන් සහ බහුජාතික නිෂ්පාදන සමාගම් සඳහා නියාමන අනුකූලතාව මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. ඔහුගේ සේවා කාලය තුළ විශාලතම ගිණුම්කරණ සමාගම් හතරෙන් දෙකක මූල්‍ය පාලනය, විගණනය සහ උපදේශන සේවා පිළිබඳ ඔහුගේ විශේෂඥතාව තවදුරටත් වැඩිදියුණු වී ඇත. ඊට අමතරව, ඔහු ජාත්‍යන්තර වෙළෙඳපොළ රාශියක් හරහා ස්මාර්ට් කර්මාන්තශාලා ක්‍රියාත්මක කිරීම්, ලීන් සික්ස් සිග්මා ක්‍රමවේද සහ ගෝලීය සැපයුම් දාම කළමනාකරණය සඳහා නායකත්වය දී ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක්, මොරටුව විශ්ව විද්‍යාලයෙන් රෙදිපිළි සහ ඇඳුම් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණ කළමනාකරණය (විශේෂ) පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ඉන්දියාවේ ඕඩු ග්ලෝබල් ඉන්ටර්නැෂනල් වෙතින් ලීන් සික්ස් සිග්මා හි සහතිකලත් කළු පටි ධාරියෙකි.

## කපුගේ අරුණ පෙරේරා මහතා

අරුණ පෙරේරා මහතා ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමයේ ආසන්නතම හිටපු සභාපතිවරයා වන අතර ඇනලිටිකල් ඉන්ස්ට්‍රමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්හී සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරියා ලෙස කටයුතු කරයි. ඔහුට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන පෙළේ සමාගම් ව්‍යාපාර ක්ෂේත්‍රවල, මූල්‍ය විශ්ලේෂණ, සාංගමික මූල්‍ය සහ තක්සේරු කළමනාකරණය පිළිබඳ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු 2017 සිට 2023 දක්වා ශ්‍රී ලංකා ප්‍රයිස්වෝටර්යවුස්කූපර්ස් (ඡඅක) ආයතනයෙහි සාංගමික මූල්‍ය සහ තක්සේරු උපදේශන අධ්‍යක්ෂවරයා විය.

අරුණ මහතා Moody`s Analytics Knowledge Services ප්‍රයිවට් ලිමිටඩ් සමාගමෙහි, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ Ernst & Young ශ්‍රී ලංකා ඇතුළු විවිධ සමාගම්වල සේවය කර ඇත. ඔහු අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කර ඇත. අරුණ ඇමරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයෙකි. ඔහු එක්සත් රාජධානියේ ලෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහකාර සාමාජිකයෙකි.

## එම් පී ඒ කුමාර මහතා

අනිල් කුමාර මීගහගේ මහතා රක්ෂණ, විදුලි සංදේශ, පාරිභෝගික භාණ්ඩ, මාධ්‍ය සහ ආගන්තුක සත්කාර ඇතුළු විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි කටයුතු කර වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති පළපුරුදු සමාගම් නායකයෙකි.

ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ කැන්විල් හෝල්ඩින්ග්ස්, සිනොලංකා හෝටල් (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හෝටල් සහ ස්පා (පුද්ගලික) සමාගම යන සමාගම්වල සභාපති ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ද විය.

අනිල් මහතා EAP හෝල්ඩින්ග්ස් හි ජ්‍යෙෂ්ඨ විධායක උප සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී මෙන්ම EBC රූපවාහිනිය /ගුවන්විදුලිය සහ EAP චිත්‍රපට අධ්‍යක්ෂවරයා ද විය. 2013 වසරේ සිට 2018 දක්වා ඔහු ස්වර්ණවාහිනී, ශ්‍රී එෆ් එම්, ඊ එෆ් එම් සහ රන් එෆ් එම් හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස මාධ්‍ය අංශයට නායකත්වය ලබා දී ඇත.

ඔහුගේ වෘත්තීය ජීවිතයේ මුල් අවධියේදී, ඔහු Samsung Mobile Sri Lanka හි දේශීය ප්‍රධානියා ලෙස සේවය කළ අතර, එහිදී ඔහු විකුණුම්, අලෙවිකරණය සහ නිෂ්පාදන බෙදා හැරීම මෙහෙයවීමේ වගකීම් දැරීය. Samsung Sri Lanka හි බෙදාහැරීමේ ජාලය ස්ථාපිත කිරීමේදී සහ දිවයින පුරා SMART shop සංකල්පය හඳුන්වා දීමේදී

# කොමිෂන් සභා සාමාජිකයින්

ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

අනිල් මහතා ශ්‍රී ලංකා හේමාස් පාරිභෝගික භාණ්ඩ අලෙවි හා ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යක්ෂ ධුරය ද දැරූ අතර, රුපියල් බිලියන 10 ක පිරිවැටුමක් අධීක්ෂණය කරමින් එහි අලෙවි මෙහෙයුම්, බෙදාහැරීම, පාරිභෝගික අලෙවිකරණය සහ ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු ද මෙහෙයවීය.

ඊට පෙර, ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර යන දෙකෙහිම සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කළ අතර, 2008/2010 වර්ෂය තුළ නව නිෂ්පාදන රාශියක් හඳුන්වා දීමෙන් සමාගම ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර ක්ෂේත්‍රයේ වෙළෙඳපොළ ප්‍රමුඛයා බවට පත් කිරීමට නායකත්වය ලබා දී ඇත.

ඔහුගේ සාංගමික ගමන 1988 දී යුනිලීවර් ශ්‍රී ලංකා සමඟින් ආරම්භ වූ අතර එහිදී ඔහු ඉහළ තනතුරුවලට පැමිණ, විකුණුම් පරිපාලන කළමනාකරු, ප්‍රාදේශීය විකුණුම් කළමනාකරු සහ ගෘහාශ්‍රිත හා පුද්ගලික සත්කාර සඳහා වෙළෙඳ කාණ්ඩ කළමනාකරු වැනි ප්‍රධාන භූමිකාවන් භාර ගනිමින් කටයුතු කර ඇත. ඔහු වියට්නාමයේ යුනිලීවර් ආයතනයෙහි ද සේවය කළ අතර, ශ්‍රී ලංකාවට නැවත පැමිණ, තම නිෂ්පාදන හෝ සේවාවන් පාරිභෝගිකයින්ට ලබා දෙන මාර්ග හඳුනා ගැනීම, ස්ථාපිත කිරීමේ උපායමාර්ගික ක්‍රියාවලි සංවර්ධනය, අලෙවිකරණය සහ ඖෂධ සහ රූපලාවන්‍ය කටයුතු සම්බන්ධ උපාය මාර්ග මෙහෙයවීමේ කටයතුවල නිරතවෙමින් යුනිලීවර් හි වසර 20 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

අනිල් මහතා එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් සහ අලෙවිකරණය පිළිබඳ වෘත්තීය පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (DipM MC, M) ලබා ඇත. ඔහු කේම්බ්‍රිජ් කළමනාකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකු වන අතර පාරිභෝගික අලෙවිකරණය සහ කළමනාකරණය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස වසර 18 කට වැඩි පළපුරුද්දක් ද ඇති අයෙකි.

# අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරුන්

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජනරාල්

තුෂාර ජයරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මුදල් හා පරිපාලන

මනුරි වීරසිංහ
අධ්‍යක්ෂ - සාංගමික කටයුතු

රියාස් බාරි
අධ්‍යක්ෂ - විමර්ෂණ හා බලාත්මක කටයුතු

රිෂ්ඩා සාරූක් ඉෂාක්
අධ්‍යක්ෂ -නීති

සුනෙත් පෙරේරා
වැඩබලන අධ්‍යක්ෂ-අධීක්ෂණ

මධුගයනී බලපිටිය
සහකාර අධ්‍යක්ෂ - නීති සහ බලාත්මක

ඩී එම් ජී ප්‍රියන්ත
සහකාර අධ්‍යක්ෂ -විමර්ෂණ

ෂර්මිලා පණ්ඩිතරත්න
සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ

මධුර පී ආර් වනිගසේකර
ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී

නොපැමිණි:
ධම්මික පෙරේරා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියන්

**වමේ සිට දකුණට සිටගෙනඃ** රන්මිණි ජයතිලක - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, තොරතුරු තාක්ෂණය, ශීනා ගුණරත්න - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, බාහිර සම්බන්ධතා

**වමේ සිට දකුණට අසුන්ගෙන සිටින්නේඃ** සජීවනී බක්මීදෙණිය - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන, මංජුලා චන්ද්‍රරත්න - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ආවේක්ෂණ

**නොපැමිණීමඃ** සෞමි කොඩිප්පිලි - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, අධීක්ෂණය

# කළමනාකරුවන්/කළමනාකාරිනියන්

**වමේ සිට දකුණට සිටගෙන:** සී. එරන්දතී වෛද්‍යසේකර - කළමනාකාරිනි, විමර්ශන, මේරියන් ග්ලෙන්ඩා සන්දනම් - කළමනාකාරිනි, සාංගමික කටයුතු, ඔලිවි සෝලංගආරච්චි - කළමනාකාරිනි, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන, නිමල් කුමාරසිංහ - කළමනාකරු, බාහිර සම්බන්ධතා, තක්ෂිලා ෆ්‍රැන්සිස් - කළමනාකාරිනි, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන, නොමානි සෙනෙවිරත්න - කළමනාකාරිනි - විමර්ශන

**වමේ සිට දකුණට අසුන්ගෙන සිටින්නේ:** ජී. ඩී. කපිල කුමාර - කළමනාකරු, විමර්ශන, අනුලා විජේසිංහ - කළමනාකාරිනි, අධීක්ෂණ, අශෝකා කේ. දයාරත්න - කළමනාකාරිනි, මානව සම්පත්, ආර්. කේ. වසන්ත සුනිමල් - කළමනාකරු, අධීක්ෂණ

**වමේ සිට දකුණට සිටගෙන:** වයි. ඩී. සඳමාලි - කළමනාකාරිනී, මූල්‍ය හා පරිපාලන, මේබලා ජයපාල - කළමනාකාරිනී, අධීක්ෂණ, ප්‍රියන්ත හේරත් - කළමනාකාරු, අධීක්ෂණ, බුද්ධිනී හේරත් - කළමනාකාරිනී, නීති සහ බලාත්මක කිරීම්, ජේ. කේ. ප්‍රියදර්ශනී - කළමනාකාරිනී, මානව සම්පත්,

**වමේ සිට දකුණට අසුන්ගෙන සිටින්නේ:** එම්. ඉම්රාන් අහමඩ් - කළමනාකාර, මූල්‍ය සහ පරිපාලන, ලක්ෂ්මි වික්‍රමනායක - කළමනාකාරිනී, මූල්‍ය සහ පරිපාලන, පී. එම්. නිරෝෂිකා උදයංගනී - කළමනාකාරිනී, නීති සහ බලාත්මක කිරීම්, රසික වල්පිටගම - කළමනාකරු, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන

**නොපැමිණීම:** සමන්ති ගුණවර්ධන - කළමනාකාරිනී, සාංගමික කටයුතු

# වසරේ විශේෂ අවස්ථාවන්

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පැවති වැඩමුළුව

නවීන පහසුකම් වලින් යුත් නව අවේක්ෂණ පද්ධතියක් අත්පත් කර ගැනීම

මාලදිවයිනේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයා සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

කුරුණෑගලදී පැවති "Varsity Battles" අවසන් මහා තරගයේ ත්‍යාග ප්‍රදානය කිරීමේ අවස්ථාව

සමාගම් ලේකම්වරුන්/ලයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරුන් සඳහා සංශෝධිත සාංගමික යහපාලන නීති පිළිබඳව පැවති දැනුවත් කිරීමේ වැඩසටහන

යාපනය විශ්ව විද්‍යාලය සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම නැවත අළුත් කිරීම

මාතර නගරයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය

කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා පැවති සම්මන්ත්‍රණය

පාසල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟාවලියේ අවසන් මහා තරඟයේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම

පාසල් සිසුන් සඳහා පැවති දැනුවත් කිරීමේ වැඩසටහනක්

හරිත ආර්ථිකයකට යොමුවීමට මග සළසන තිරසාර බැඳුම්කර පිළිබඳව පැවති වැඩමුළුව

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම නැවත අළුත් කිරීම

ලියාපදිංචි ආයෝජන උපදේශකවරුන් සඳහා පැවති අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් (CPD)

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, සත්කාරකත්වය දක්වමින් සුරැකුම්පත් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOSCO) ප්‍රතිපත්ති කමිටු අංක 8 හි වාර්ෂික සමුළුවට පැවැත්විය

මාතලේ නගරයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම නැවත අළුත් කිරීම

# වසරේ විශේෂ අවස්ථාවන්

දඹුල්ල නගරයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව සංවිධානය කළ ගුරු පුහුණු වැඩසටහනක්

ඉතා දුෂ්කර අධ්‍යාපන කලාපයක් වන දිඹුලාගල අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සඳහා පැවති ප්‍රාග්ධන වෙළෙඳපොළ පුහුණු වැඩසටහනක්

රත්නපුර ආයෝජක සම්මන්ත්‍රණය

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් භාර ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක්

නුවරඑළිය ආයෝජක සම්මන්ත්‍රණය

වව්නියා නගරයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය

# මෙහෙයුම් සමාලෝචනය

## ඉක්මනින් හා පහසුවෙන් ගමන් කරන උත්ප්‍රේරක

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, විධිමත් පද්ධති සහ අනුවර්තන උපාය මාර්ග හරහා මෙහෙයුම් ප්‍රතිචාරාත්මක බව ප්‍රවර්ධනය කරයි. අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා අපගේ කැපවීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්යක්ෂමව, කඩිසරව සහ කොටස්කරුවන්ගේ සහ ගෝලීය මූල්‍ය ක්ෂේත්‍රයේ පරිණාමය වන අවශ්‍යතා සමඟ පෙළගැසී ඇති බව සහතික කරයි.

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

ආයෝජක විශ්වාසය, වෙළෙඳපොළ අඛණ්ඩතාව සහ මූල්‍ය ස්ථාවරත්වය ඇති කරන ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වන සිය මෙහෙවරෙහි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) නොසැලී සිටී. පසුගිය වසර තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන නියාමන ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාවට නංවා ඇති අතර අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම, ආයෝජක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, සහ නැගී එන අවදානම් සහ වෙනස්වන ගෝලීය ප්‍රමිතීන්ට මුහුණ දීම සඳහා වෘත්තීයමයභාවය ලබාදීමේ විභාග පවත්වා ඇත.

### බලපත්‍ර ලබා දීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ ප්‍රධාන කාර්යයක් වන්නේ නියාමන ප්‍රමිතීන් නිසි ලෙස සපුරාලන ආයතනවලට බලපත්‍ර ලබා දීම මගින්, ඔවුන්ට කර්මාන්තය තුළ ක්‍රියාත්මක වීමට බලය ලබා දීමයි. වෙළෙඳපොළ ආයතන සහ අතරමැදියන්ට බලපත්‍ර ලබා දීම, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද නියාමන රාමුව යටතේ ව්‍යුහගත අදියර දෙකක ක්‍රියාවලියකි. පළමු අදියරේදී, බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මූලික අනුමැතිය (in Principle approval) ලබා ගත යුතු අතර, වැඩිදුර අවශ්‍යතා සපුරාලීමෙන් පසු, අවසාන අනුමැතිය (Final approval) ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණය මූලික බලපත්‍ර ලබාදීමේ අදියරෙන් ඔබ්බට ද විහිදේ. වෙළෙඳපොළ අතරමැදියන්ට ලබා දෙන බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීමට යටත් වන අතර, එසේ අළුත් කිරීමේදී, අදාළ නීතිරීතිවලට අනුකූල බව, අභ්‍යන්තර පාලනයන් පිළිබඳ තක්සේරුවක් සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ සහ සේවාදායකයන් සමඟ ගණුදෙනු කරන පුද්ගලයන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය ඇගයීම සම්බන්ධයෙන් ගැඹුරු සමාලෝචනයක් සිදුකිරීම ද ඇතුළත් වේ.

මෙම බලපත්‍ර ක්‍රියාවලිය මගින්, නියාමන අධීක්ෂණය, මූල්‍ය වෙළෙඳපොළ අවංකභාවය සහ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, ආයෝජක විශ්වාසය ඇතිකිරීම, සහ සාධාරණ, ක්‍රමවත් ගණුදෙනු ප්‍රවර්ධනය  තහවුරු කරයි.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ, ආයතන සඳහා ලබා දී ඇති නව බලපත්‍ර සහ 2024 දෙසැම්බර් 31 වන දිනට මුළු බලපත්‍රලාභීන් සංඛ්‍යාව පහත පරිදි වේ: (සංඛ්‍යා සටහන 01, 02:)

**සංඛ්‍යා සටහන 01: 2024 වර්ෂයේදී ආයතන සඳහා බලපත්‍ර ලබා දීම**

| නියාමනයට ලක් වූ ආයතන වර්ගය | 2024 වර්ෂය තුළ ලබා දෙන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 2024 දෙසැම්බර් 31 වන දින වන විට ලබා දී ඇති මුළු බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොටස් හුවමාරු | 01 | 01 |
| නිෂ්කාශනාගාර | - | 01 |
| මධ්‍යම තැන්පතුගාර | - | 01 |
| කොටස් තැරැව්කාර ආයතන | - | 27 |
| කොටස් වෙළෙන්ඳන් | - | 10 |
| කළමනාකරණ සමාගම්* | 03 | 16 |
| ආයෝජන කළමානාකරුවන් | 01 | 22 |
| ආන්තික ණය සැපයුම්කරුවන් | - | 20 |
| කොටස් ප්‍රාරක්ෂකයින් | - | 08 |
| ණය ප්‍රමාණීකරණ සමාගම් | - | 02 |
| සාංගමික මූල්‍ය උපදේශකයින් | 04 | 08 |

*අනුමත සාමූහික ආයෝජන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට බලයලත් සමාගම්.

සංඛ්‍යා සටහන 02: 2024 වර්ෂයේදී බලපත්‍රලාභී ආයතන ගණන

| බලපත්‍ර වර්ගය | බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව | |
|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දිනට | 2024 දෙසැම්බර් 31 දිනට |
| කොටස් හුවමාරු | 01 | 01 |
| නිෂ්කාශනාගාර | 01 | 01 |
| මධ්‍යම තැන්පතුගාර | 01 | 01 |
| කොටස් තැරැව්කාර ආයතන | 27 | 27 |
| කොටස් වෙළෙන්දන් | 11 | 10 |
| කළමනාකරණ සමාගම්* | 16 | 16 |
| ආයෝජන කළමානාකරුවන් | 22 | 22 |
| ආන්තික ණය සැපයුම්කරුවන් | 20 | 20 |
| කොටස් ප්‍රාරක්ෂකයින් | 08 | 08 |
| ණය ප්‍රමාණීකරණ සමාගම් | 02 | 02 |
| සාංගමික මූල්‍ය උපදේශකයින් | 04 | 08 |

මෙහෙයුම් කටයුතු කරගෙනයාමට අපේක්ෂා නොකළ පහත සඳහන් ආයතනවල බලපත්‍ර සමාලෝචිත වසර තුළදී නැවත අලුත් නොකරන ලදි.

- ආයෝජන කළමනාකාරු - කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
- කොටස් වෙළෙඳුන් - සොෆ්ට්ලොජික් ස්ටොක්බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය

ඊට අමතරව, සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ, බලපත්‍රලාභී කළමනාකරණ සමාගම් විසින් ක්‍රියාත්මක කරන සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) හයක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී. (සටහන: 03)

සංඛ්‍යා සටහන 03: 2024 දී මුළු සාමූහික ආයෝජන යෝජනා ක්‍රම

| | සමස්ත ආයෝජන යෝජනා ක්‍රම සංඛ්‍යාව | |
|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දින වන විට | 2024 දෙසැම්බර් 31 දින වන විට |
| අනුමත සාමූහික ආයෝජන යෝජනා ක්‍රම ගණන | 84 | 90 |

## ප්‍රතිපත්ති මුලපිරීම්

### කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය කිරීම

වර්ෂ 2018 ජනවාරි 26 දිනැති ගැසට් පත්‍රයේ II වන කොටසේ 2018 පෙබරවාරි 1 වන දින නිකුත් කරන ලද අතිරේකයේ පළ කළ කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණ පනත් කෙටුම්පත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වැඩි දියුණු කිරීමට ක්‍රියා කර ඇත.

පුළුල් සාකච්ඡා වලින් අනතුරුව, කොමිෂන් සභාව තහවුරු කර ඇත්තේ, කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණ පනත් කෙටුම්පතේ එකම අරමුණ වන්නේ වගකීමෙන් සීමා වූ සමාගමක් කොටස්වලට සීමා වූ සමාගමක් බවට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීම බවයි. යෝජිත කමිටු අදියර සංශෝධන සඳහා 2024 අප්‍රේල් 8 වන දින කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.

ඉන්පසුව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම සංශෝධන ඇතුළත් කරන ලද සංශෝධිත කෙටුම්පත, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය සඳහා යොමු කරන ලදී. එයට ප්‍රතිචාර වශයෙන්, නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඉල්ලා සිටි අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එයට සක්‍රීයව ප්‍රතිචාර ලබා දෙමින් සිටින ලදී.

## අනුමැති

### දේශීය, කලාපීය සහ ගෝලීය අරමුදල්

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාග මෙහි නිර්දේශය මත, කොළඹ කොටස්

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

නීති සහ බලාත්මක කිරීමේ කණ්ඩායම

හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති සමාගම්වල කොටස්වල ආයෝජනය කිරීමට ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙයි. විනිමය පාලන රෙගුලාසි, වර්ෂ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, වර්ෂ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සම්බන්ධ නීතිවලට අනුකූලව මෙම අනුමැතිය ලබා දෙනු ලැබේ.

2024 වසර තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 37 ක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර නම් වෙනස් කිරීම් 49 ක් වාර්තා ගත කරනු ලැබ ඇත.

### කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳ සහභාගිවන්නන්ගේ රීති සංශෝධන (පෙර කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස් තැරැව්කාර රීති ලෙස හැඳින්වූ)

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුව විසින් සිය වෙළෙඳ සහභාගිවන්නන්ගේ රීති සඳහා යෝජනා කරන ලද පහත සංශෝධන සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී:

1) වෙළෙඳ සහභාගිවන්නන් විසින් භාවිතා කරනු ලබන යෙදුම් පද්ධති සඳහා අදාළ වන අතිරේක අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම පහසු කිරීම.

2) කොටස් තැරැව්කරු හට සුවිශේෂී සේවාවන් සපයන පුද්ගලයින් නිර්වචනය කිරීමට, ඇණවුම් පටිගත කිරීම සංශෝධනය කිරීමට සහ නැවත බැලීමට, සහ කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන ලද ප්‍රකාශනය සංශෝධනය කිරීම.

3) වෙළෙඳ බේරුම්කරණ චක්‍රය T+3 සිට T+2 දක්වා කෙටි කිරීම පහසු කිරීම.

4) වත්මන් වෙළෙඳපොළ භාවිතයන් සමඟ එය තවදුරටත් පෙළගැස්වීම.

### කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳ රීති සංශෝධන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුව විසින් සිය වෙළෙඳ රීති සඳහා යෝජනා කරන ලද පහත සංශෝධන සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී:

1) වෙළෙඳ බේරුම්කරණ චක්‍රය T+3 සිට T+2 දක්වා කෙටි කිරීම පහසු කිරීම සඳහා.

2) කොළඹ කොටස් හුවමාරුවේ කවුන්ටරය හරහා ක්‍රියාත්මක වන ඉහළ ඵලදායිතා ආයතනික ණය සුරැකුම්පත් හඳුන්වාදීම සඳහා.

### කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ රීති සංශෝධන

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුව ලැයිස්තුගත කිරීමේ රීති සම්පූර්ණයෙන්ම කොළඹ කොටස් හුවමාරුව විසින් සංශෝධනය කර ඇති අතර ඇතැම් යෝජිත රීති ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරමින් පවතී. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, පහත යෝජිත සංශෝධන ලැයිස්තුගත කිරීමේ රීති සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමත ලබා දෙන ලදී:

1) ෂරියා අනුකූල ණය සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම පහසු කිරීම.

2) කොළඹ කොටස් හුවමාරුවේ හි ප්‍රධාන රීති උල්ලංඝනය කිරීම සඳහා ලැයිස්තුගත ආයතනවල අධ්‍යක්ෂවරුන්ට දඩ පැනවීමට පහසුකම් සැලසීම පහසු කිරීම.

3) ලැයිස්තුගත ආයතනවල අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් නොකර ඇති බවට හඳුනාගත් විට එය සම්බන්ධයෙන් ලැයිස්තුගත ආයතනවලට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සංශෝධනය කිරීම.

4) කොළඹ කොටස් හුවමාරුවේ කවුන්ටරය හරහා ක්‍රියාත්මක වන ඉහළ ඵලදායිතා ආයතනික ණය සුරැකුම්පත් හඳුන්වාදීම පහසු කිරීම.

5) කොළඹ කොටස් හුවමාරුවේ යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීම සහ ලැයිස්තුගත කිරීම පහසු කිරීම.

6) වෙළෙඳ බේරුම්කරණ චක්‍රය T+3 සිට T+2 දක්වා කෙටි කිරීම පහසු කිරීම.

### මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි (CDS) රීති සංශෝධන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුව විසින් සිය මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි රීති සඳහා යෝජනා කරන ලද, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත/ස්ථාපිත ආයතන විසින් නිකුත් කරන ලද විදේශ විනිමය වශයෙන් නියම කර ඇති ණය සුරැකුම්පත් නිෂ්කාශනය සහ පියවීම පහසු කිරීම සඳහා අදාළ සංශෝධනය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී:.

### කොළඹ කොටස් හුවමාරුවෙහි නිෂ්කාශනාගාර රීති සංශෝධන

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුව විසින් සිය කොළඹ කොටස් හුවමාරුවෙහි නිෂ්කාශනාගාර රීති සඳහා යෝජනා කරන ලද පහත සංශෝධන සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී:

1) වෙළෙඳ බේරුම්කරණ චක්‍රය T+3 සිට T+2 දක්වා කෙටි කිරීම පහසු කිරීම.

2) කොළඹ කොටස් හුවමාරුවේ කවුන්ටරය හරහා ක්‍රියාත්මක වන ඉහළ ඵලදායිතා ආයතනික ණය සුරැකුම්පත් හඳුන්වාදීම.

## ලැයිස්තුගත කිරීම ඉවත් කිරීම

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද, 5 වන රීතිය අනුව සිදු කරන ලද පහත සඳහන් සමාගම්වල ස්වේච්ඡාවෙන් ඉවත් කිරීමේ අයදුම්පත් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී:

1) යුනිසිස්ට් ඉන්ජිනියරින්ග් පී එල් සී

2) එක්ස්පෝලංකා හෝල්ඩින්ග්ස් පී එල් සී

3) එයිට්කන් ස්පෙන්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට් පී එල් සී

## සමාගම් පවරා ගැනීම් සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

1995 සමාගම් පවරාගැනීම් සහ ඒකාබද්ධ කිරීම් (TOM) සංශෝධිත සංග්‍රහය ප්‍රකාරව 2024 වර්ෂය තුළ පහත පවරා ගැනීමේ අර්පණ පරිපාලනය කරන ලදී: (සංඛ්‍යා සටහන 04)

**සංඛ්‍යා සටහන 04: සමාගම් පවරා ගැනීම් සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය කාරව පරිපාලනය කරන ලද අර්පණ**

| අර්පණකරු | අර්පණ ලාභියා | අර්පණයේ ස්වාභාවය | පවතින තත්වය |
|---|---|---|---|
| චෙක්ටා ග්ලොබල් (පුද්ගලික) සමාගම | සීලොන් ප්‍රින්ටෙර්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | සිදුවෙමින් පවතී |
| ඉකොනික් ට්‍රස්ට් (පුද්ගලික) සමාගම | සියෙරා කෙබල්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | සිදුවෙමින් පවතී |

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 80 වන වගන්තිය යටතේ අනුමැතීන්

ලයිස්තුගත පොදු සමාගමක් හෝ හුවමාරුවක ලයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති කිසියම් පොදු සමාගමක් කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පුද්ගලයෙකුගේ අනුමැතියෙන් තොරව සෘජුව හෝ තෙවන පාර්ශවයක් හරහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මගින් හෝ වෙනත් ආකාරයකින් මහජන අර්පණයක් මගින් අරමුදල් ලබා ගැනීමක් සිදු නොකළ යුතුය. වසර තුළ ඩිජිටල් මොබිලිටි සොලියුෂන්ස් ලංකා සමාගමට අනුමැතිය ලබා දී ඇත. ට්‍රාන්ස් කාර්ගෝ ලිමිටඩ් සහ ලංකා ඩෙයරීස් ප්‍රයිවට් ලිමිටඩ් අයුදුම්පත් ඇගයීමක් සිදුකරන ලදි.

## වෙළෙඳ භූමියෙන් බැහැර ගණුදෙනු සඳහා අනුමැතිය ලබාදීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 84 (1) ප්‍රකාරව "විනිමය ස්ථානයක ලයිස්තුගත කළ සමාගමක සුරැකුම්පත් දරන තැනැත්තකු විසින් එම බලපත්‍ර ලත් විනිමය ස්ථානය විසින් යොදාගනු ලැබූ වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූලව එම සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම, තෑගි දීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම කරනු ලැබිය යුතුය. එසේ වුවද, එම විනිමය ස්ථානය විසින් කිසිම නිශ්චිත වෙළෙඳ කාර්ය පටිපාටියක් යොදාගෙන නොමැති විටදී, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගනු ලැබිය යුතුය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, සුවිශේෂී පැවරුම් 664 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර කොටස් තෑගි කිරීම් 152 ක් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී. මෙම සුවිශේෂී පැවරුම් සිදුකරන ලද්දේ ආන්තික වෙළෙඳාම, තනි පුද්ගල ගිනුම් වල සිට ඒකාබද්ධ ගිනුම් වලටත් / ඒකාබද්ධ ගිණුම් වල සිට ඒකාබද්ධ ගිනුම් වලටත්/ ඒකාබද්ධ ගිණුම් වල සිට තනි පුද්ගල ගිණුම් වලටත්, මූල්‍ය පහසුකම්, තෑගි කිරීම් (විශේෂ), ලයිස්තුගත භාවයෙන් ඉවත් කිරීමේ අර්පණ සඳහා පහසුකම් සැලසීම සඳහායි.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 81 වන වගන්තිය යටතේ අනුමැතිය ලබාදීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය මේෂන් සභා පනතේ 81 වන වගන්තියට අනුව, ලයිස්තුගත සමාගම් විසින් ලයිස්තුගත නොකළ සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ අයදුම්පත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව නේෂන්ස් ට්‍රස්ට් බැංකුවට කොමිසමේ අනුමැතිය ලබා දුන් අතර සණස ලයිෆ් රක්ෂණ සමාගමේ අයදුම්පත ඇගයීමට ලක් කරන ලදී.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධාන සහ උපදෙස්

- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන්සභා පනතේ 16 (ඇ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විධානයක් මගින් කොළඹ කොටස් හුවමාරුව වෙත ආයෝජකයෙකු විසින් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසත් ඔහුට පුද්ගලිකව කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දෙන ලෙසත් නියම කරන ලදී.
- 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට පනවන ලද දඬුවමට අනුකූල නොවීම සම්බන්ධයෙන් ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයෙකුට විනය ක්‍රියාමාර්ග සහ පරිපාලන දඬුවමක් පැනවීමේ දැන්වීමක් නිකුත් කරන ලෙස කොළඹ කොටස් හුවමාරුව වෙත උපදෙස් දෙන ලදී.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනුකූලතා පහසුකම් මූලපිරීම්

## කොටස් මාරු කිරීම තහනම් කිරීම පිළිබඳ දැන්වීම්

ඇතැම් පුද්ගලයින්ගේ සහ ආයතනවල කොටස් හිමිකම පැවරීම වැළැක්වීම සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණය විසින් නිකුත් කරන ලද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාගත් ඇතැම් අවුරා තැබීමේ නියෝග පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන්සභාවට දැනුම් දී තිබෙන ලදී. අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එකී කොළඹ මහාධිකරණයේ තීරණ කොළඹ කොටස් හුවමාරුව සහ මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගම වෙත දැනුම් දීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

### බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද ඉල්ලීම්

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල විධායක කාර්යයන් ඉටු කරන අධ්‍යක්ෂවරුන් හෝ නිලධාරීන් ලෙස පත් කිරීමට යෝජිත හෝ දැනටමත් පත් කර ඇති පුද්ගලයින්ගේ පසුබිම් පරීක්ෂාව දීර්ඝ කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, විධායක කාර්යයන් ඉටු කරන අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ යෝග්‍යතාවය සහ හිමිකාරිත්වය තක්සේරු කිරීම, 2011 අංක 3 දරන විධානය යටතේ විධිමත් පරීක්ෂණයක් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහසුකම් සපයන ලදී.

2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව, එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන් ලෙස එවැනි පුද්ගලයින් පත් කිරීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන්සභාවේ නියාමන රාමුවට අනුව වැළැක්විය හැකි බැවින් එකී ඕනෑම නිරීක්ෂණ/අහිතකර සොයාගැනීමක් පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන්සභාව දැනුම් දෙන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලීමක් කර ඇත.

### වෙළඳාම අත්හිටුවීම සහ ව්‍යාපාර අත්හිටුවීම පිළිබඳ දැන්වීම්

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(3) වගන්තිය ප්‍රකාරව, කොළඹ මහාධිකරණය විසින් ඇතැම් පුද්ගලයින්ගේ සහ ආයතනවලට එරෙහිව නිකුත් කරන ලද ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදී. කොළඹ මහාධිකරණය විසින් නිකුත් කරන ලද තීරණ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොළඹ කොටස් හුවමාරුව සහ මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගම වෙත දැනුම් දීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇත.

### 2019-2023 කාල සීමාව තුලදී ශ්‍රී ලංකාවේ අල්ලස් හා දූෂණ මැඩපැවැත්වීම (CIABOC) සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ තක්සේරුව

CIABOC විසින් ඉල්ලා සිටි පරිදි, 2019-2023 කාල සීමාවට අදාළ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වෙන් කරන ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඔවුන්ට දැනුම් දී ඇත.

## අධීක්ෂණය සහ අනුකූලතාවය

### ලැයිස්තුගත සමාගම්

සියලුම ලැයිස්තුගත සමාගම් මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස 5 ක් ඇතුළත ඔවුන්ගේ කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් හුවමාරුවට (CSE) වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතුය. සාංගමික කටයුතු අංශය ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචනයට ලක් කරන ලද අතර අනුකූල නොවන කරුණු සම්බන්ධයෙන් සමාගම් වෙත දැනුම් දෙනු ලැබේ. මෙම ප්‍රයත්නයේදී ලැයිස්තුගත සමාගම්වල ප්‍රතිචාර අතිශයින්ම ධනාත්මක වේ.

මෙම කාර්යයේ අරමුණ වන්නේ ලැයිස්තුගත සමාගම් විසින් මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ තොරතුරු බෙදා හැරීම වැඩිදියුණු කිරීමයි. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විනිවිදභාවය සහ වගවීම ස්ථාපිත කිරීම සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙන යන බව සහතික කිරීම සඳහා ලැයිස්තුගත සමාගම් විසින් අත්‍යවශ්‍ය තොරතුරු කඩිනමින් සහ නිසියාකාරව බෙදා හැරීම අවශ්‍ය වේ.

වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී සාංගමික කටයුතු අංශය පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළේය:

- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීතිවලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම්
- සාංගමික යහපාලන පිළිවෙත්
- විශේෂිත මූල්‍ය තොරතුරු
- සභාපතිවරයාගේ වාර්තාව
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
- කොටස් හිමියන්ගේ සහ ආයෝජකයින්ගේ තොරතුරු
- මූල්‍ය දත්ත
- අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා

කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීමේ නීති සහ අදාළ රෙගුලාසි වලට අනුකූලව වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන

සාංගමික කටයුතු කණ්ඩායම

සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගම් මත පැටවී ඇති වගකීම පිළිබඳව දැනුවත්භාවයේ මට්ටම අඛණ්ඩව වැඩිදියුණු කිරීමට මෙම ක්‍රියාවලිය දායක වනු ඇත.

වසර තුළ ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචන 114 ක් පවත්වා ඇත. අනුකූලතාව වැඩිදියුණු කිරීම සහ හෙළිදරව් කිරීම් පුළුල් කිරීම සඳහා අදහස් දැක්වීමේ ලිපි 61 ක් යවන ලද අතර, සමාලෝචන 38 ක් වසා දැමීම් ලෙස අවසන් කරන ලදී.

තවද ණයකර 10 ක් සහ කොටස් නිකුත් හා සම්බන්ධ සංස්ථා ප්‍රකාශ 04 ක් සමාලෝචනය කරන ලදී.

### ලැයිස්තුගත සමාගම් විසින් වෙළෙඳපොළ නිවේදන හරහා කරන ලද හෙළිදරව් කිරීම්

වසර තුළ ලැයිස්තුගත සමාගම් විසින් වෙළෙඳපොළ නිවේදන හරහා කරන ලද හෙළිදරව් කිරීම් සමාලෝචනය කරන ලද අතර එවැනි අවස්ථා 18 ක් සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව වෙතින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටින ලදි. එවැනි පැහැදිලි කිරීම් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විය. (සංඛ්‍යා සටහන 05)

**සංඛ්‍යා සටහන 05: ලැයිස්තුගත සමාගම් විසින් වෙළෙඳපොළ නිවේදන හරහා කරන ලද හෙළිදරව් කිරීම්**

| පැහැදිළි කිරීම්වල ස්වභාවය | අවස්ථා ගණන |
|---|---|
| වොච් ලයිස්තුවේ/දෙවන පුවරුවේ තිබෙන අතරතුර අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ගනුදෙනු | 3 |
| ප්‍රමාද වූ හෙළිදරව් කිරීම - අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ගනුදෙනු | 2 |
| ගණුදෙනු තහනම් කාලසීමාව තුළ ගණුදෙනු කිරීම (කොටස් වෙළෙඳපොළ රීති 8.6) අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ගනුදෙනු | 3 |
| ප්‍රමාද වූ හෙළිදරව් කිරීම් | |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම් | 8 |
| අනෙකුත් ක්ෂණික සාංගමික හෙළිදරව් කිරීමේ අවශ්‍යතා | 2 |

## අනෙකුත් නියාමන ආයතන / රජයේ ආයතන වෙත යොමු කරන ලද කරුණු

පිළිගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම් අදාළ ප්‍රමිතීන්ට අනුකූලද යන්න පැහැදිළි කිරීම් ලබා ගැනීම සඳහා පහත කරුණු වෙනත් නියාමකයින් වෙත යොමු කරන ලදි. (සංඛ්‍යා සටහන 06)

**සංඛ්‍යා සටහන 06: අනෙකුත් නියාමකයින් වෙත යොමු කරන ලද කරුණු**

| රාජ්‍ය නියාමන ආයතනය | සමාගම් සංඛ්‍යාව | අදාළ කරුණු සහ ප්‍රතිඵල |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) | 01 | ඇපරල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) | 03 | ඒෂියා කැපිටල් පී.එල්.සී<br>හෙල ඇපරල් හෝල්ඩිංග්ස් පීඑල්.සී<br>W M Mendis සමාගම විසින් NDB පී.එල්.සී කොටස් මිලදී ගැනීම |

## වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් අධීක්ෂණය කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විෂය පථයට ස්ථානීය (on-site) සහ දුරස්ථ (off-site) අධීක්ෂණ යන දෙයාකාරය හරහා නියාමනය කරන ලද ආයතනවල බලපත්‍ර ප්‍රදානය කිරීම සහ අලුත් කිරීම සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් යන පාර්ශව දෙකම, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන, සහ පනවන ලද නීති සහ නියාමනයන්ට අනුකූල බවට සහතික කර ගැනීමට මෙම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

වසර තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියාමන රාමුව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස ශක්තිමත් කරන සන්ධිස්ථාන කිහිපයක් වෙත ළඟා වීමට හැකි විය. වෙළෙඳපොළ අතරමැදියන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එවැනි ආයතනවලට අදාළ වන අවම මූල්‍ය අවශ්‍යතා වන අවම කොටස් හිමියන්ගේ අරමුදල් සහ ද්‍රවශීලතා අවශ්‍යතා යන දෙකම සංශෝධනය කළ අතර ඇතුළුව, කර්මාන්තය පුරා මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශක්තිමත් බව එමගින් සහතික කර ගැනීමට හැකි වනු ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ඒකකයේ (AML/CFT) ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ජාතික අන්‍යෝන්‍ය ඇගයීමට (National Mutual Evaluation) පහසුකම් සැලසීම සඳහා හරස් ක්‍රියාකාරී නියෝජනයක් (Cross Functional Representation) සහිත කැපවූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ඒකකය පිහිටුවීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු සිදු කළේය. 2026 සඳහා සැලසුම් කර ඇති

අධීක්ෂණ කණ්ඩායම

ජාතික අන්‍යෝන්‍ය ඇගයීමට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවේ AML/CFT ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. තවද, කොළඹ කොටස් හුවමාරුව (CSE), මූල්‍ය බුද්ධි ඒකකය (FIU), කොළඹ කොටස් තැරැව්කරුවන්ගේ සංගමය (CSBA) සහ තැරැව්කාර ආයතනවල පසු කාර්යාල පද්ධති සැපයුම්කරුවන් (Broker Back Office System Providers) සමඟ ඔවුන්ගේ සහයෝගය ඇතිව, කොටස් තැරැව්කරුවන් සඳහා පොදු සම්බාධක පිරික්සුම් මෙවලමක් (Common sanction screening Tool) සහ ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ සමුළුවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද අතර, එමඟින් මූල්‍ය බුද්ධි ඒකකයේ අවශ්‍යතා සමඟ ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ අනුකූලතාවය සහතික කිරීමක් අපේක්ෂා කරන ලදි.

2022 මැයි මාසයේදී හඳුන්වා දුන් නව සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහයට (CIS සංග්‍රහය) අනුකූලව, අවම ද්‍රවශීලතා අවශ්‍යතා, ණය ගැනීමේ සීමාවන්, ආයෝජන සීමාවන්, මාසික ප්‍රතිලාභ සහ වාර්තා කිරීමේ බැඳීම් සහ CIS දියත් කිරීම සඳහා කාල නියමයන් ඇතුළුව සමාගම් කළමනාකරණයට අදාළ අවශ්‍යතා නිශ්චිතව දක්වමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ නියෝග කිහිපයක් නිකුත් කරන ලදී. ඊට අමතරව, CIS භාරකරුවන්ගේ අනුකූලතා වගකීම් නිශ්චිතව දක්වමින්, කර්මාන්තය ශක්තිමත් නියාමන ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික කරමින් නියෝගයක් නිකුත් කරන ලදී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා වැදගත් සන්ධිස්ථානයක් වූයේ වසර 16 කට පසු වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීමට හැකිවීමයි. ඵලදායී අධීක්ෂණය සහ පොදුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පවතින ව්‍යුහය සමාලෝචනය කිරීමෙන් පසු ගාස්තු ව්‍යුහය සංශෝධනය කරන ලදී. 2007 සිට වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා සහ 1991 සිට ඒකක භාර/CIS සඳහා ගාස්තු ව්‍යුහයට සංශෝධනයක් සිදු කර නොමැත. මුදල්,

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

ආර්ථික ස්ථායිකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පසුව, සංශෝධිත ගාස්තු ව්‍යුහය 2024 පෙබරවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වේ.

මීට අමතරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (Key Management Personal) සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ සේවාදායකයින් සමඟ කටයුතු කරන පුද්ගලයින්ගේ (Persons Dealing with Clients) සුදුසුකම් සහ යෝග්‍යතාවයෙන් (fitness and propriety) සම්බන්ධ රාමුවක් ස්ථාපිත කිරීම අඛණ්ඩව සිදුකරගෙන ගිය අතර එමගින් බලාපොරොත්තු වූයේ ඔවුන්ගේ වෘත්තීයභාවය සහ අවංකභාවය පිළිබඳ ප්‍රමිතීන් සපුරාලීම සහතික කිරීමයි. තවද, කර්මාන්තය තුළ වගවීම සහ අනුකූලතාව ශක්තිමත් කිරීමේ අරමුණින්, වෙළෙඳපොළ අතරමැදියන් විසින් සිදු කරනු ලබන උල්ලංඝනයන් සහ/හෝ අනුකූල නොවීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග (Enforcement Actions) ක්‍රියාත්මක කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියා පටිපාටියක් හඳුන්වා දෙන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාව සහ පාලන අධීක්ෂණයන් වැඩි දියුණු කිරීම සඳහා, තාක්ෂණික විසඳුමක් ලබා ගැනීමට පියවර ගන්නා ලදී. සවිස්තරාත්මක ගණුදෙනු ක්‍රියාවලියකින් පසුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වඩාත් සුදුසු ලංසුකරු සාර්ථකව හඳුනාගෙන, නව මෘදුකාංග-සේවාවක් වන (Software as a Service-SaaS& SupTech Solution ස්ථාපිත කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළේය.

### කොටස් තැරැව්කරුවන්

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොටස් තැරැව්කරුවන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීමේදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණ ක්‍රියාකාරකම් සිදු කරන ලද්දේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන, අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූල වීමේ තත්ත්වය තක්සේරු කිරීම සඳහා ය. කොටස් තැරැව්කරුවන්ගේ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණයන් සිදුකරන ලද්දේ අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් මත වන අතර , එහිදී මූල්‍ය සහ මූල්‍ය නොවන සාධක මත පදනම්ව අවදානම තක්සේරු කරන ලදී.

දුරස්ථ අධීක්ෂණයට ප්‍රධාන වශයෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, මාසික විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන සහ කොටස් තැරැව්කරුවන් විසින් දෙසතියකට වරක් ඉදිරිපත් කරන ලද ණයගැතිභාවය පිළිබඳ හෙළිදරව් කිරීමේ වාර්තා සමාලෝචනය කිරීම ඇතුළත් වේ.

දුරස්ථ අධීක්ෂණයේ කොටසක් ලෙස, කොටස් තැරැව්කරුවන්ගේ අනුකූල නොවීම් සහ එවැනි අනුකූල නොවීම් සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් ගනු ලබන නියාමන පියවර සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් ඉදිරිපත් කරන ලද මාසික වාර්තාවන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලදී. මෙමගින් අදාළ නීතිරීතිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් කඩිනම් නියාමන පියවර ගෙන තිබේද යන්න තක්සේරු කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට හැකි විය.

මීට අමතරව, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ සාදන ලද නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමේ තත්ත්වය තීරණය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ නියෝජිතයින් සමඟ ඒකාබද්ධ පරීක්ෂණයන් පවත්වන ලදී. වසර තුළ එවැනි පරීක්ෂණ හතරක් පවත්වන ලදී. වසර තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොටස් තැරැව්කාර ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනුකූලතා නිලධාරීන් සඳහා කොටස් තැරැව්කාර සමාගම් තුළ සම්බාධක පිරික්සුම් මෙවලම (අවදානම් හඳුනා ගැනීමට සහ අවම කිරීමට උපකාර කිරීම සඳහා නිර්මාණය කර ඇති මෘදුකාංග විසඳුමකි) භාවිතය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය විසින් දැනුවත් කිරීමක් සංවිධානය කරන ලදී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කර්මාන්තයේ කාර්ය සාධනය දෙස අවධානය යොමුකරන විට කොටස් තැරැව්කාර ආයතනවල මුළු පිරිවැටුම 2023 වසරට සාපේක්ෂව 33% කින් ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි. කර්මාන්තයේ ලාභදායීත්වය 38% ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, 2023 දී වාර්තා වූ රුපියල් මිලියන 1,216 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 දී රුපියල් මිලියන 1,678 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාලේඛනයක් පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 07)

**සංඛ්‍යා සටහන 07: කොටස් තැරැව්කාර ආයතන සම්බන්ධ විශේෂිත අවස්ථා**

| | 2024 (රු. '000) | 2023 (රු. '000) | වෙනස % |
|---|---|---|---|
| පිරිවැටුම | 6,156,193 | 4,635,144 | 33 |
| ශුද්ධ තැරැව්කාර කටයුතු | 5,557,802 | 4,166,262 | 33 |
| වෙනත් ආදායම් | 2,725,033 | 3,846,382 | (29) |
| මෙහෙයුම් ලාභය/අලාභය | 2,847,469 | 2,787,191 | 2 |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය/අලාභය | 2,272,491 | 1,838,886 | 24 |
| බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය/අලාභය | 1,678,965 | 1,216,551 | 38 |
| මුළු වත්කම්* | 44,890,398 | 24,280,733 | 85 |
| මුළු වගකීම්* | 29,840,971 | 11,432,918 | 161 |
| කොටස් හිමියන්ගේ අරමුදල්* | 15,049,426 | 12,847,816 | 17 |

*දෙසැම්බර් 31 වන විට

මූලාශ්‍රය: කොටස් තැරැව්කරුවන් විසින් කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන

## ඒකක භාර කළමනාකරණ සමාගම් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම

2024 වර්ෂයේ දී, අනුකූලතාව අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සහ අවදානම් පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් සඳහා පහසුකම් සැලසීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවදානම් මත පදනම් වූ අධීක්ෂණ ප්‍රවේශයක් පවත්වා ගෙන ගියේය. එමගින් ආයෝජක අයිතීන් ආරක්ෂා කිරීම සහ කර්මාන්තය තුළ අවදානම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

විචක්ෂණශීලී, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිවලට අදාළ ප්‍රධාන අවදානම් ඇගයීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කළමනාකරණ සමාගම්වල ස්ථානීය අධීක්ෂණය (On-site Supervision) සඳහා එහි අවදානම් පාදක ප්‍රවේශය (Risk Based Supervision) ශක්තිමත් කරන ලදී. මෙම තක්සේරුව මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව, අදාළ නියාමන අවශ්‍යතා සහ පාලන ප්‍රමිතීන්ට අනුකූල වීම සමාලෝචනය කිරීම අරමුණු කර ගෙන ඇත.

කළමනාකරණ සමාගම්වල ස්ථායිතාව තහවුරු කිරීම සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අවම මූල්‍ය අවශ්‍යතා සමඟ නිසි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සහ අනුකූලතා වාර්තා (Compliance Reports) විශ්ලේෂණය කිරීමෙන් දුරස්ථ අධීක්ෂණය වැඩි දියුණු කරන ලදී. 2024 වර්ෂය තුළ, විචක්ෂණශීලී ප්‍රමිතීන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, කළමනාකරණ සමාගම් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සඳහා අදාළ වන අවම මූල්‍ය අවශ්‍යතා සංශෝධනය කරන ලදී.

අතිරේකව, ඒකක හිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීම සඳහා අදාළ රීති මගින් නියම කර ඇති පරිදි අවම ඒකක හිමියන් සංඛ්‍යාව, ආයෝජන සඳහා සීමාවන් සහ සැපිරිය යුතු ද්‍රවශීලතා අවශ්‍යතා ඇතුළු නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සාමූහික යෝජනා ක්‍රමවල මාසික ප්‍රතිලාභ වාර්තා (Monthly Returns of CIS Schemes) ඉදිරිපත් කිරීම් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධිමත්ව සමාලෝචනය කරන ලදී.

නියාමන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් CIS සඳහා අතිරේක නියාමන අවශ්‍යතා නියෝගයක් නිකුත් කිරීම මගින් හඳුන්වා දෙන ලදී. ආයෝජන සීමාවන් සංශෝධනය කිරීම, ණය ගැනීම් මත සීමාවන් පැනවීම සහ ද්‍රවශීලතා අවශ්‍යතා හඳුන්වාදීම ඊට ඇතුළත් විය. අනුකූලතා වාර්තාවක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම ඇතුළත් කරමින් CIS වල භාරකරුවන්ගේ වගකීම් පුළුල් කරන ලද අතර එම වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමිතිගත ආකෘති පත්‍රයක් නියෝගයක් මගින් නිකුත් කරන ලදී.

යෝජනා ක්‍රමවල මූල්‍ය ස්ථායිතාව ඇගයීම සහ නියාමන අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කළමනාකරණ සමාගම් සහ ඊට හි භාරකරුවන් සමඟ අඛණ්ඩ සන්නිවේදනයක් පවත්වාගෙන යයි. වසර තුළ ආයෝජන සීමාවන් සහ ද්‍රවශීලතා අවශ්‍යතා උල්ලංඝනය කිරීම් හඳුනාගෙන ඒ සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කරන ලදී. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම, අනුකූලතාව පවත්වාගෙන යාම සහ විය හැකි අවදානම් අවම කිරීම සඳහා කළමනාකරණ සමාගම් විසින් ක්‍රියාකිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අවශ්‍ය වේ. අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම සමාගම්වලට කාලෝචිත මග පෙන්වීමක් ලබා දෙන ලදී.

වසර තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නව යෝජනා ක්‍රම හයක් අනුමත කරන ලද අතර, ඉන් දෙකක් කොළඹ කොටස් හුවමාරුවෙහි ඔවුන්ගේ ඒකක ලයිස්තුගත කරන ලද අතර ඒවා ආවෘතාන්ත ආයෝජන (Closed Ended) යෝජනා ක්‍රම විය. (සංඛ්‍යා සටහන 08, රූප සටහන 01)

### සංඛ්‍යා සටහන 08: ආයෝජන යෝජනා ක්‍රමවල සමස්ත තත්ත්වය

| | 2024 දෙසැම්බර් 31 වන විට | 2023 දෙසැම්බර් 23 වන විට | ප්‍රතිශතාත්මක වෙනස |
|---|---|---|---|
| අනුමත යෝජනා ක්‍රම ගණන | 90 | 84 | 7.14 |
| ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම ආසන්නතම (රු. බිලියන) | 544.83 | 407.74 | 33.62 |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 114,898 | 93,450 | 22.95 |
| නිකුත් කළ ඒකක ගණන ආසන්නතම (රු. මිලියන) | 30,261 | 13,371 | 126.32 |
| කොටස්වල ආයෝජනය ආසන්නතම (රු. මිලියන) | 30,956 | 18,506 | 67.28 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ආසන්නතම (රු. මිලියන) | 380,217 | 315,238 | 20.61 |
| වෙනත් උපකරණවල ආයෝජනය* ආසන්නතම (රු. මිලියන) | 129,128 | 70,175 | 84.01 |

* වාණිජ පත්‍රිකා, භාර සහතික, ණයකර, බැංකු තැන්පතු ආදිය.

මූලාශ්‍රය: කළමනාකරණ සමාගම් විසින් සිදු කළ නියාමන ඉදිරිපත් කිරීම්

### රූප සටහන 01: ඒකක භාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස



## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

### අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන්

ආන්තික ණය සැපයුම්කරුවන් (Margin Providers), ආයෝජන කළමනාකරුවන් (Investment Managers), ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන (Credit Rating Agencies), ප්‍රාරක්ෂණ ආයතන (Underwriters), සහ සාංගමික මූල්‍ය උපදේශකයින් (Corporate Finance Advisors), ඇතුළු වෙළෙඳපොළ අතරමැදියන්ගේ ද නියාමනය සහ අධීක්ෂණය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සහතික කරයි. මෙම අධීක්ෂණය මඟින් සියලුම ආයතන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන සහ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කරයි. වෙළෙඳපොළ අතරමැදියන් හා සම්බන්ධ අවදානම්, ඵලදායී ලෙස හඳුනා ගැනීම, නිරීක්ෂණය කිරීම, අවම කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා, ස්ථානීය (On-site ) සහ දුරස්ථ (Off-Site) අධීක්ෂණය යන දෙකම ඇතුළත් ශක්තිමත් අවදානම් පාදක අධීක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කරන ලදී.

2024 වර්ෂය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සාංගමික මූල්‍ය උපදේශක (Corporate Finance Advisors) කාණ්ඩය යටතේ ආයතන හතරකට සහ ආයෝජන කළමනාකරු (Investment Managers) යන කාණ්ඩය යටතේ එක් ආයතනයකට බලපත්‍ර ප්‍රදානය කළේය. තවද, සිය මෙහෙයුම් කරගෙන යාමට අපේක්ෂා නොකල එක් කොටස් වෙළෙන්දෙකුගේ (Stock Dealer) සහ එක් ආයෝජන කළමනාකරුවෙකුගේ (Investment Managers) බලපත්‍ර අළුත් නොකරන ලදි.

### මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, සහ මූල්‍ය ව්‍යාප්තිය වැඩිවීම වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෙන ඇති පියවර

ගෝලීය ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරන මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකාය (FATF) ගෝලීය වශයෙන් මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ අනෙකුත් අදාළ වරදවල් මැඩපැවැත්වීම සඳහා ඊට අදාළ නිර්දේශ 40ක් හඳුන්වා දී ඇත. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කණ්ඩායම (APG) මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකායෙහි කලාපීය අනුබද්ධ ආයතනය ලෙස ක්‍රියා කරන අතර එමඟින් කලාපයේ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකායෙහි නිර්දේශවලට අනුකූල වීමේ මට්ටම නිරීක්ෂණය කරනු ලබයි. ශ්‍රී ලංකාව ආසියා පැසිෆික් කණ්ඩායමෙහි ආරම්භක සාමාජිකයෙකි.

මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකාය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථය සැලකිල්ලට ගනිමින්, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා රටේ සියලුම පාර්ශවකරුවන්ගේ කැපවීම සහ සම්බන්ධීකරණය කිරීමේ අරමුණින් මූල්‍ය බුද්ධි ඒකකයේ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ප්‍රතිපත්ති සැකසුම් පිළිබඳ මූලික කමිටුව වන ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC) විසින් වර්තමානය වන විට රාමුවක් සකස් කර ඇත.

මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකාය විසින් කලාපීය අධීක්ෂණ ආයතන හරහා රටවල මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් හා සම්බන්ධ නීතිමය, ආයතනික රාමුව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ නිර්ණායකයන් ඇගයීමට ලක් කරයි. ශ්‍රී ලංකාව එවැනි අන්‍යෝන්‍ය ඇගයීම් දෙකකට භාජනය වූ අතර තුන්වන ඇගයීම 2026 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතය. මෙම අන්‍යෝන්‍ය ඇගයීමේදී, ශ්‍රී ලංකාව මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සමඟ අනුකූල වීම සහ ක්ෂණික ප්‍රතිඵල 11 ක් හරහා ඒවායේ කාර්යක්ෂමතාව පෙන්නුම් කළ යුතුය.

ආර්ථිකයේ සුරැකුම්පත් අංශයේ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් වලට මුහුණදීම සඳහා 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ (සංශෝධිත) විධිවිධාන අනුව, අදාළ අධීක්ෂණ අධිකාරියක් ලෙස මූල්‍ය බුද්ධි ඒකකයෙහි කොටස්කරුවෙකු වීමේ වැදගත්කම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තේරුම් ගෙන ඇත.

වර්තමානය වන විට, මේ සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලද ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික සම්බන්ධීකරණ කමිටුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සමීපව කටයුතු කරයි. තවද, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් සුරැකුම්පත් වෙළෙඳපොළට අදාළව 2021/2022 ශ්‍රී ලංකාවේ ජාතික මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව අනුව හඳුනාගත් අඩුපාඩු/හිඩැස් මඟහරවා ගැනීම කෙරෙහි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කරනු ඇති අතර මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධක බලකායෙහි නිර්දේශ 40 සාක්ෂාත් කර ගැනීම සඳහා නියාමනයට ලක්වන ආයතනවලට මග පෙන්වීමක් ද ලබා දෙනු ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සමීප සහයෝගයෙන් සම්බන්ධීකරණ ක්‍රියාකාරකම් මාලාවක් ක්‍රියාවට නංවන ලද අතර, එමඟින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සකස් කරන ලද එක්සත් ජාතීන්ගේ ගනුදෙනු පිරික්සුම් මෙවලමක් සියලුම කොටස් තැරැව්කරුවන් අතර බෙදා ගැනීමට කටයුතු කරනු ලැබීය. බොහෝ කොටස් තැරැව්කරුවන් විසින් ක්‍රියාත්මක කර ඇති ගනුදෙනු අධීක්ෂණ පද්ධති සඳහා මාර්ගෝපදේශ සැපයීමට ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහසුකම් සැලසූ අතර, අනෙක් අය මේ සම්බන්ධයෙන් තමන්ගේම පද්ධති භාවිතා කිරීම දිගටම කරගෙන යනු ලබයි.

2022 වර්ෂයේදී සියලුම වෙළෙඳපොළ ආයතන සහ සියලුම වෙළෙඳපොළ අතරමැදියන් වෙත නිකුත් කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති මගින් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය බුද්ධි ඒකකය විසින් කලින් කලට නිශ්චිතව දක්වා ඇති ඔබේ සේවාදායකයා දැන ගන්න (KYC) සහ තම සේවාදායකයා මනා විමර්ශනයකට ලක් කිරීමේ (CDD) ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම අනිවාර්ය වේ. මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ අනුකූලතා වාර්තාවේ කොටසක් ලෙස, සියලුම වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් මාසිකව සහ කාර්තුමය වශයෙන් පහත තොරතුරු ඉදිරිපත් කර තහවුරු කළ යුතු බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සියලුම වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන්ගෙන් ඉල්ලා සිටී:

- සැක සහිත ගනුදෙනු වාර්තා පිළිබඳ තොරතුරු (ඇත්නම්);
- තොරතුරු සංඛ්‍යාව; සහ
- ප්‍රතිඵල (ඇත්නම්)

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සැලකිය යුතු සහ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි. 2024 වර්ෂයේදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනයකින් පසුව සැක සහිත ගනුදෙනු වාර්තාවක් (STR) මූල්‍ය

බුද්ධි ඒකකය වෙත යොමු කරන ලද අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාංගමික කටයුතු අංශය එම කාලය තුළ අතිරේක කරුණු දෙකක් යොමු කරන ලදී.

මීට අමතරව, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම යන ක්ෂේත්‍රයන්ට අදාළ ඇතැම් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සහ 2024 අගෝස්තු මාසයේදී පවත්වන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් සඳහා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව නායකත්වය ලබා දෙන ලදී. එම අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා ක්ෂේත්‍රය නියෝජනය කරන නියෝජිතයින් 51 දෙනෙකු සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සමාජිකයින් 50 දෙනෙකු සහභාගී විය. ඊට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මෙහෙයවන ලද කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ආරම්භ කරන ලදී.

## වෘත්තීය ප්‍රමිතීන් හා වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ හැසිරීම වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ආයෝජන උපදේශන ලබාදීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමයේ කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශය විසින් වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පැවැත්වීම සිදු කරයි. ඉහත කරුණු වලට අමතරව, ආයෝජනයේ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ මහජනතාවට ලබා දීම සඳහා ව්‍යුහගත වැඩසටහන් ද ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශය විසින් සපයයි. (රූප සටහන 02)

රූප සටහන 02 : ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව



## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

2024 කාල පරිච්ඡේදය තුළ, ආයෝජන උපදේශකයින් සඳහා අවම මට්ටමේ ප්‍රවීණතාවයක් සහ නිපුණතාවයක් ලබා දීම සහ එමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජන උපදේශකයින් සඳහා ගුණාත්මක ප්‍රමිතියක් සහිතව සේවය කිරීම අරමුණු කරගත් ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. කොටස් සුරැකුම්පත්, ණය සුරැකුම්පත් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම යනාදී වත්කම් පන්ති එකක් හෝ කිහිපයක් සඳහා සහතික කළ ආයෝජන උපදේශකයින් සඳහා වෙනම සහතික ලබා දීම සඳහා එම රාමුව ස්ථාපිත කර ඇත.

මෙම සෑම සහතික කිරීමක්ම ආයෝජන උපදේශකයින් සඳහා බලපත්‍ර ක්‍රියාවලියට දායක වේ. ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සුදුසුකම් යනු සුරැකුම්පත් කර්මාන්තය තුළ ඇති සියලුම වත්කම් පන්ති ඇතුළත් ඉහළම සහතිකයයි.

පහත දැක්වෙන්නේ එක් එක් වත්කම් පන්තිය සඳහා වෙන වෙනම සහතික කිරීම් සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද අනුරූප බලපත්‍රවල ක්‍රමලේඛනයකි. (රූප සටහන 03)

**රූප සටහන 03 : සහතික කිරීමේ මට්ටම සහ නිකුත් කර ඇති බලපත්‍ර**

| විෂය අංකය | විෂයය | සහතික පත්‍රයේ සහ බලපත්‍රයේ මට්ටම | | | | |
|---|---|---|---|---|---|---|
| | | හිමිකම් | ණයකර | ව්‍යුත්පන්න | ඒකක භාර / සාමූහික ආයෝජන යෝජනා ක්‍රම | ප්‍රාග්ධන වෙළෙඳපොළ |
| විෂයමාලා අංක 1 | සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ | ● | ● | ● | ● | ● |
| විෂයමාලා අංක 2 | හිමිකම් නිකුතු | ● | | | | ● |
| විෂයමාලා අංක 3 | ණය සුරැකුම්පත් | | ● | | | ● |
| විෂයමාලා අංක 4 | ව්‍යුත්පන්න සුරැකුම්පත් | | | ● | | ● |
| විෂයමාලා අංක 5 | ඒකක භාර | | | | ● | ● |
| විෂයමාලා අංක 6 | මූල්‍ය සැළසුම්, උපදේශණය හා අලෙවිකරණය | ● | ● | ● | ● | ● |
| විෂයමාලා අංක 7 | සුරැකුම්පත් නියාමනය සහ ආචාරධර්ම | ● | ● | ● | ● | ● |
| | සහතිකපත්‍ර | හිමිකම් සුරැකුම්පත් සහතික පත්‍රය (CES) | ණය සුරැකුම්පත් සහතික පත්‍රය (CDS) | ව්‍යුත්පන්න සුරැකුම්පත් සහතික පත්‍රය (CDvS) | සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CCIS) | ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍රය (CCM) |
| | කර්මාන්තය පිළිබඳ අදාළ පලපුරුද්ද | මාස 6 කි | මාස 6 කි | මාස 6 කි | මාස 6 කි | වසරකි |
| | Viva Voce විභාග | අවශ්‍යයි | අවශ්‍යයි | අවශ්‍යයි | අවශ්‍යයි | අවශ්‍යයි |
| | කර්මාන්තය සම්බන්ධ තනතුර | සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA) | සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරැකුම්පත් උපදේශක (CDSA) | සහතිකපත්‍ර ලාභී හිමිකම් සුරැකුම්පත් උපදේශක (CDvSA) | Certified Collective Investment Schemes Advisor (CCISA) | Registered Investment Advisor (RIA) |
| | අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා | වාර්ෂිකව අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා ලකුණු 4 කි. | | | | |

රටේ සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ඇති වූ සහ ඇතිවන වෙනස්කම් වලට අනුවර්තනය වීමේ වැදගත්කම තේරුම් ගෙන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, මාර්ගගත වේදිකා (online platform) සහ පුද්ගල සැසි (In-person) හරහා අඛණ්ඩ දේශන පැවැත්වීම දිගටම කරගෙන ගියේය. සලකා බලනු ලබන කාල සීමාව තුළ මෙම සහතික කිරීමේ වැඩසටහන් වලට සම්බන්ධ වන සිසුන් සංඛ්‍යාවේ වර්ධනය වන ප්‍රවණතාවක් නිරීක්ෂණය විය. මෙම වැඩසටහන් සම්බන්ධයෙන් 2024 දී පැවැත්වීමට නියමිත සියලුම විභාග 2024 දෙසැම්බර් 31 වන දින වන විට පවත්වා අවසන් කරන ලදී.

එහි බලපත්‍ර ක්‍රමයේ කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රාග්ධන වෙළඳපොළේ ආයෝජන උපදේශකයෙකු ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා අනිවාර්ය වන ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), සහතික කළ හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA) සහ සහතික කළ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම උපදේශක (CCISA) සහතික පරිපාලනය කරන ලදී. එපමණක් නොව, චක්‍රලේඛ සහ නියෝග හරහා වෙළඳපොළට දැනුම් දී ඇති පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍ර අවලංගු වූ ආයෝජන උපදේශකයින් ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපන අංශය විසින් නැවත සේවයේ පිහිටුවීම දිගටම කරගෙන ගියේය. ආයෝජන උපදේශකයින් සඳහා අඛණ්ඩ වාචික පරීක්ෂණ වසර පුරා කිසිදු බාධාවකින් තොරව පවත්වන ලද අතර එය වත්කම් පන්ති හතරටම එනම් හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා සපයන බලපත්‍ර අපේක්ෂකයන්ගෙන් සමන්විත විය.

වෙළෙඳපොළ වෘත්තිකයන්ට අදාළ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් මාර්ගගත ආකාරයෙන් සහ භෞතික සැසි ලෙස පවත්වන ලදී.

## වෙළෙඳපොළ වෘත්තිකයන්

### ප්‍රාග්ධන වෙළඳපොළ සහතිකය (CCM), හිමිකම් සුරැකුම්පත් සහතිකය (CES), ණය සුරැකුම්පත් සහතිකය (CDS) සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සහතිකය

ඉහත වැඩසටහන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද අතර 2023 දී ආරම්භ කරන ලද 27 වන කාණ්ඩයට අදාළ දේශන 2024 සැප්තැම්බර් මාසයේදී අවසන් විය. මේ අතර 28 වන කණ්ඩායම 2024 අගෝස්තු මාසයේදී ආරම්භ වූ අතර 2025 සැප්තැම්බර් මාසයේදී අවසන් වේ. 2025 මාර්තු මාසයේදී ආරම්භ වීමට නියමිත නව කණ්ඩායම සඳහා අයදුම්පත් 2024 දෙසැම්බර් මාසයේදී කැඳවන ලදී. (සංඛ්‍යා සටහන 09)

සංඛ්‍යා සටහන 09 : කාර්ය සාධනය

| සිසුන් සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|
| මුළු ලියාපදිංචිය | සුරැකුම්පත් වෙළඳපොළ සහ උපකරණ මාලාව සම්පූර්ණ කළ ප්‍රමාණය | හිමිකම් සුරැකුම්පත් | ණය සුරැකුම්පත් | සාමූහික ආයෝජන යෝජනා ක්‍රම මාලාව සම්පූර්ණ කළ ප්‍රමාණය | මූල්‍ය සැලසුම්කරණය, උපදේශනය සහ අලෙවිකරණය මාලාව සම්පූර්ණ කළ ප්‍රමාණය | සුරැකුම්පත් රෙගුලාසි සහ ආචාර ධර්ම මාලාව සම්පූර්ණ කළ ප්‍රමාණය |
| 169 | 32 | 37 | 20 | 29 | 25 | 25 |

### ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), සහතික කළ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම උපදේශක (CESA) සහ නැවත ස්ථාපිත කිරීම්.

වසර තුළ RIA බලපත්‍රය, CESA බලපත්‍රය, CCISA බලපත්‍රය අපේක්ෂකයන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සහ වාර්ෂික CPD අවශ්‍යතාවයට අනුකූල නොවීම හේතුවෙන්, බලපත්‍රය කල් ඉකුත් වූ ආයෝජන උපදේශකයින් නැවත සේවයේ පිහිටුවීම සඳහා වාචික පරීක්ෂණ විභාග 17 ක් පවත්වන ලදී.

ඒ අනුව, මෙම වාචික පරීක්ෂණ විභාග සඳහා සිසුන් 72 දෙනෙකු සහභාගී වූ අතර, සාමාන්‍ය සමත් වීමේ අනුපාතය 70% කි. සමත් වූ සිසුන්ගෙන් 24 දෙනෙකු RIA බලපත්‍රය ලබා ගත් අතර, එය 49% ක ප්‍රතිශතයක් වන අතර සිසුන් 14 දෙනෙකු CESA බලපත්‍රය ලබාගෙන ඇති අතර එය සමත් වූ සිසුන්ගෙන්, 28% ක් වන අතර සිසුන් 4 දෙනෙකු CCISA බලපත්‍රය ලබාගෙන ඇති අතර, එය 8% කි. වසර තුළ ආයෝජන උපදේශකයින් 7 දෙනෙකු පමණක් නැවත සේවයේ පිහිටුවන ලද අතර, එය 29% ක ප්‍රතිශතයක් වේ. (සංඛ්‍යා සටහන 10)

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

සංඛ්‍යා සටහන 10 : වාචික පරීක්ෂණ විභාගවල සංඛ්‍යානමය කාර්ය සාධනය

| වාචික පරීක්ෂණ විභාගය | සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | සාමාන්‍ය සමත් සිසුන් සංඛ්‍යාව (% ලෙස) |
|---|---|---|
| ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) / සහතික කළ කොටස් සුරැකුම්පත් උපදේශක (CESA) / නැවත ස්ථාපිත කිරීම් (Re-Instatements) | 72 | 70 |

### අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා දේශීය හා ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොළවල නවතම ප්‍රවණතා නිරන්තරයෙන් තක්සේරු කිරීමට සහ යාවත්කාලීන කිරීමට හැකි වන පරිදි CPD වැඩසටහන් 5 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා 1,100 කට අධික සහභාගීවන්නන් ආකර්ෂණය වූ අතර, ඒ අතර කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින්, විශ්ලේෂකයින් සහ මූල්‍ය අංශයේ වෙනත් කර්මාන්තවල සේවය කළත් ඔවුන්ගේ බලපත්‍රය රඳවා ගැනීමට කැමති පුද්ගලයින් ද සහභාගී වූහ. CPDs භෞතික හා මාර්ගගත වෙබිනාර් ලෙස පවත්වන ලදී.

ඊළඟ වසර සඳහා ඔවුන්ගේ RIA තත්ත්වය අලුත් කිරීම සඳහා, දැනට සිටින ආයෝජන උපදේශකයින් වසරකට අවම වශයෙන් CPD සම්මන්ත්‍රණ ලකුණු 4 ක් ලබා ගැනීම සඳහා වන අනිවාර්ය අවශ්‍යතාවය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යන ලදී. (සංඛ්‍යා සටහන 11)

සංඛ්‍යා සටහන 11 : CPD වැඩසටහන් වල සාරාංශය: 2024 වර්ෂය

| අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනේ මාතෘකාව | සහභාගිවන්නන් සංඛ්‍යාව |
|---|---|
| නව නිෂ්පාදන මුලපිරීම් | 261 |
| FIT රාමුව යටතේ මුදල් ප්‍රතිපත්ති පියවර | 319 |
| 7 වන ශ්‍රේණිය - රෙගුලාසි සහ ආචාර ධර්ම | 311 |
| සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ කැපී පෙනෙන ලක්ෂණ, V කොටස අවධාරණය කිරීම | 229 |
| කොළඹ කොටස් හුවමාරුවේදී හඳුන්වා දුන් නව්‍ය නව නිෂ්පාදන | 59 |

### වෘත්තීය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ උත්සාහයන්

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, සහතික කිරීමේ වැඩසටහන සඳහා ලිහිල් ප්‍රවේශ අවශ්‍යතා සහ නිදහස් කිරීම් සපයන නියෝගයක් නිකුත් කරන ලදී. 2024 අගෝස්තු 1 වන දින සිට බලාත්මක වූ මෙම නියෝගය, අධ්‍යාපනික සහ වෘත්තීය ප්‍රමිතීන් කර්මාන්තයේ හොඳම භාවිතයන් සහ නැගී එන වෙළෙඳපොළ ප්‍රවණතා සමඟ පෙළගස්වා, අපේක්ෂා කරන සහ වත්මන් ආයෝජන උපදේශකයින්ට වඩා හොඳින් සහාය වීම අරමුණු කරගත් නව ප්‍රවේශ අවශ්‍යතා හඳුන්වා දෙයි.

CCM සඳහා ඇතුළත් වීමේ අවශ්‍යතා ලිහිල් කිරීම මඟින් ප්‍රවේශය පුළුල් වන අතර එමඟින් අපේක්ෂකයින්ට පුළුල් පරාසයකට සහභාගී වීමට හැකි වේ. නව නිර්ණායක මඟින් අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ පුළුල් පරාසයක් හඳුනා ගන්නා අතර එමඟින් වැඩි පිරිසකට සහතික කිරීමේ වැඩසටහන හැදෑරීමට ඉඩ සැලසේ.

මෙම විධානයන් විවිධ වෘත්තීය පසුබිම් සහ පෙර ඉගෙනුම් අත්දැකීම් සඳහා ඉඩ සලසයි, එබැවින් CCM සඳහා නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය පුළුල් කර ඇත. මීට පෙර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වරලත් මූල්‍ය විශ්ලේෂක මට්ටම 2 සමත් අපේක්ෂකයින් සඳහා පමණක් නිදහස් කිරීම් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, වර්තමානයේ, වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA), වරලත් සහතික කළ ගිණුම් සංගමය (ACCA), ශ්‍රී ලංකා වරලත් ගිණුම් ආයතනය (CA) යන ආයතනවල අවසන් විභාගය සමත් වූ අපේක්ෂකයින් මෙන්ම මූල්‍ය ආශ්‍රිත විෂයයකින් උපාධියක් හෝ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර ඇති අය නිදහස් කිරීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

මෙම සංශෝධන සැලසුම් කර ඇත්තේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ වෘත්තීය ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ වැඩිදියුණු කිරීම සඳහා වන අතරම එය වඩාත් ඇතුළත් කර ගන්නා සහ අඛණ්ඩ වෘත්තීය වර්ධනයට සහාය වන බැවිනි.

### ආයෝජන වැඩසටහන් (PI)

විභව ආයෝජකයින් සඳහා කොටස් වෙළඳාමේ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ පිළිබඳ දැනුවත්භාවයක් ලබාදීමේ අරමුණින් ආයෝජන වැඩසටහන් ආරම්භ කරන ලදී. වසර තුළ සති පහක් පුරා කාණ්ඩ දෙකක් ආරම්භ කරන ලදී. 31 වන කාණ්ඩය සඳහා, ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහන 2024 මැයි මාසයේදී ලියාපදිංචි සහභාගිවන්නන් 10 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද අතර ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහනක් වූ 32 වන කාණ්ඩය සඳහා, 2024 ඔක්තෝබර් මාසයේදී ලියාපදිංචි සහභාගිවන්නන් 6 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදී. කර්මාන්තයේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙය සිදු කරන ලදී.

### රන් පදක්කම් සහ මුදල් ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය

උපාධි අපේක්ෂකයින් අතර ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන ගියේය. ඒ සඳහා, විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළඳපොළ ආශ්‍රිත විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද සමාලෝචිත වර්ෂය තුළ රන් පදක්කම් සහ මුදල් ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය පරිපාලනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, ප්‍රාග්ධන වෙළඳපොළ ක්ෂේත්‍රයේ හොඳම කාර්ය සාධනයක් පෙන්නුම් කරන උපාධි අපේක්ෂකයාට රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් පිරිනමන ලදී.

ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික විශ්වවිද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කර ඇත. ඒ අනුව, 2024 වර්ෂය තුළ පහත සඳහන් ජාතික විශ්වවිද්‍යාල සඳහා රන් පදක්කම් සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
- කැලණිය විශ්වවිද්‍යාලය,
- නැගෙනහිර විශ්වවිද්‍යාලය,
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
- රුහුණු විශ්වවිද්‍යාලය,

## වාසිටි බැට්ල්ස්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව රාජ්‍ය විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා "Varsity Battles" ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රශ්න විචාරාත්මක තරඟය 2024 නමින් අන්තර් විශ්ව විද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟයක් සංවිධානය කර පවත්වන ලදී.

මෙම ප්‍රශ්න විචාරාත්මක තරඟය සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂකයින් අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩි කිරීමයි. මෙම මුලපිරීම මඟින් උපාධි අපේක්ෂකයින්ට ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ වැඩි දැනුමක් ලබා ගැනීමට සහ කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීමට සහ ප්‍රාග්ධන වෙළඳපොළ කර්මාන්තයේ රැකියා අවස්ථා සොයා ගැනීමට පෙළඹවීමට මග පාදනු ඇත.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල 13 ක් නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී වූහ. ගෝලීය වෙළඳපොළ, සාමාන්‍ය දැනුම, ශ්‍රී ලංකා ආර්ථිකය සහ ව්‍යාපාර, කාලීන කටයුතු, ක්‍රීඩා, විනෝදාස්වාදය සහ මූල්‍ය සුරැකුම්පත් කළමනාකරණයට අදාළ අනෙකුත් ක්ෂේත්‍ර ඇතුළු විවිධ දැනුම් ක්ෂේත්‍ර පිළිබඳව සහභාගිවන්නන් පරීක්ෂාවට ලක් කරන ලදී.

තරඟය අදියර දෙකකින් පවත්වන ලදී. එනම්:

පළමු අදියර : විශ්ව විද්‍යාලයක එක් එක් පීඨය නියෝජනය කරන කණ්ඩායම් සමඟ අන්තර් පීඨ තරඟය.

දෙවන අදියර : පළමු අදියරේදී තෝරාගත් සෑම විශ්ව විද්‍යාලයකම ඉහළම කණ්ඩායම් තුන සමඟ ජාතික මට්ටමේ තරඟය.

සමස්ත ජයග්‍රාහකයා: කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය  නියෝජනය කළ කණ්ඩායම ඉහළම ලකුණු ලබා 2024 වර්ෂයේදී සමස්ත ජයග්‍රාහකයා විය.

පළමු අනුශූරතාවය: කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය කණ්ඩායම පළමු අනුශූරතාවය ලබා ගත්තේය.

දෙවන අනුශූරතාවය: සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය කණ්ඩායම දෙවන අනුශූරතාවය ලබා ගත්තේය.

## උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පළවූ පුවත්පත් ලිපි

**The Island, Tuesday, 6th February 2024**

## SEC Sri Lanka introduces mechanism to report social media wrongdoings

**Daily FT Friday, 16th August 2024**

## SEC amends entry requirements for Cap Market professionals

**Ceylon Today, Tuesday, 10th September 2024**

## SEC issues new directions on Whitelist Indices

With the objective of protecting the interest of investors seeking Shariah compliant investments and rationalising the construction and publication of Shariah compliant Whitelist Equity Indices in the capital market, the Securities and Exchange Commission of Sri Lanka (SEC) has issued new regulatory directions to Market Institutions and Market Intermediaries operating Whitelist Indices.

Shariah compliant equities are equity securities which have been determined to be Shariah compliant. The process of determining whether an equity is Shariah compliant, and therefore appropriate for investment by investors seeking Shariah compliant investments, is done through a Shariah screening methodology of listed securities and consists of a set of qualitative and quantitative components.

Recognising the growing demand for Shariah Compliant Debt Securities such as Sukuks, both domestically and internationally, the SEC recently took a proactive step by approving an enabling regulatory framework to introduce and list such products on the Colombo Stock Exchange (CSE). The list of Accredited Shariah Scholars and the compliance certification process approved by the SEC provides credibility to the products listed on the CSE.

In order to provide investors assurance that the Whitelist Indices operating in Sri Lanka are in compliance with Principles and Rules of Shariah and that the securities screening methodology is on par with globally recognized screening thresholds, the SEC requested the approved list of Accredited Shariah Scholars, recognized as Supplementary Service Providers under the SEC Act, to develop a Shariah Securities Screening Methodology standard that is comprehensive, comparable to global benchmarks, and relevant to local market conditions. Thereupon, a Standard Shariah Complian...

**Daily FT, Thursday, 22 February 2024**

## SEC and CSE host investor forum in Vavuniya

**Ceylon Today, Friday, 10th May 2024**

## SEC SRI LANKA CERTIFIES SHARIAH SCHOLARS FOR MARKET PRODUCTS

The Securities and Exchange Commission of Sri Lanka (SEC) yesterday said that they have approved a list of Accredited Shariah Scholars as "Supplementary Service Providers".

These scholars are authorised to certify the Shariah compliance of Islamic Capital Market Products intended for listing on the Colombo Stock Exchange (CSE) in accordance with the Listing Rules. The SEC considers this as an essential step in view of products that require Shariah compatibility and to satisfy the needs of Islamic investors.

Recognising the growing demand for Shariah Compliant Debt Securities such as Sukuk, both domestically and internationally, the SEC took a proactive step by approving an enabling regulatory framework to introduce such products on the Colombo Stock Exchange. The Accredited Shariah Scholars and compliance certification process approved by the SEC will provide credibility to the products listed on the Exchange.

The SEC published an advertisement calling for applications from Shariah Scholars with the requisite academic / professional qualifications, work experience...

... Mufaffar (based in Sri Lanka), Aishath Muneeza (based in Malaysia), Mohammed Siraj Najubudeen (based in Saudi Arabia) and Dr. Suleiman Dalhatu Sani (based in Saudi Arabia).

As outlined in the published Guidelines and SEC's directive to the CSE, issuers of Islamic capital market products seeking a listing on the CSE are required to obtain a Shariah compliance certification from any three of the Accredited Shariah Scholars. The Guidelines define the duties of a Shariah Scholar, qualifications and experience required, submission of reports and record maintenance, governance standards, conflict of interest management, and fit & proper criteria.

**Ceylon Today, Tuesday, 16th July 2024**

SEC Hosts IOSCO Policy Committee Meeting

## SEC advocates for informed, empowered retail investors

**Daily Mirror, Monday, 3rd June 2024**

## SEC calls upon listed company secretaries to play an active role in board governance

**Daily Mirror, Wednesday, 14th February 2024**

## SEC approves regulatory framework for Infrastructure Bonds

The Securities and Exchange Commission (SEC) yesterday announced the approval of a regulatory framework to facilitate the issuance and listing of Infrastructure Bonds on the Colombo Stock Exchange (CSE).

This landmark decision by the SEC is aimed at fostering both foreign and local investments in infrastructure projects that will contribute to the economic development and well-being of the country.

Infrastructure Bonds aim to raise capital for vital projects such as roads, rail, water management, waste management systems, airports, seaports, mixed development projects, natural disaster protection systems, deep water ports, gas supply systems, utility projects, telecommunications infrastructure, etc. which are integral to economic growth and sustainability.

"The misallocation of capital is a root cause of our economic crisis. It is our objective to enable instruments that can raise long-term capital for development projects and provide investor assurance that such capital is allocated to the project's stated purpose with transparency and accountability," said SEC Chairman Faizal Salieh.

"We have now created an opportunity for government bodies such as Municipal Councils, Urban Councils, Local Government Councils, the Urban Development Authority, etc. and even large private sector companies to finance infrastructure projects through these bonds," he added.

There is a need for Sri Lanka to develop a market for Infrastructure Bonds and raise the long - term capital needed for infrastructure projects.

The scope of infrastructure development in emerging economies has evolved significantly in recent decades and now comprises a broad range that includes traditional infrastructure projects such as power, oil and gas, and water as well as low-carbon, climate-resilient infrastructure such as renewable energy projects.

MORE ON P8

## සමාජ මාධ්‍ය ජාල හරහා සිදු කළ ආයෝජන දැනුවත් කිරීම්

උපායමාර්ගික අරමුණු 1

# ශක්තිමත් නියාමන පරිසරයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම

**සමාජ මාධ්‍ය ජාල හරහා සිදු කළ ආයෝජන දැනුවත් කිරීම්**




SEC
உங்கள் முதலீட்டு ஆலோசகர் முதலீட்டைப் பரிந்துரைக்கும்போது, முதலீடு எவ்வாறு செயல்படுகிறது, அதன் ஆபத்து நிலை, அதை ஏன் வாங்க வேண்டும், உங்கள் இலக்குகளை அடைய அது எவ்வாறு உதவும் என்பது பற்றிய கேள்விகளைக் கேட்க மறக்காதீர்கள்.

ගනුදෙනු කරුවෙකු නොව, ආයෝජකයකු වීමට උත්සාහ කරන්න.
SEC

SEC
A wonderful company with strong fundamentals, competitive advantages, and a robust business model is more likely to provide consistent returns and growth over time. Conversely, a fair company, even if purchased at a lower price, may lack the inherent qualities needed to thrive, making it a riskier and potentially less rewarding investment.

SEC

SEC
பங்குச் சந்தையானது எவ்வித பெறுமதியுமற்ற அனைத்தினதும் விலையை அறிந்த தனிநபர்களால் நிரம்பியுள்ளது.
பிலிப் பிஷர்


FACT OR MYTH MYSTERIES
?
It's good to make sudden decisions When the market is uncertain.
A Fact
B Myth

SEC
A smart investor reviews disclosure documents and recognizes that investments in sustainable finance may significantly differ and need to be evaluated on their terms.

SEC
Advantages of Investing in Fundamentally Strong Shares
• Lower Investment Risk
• Consistent and Reliable Returns
• Potential for Capital Appreciation
• Dividend Yield
• Enhanced Market Confidence
• Protection Against Inflation

SEC
கேளுங்கள்
உங்கள் முதலீடுகள் அல்லது அவற்றின் செயல்திறன் குறித்து கேள்விகள் அல்லது சந்தேகங்கள் இருந்தால், உங்கள் முதலீட்டு ஆலோசகரிடம் கேளுங்கள். ஒரு சிறந்தஆலோசகர் நீங்கள் ஒரு தகவலறிந்த முதலீட்டாளராக இருக்க வேண்டும் என்பதுடன் உங்களது சந்தேகங்களை விருப்பத்துடன் ஏற்றுக்கொள்வார்.

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

**සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලික නියාමන අරමුණක් වන්නේ සාධාරණ හා ක්‍රමවත් වෙළෙඳ ගණුදෙනු පවත්වා ගැනීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීමේ ගණුදෙනු සහ අනෙකුත් අසාධාරණ ගණුදෙනු භාවිතයන් හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා වෙළෙඳපොළ ආවේක්ෂයන් සිදු කරනු ලබයි. එහි ආවේක්ෂණ ජාලය හරහා අනාවරණය වන ඕනෑම සැක සහිත විෂමාචාරයක් ගැඹුරු සමාලෝචනයකට භාජනය වේ. වැරදි සිදු කර ඇති බවට සාධාරණ සැකයක් තිබේ නම්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විමර්ශණ ආරම්භ කරන අතර, අවශ්‍ය විටෙක බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.**

### ආවේක්ෂණය

ප්‍රාග්ධන වෙළෙඳපොළ සාධාරණත්වය, විනිවිදභාවය හා ආයෝජකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශය වගකියනු ලැබේ. අසාමාන්‍ය මිල හා ගණුදෙනු හා ප්‍රමාණ වෙනස්වීම් හා සැකසහිත ගණුදෙනු හැසිරීම් රටා හඳුනා ගැනීම මගින් ආවේක්ෂණ අංශය ක්‍රියාකාරී ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළ ගණුදෙනු අධීක්ෂණය කරනු ලබයි.
ප්‍රාග්ධන වෙළෙඳපොළ අඛණ්ඩතාවය හා ආයෝජනයන්ගේ උපරිම ආරක්ෂාව වෙනුවෙන් මෙම අධීක්ෂණ/ සුපරීක්ෂණ ක්‍රියාවලිය මෙහෙය වනු ලබයි.

අසාමාන්‍ය ගණුදෙනු ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තත්‍යකාලීන අධීක්ෂණයක් සිදුකරනු ලබයි. යම් අක්‍රමිකතාවයක් හඳුනාගත් පසු ඒ සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරනු ලබන අතර ආවේක්ෂණ වාර්තා (Survellance Referrals and Survellance Notes) තුළින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගණු ලබයි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ දත්ත පූර්වගාමී ලෙස විශ්ලේෂණය කිරීම සඳහා උසස් අධීක්ෂණ වේදිකා භාවිතා කරන අතර එමගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂමතා සහ විභව අවදානම් කාලෝචිත ලෙස හඳුනාගැනීම සහතික කෙරේ. නිරීක්ෂණ වාර්තා කොමිසම වෙත යොමු කරනු ලබන අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරුව විමර්ෂණ හා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කරනු ලැබේ.

2024 වර්ෂය තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අති නවීන වෙළෙඳපොළ ආවේක්ෂණ පද්ධතියක් නැස්ඩැක් (Nasdaq) වෙතින් අත්පත් කර ගනිමින් වෙළෙඳපොළ ආවේක්ෂණ භූමිකාව ශක්තිමත් කිරීම සඳහා පියවර ගනු ලැබීය. වෙළෙඳපොළ විෂමතා, විභව විෂමතා හා අනෙකුත් වෙළෙඳපොළ විෂමාචාර හඳුනාගනිමින් ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය අති නවීන තාක්ෂණය නැස්ඩැක් ආවේක්ෂණ පද්ධතිය මගින් ලබා දෙයි. පද්ධතියේ වැඩිදියුණු කරන ලද ඇල්ගොරිදම, අභිරුචිකරණය කළ හැකි සංඥා / පූර්ව දැනුම්දීම් වාර්තා උත්පාදනය කිරීමේ හැකියාව, දෘෂ්‍යකරණ මෙවලම් හා තත්කාලීන දත්ත විශ්ලේෂණය සමඟින් වෙළෙඳපොළ දත්ත නැවත ධාවනය කිරීම (Market Reply), වෙළෙඳපොළ ක්‍රියාකාරුවන්ගේ පූර්ව ආරක්ෂාව හා ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ සමස්ත ස්ථාවරත්වය මෙන්ම විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා දායක වේ. ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ඉහළ නැංවීම හා විශාල දත්ත ප්‍රමාණයක් සැකසීම සඳහා මෙම පද්ධතිය පරිමාණය කරගත හැකි අතර කෘතිම බුද්ධිය හා යාන්ත්‍රණ අධ්‍යනය ඒකාබද්ධ කිරීම මගින් එහි හඳුනාගැනීමේ හැකියාව සිදු කළ හැක. මෙම පද්ධතිය 2025 දෙවන කාර්තුව තුළදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 2024 වසර තුළ සිදු වූ ආවේක්ෂණ ක්‍රියාකාරකම්

2024 වසර සඳහා ආවේක්ෂණ ක්‍රියාකාරකම් හි සාරාංශයක් පහතින් දැක්වේ. (සංඛ්‍යා සටහන 12)

**සංඛ්‍යා සටහන 12 : ආවේක්ෂණ ක්‍රියාකාරකම් 2024**

| නිරීක්ෂණ | දුරකථන ඇමතුම් ලබාදීම් | අනෙකුත් අංශවල ඉල්ලීම මත ලබාදුන් ගණුදෙනු විශ්ලේෂණ වාර්තා | වැඩිදුර අධීක්ෂණය කිරීම් | ප්‍රකාශ ලබා ගැනීම් | ආවේක්ෂණ සටහන් | ආවේක්ෂණ වාර්තා |
|---|---|---|---|---|---|---|
| 147 | 27 | 20 | 92 | 4 | 6 | 11 |

ආවේක්ෂණ ක්‍රියාවලිය මගින් 2024 වසරේ දී සැක සහිත ක්‍රියාකාරකම් 147 ක් හඳුනාගෙන ඇති අතර එය ඉහත වගුව මගින් දක්වා ඇත. සම්පූර්ණ වෙළෙඳපොළ දින 240න් සෑම වෙළෙඳපොළ දින 2ක් තුළම අවම වශයෙන් එක් අවස්ථාවක නිරීක්ෂණයක් වාර්තා කොට ඇත. ඊට අමතරව ආවෙක්ෂණ අංශය විසින් අවස්ථාවන් 27ක දී පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා සැක සහිත පාර්ශවයන් සම්බන්ධ කරගත් අතර පුද්ගලයන් 4 දෙනෙකුගෙන් ප්‍රකාශ ලබා ගැනීම් සිදු කරනු ලැබිණි. මෙම ආවේක්ෂණ මිනුම්කරණයන්, වෙළෙඳපොළ සැක සහිත ක්‍රියාකාරකම් අඛණ්ඩව පැවතීම අධෛර්යමත් කරමින් පූර්වගාමී වැලැක්වීමක් ලෙස ක්‍රියාකාරයි.

2024 වසර තුළ දී ආවේක්ෂණ අංශය විසින් පූර්ණ විමර්ශනය සඳහා ආවෙක්ෂණ වාර්තා 11 ක් ජනනය කර ඇති අතර සැක සහිත වෙළෙඳ ක්‍රියාකාරකම්වලට අදාළ සොයා ගැනීම් මත පදනම්ව ආවේක්ෂණ සටහන් 6 ක් සකස් කර ඇත. මීට අමතරව විමර්ශන අංශය ඇතුළු අනෙකුත් අංශයන් හී ඉල්ලීම් මත ආවෙක්ෂණ අංශය විසින් විශ්ලේෂණ වාර්තා 20ක් සපයා ඇති අතර , වැඩිදුර අධීක්ෂණය සඳහා නිරීක්ෂණ 92 ක් සලකුණු තර ඇත.

## සමාජ මාධ්‍ය අධීක්ෂණය

ආයෝජකයන් විසින් ලයිස්තුගත සුරැකුම්පත් පිළිබඳ තොරතුරු එක්රැස්කිරීමට සමාජ මාධ්‍ය මත පදනම් වීමෙහි වැඩිවීමක් දක්ණට ලැබේ. කෙසේ වෙතත් ආයෝජකයන් නොමඟ යැවීම සඳහා වැරදි තොරතුරු පළ කරන පාර්ශවයන් විසින් මෙම සමාජ මාධ්‍ය ජාලා ද විකෘති භාවයට පත් කරමින් සිටී. එවැනි පළ කිරීම් වලට නිර්දේශ හෝ ඉලක්ක මිල ගණන් ඇතුළත් විය හැකි අතර එමගින් විභව ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයක්, සුරැකුම්පත් මිල හා වටිනාකම පිළිබඳව නිවැරදි නොවන සංජානනයක් ඇතිවිය හැකිය. මෙය වෙළෙඳපොළ අස්ථාවරත්වය හා වැරදි වෙළෙඳපොළ තීරණවලය හේතු විය හැක.

තොරතුරු මත පදනම් වූ වෙළෙඳපොළ හැසිරවීම ඇතුළුව වෙළෙඳපොළ විෂමාචාරයන් හී විභව අවස්තා හඳුනා ගැනීම සඳහා ආවේක්ෂණ අංශය විසින් ෆෙස්බුක්, ඉන්ටර්ග්‍රම්, යූ ටියුබ්, ටෙලිග්‍රෑම්, වට්ස් ඇප් වැනි සමාජ මාධ්‍ය වේදිකා සක්‍රීයව නිරීක්ෂණය කරන අතර ඒවා විසඳීම සඳහා සක්‍රියව පියවර ගනී.

2024 වසරේ දී, සමාජ මාධ්‍ය වල පල කරන ලද සැක සහිත අන්තර්ගතයන් පිළිබඳ අවස්ථා 19 ක් ආවේක්ෂණ අංශය විසින් නිරීක්ෂණය කරන ලදි. ආයෝජකයන් 12 ගෙන් පැහැදිලි කිරීම් ලබා ගත් අතර එක් අවස්ථාවක බරපතල කම සළකා බලා ඒ සම්බන්ධයෙන් විධිමත් ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලදි. සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් වූ සැක සහිත හැසිරීමක් පිළිබඳ එක් අවස්ථාවක් විමර්ශන අංශයට යොමු කරන ලද අතර, තවත් එක් නිරීක්ෂණයක් ඔවුන්ගේ අවධානය සඳහා සාංගමික කටයුතු අංශයට යොමු කරන ලදි. අඛණ්ඩ අනුකූලතාව සහතික කිරීම පදනම් කර ගනිමින් ඉදිරි අධීක්ෂණ සඳහා ආවේක්ෂණ අංශය විසින් සමාජ මාධ්‍ය සම්බන්ධ වූ නිරීක්ෂණ දෙකක් සලකුණු කරන ලදි. එසේම මිල /පරිමාව සම්බන්ධ ගැටළුවලට අදාළ සාංගමික නිවේදන වලට අදාළ සමාජ මාධ්‍ය පරීක්ෂාවද, ආවේක්ෂණ අංශය විසින් නිරීක්ෂණය කරනු ලබයි.

## විමර්ශන කටයුතු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සදහන් විධිවිධාන හෝ ඒ යටතේ දක්වා ඇති ඕනෑම නියාමන අවශ්‍යතා, නීතිරීති හෝ විධාන උපදේශ කඩකිරීම් හෝ ඊට පටහැනිව කටයුතු කිරීම් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශන පවත්වනු ලබයි. එය ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමක වශයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යය, බලතල සහ යුතුකම් වලින් එකකි. ආයෝජකයින්ගේ අභිලාෂ ආරක්ෂා කරන අතරතුර සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළඳපොළක් පවත්වාගෙන යාම සඳහා වන එහි කැපවීමේ කොටසක් ලෙස, වෙළඳපොළ ආයතන, වෙළඳපොළ අතරමැදියන්, ලියාපදිංචි පුද්ගලයින්, ලැයිස්තුගත පොදු සමාගම් සහ ලැයිස්තුගත විදේශීය ආයතනවල ක්‍රියාකාරකම් සෝදිසි කිරීම සහ විමර්ශනය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය පවරා ඇත.

2024 වර්ෂය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙර වර්ෂයේ සිට ඉදිරියට ගෙන යන ලද පරීක්ෂණ 55 න් 36 ක් අවසන් කරන ලදී. තවද, 2024 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් නව විමර්ශන හතක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. 2024 වසර තුළ ආරම්භ කරන ලද ඉහත සඳහන් නව විමර්ශන වලින් හයක්, 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත) යටතේ ඇති සැක සහිත උල්ලංඝන සම්බන්ධයෙන් වූ අතර, ඒවාට අභ්‍යන්තර වෙළඳාම මෙන්ම ව්‍යාජ වෙළඳාම, වෙළඳපොළ මිල තීරණය කිරීම සහ සුරැකුම්පත් සම්බන්ධ වංචා ඇතුළු වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීම ඇතුළත් වූ අතර, අනෙක් විමර්ශනය 2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතියට පටහැනිව වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීමක් පිළිබඳ සැක සහිත සිද්ධියකට අදාළ වන අතර ඊට අදාළ කොටස් ගනුදෙනු සිදු වී ඇත්තේ 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංශෝධිත පනත (පැරණි පනත) බලාත්මකව පැවති කාලය තුළදී ය.

ඒ අනුව, සමස්තයක් වශයෙන්, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශන 62 ක් සිදු කරන ලද අතර, වර්ෂය තුළ අවසන් කරන ලද විමර්ශනවල නිරීක්ෂණ මත පදනම්ව පහත සඳහන් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලදී:

- සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගය තීරණය කිරීමට පෙර පුද්ගලයන් 12 දෙනෙකුට සහ ආයතන හතරකට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට.

ආවේක්ෂණ කණ්ඩායම

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

- පුද්ගලයන් තිදෙනෙකුට සහ ආයතන තුනකට අනතුරු හැඟවීමේ ලිපි (Letters of Warning) නිකුත් කිරීමට.
- අනාගතයේදී එම හැසිරීම නැවත සිදු කිරීම වැළැක්වීම සඳහා එක් ආයතනයකට තරවටු කිරීමේ ලිපියක් (Letter of Reprimand) සහ සදාචාර විරෝධී හැසිරීම සඳහා එක් පුද්ගලයෙකුට ලිපියක් නිකුත් කිරීමට.
- ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු අදාළ පුද්ගලයෙකුට නැවත විදේශගත වීම වැළැක්වීමේ අධිකරණ නියෝගයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කිරීමට.
- විමර්ශන හතරකට අදාළ නිරීක්ෂණ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ද, විමර්ශන දෙකකට අදාළ නිරීක්ෂණ කොළඹ කොටස් හුවමාරුව වෙත ද, එක් විමර්ශනයකට අදාළ නිරීක්ෂණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ද අවශ්‍ය පියවර ගැනීම සඳහා යොමු කිරීමට.

තවද, විමර්ශන වලට භාජනය වූ පුද්ගලයින්/ආයතන විසින් වරදක් සිදු කර ඇති බව අදාළ විමර්ශන වලදී ලබාගත් සාක්ෂි මගින් තහවුරු නොවීම හේතුවෙන් 2024 වසර තුළ සම්පූර්ණ කරන ලද විමර්ශන 36 න් 23 ක් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයකින් තොරව අවසන් කරන ලදී.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ අවසන් කරන ලද ඉහත සඳහන් විමර්ශන වලට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දැනට විමර්ශන කටයුතු සිදුකෙරෙමින් පවතින පරීක්ෂණයකට අදාළ උප කරුණු දෙකක් ද සම්පූර්ණ කරන ලදී. එමෙන් ම, තවත් එක් විමර්ශනයකට අදාළ විමර්ශන වාර්තාව සමාලෝචනය කිරීමෙන් පසු එම විමර්ශනයේ ඇතැම් අංශ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමට කොමිෂන් සභාව නිර්දේශ කරන ලදී.

සමාලෝචනය කරන ලද වර්ෂය පුරාම, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනෙකුත් නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් සමඟ ඇති සම්බන්ධතාවය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ අතර, විමර්ශන කටයුතුවලට සම්බන්ධ කාර්ය මණ්ඩලයේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුම හුවමාරු කර ගැනීමේ සැසි සංවිධානය කරන ලදී. තවද, ඩිජිටල් පරිවර්තනය සඳහා වන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස, දත්ත සහ විමර්ශන ලිපිගොනු වල ආරක්ෂාව සහ ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා අතිරේක පියවර ක්‍රියාත්මක කරන ලදී.

### බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

#### හේතු දැක්වීමේ නිවේදන

ආයෝජන උපදේශකයෙකුට දැන්වීම් දෙකක් නිකුත් කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතියට පටහැනිව පෙර විකිණීම යන වරද සිදු කිරීම සහ ඊට සම්බන්ධ වැරදි සිදු කිරීම සම්බන්ධයෙන් හේතු දැන්වීම සඳහා ආයෝජන උපදේශකයින් දෙදෙනෙකු ඇතුළු පුද්ගලයින් අට දෙනෙකුට දැන්වීම් නිකුත් කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතියට පටහැනිව පෙර විකිණීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීමටහිටපු ආයෝජන උපදේශකයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත) හි 32 වන වගන්තිය යටතේ අභ්‍යන්තර ගනුදෙනු සහ වෙනත් සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් හේතු දැන්වීම සඳහා පුද්ගලයින් හතර දෙනෙකුට දැන්වීම් නිකුත් කරන ලදී.

1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත) හි 32 (6) වගන්තිය උල්ලංඝනය කරමින් අභ්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් හේතු දැක්වීමට පොදු ලැයිස්තුගත සමාගමක සභාපතිවරයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතියට පටහැනිව, පොදු ලැයිස්තුගත සමාගමක කොටස්වල පෙර විකිණීම යන පෙර විකිණීම සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා කොටස් තැරැව්කාර සමාගමකට දැන්වීමක් නිකුත් කරන ලද අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතියට පටහැනිව කොටස් තැරැව්කාර සමාගමට ආධාර කිරීම සහ අනුබල දීම මගින් කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීමට ආයෝජකයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 13 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීමට සමාගම් දෙකකට දැන්වීම් නිකුත් කරන ලදී.

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් නොකිරීම සහ 2023 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් මෙම සමාගමට පනවන ලද පරිපාලන දඩුවම ගෙවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හේතු දැක්වීමට පොදු ලැයිස්තුගත සමාග මක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට දැන්වීම් නිකුත් කරන ලදී.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් පනවන ලද පරිපාලන දඩුවමක් ගෙවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හේතු දැක්වීමට පොදු ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට දැන්වීම් නිකුත් කරන ලදී.

2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කරමින් වෙළෙඳපොළ හැසිරවීම සම්බන්ධයෙන් ආයෝජකයෙකුට හේතු දැක්වීම සඳහා දැන්වීමක් නිකුත් කරන ලදී.

සත්‍ය නොවන, වැරදි හෝ නොමඟ යවන සුළු තොරතුරු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලබා දීම මගින් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175 (1) (ආ) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාගමකට හේතු දැක්වීම සඳහා දැන්වීමක් නිකුත් කරන ලදී.

වෙළඳපොළ අතරමැදියෙකුගේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු ලෙස සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අසත්‍ය, වැරදි හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබා දීමෙන් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175 (1) (ආ) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා කොටස් තැරැව්කාර සමාගමක අධ්‍යක්ෂවරයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත) හි 32 (1) වගන්තිය උල්ලංඝනය කරමින් අභ්‍යන්තරිකයෙකු ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා පොදු ලැයිස්තුගත සමාගමක නියෝජ්‍ය සභාපතිවරයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 183 වන වගන්තියට අනුව, ආන්තික සැපයුම්කරුවන්ට නිකුත් කරන ලද රීතිවලට අදාළව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීම 2021

අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 137 (2) (අ) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා ආයෝජන උපදේශකවරයෙකුට දැන්වීමක් නිකුත් කරන ලදී.

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 137 (2) වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා ආයෝජකයින් දෙදෙනෙකුට දැන්වීම් නිකුත් කරන ලදී.

## අනතුරු ඇඟවීම්

2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය හැකි හැසිරීමක් සම්බන්ධයෙන් ආයෝජකයෙකුට අවවාද කරන ලදී.

එක් ආයෝජන උපදේශකයෙකු තවත් ආයෝජන උපදේශකයෙකු සමඟ සිදුකල ගලපන ලද ගනුදෙනු වලට අදාළව එවැනි හැසිරීම් වලින් වැළකී සිටින ලෙස අවවාද කරන ලදී.

වැදගත් ආකාරයෙන් බලපෑමට ඉඩ ඇත්තා වූ තොරතුරු හෙළිදරව් කිරීම මගින් සිදුකල නොසැලකිලිමත් හැසිරීම සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමකට අවවාද කරන ලදී.

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 132 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය හැකි හැසිරීමෙන් වැළකී සිටින ලෙස ආයෝජකයෙකුට අවවාද කරන ලදී.

කොළඹ කොටස් හුවමාරුව හි ලැයිස්තුගත කිරීමේ රීතිවල 8.2 වගන්තියට අනුකූල නොවීම සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගම් දෙකකට අවවාද කරන ලදී.

පොදු ලැයිස්තුගත සමාගමක නියෝජ්‍ය සභාපතිවරයෙකුට 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත) හි 32 (1) වගන්තිය උල්ලංඝනය කරමින් අභ්‍යන්තර ගනුදෙනු කිරීමකට සමාන විය හැකි වෙළඳාමෙන් වැළකී සිටින ලෙස අවවාද කරන ලදී.

වෙළඳපොලේ ව්‍යාජ නොමඟ යවන පෙනුමක් ඇති කිරීමට හේතු විය හැකි ඇතැම් හැසිරීම් මගින් කොළඹ කොටස් හුවමාරුව හි ලැයිස්තුගත කර ඇති කොටස්වල මිලෙහි අනවශ්‍ය මිල අස්ථාවරත්වයක් ඇති කිරීම සම්බන්ධයෙන් ආයෝජකයෙකුට අවවාද කරන ලදී.

කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති සුරැකුම්පත් සම්බන්ධයෙන් අසත්‍ය/නොමඟ යවන තොරතුරු අඩංගු බව පෙනෙන සමාජ මාධ්‍යවල ඇතැම් පළ කිරීම් සිදු කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම, එවැනි ප්‍රකාශවල හෝ තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට සාධාරණ සැලකිල්ලක් නොගෙන, එම සුරැකුම්පත් සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීමට ආයෝජකයින්ට බලපෑම් කළ හැකි ආකාරයෙන් සහ එමගින් එම සුරැකුම්පත් සම්බන්ධයෙන් ව්‍යාජ වෙළඳපොළක් නිර්මාණය කිරීමට දායක වීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට අවවාද කරන ලදී.

## අවවාද ලිපි

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 129 (1) වගන්තියට පටහැනිව වෙළඳපොළ හැසිරවීමක් විය හැකි හැසිරීමක් සම්බන්ධයෙන් ආයෝජකයෙකුට අවවාද කරන ලදී.

## ලිපි නිකුත් කිරීම

කොටස් ගනුදෙනුවල නිරත වන විට නිසි සැලකිල්ලක් දක්වන ලෙසත්, ඔවුන්ගේ ගනුදෙනු වෙළඳපොළ/මිල හැසිරවීමකට සමාන නොවන බවට වග බලා ගන්නා ලෙසත් පුද්ගලයින් තිදෙනෙකුට ලිපි මගින් උපදෙස් දෙන ලදී.

ආයෝජකයෙකුට ඔහු සේවය කළ සංස්ථාවේ ඉදිරියේදී ගනු ලබන ආයෝජන තීරණ පිළිබඳව දැනුවත්ව සිටියදී ඇතැම් සමාග ම්වල කොටස් මිලදී ගැනීමේ සදාචාර විරෝධී හැසිරීමෙන් වැළකී සිටීමට උපදෙස් දෙන ලදී

## තරවටු කිරීමක්

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (iii) වගන්තිය ප්‍රකාරව කොටස් තැරැව්කාර සමාගමකට කොළඹ කොටස් හුවමාරුව හි වෙළඳ සහභාගිවන්නන්ගේ නීති (පෙර කොළඹ කොටස් හුවමාරුව හි කොටස් තැරැව්කාර නීති ලෙස හඳුන්වන ලද.) උල්ලංඝනය කිරීමේ හැසිරීම සම්බන්ධයෙන් තරවටු කිරීමක් නිකුත් කරන ලදී.

කොළඹ කොටස් හුවමාරුව හි වෙළඳ සහභාගි වන්නන්ගේ රීතිවල රීති 13.3 (3) සහ 13.3 (4) සහ එවකට පැවති කොළඹ කොටස් හුවමාරුව හි කොටස් තැරැව්කාර රීතිවල (දැන් කොළඹ කොටස් හුවමාරුව හි වෙළඳ සහභාගිවන්නන්ගේ රීති ලෙස හැඳින්වේ) රීති 7.1.3 (3) උල්ලංඝනය කිරීම මගින් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175 (1) (අ) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන්, කොටස් තැරැව්කාර සමාගමේ හැසිරීම සම්බන්ධයෙන්, 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (iii) වගන්තිය යටතේ තරවටු කිරීමක් නිකුත් කරන ලදී.

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175 (1) (ආ) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන්, කොටස් තැරැව්කාර සමාගමකට, 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (iii) වගන්තිය යටතේ තරවටු කිරීමක් නිකුත් කරන ලදී.

## පරිපාලන දඬුවම්

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (ii) වගන්තිය ප්‍රකාරව ආයෝජන උපදේශකයෙකුට රුපියල් මිලියන 1 ක පරිපාලන දඩයක් නියම කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අසත්‍ය සහ වැරදි තොරතුරු සැපයීම සම්බන්ධයෙන් 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (ii) වගන්තිය ප්‍රකාරව කොටස් තැරැව්කාර සමාගමක ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකුට රුපියල් මිලියන 1 ක පරිපාලන දඩයක් නියම කරන ලදී. 2024 දෙසැම්බර් 31 වන දින වන විට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එකී ගෙවීම සිදු කර නොමැත. ඉහත තීරණය අවලංගු කරන ලෙස ඉල්ලා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව ඔහු අංක 466/24 දරන රිට් අයදුම්පතක් ගොනු කළේය. අභියාචනාධිකරණ නඩුවේ ඊළඟ දිනය දක්වා මෙම කාරණය සම්බන්ධයෙන් තවදුරටත් තීරණයක් නොගන්නා ලෙස අභියාචනාධිකරණය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියෝගයක් ලබා දී ඇත.

එම නඩුව අභියාචනාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

2023 සැප්තැම්බර් 30 වන දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා අතුරු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ විසින් පනවන ලද පරිපාලන දඩය ගෙවීමට අපොහොසත් වීම සම්බන්ධයෙන්, 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 178 (1) (ii) වගන්තිය ප්‍රකාරව, ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරුන් සිව්දෙනකුට රු. 100,000/- ක පරිපාලන දඩයක් නියම කරන ලදී.

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

විමර්ශන කණ්ඩායම

### වෙනත් ආයතන වෙත යොමු කිරීම්

විමර්ශනයක සොයාගැනීම් මත පදනම්ව, ආයෝජකයෙකුගේ අරමුදල් ගනුදෙනු සම්බන්ධව 2006 අංක 19 දරන මූල්‍ය ගනුදෙනු පනත යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට යොමු කරන ලදී.

විමර්ශනයක සොයාගැනීම් මත පදනම්ව, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් සම්බන්ධ චෝදනාවට 6 කට අදාළ සොයාගැනීම් කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පරීක්ෂණයක සොයාගැනීම් මත පදනම්ව, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීතිරීතිවල 8.2 වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසියම් ලැයිස්තුගත සමාගමකට එරෙහිව කොළඹ කොටස් වෙළෙඳපොල විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය විමසීම සඳහා ඇතැම් සොයාගැනීම් ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කරන ලදී.

### බේරුම්කරණ ගිවිසුම්

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 152 (4) වගන්තිය යටතේ එක් පුද්ගලයෙකු සමඟ බේරුම්කරණ ගිවිසුමකට එළඹුණි.

### සමථයකට පත් කරන ලද වැරදි

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නීතිරීතිවල 14 වන රීතියට පටහැනිව ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පෙර විකිණීම් සිදු කර ඇති බවට සොයා ගන්නා ලද පුද්ගලයෙකුගේ අයදුම්පත මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට රුපියල් මිලියන 3.3 ක මුදලක් ගෙවීමෙන් පසු මෙම කාරණය සමථයකට පත් කරන ලදී.

පුළුල් සලකා බැලීමකින් පසු, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, පුද්ගලයන් තිදෙනෙකු විසින් සිදු කරන ලද වැරදි යම් යම් කොන්දේසි වලට යටත්ව සමථයකට පත් කිරීමට තීරණය කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට රුපියල් මිලියන 23.1 ක මුළු මුදලක් ගෙවීම මත මෙම සමථය සිදු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගොනු කරන ලද නඩුවක විත්තිකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම කොමිසම විසින් පිළිගනු ලැබුවේ, ඔහු විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට රු. 333,333.33 ක් ගෙවීමෙන් පසු මෙම කාරණයට සම්බන්ධිත තවත් කාරණයක් සමථයකට පත් කර ඇති බැවිනි.

### අධිචෝදනා පත්‍ර

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වෙළඳපල විෂමාචාරය සම්බන්ධයෙන් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට, ආයෝජකයින් හතර දෙනෙකු සම්බන්ධ තොරතුරු ගරු නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.

### කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ගත් තීරණ

පහත සඳහන් පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, තීරණය කර ඇත.

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ අභ්‍යන්තරික වෙළඳාම සම්බන්ධ විධිවිධාන සහ ඊට සම්බන්ධ වෙනත් වැරදි උල්ලංඝනය සම්බන්ධයෙන් පුද්ගලයින් සිව් දෙනෙකුට එරෙහිව;

2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකයින් තිදෙනෙකුට එරෙහිව;

2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතිය උල්ලංඝනය කරමින් පෙර විකිණීම් සිදු කිරීම සම්බන්ධයෙන් එක් ආයෝජන උපදේශකයෙකුට එරෙහිව;

2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම සම්බන්ධයෙන් ආයෝජකයන් දෙදෙනෙකුට එරෙහිව;

2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම සම්බන්ධයෙන් පුද්ගලයෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, තීරණය කර ඇත. ඔහුට ගමන් සීමා පනවා ඇත.

2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතිය උල්ලංඝනය කරමින් පෙර විකිණීම් සිදු කිරීම සම්බන්ධයෙන් සහ ඊට සම්බන්ධිත වැරදි සඳහා කොටස් තැරැව්කාර සමාගමකට සහ එක් ආයෝජකයෙකුට එරෙහිව;

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32 (6) වගන්තිය උල්ලංඝනය කරමින් අභ්‍යන්තරික වෙළඳාම කිරීම සම්බන්ධයෙන් පොදු ලැයිස්තුගත සමාගමක ප්‍රධානියෙකුට එරෙහිව;

2001 සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 14 වන රීතිය උල්ලංඝනය කරමින් පෙර විකිණීම් සිදු කිරීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකයෙකුට සහ පෙර විකිණීම් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් ඔහුගේ සේවාදායකයෙකුට එරෙහිව;

2015 දී විධානයක් මගින් නිකුත් කරන ලද වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ වන නියාමන ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කරන ලද හිටපු ආයෝජන කළමනාකරුවෙකුට, එවකට එහි අධ්‍යක්ෂවරුන් සහ එහි හිටපු ප්‍රධාන ආයෝජන නිලධාරියාට එරෙහිව.

## නඩු පැවරීම්

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී නිසාර්: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/S/5322/17

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොළ/මිල කෘත්‍රිම ලෙස හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළඳපළ/මිල හැසිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධව එම්. අයි. සම්සුදීන් සහ බෆික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී.

මෙම නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ලංකා කන්නන්ගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්බාන් සහ රවීන්ද්‍ර මල්ලවාරච්චි: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/13736/19

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදවල් වන වෙළෙඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම, වෙළඳපොළ අයථා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකවරුන් හතර දෙනෙකුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී.

මෙම නඩුව අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව සේන යද්දෙහිගේ සහ එස්.තිනාමනි: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/12639/19

2019 වර්ෂයේ දී, අභ්‍යන්තර වෙළෙඳාමට සහ එයට අනුබල දීමට එරෙහිව ආචාර්ය සේන යද්දෙහිගේ සහ එස්.තිනාමනි යන අයට දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32 වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී.

සම්බන්ධිත ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවක් වන SC Appeal 164/2023 නඩුව, මෙම නඩුවේ කටයුතු අත්හිටුවා ඇති බැවින් මෙම නඩුව බහා තබා ඇත.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ඩබ්ලිව්.කේ.එච්. වෑගපිටිය, තිලක් ද සිල්වා සහ තක්ෂිල හුලංගමුව: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/16967/20

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම ට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ඉහත සඳහන් පුද්ගලයන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදී.

2024 අප්‍රේල් 03 වන දින මෙම නඩුව අධිකරණයේ කැඳවූ අවස්තාවේ දී එය, එවකට පැවති සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51ඊ වගන්තිය ප්‍රකාරව වැරදි සමථයකට පත් කිරීම සලකා බැලීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉල්ලීමක් කරන ලදී.

එකී වැරදි හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සිදු වූ පාඩුව, වරදේ සිට ගතවී ඇති කාලය, EPF අරමුදලට සිදු වූ පාඩුව පියවීමට විත්තිකරුවන් එකඟ වීම, මෙම නඩුවට අදාළ අනෙකුත් විභාග වෙමින් පවතින නඩු සහ පෙර වැරදි නොමැති වීම සලකා බැලූ කොමිසම, විත්තිකරු විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට පහත සඳහන් මුදල් මගින් ගෙවීමෙන් පසු එම වැරදි සමථයකට පත් කිරීම සඳහා වන අයදුම්පත සලකා බැලීමට තීරණය කළේ

| | |
|---|---|
| ඩබ්ලිව්.කේ.එච්. වෑගපිටිය, සහ | මිලියන 6.6 |
| යු කේ තිලක් ද සිල්වා | මිලියන 9.9 |
| ටී අයි තක්ෂිල හුලංගමුව | මිලියන 6.6 |
| එකතුව | මිලියන 23.1 |

සේවක අර්ථසාධක අරමුදල විසින් රු. 2011 ඔක්තෝබර් 10 වන දින රු. 48/- කට මිලදී ගත් ලාෆ්ස් ගෑස් පීඑල්සී හි කොටස් මිලියන 33 ක් සඳහා ගෙවන ලද අතිරික්ත මුදල වන රුපියල් මිලියන 231 ක මුදල ඩබ්ලිව්.කේ.එච්. වෑගපිටිය, යු කේ තිලක් ද සිල්වා, ටී අයි තක්ෂිල හුලංගමුව විසින් සේවක අර්ථසාධක අරමුදල වෙත පියවීමට එකඟ වීමෙන් පසුව, ඉහත සමථයක 2024 ජූලි 19 වන දින අධිකරණය ඉදිරියේ සිදු කරන ලදී.

එදින උගත් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ නඩුව කැඳවූ විට, ඉහත සඳහන් කළ මුදල් විත්තිකරුවන් තිදෙනා විසින් විවෘත අධිකරණයේදී සේවක අර්ථසාධක අරමුදලට සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පියවන ලද අතර, එම අරමුදල් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කරන ලදී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව නිහාල් රදැල්ල: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/23337/22

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 46අ(4) වගන්තියට පටහැනිව ක්‍රියා කරමින් විමර්ශනයක් අතරතුරදී ලබාගත් ප්‍රකාශ සටහන් කිරීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දීමේදී අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් නිහාල් රදැල්ල මහතාට එරෙහිව 2022 දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පවරන ලදී.

එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 51ඊ වගන්තිය ප්‍රකාරව එම වරද සමථ කිරීම පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සලකා බලන ලෙස ඉල්ලා ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා විසින් අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී. චූදිතයාට එරෙහිව පෙර සොයාගැනීම් කිසිවක් නොමැති බව සහ මීට සම්බන්ධිත නඩුකරය දැන් වන විට සමථ කර ඇති බැවින්, 2024 නොවැම්බර් 01 වන දින කොමිෂන් සභාව විසින් නිහාල් රදැල්ලට එරෙහි මෙම නඩුකරය ඔහු විසින්

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට රු. 333,333.33 ක් බැර කිරීමෙන් අනතුරුව සමථ කරන ලදී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව රියාස් මොහොමඩ් සංගානි: මහේස්ත්‍රාත් අධිකරණය කොටුව/ 28266/2023

විදුලංකා පුද්ගලික සමාගමේ කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32(1) සහ 32(6) වගන්තිවලට පටහැනිව සිදු කල අභයන්තරික වෙළඳාම් අවස්තා දෙකක් සඳහා 2023 දී රියාස් මොහොමඩ් සංගානි යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව රියාස් මොහොමඩ් සංගානි: මහේස්ත්‍රාත් අධිකරණය කොටුව/ 33954/2024

විදුලංකා පුද්ගලික සමාගමේ කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32(1) වගන්තියට පටහැනිව සිදු කල අභයන්තරික වෙළදාම් අවස්තාවක්ස දහා 2024 දී රියාස් මොහොමඩ් සංගානි යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව රියාස් මොහොමඩ් සංගානි: මහේස්ත්‍රාත් අධිකරණය කොටුව/ 33955/2024

විදුලංකා පුද්ගලික සමාගමේ කොටස් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එවකට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 32(1) වගන්තියට පටහැනිව සිදු කල අභයන්තරික වෙළදාම් අවස්තාවක්ස දහා 2024 දී රියාස් මොහොමඩ් සංගානි යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ඩබ්ලිව්. ඊ. එම්. වීරසිංහ, ඊ. ඒ. ගුණවර්ධන, සහ එස්. එම්.ද ආර්. ගුණසේකර: මහේස්ත්‍රාත් අධිකරණය /කොටුව/28328/23

51(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 51(2) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය යටතේ වන වෙළඳපොළ නොමගයවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඩබ්ලිව්. ඊ. එම්. වීරසිංහ, ඊ. ඒ. ගුණවර්ධන, සහ එස්. එම්.ද ආර්. ගුණසේකර යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2023 වසරේ දී නඩු පවරන ලදී. පාර්ශවයන්ට සිතාසි නිකුත් කිරීමට ඇත.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/28706/23

එවකට 1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය උල්ලංඝනය කරමින් රෙග්නිස් ලංකා පොදු සමාගමේ කොටස් සම්බන්ධව වෙළඳපොළ නොමග යවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2023 වසරේ දී නඩු පවරන ලදී.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව එ. කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර: මහේස්ත්‍රාත් අධිකරණය /කොටුව / 28707 / 23

එවකට 1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය උල්ලංඝනය කරමින් ඇස්කොට් හෝල්ඩින්ග්ස් පොදු සමාග මේ කොටස් සම්බන්ධව වෙළඳපොළ නොමග යවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් කේ. ඒ. එල්. ඩී. ලංකා කන්නන්ගර යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2023 වසරේ දී නඩු පවරන ලදී.

**එය ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳ පොළ නියාමක වශයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යය, බලතල සහ යුතුකම් වලින් එකකි. ආයෝජකයින්ගේ අභිලාෂ ආරක්ෂා කරන අතරතුර සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් ප්‍රාග ධන වෙළඳපොළක් පවත්වාගෙන යාම සඳහා වන එහි කැපවීමේ කොටසක් ලෙස, වෙළඳපොළ ආයතන, වෙළඳපොළ අතරමැදියන්, ලියාපදිංචි පුද්ගලයින්, ලැයිස්තුගත පොදු සමාගම් සහ ලැයිස්තුගත විදේශීය ආයතනවල ක්‍රියාකාරකම් සෝදිසි කිරීම සහ විමර්ශනය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය පවරා ඇත.**

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ගෝවින්දසාමි රමනන් සහ කනගරත්නම් නවීන්කාන්ත්: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/28553/ 23

දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතෙහි 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි, 2001 දෙසැම්බර් මස 18 වන දින දරන ඇති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතියට පටහැනිව වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව ගෝවින්දසාමි රමනන් සහ කනගරත්නම් නවීන්කනාත් මහතාට එරෙහිව 2023 වසරේ දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පවරන ලදී. චූදිතයන්ට සිතාසි නිකුත් කර ඇත.

පසුව ගෝවින්දසාමි රමනන් යන අය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය සහ

ඔහුට නිකුත් කල සිතාසි නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා ස්ර්ශියොරාරි රිට් ආඥාවක් සහ අනෙකුත් සහන සඳහා ඉල්ලීමක් කරමින් අභියාචනාධිකරණයේ රිට් අයදුම් පතක් ගොනු කරන ලදී (පහත බලන්න CA/Writ/111/24) .

ඒ අනුව මෙම නඩුකරය මහේස්ත්‍රාත් අධිකරණය විසින් බහා තබන ලදී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ගෝවින්දසාමි රමනන්: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව / 29040 / 24

එවකට 1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය උල්ලංඝනය කරමින් ඉන්ඩස්ට්‍රියල් ඇස්පෝල්ට්ස් පොදු සමාගමේ කොටස් සම්බන්ධව වෙළඳපොළ නොමගයවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් ගෝවින්දසාමි රමනන් යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2024 වසරේ දී නඩු පවරන ලදී. චූදිතට සිතාසි නිකුත් කර ඇත.

පසුව ගෝවින්දසාමි රමනන් යන අය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය සහ ඔහුට නිකුත් කල සිතාසි නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා ස්ර්ශියොරාරි රිට් ආඥාවක් සහ අනෙකුත් සහන සඳහා ඉල්ලීමක් කරමින් අභියාචනාධිකරණයේ රිට් අයදුම් පතක් ගොනු කරන ලදී (පහත බලන්න CA/Writ/115/24).

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුකටයුතු තාවකාලිකව නවතමින් අභියාචනාධිකරණය විසින් නොතීසි සහ අතුරු තහනම් නියෝග යක් නිකුත් කරන ලදී.

ඒ අනුව මෙම නඩුකරය මහේස්ත්‍රාත් අධිකරණය විසින් බහා තබන ලදී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව අමානා ඇසෙට් ලිමිටඩ්, එහි අධ්‍යක්ෂවරු (ඒ.ඒ. එම් හරූන්, එම්. ඊ සාහීද්, එල්. යාදව්) සහ ප්‍රධාන ආයෝජන නිලධාරී (එස්.නිලම්): මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව /30437/24

ආමානා ඇසෙට් ලිමිටඩ් යන සමාගමට සහ අදාල කාල පරිච්ඡේදය තුල එහි සේවය කල අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන ආයෝජන නිලධාරී හට 2015 දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වෙළඳපොළ අතරමැදියන්ට අදාළ වන නියාමන ප්‍රමිතීන්ට පටහැනිව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2024 වසරේ දී නඩු පවරන ලදී. මෙම නියාමන ප්‍රමිතීන් 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) විධිවිධාන යටතේ පනවන ලද අවශ්‍යතා වන අතර එම CA හි 51 (3) වගන්තිය සමඟ කියවිය යුතු 51 (1) (අ) වගන්තිය යටතේ පනවන ලදී.

පාර්ශව සඳහා සිතාසි නිකුත් කිරීමට නියමිත අතර අභියාචනාධිකරණයේ පවතින CA/Wriit/203/24 යන රිට් අයදුම්පත හේතුවෙන් මෙම නඩුකරය මහේස්ත්‍රාත් අධිකරණයේ බහා තබන ලදී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ලංකා කන්නංගර සහ කපිල සෙනරත්: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/ 36468/24

දණ්ඩ නීති සංග්‍රහයේ අංක 113 (ආ) සහ 102 සමග කියවිය යුතු අංක 51 (අ) සහ එවකට 1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදවල් වන ඔනාලි හෝල්ඩින්ග්ස් පී එල් සී හී කොටස් සම්බන්ධව ක්‍රියා කරමින් 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය යටතේ වන වෙළඳපොළ නොමග යවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් සහ වෙළඳපොල නොමග යැවීමට කුමන්ත්‍රනය කිරීම හා ආධාර අනුබල දීම සඳහා ලංකා කන්නංගර සහ කපිල සෙනරත් යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2024 වසරේ දී නඩු පවරන ලදී.

පාර්ශව සඳහා සිතාසි නිකුත් කිරීමට නියමිත අතර මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/ 28831/24

51(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 51(2) වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 දිනැති අංක 1215/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 රීතිය යටතේ පාම් ගාර්ඩන් හොටෙල්ස් පී එල් සී කොටස් සම්බන්ධයෙන් ක්‍රියා කරමින් වෙළඳපොළ නොමගයවන සුලු ලෙස හැසිරවීම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා යන අයට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2024 වසරේ දී නඩු පවරන ලදී.

එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා යන අයට සිතාසි නිකුත් කර ඇත. CA/Writ/292/24 යන නඩුකරය හේතුවෙන් අභියාචනාධිකරණය මගින් මෙම නඩුකරය තාවකාලිකව නවතා ඇත.

### අධ්‍යක්ෂ ජනරාල්- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා සහ එස්. එම්. අරුන උපේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/ 28830/24

දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතෙහි 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි, 2001 දෙසැම්බර් මස 18 වන දින දරන ඇති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතියට පටහැනිව ඇසෝසියේටඩ් මෝටර් ෆයිනෑන්ස් පී එල් සී හී කොටස් සම්බන්ධව වෙළඳපොළ නොමගයවන සුලු ලෙස හැසිරවීම සහ ඒ සඳහා කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා සහ එස්. එම්. අරුන උපේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා යන අයට එරෙහිව 2024 වසරේ දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී නඩු පවරන ලදී. චූදිතයන්ට සිතාසි නිකුත් කර ඇත.

එස්. එම්. ඩී. එන්. පී බණ්ඩා සහ එස්. එම්. අරුන උපේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා යන අයට සිතාසි නිකුත් කර ඇත. CA/Writ/293/24 සහ CA/Writ/294/24 යන නඩුකර හේතුවෙන් අභියාචනාධිකරණය මගින් මෙම නඩුකරය තාවකාලිකව නවතා ඇත.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් එදිරිව කහවලගේ ධනුෂ්ක ගුණරත්න: මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/32066/24

1987 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(1)(අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි, 2001 දෙසැම්බර් 18 වන දින අංක 1215/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය උල්ලංඝනය කරමින් ලංකා වෝල්ටයිල්ස් පීඑල්සී හි කොටස් උපයෝගී කරගනිමින් වෙළඳපොල කෘත්‍රිම ලෙස හැසිරවීමේ වරද සම්බන්ධයෙන් 2024 දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කේ.ඩී. ගුණරත්නට එරෙහිව නීතිමය පියවර ගන්නා ලදී.

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

ගුණරත්න මහතාට සිතාසි නිකුත් කර ඇති අතර එම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### තාලිබ් තව්ෆීලක් අල් නකිබ් එදිරිව කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව: WP/HCCA/LA/COL/158/17(LA) - DC නඩු අංක: DSP/20/2016

1982 අංක 17 දරන සමාගම් පනතේ අනිවාර්ය විධිවිධානවලට පටහැනිව හීත් ඇන්ඩ් කම්පැනි (සිලෝන්) ලිමිටඩ් විසින් සිදු කරන ලද කොටස් නිකුතුවකින් 14% ක කොටස් හිමියෙකු වන හන්ටර් සහ සමාග මට සිදුවන බලපෑම පිළිබඳ විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය මත, පැමිණිලිකරු (මිය ගොස් ඇත) විසින් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේදී ඉහත ක්‍රියාමාර්ගය ආරම්භ කරන ලදී. දිසා අධිකරණය විසින් 2017 ඔක්තෝබර් 26 දිනැති නියෝගය මගින්, දිසා අධිකරණයට මෙම කාරණය විභාග කිරීමට අධිකරණ බලයක් නොමැති බවට පවසමින් නඩුව නිෂ්ප්‍රභ කළ අතර, පැමිණිලිකරු විසින් බස්නාහිර පළාතේ සිවිල් අභියාචනා මහාධිකරණයට අභියාචනයට අවසර ඉල්ලා නඩු පවරා ඇත.

එම නඩුව එම අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### තලිබ් තව්ෆීල්ක් අල් නකිබ් එදිරිව කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව: WP/HCCA/LA/COL/158/17 (LA) සමඟ සම්බන්ධ WP/HCCA/COL/175/2017/F

පෙත්සම්කරු (තාලිබ් තව්ෆික් අල්-නකිබ්) විසින් අභියාචනයට අවසර ඉල්ලා නඩු පවරා ඇති ඉහත සඳහන් දිසා අධිකරණ නියෝගයට එරෙහිව නඩු අංක WP/HCCA/LA/COL/158/17 (LA) යටතේ පහත සඳහන් කරුණු සහ වෙනත් කරුණු මත පදනම් ව තවත් අභියාචනයක් ගොනු කරන ලදී.

අ) කොළඹ දිසා අධිකරණයේ උගත් විනිසුරුවරයා විසින් අංක DSP/20/2016 දරණ නඩුවට අදාළව ලබාදුන් 2017 ඔක්තෝබර් 26 දිනැති නියෝගය අවලංගු කිරීම /ආපසු හැරවීම;

ආ) කොළඹ දිසා අධිකරණයට, අංක DSP/20/2016 දරණ නඩුව විභාග විභාග කිරීමට අධිකරණ බලය ඇති බව ප්‍රකාශ කරමින් නියෝගයක් නිකුත් කිරීම;

ඇ) අංක DSP/20/2016 නඩුවේ දක්වා ඇති සියලුම කරුණු මත පදනම් ව නඩු විභාගය ඉදිරියට ගෙන යාමට කොළඹ දිසා අධිකරණය වෙත නියෝගයක් නිකුත් කිරීම; හෝ

විකල්පයක් ලෙස, නඩුවේ දක්වා ඇති කරුණු පිළිබඳ විමසා තීරණය කිරීමට නිවැරදි අධිකරණය යැයි අධිකරණයට හැඟෙන අධිකරණයට නඩුව මාරු කිරීමේ නියෝගයක් නිකුත් කිරීම

නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 1. රියාස් මොහොමඩ් සංගානි එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/301/2023

පෙත්සම්කරු විසින් සිදු කරන ලද අභ්‍යන්තර ගනුදෙනු වැරදි හතර සමනය කිරීම සඳහා කොමිසම විසින් පනවන ලද මුදලේ ප්‍රමාණය අභියෝගයට ලක් කරමින් රියාස් මොහොමඩ් සංගානි (පෙත්සම්කරු) විසින් අභියාචනාධිකරණයට මෙම අයදුම්පත ගොනු කරන ලදී. ඔහු විසින්, පහත සඳහන් කරුණු සහ වෙනත් කරුණු මත පදනම් ව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට මඟ පෙන්වීම සහ/හෝ බල කිරීම සඳහා අභියාචනාධිකරණයෙන් මන්ඩාමුස් රිට් ආඥා ඉල්ලා සිටින ලදී.

අ) පෙත්සම්කරු විසින් උපයන ලද ඕනෑම ලාභයකට සමානුපාතික හා සාධාරණ මුදලකට පෙත්සම්කරු විසින් සිදු කරන ලද වැරදි හතර සමථයකට පත් කිරීම; සහ

ආ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුට එරෙහිව කාරණය සමථයකට පත් කිරීමට ගත් තීරණය සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කිසිදු තොරතුරක් ප්‍රකාශයට පත් නොකිරීම.

මෙම වසරේදී අභියාචනාධිකරණය විසින් නඩුව නිෂ්ප්‍රභ කරන ලදී.

### 2. රියාස් මොහොමඩ් සංගානි එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/797/2023

පෙත්සම්කරු විසින් සිදු කරන ලද අභ්‍යන්තර ගනුදෙනු වැරදි හතර සමනය කිරීම සඳහා කොමිසම විසින් පනවන ලද මුදලේ ප්‍රමාණය අභියෝගයට ලක් කරමින් රියාස් මොහොමඩ් සංගානි (පෙත්සම්කරු) විසින් අභියාචනාධිකරණයට මෙම අයදුම්පත ගොනු කරන ලදී. ඔහු විසින්, පහත සඳහන් කරුණු සහ වෙනත් කරුණු මත පදනම් ව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට මඟ පෙන්වීම සහ/හෝ බල කිරීම සඳහා අභියාචනාධිකරණයෙන් මන්ඩාමුස් රිට් ආඥා ඉල්ලා සිටින ලදී.

අ) පෙත්සම්කරු විසින් උපයන ලද ඕනෑම ලාභයකට සමානුපාතික හා සාධාරණ මුදලකට පෙත්සම්කරු විසින් සිදු කරන ලද වැරදි හතර සමථයකට පත් කිරීම; සහ

ආ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුට එරෙහිව කාරණය සමථයකට පත් කිරීමට ගත් තීරණය සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කිසිදු තොරතුරක් ප්‍රකාශයට පත් නොකිරීම.

මෙම වසරේදී අභියාචනාධිකරණය විසින් නඩුව නිෂ්ප්‍රභ කරන ලදී.

### 3. තුෂාන් වික්‍රමසිංහ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය; CA/Writ/466/2024

වික්‍රමසිංහ මහතා විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පළමුවන වගඋත්තරකරු ලෙසත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා දෙවන වගඋත්තරකරු ලෙසත් නම් කරමින්, කොමිෂන් සභාව විසින් (වෙනත් කරුණු අතර) පනවන ලද රු. 1,000,000/- ක පරිපාලන දඩය නොගෙවීම සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඔහුට එරෙහිව තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම වැළැක්වීම සඳහා ඉහත රිට් අයදුම්පත ගොනු කරන ලදී.

කොමිෂන් සභාව විසින් වික්‍රමසිංහ මහතා වෙත ඉහත පරිපාලනමය දණ්ඩනය පනවන ලද්දේ ඔහු විසින් කැපිටල් ට්‍රස්ට් සෙක්‍යුරිටීස් ප්‍රයිවට් ලිමිටඩ්හි කොටස් තැරැව්කාර බලපත්‍රය අලුත් කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ පුද්ගලයෙකු ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද 2023 ජූලි 21 දිනැති ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ අසත්‍ය සහ වැරදි තොරතුරු සැපයීම මගින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 175(1)(ඉ) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි.

මෙම කාරණය අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 4. ගෝවින්දසාමි රමනන් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/60/2024

ගෝවින්දසාමි රමනන් විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරමින් 2024 ජනවාරි මාසයේදී ඉහත අභියාචනාධිකරණ රිට් අයදුම්පත ගොනු කළේ, 1995 (සංශෝධිත) සමාගම් පවරාගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සංග්‍රහයේ රීති 30(1) උල්ලංඝනය කළ සමාග මක හැසිරීම සම්බන්ධයෙන්,

එම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස තමාට නිකුත් කරන ලද ක්‍රියාමාර්ග නිවේදනය අවලංගු කිරීමට සහ 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51(3) වගන්තිය ප්‍රකාරව ඔහුට නිකුත් කරන ලද හේතු දැක්වීමේ දැන්වීම අවලංගු කිරීමට සර්ටියෝරාරි ආඥාවක් ඉල්ලා සිටිමිනි.

මෙම කාරණයේ නව වර්ධනයන් හේතුවෙන් ඉහත සඳහන් උල්ලංඝනයන් සම්බන්ධයෙන් අදාළ සමාගමට එරෙහිව ක්‍රියාමාර්ග නොගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගත් තීරණය සැලකිල්ලට ගනිමින්, පෙත්සම්කරු ඔහු විසින් ගොනු කරන ලද රිට් අයදුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.

### 5. අමානා ඇසෙට් ලිමිටඩ් සහ ලව් යාදව් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ වෙනත් අය; CA/Writ/203/24

2024 වර්ෂයේ දී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 51 (3) වගන්තිය සමඟ කියවිය යුතු 51 (1) (අ) වගන්තියේ අවශ්‍යතා යටතට ගැනෙන , කොමිෂන් සභාව විසින් 2015 දී වෙළඳපොළ අතරමැදියන්ට නිකුත් කරන ලද නියාමන ප්‍රමිතීන්ට අදාළ විධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අමානා ඇසෙට් ලිමිටඩ්, එහි අධ්‍යක්ෂවරුන් (ඒ.ඒ.එම්.හරූන්, එම්.ඊ.සහීඩ්, එල්.යාදව්) සහ හිටපු ප්‍රධාන ආයෝජන නිලධාරී (එස්.නිලාම්) යන අයට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ දී නීතිමය පියවර ගන්නා ලදී.

එවැනි තත්වයන් යටතේ, අමානා ඇසෙට් ලිමිටඩ් සහ ලව් යාදව් විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ රිට් අයදුම්පතක් ගොනු කරන ලද අතර එමගින්, වෙනත් කරුණු අතර, කොමිෂන් සභාව විසින් ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වැළැක්වීමට සහ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ සිදුවන ඕනෑම ක්‍රියාමාර්ග යක් අත්හිටුවීමට ඉල්ලා සිටින ලදී. ඒ අනුව අභියාචනාධිකරණය විසින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අතුරු නියෝගයක් නිකුත් කරන ලද අතර එම කාරණය අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 6. මිලංක ඉඳුරුවගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/171/24

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ රීතිවල 14 වන රීතිය උල්ලංඝනය කිරීමෙන් පෙත්සම්කරු කොටස්වල පෙර විකිණීම් (front running) වරද සිදු කර ඇති බවට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ තීරණය සහ එම උල්ලංඝනය සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නඩු පැවරීමට ගත් තීරණය අවලංගු කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු මෙම රිට් අයදුම්පත ගොනු කර ඇත. පෙත්සම්කරුගේ ඒකපාර්ශ්වික ඉල්ලීම අසා අභියාචනාධිකරණය විසින් ඇතැම් අතුරු නියෝග නිකුත් කළ අතර එම කාරණය අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 7. නාගරික සංවර්ධන අධිකාරිය (UDA) එදිරිව ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගම සහ වෙනත් අය: HC (Civil)/11/2021/CO

ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගමෙහි ඡන්ද අයිතියෙන් 5% කට නොඅඩු හිමි කොටස් හිමියෙකු වන නාගරික සංවර්ධන අධිකාරිය විසින්, සමාගම් පනතේ 226, 520 සහ 521 වගන්ති සමඟ කියවිය යුතු, පනතේ 225 වන වගන්තිය යටතේ, ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගමට එරෙහිව බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයෙහි (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම) නඩුවක් ගොනු කරන ලදී.

පාලනයේ සිදු වූ ප්‍රමාණාත්මක වෙනසක් හේතුවෙන් ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගමෙහි කටයුතු සමාගමේ ලැදියාවන්ට අගතියක් වන ආකාරයෙන් සිදුවෙමින් පවතින බවට නාගරික සංවර්ධන අධිකාරිය විසින් චෝදනා කරන ලදී. මෙම පාලනයේ ප්‍රමාණාත්මක වෙනස සිදු වූයේ ලංකා රියැල්ටි ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම විසින් අනිවාර්ය කොටස් නිකුතුවක් හරහා ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගමෙහි පාලනය අත්පත් කර ගැනීම හේතුවෙනි.

නාගරික සංවර්ධන අධිකාරිය (පෙත්සම්කරු) විසින්, ඔනෙලි හෝල්ඩින්ග්ස් සමාගම, ලංකා රියැල්ටි ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, රේනුකා කැපිටල් සමාගම, PW කෝපරේට් කෝපරේට් සෙක්‍රටේරියල් පුද්ගලික සමාගම, සහ කොළඹ කොටස් හුවමාරුව පිළිවෙලින්, පළමු සිට පස්වන වගඋත්තරකරුවන් ලෙස නම් කරන ලද අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හයවන වගඋත්තරකරු විය.

අධිකරණය විසින්, 2024 පෙබරවාරි මාසයේ දී අවසාන අධිකරණ නියෝගය ලබා දුන් අවස්ථාවේ දී, පෙත්සම්කරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව කිසිදු සහනයක් ඉල්ලා නොමැති බැවින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම නඩුවෙන් නිදහස් කරන ලදී.

### 8. ලංකා රියැලිටි ඉන්වෙස්ට්මන්ට් සමාගම එදිරිව නාගරික සංවර්ධන අධිකාරිය සහ වෙනත් අය: CA RII Application No: 34/2024

ලංකා රියැලිටි ඉන්වෙස්ට්මන්ට් සමාගම (පෙත්සම්කරු) විසින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිව් වන වගඋත්තරකරු ලෙස නම් කරමින්, අභියාචනාධිකරණයට ඉහත අයදුම්පත ගොනු කරන ලද අතර, එමගින් වෙනත් කරුණු අතර පහත සඳහන් සහන ඉල්ලා සිටී:

අ) 2024 පෙබරවාරි 15 වන දින වාණිජ මහාධිකරණයේ අංක HC CIVIl/11/2021/CO දරන නඩුවේදී (නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොනු කරන ලද), ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අවලංගු කරමින් නියෝගයක් ලබා දීම; සහ

ආ) පෙත්සම්කරුට එරෙහිව වලංගු පැමිණිල්ලක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කර, කොමිෂන් සභාව විසින් ඒ සඳහා තීන්දුවක් ලබා දෙන තෙක්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද අයදුම්පත විභාග කර තීරණය කිරීමට කොළඹ පිහිටි බස්නාහිර පළාත් (සිවිල්) මහාධිකරණයට අධිකරණ බලයක් නොමැති බව ප්‍රකාශ කරමින් නියෝග යක් ලබා දීම.

මෙම නඩුවේදී, පෙත්සම්කරු විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව කිසිදු සහනයක් ඉල්ලා නොමැති අතර, කාරණය අභියාචනාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 9. සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව: CA/ Writ/417/2017

සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව: SC/Appeal/164/23

### (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව සේන යද්දෙහිගේ සහ S. තිනාමනි - මහේස්ත්‍රාත් අධිකරණය/කොටුව/12639/19 නඩුව සමඟ සම්බන්ධයි)

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආචාර්ය සේන යද්දෙහිගේ සහ සුබ්‍රමනියම් තිනමනි මහතාට එරෙහිව Kegalle Plantations PLC හි කොටස් සම්බන්ධයෙන් අභ්‍යන්තරික තැනැත්තන් විසින් ගනුදෙනු කිරීම සහ ඒ සඳහා ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

(MC/Fort/12639/19) හමුවේ ගොනු කළ නඩුවට ප්‍රතිචාර වශයෙන්, එහි පළමු චූදිත විසින් අභියාචනාධිකරණය හමුවේ රිට් පෙත්සමක් ගොනු කරමින්, වෙනත් කරුණු අතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අත්හිටුවන ලෙස ඉල්ලා සිටියේය. අභියාචනාධිකරණය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අත්හිටුවීම ප්‍රතික්ෂේප කළ අතර, නොතීසි සම්බන්ධයෙන් ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය.

ඉන්පසුව, චූදිත විසින් එම නියෝගය අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විශේෂ අවසරයක් ලබා ගැනීම සඳහා අභියාචනයක් ගොනු කළ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය පෙත්සම්කරුගේ ඉල්ලීම පිළිගනිමින් නඩුව විභාගයට නියම කර ඇත. මෙම නඩුව දැනට අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### 30. ෂෝ වොලස් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී සහ ශමින්ද්‍ර රාජපියා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, චින්තක මෙන්ඩිස් සහ වෙනත් අය: CA/Writ/460/2023

පෙත්සම්කරුවන් විසින්, වෙනත් කරුණු අතර, 1 වැනි වගඋත්තරකරු විසින් පෙත්සම්කරුවන්ට නිකුත් කළ "නඩු ක්‍රියාමාර්ග පිළිබඳ දැන්වීම්" වලට එරෙහිව සර්ටියොරාරි ආඥාවක් ලබා ගැනීම සඳහා සහ 1 වැනි වගඋත්තරකරු සහ/හෝ 2 වැනි වගඋත්තරකරු සහ/හෝ 3 වැනි වගඋත්තරකරු විසින් පෙත්සම්කරුවන්ට එරෙහිව අපරාධික හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම වැළැක්වීම සඳහා තහනම් නියෝගයක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් ගොනු කර ඇත.

මෙම නඩුව දැනට අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### 31. වෛද්‍ය සෙනෙවිරත්න මුදියන්සේලාගේ ධම්මික නරේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/292/2024

වෙළඳපොල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය සෙනෙවිරත්න මුදියන්සේලාගේ ධම්මික නරේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩාට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගොනු කළ (MC/Fort/28831/24) නඩුවට ප්‍රතිචාර වශයෙන්, මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ වෙනත් කරුණු අතර නඩු කටයුතු අත්හිටුවන ලෙස ඉල්ලා, විත්තිකරු අභියාචනාධිකරණය හමුවේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව රිට් අයදුම්පතක් ගොනු කළේය.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී

### 32. වෛද්‍ය සෙනෙවිරත්න මුදියන්සේලාගේ ධම්මික නරේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/293/2024

වෙළඳපොල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වෛද්‍ය සෙනෙවිරත්න මුදියන්සේලාගේ ධම්මික නරේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩාට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගොනු කළ (MC/Fort/28830/24) නඩුවට ප්‍රතිචාර වශයෙන්, මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ වෙනත් කරුණු අතර නඩු කටයුතු අත්හිටුවන ලෙස ඉල්ලා, විත්තිකරු අභියාචනාධිකරණය හමුවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව රිට් අයදුම්පතක් ගොනු කළේය.

මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී

### 33. සෙනෙවිරත්න මුදියන්සේලාගේ අරුණ උපේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/294/2024

වෙළඳපොල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් සහ ඒ සඳහා ආධාර කිරීම සහ අනුබල දීම සම්බන්ධයෙන් වෛද්‍ය සෙනෙවිරත්න මුදියන්සේලාගේ ධම්මික නරේන්ද්‍ර ප්‍රේමරත්න බණ්ඩාට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගොනු කළ (MC/Fort/28830/24) නඩුවට ප්‍රතිචාර වශයෙන්, මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ වෙනත් කරුණු අතර නඩු කටයුතු අත්හිටුවන ලෙස ඉල්ලා, විත්තිකරු අභියාචනාධිකරණය හමුවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව රිට් අයදුම්පතක් ගොනු කළේය. මෙම නඩුව අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී

### 34. ජී. රමණන් එදිරිව ගරු කොළඹ කොටුව මහේස්ත්‍රාත්තුමන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, චින්තක මෙන්ඩිස් සහ වෙනත් අය: CA/Writ/111/2024

පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණය හමුවේ රිට් අයදුම්පතක් ගොනු කර ඇති අතර, වෙනත් කරුණු අතර, වෙළඳපොල නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනු කරන ලද නඩුවකදී තමන්ට සහ වෙනත් අයකුට එරෙහිව නිකුත් කළ ගරු මහේස්ත්‍රාත්තුමාගේ නියෝගය සහ සිතාසි අවලංගු කරන ලෙස ඉල්ලා සර්ටියොරාරි ආඥාවක් ලබා ගැනීමට ඉල්ලා ඊට අදාල තීරණ (contested decisions) හා නිකුත් කළ ක්‍රියාමාර්ග දැන්වීම මත පදනම්ව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුට එරෙහිව ඉදිරියට ගන්නා ක්‍රියාමාර්ග වැලක්වීමට තහනම් ආඥාවක්ද ඉල්ලා ඇත. අධිකරණය විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව දැන්වීම් සහ අතුරු නියෝග නිකුත් කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදි. අදාළ අතුරු නියෝගයට විරෝධය පළ කරමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, අධ්‍යක්ෂ ජනරාල්තුමා, නීතිපතිතුමා සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ද ගොනු කරන ලදී. රිට් අයදුම්පතද, එයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අභියාචනයද අධිකරණවල ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 35. ජී. රමණන් එදිරිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගරු මහේස්ත්‍රාත්තුමන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, චින්තක මෙන්ඩිස් සහ වෙනත් අය: CA/Writ/115/2024

පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණය හමුවේ රිට් අයදුම්පතක් ගොනු කර ඇති අතර, වෙනත් කරුණු අතර, වෙළෙඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනු කරන ලද නඩුවකදී තමන්ට එරෙහිව නිකුත් කළ ගරු මහේස්ත්‍රාත්තුමාගේ නියෝගය සහ සිතාසි අවලංගු කරන ලෙස ඉල්ලා සර්ටියොරාරි ආඥාවක් ලබා ගැනීම ඉල්ලා ඉල්ලා ඊට අදාල තීරණ (contested decisions) හා නිකුත් කළ ක්‍රියාමාර්ග දැන්වීම මත පදනම්ව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුට එරෙහිව ඉදිරියට ගන්නා ක්‍රියාමාර්ග වලක්වන ලෙස තහනම් ආඥාවක්ද ඉල්ලා ඇත. අධිකරණය විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව දැන්වීම් සහ අතුරු නියෝග නිකුත්

කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදි. අදාළ අතුරු නියෝගයට විරෝධය පළ කරමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, අධ්‍යක්ෂ ජනරාල්තුමා, නීතිපතිතුමා සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ගොනු කරන ලදී. රිට් අයදුම්පතද, එයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අභියාචනයද අධිකරණවල ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 36. කැපිටල් ඇලායන්ස් සිකියුරිටීස් (පුද්) සමාගම එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/789/24

පෙත්සම්කරු විසින් මෙම රිට් අයදුම්පත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව ගොනු කර ඇත්තේ වෙනත් කරුණු අතර, පෙත්සම්කරු වන කොටස් තැරැව්කාර සමාගමට එරෙහිව සේවාදායකයෙකු විසින් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් පුද්ගල විභාග යක් පවත්වන ලෙස කොළඹ කොටස් වෙළඳපොළට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කළ විධානය සර්ටියොරාරි ආඥාවක් මඟින් අවලංගු කරන ලෙසටය. මෙම නඩුව වසර අවසානයේදී අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 37. ජී. සී. එස්. රමනායක සහ තවත් එක් අයෙකු එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/411/2024

LOLC සිකියුරිටීස් ලිමිටඩ් විසින් තම CDS ගිණුමේ අනවසර කොටස් මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් පෙත්සම්කරුට මූල්‍යමය පාඩු සිදු වූ බවට චෝදනා කරමින් පෙත්සම්කරුවන් විසින් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කල අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව (CSE), CSE හි ප්‍රධාන විධායක නිලධාරී, මධ්‍යම තැන්පතු පද්ධතිය (පුද්ගලික) සමාගම, LOLC සිකියුරිටීස් ලිමිටඩ් සහ එහි නිලධාරීන් තිදෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. පෙත්සම්කරුවන් ඉල්ලා සිටි සහන අතරට ඇතැම් ප්‍රකාශන ප්‍රදානය කිරීම සහ ඔවුන්ගේ CDS ගිණුම යථා තත්ත්වයට පත් කිරීම සඳහා මැන්ඩමස් ආඥාවක් ලබා ගැනීමට, බලහත්කාර විකුණුම් සහ පොලී ගාස්තු ආපසු හැරවීම සහ විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම ඇතුළත් විය. කොටස්/වත්කම් බලහත්කාරයෙන් විකිණීම සහ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග වැළැක්වීම, අනවසර මිලදී ගැනීම් වලට පෙර පැවති තත්ත්වයට CDS ගිණුම ප්‍රතිස්ථාපනය කිරීම සහ අධීක්ෂණය යටතේ ආයෝජනාවලිය මාරු කිරීමට ඉඩ දීම සඳහා අධිකරණය අතුරු නියෝග නිකුත් කළේය. කෙසේ වෙතත්, LOLC සිකියුරිටීස් ලිමිටඩ් සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු නිකුත් කරන ලද අතුරු නියෝගවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් අතුරු නියෝග ඉවත දමා, නිකුත් කරන ලද නොතීසිය බාධාවකින් තොරව අභියාචනාධිකරණයට නැවත යොමු කරන ලදී (පහත SC Spl LA 40/2024 බලන්න). මෙම නඩුව අභියාචනාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 38. එම්.ටී.එම්.ෂුයිබ්, ඩබ්ලිව්.කේ.ජී.අබේසිංහ සහ පී.කේ.ආර්.දේශප්‍රිය එස්ඊසී සහ තවත් අයට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/189/24

එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පීඑල්සී හි කොටස් හිමියන් තිදෙනෙකු විසින් ලැයිස්තුගත සමාගම නිල ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අභියෝගයට ලක් කරමින් සහ වෙනත් කරුණු අතර එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පීඑල්සී එම ක්‍රියාවලිය වැළැක්වීමට නඩුවක් ගොනු කළහ. නඩුවෙහි කරුණු තහවුරු කිරීමෙන් අනතුරුව පෙත්සම්කරුවන්ගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලදී.

### 39.ඒ. කේ. අමුණුගම සහ වෙනත් නව දෙනෙක් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/312/24

එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පීඑල්සී සමාගම විසින් ගොනු කළ ලැයිස්තුගත සමාගම නිල ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ අයදුම්පත සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබාදීම වළක්වා ගැනීමට සඳහා පෙත්සම්කරුවන් (අවාසිය වූ කොටස් හිමිකරුවන් ලෙස හැඳින්වෙන) විසින් මෙම රිට් අයදුම්පත ගොනු කර ඇත. නඩුව දැනට අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### 40. එල් . ඩී පරණමාන සහ වෙනත් 7 දෙනෙක් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: CA/Writ/339/24

එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පීඑල්සී සමාගම විසින් ගොනු කළ ලැයිස්තුගත සමාගම නිල ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ අයදුම්පත සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබාදීම වළක්වා ගැනීම සඳහා පෙත්සම්කරුවන් (අවාසිය වූ කොටස් හිමිකරුවන් ලෙස හැඳින්වෙන) විසින් මෙම රිට් අයදුම්පත ගොනු කර ඇත. නඩුව දැනට අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

### 41. කේ. සී. විග්නරාජා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ වෙනත් අය: SC CHC Appeal 70/2018

පෙත්සම්කරු කේ. සී. විග්නරාජා Standard Capital PLC සහ එහි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කොළඹ වාණිජ මහාධිකරණය ගොනු කර ඇති CHC/CO/09/2016 ව්‍යුත්පන්න නඩුවක් සම්බන්ධයෙන් පෙත්සම්කරු ඉල්ලා සිටි සහනයන් ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව පෙත්සම්කරු විසින් මෙම අයදුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කර ඇත. මෙම නඩුව අතර, පෙත්සම්කරු පවසන්නේ තමන් අනිතික ලෙස සමාග මේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද විගණන කමිටු සභාපති ලෙසද ඉවත් කළ බවයි. පෙත්සම්කරු-අභියාචකයා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 7 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇත්තේ, එය කොළඹ කොටස් හුවමාරුව සහ එහි ලැයිස්තුගත සමාගම් පාලනය කරන නියාමන අධිකාරියක් වශයෙන් සැලකෙන හෙයිනි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව කිසිඳු සහනයක් පෙත්සම්කරු-අභියාචකයා ඉල්ලා නොමැත. පෙත්සම්කරු-අභියාචකයා අභාවප්‍රාප්ත වීමෙන් අනතුරුව, මෙම අයදුම්පත 2024 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී.

### 42. එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් එදිරිව ජී. සී. එස්. රාමනායක සහ වෙනත් අය: SC Spl LA අයදුම්පත අංක: 40/2024

එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් විසින් පෙත්සම්කරුවන්ගේ මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුමට අනවසර කොටස් මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් පෙත්සම්කරුවන්ට මූල්‍යමය පාඩු සිදු වූ බවට දක්වමින් පෙත්සම්කරුවන් අභියාචනාධිකරණයේ රිට් අයදුම්පතක් ගොනු කර ඇත. එකී පෙත්සමේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරී, මධ්‍යම තැන්පතු පද්ධතිය (පුද්ගලික) සමාගම, එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් සහ එහි නිලධාරීන් තිදෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. පෙත්සම්කරුවන් අයැද සිටි සහන අතර ඇතැම් ප්‍රකාශන ප්‍රදානය කිරීම සහ ඔවුන්ගේ මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම යථා තත්ත්වයට පත් කිරීම සඳහා මැන්ඩාමුස් රිට් ආඥාවක් ලබා ගැනීමට, බලහත්කාර විකුණුම් සහ පොලී ගාස්තු ආපසු හැරවීම සහ විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම ආදී සහනයන් ඇතුළත් වේ. කොටස්/වත්කම් බලහත්කාරයෙන් විකිණීම සහ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග වළක්වමින්, අනවසර මිලදී ගැනීම් වලට පෙර පැවති තත්ත්වයට මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

ප්‍රතිස්ථාපනය කිරීමට සහ අධීක්ෂණය යටතේ ආයෝජනාවලිය මාරු කිරීමට ඉඩ දෙමින් අධිකරණය අතුරු නියෝග නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු එකී නිකුත් කරන ලද අතුරු නියෝගවලට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ අතර, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනාධිකරණයේ ලබා දුන් අතුරු නියෝග ඉවත දමා, නිකුත් කරන ලද නොතීසියට බාධාවකින් තොරව අභියාචනාධිකරණයට නැවත යොමු කරන ලදී.

### 43. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ නීතිපති එදිරිව කැපිටල් ට්‍රස්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සහ තුෂාන් වික්‍රමසිංහ: (SC Spl LA 21/2024 (CA/Writ/465/2022 වෙතින් අභියාචනය)

2 වන පෙත්සම්කාර - වගඋත්තරකරුට එරෙහිව අපරාධ නඩු පැවරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණය සහ ඊට අදාල නඩු කටයුතු පැවරීමේ දැන්වීම අවලංගු කරමින් 2 වන පෙත්සම්කාර - වගඋත්තරකරු විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද රිට් අයදුම්පතක් (CA/Writ/465/22) සම්බන්ධයෙන් වන අභියාචනාධිකරණ තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙම අභියාචනා අවසර අයදුම්පත ගොනු කර ඇත.

### 44. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ජී. රමනන් සහ වෙනත් අය: SC Spl LA අයදුම්පත අංක 117/2024 (CA/Writ/111/2024 වෙතින් අභියාචනය)

පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණය ඉදිරියේ රිට් අයදුම්පතක් ගොනුකරන ලද අතර එමගින්, වෙළඳපොළ කෘත්‍රිම ලෙස හැසිරවීම සහ ඒ සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කිරීමකට අදාළව චෝදනා ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුට සහ තවත් අයෙකුට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලද නඩුවකදී ගරු මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද නියෝගය සහ පෙත්සම්කරු වෙත නිකුත් කළ සිතාසි අවලංගු කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුට එරෙහිව ආරවුල් කරන ලද තීරණ සහ නඩු පැවරීමේ නිවේදන මත තවත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නවතාලමින් ප්‍රොහිබිෂන් රිට් ආඥාවක් ද ඉල්ලා සිටින ලදී. ගරු අභියාචනාධිකරණය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු නවතාලමින් වගඋත්තරකරුවන්ට එරෙහිව අතුරු නියෝගයන් සහ නොතීසි නිකුත් කරන ලදී.

මේ වන විට අදාළ අතුරු නියෝග යට විරෝධය පළ කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, එහි අධ්‍යක්ෂක ජනරාල්, නීතිපතිවරයා සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත විශේෂ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පතක් ගොනු කර ඇති අතර, එය කරුණු තහවුරු කිරීම සඳහා නියමිතව පවතී.

### 45. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ජී. රමනන් සහ වෙනත් අය: SC Spl LA අයදුම්පත අංක 118/2024 (CA/Writ/115/2024 වෙතින් අභියාචනය)

පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණය ඉදිරියේ රිට් අයදුම්පතක් ගොනුකරන ලද අතර එමගින්, වෙළඳපොළ නොමග යවන සුලු ආකාරයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පෙත්සම්කරුට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලද නඩුවකදී ගරු මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද නියෝගය සහ පෙත්සම්කරු වෙත නිකුත් කළ සිතාසි අවලංගු කරමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුට එරෙහිව ආරවුල් කරන ලද තීරණ සහ නඩු පැවරීමේ නිවේදනය මත තවත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නවතාලමින් ප්‍රොහිබිෂන් රිට් ආඥාවක් ද ඉල්ලා සිටින ලදී. ගරු අභියාචනාධිකරණය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු නවතාලමින් වගඋත්තරකරුවන්ට එරෙහිව අතුරු නියෝග යන් සහ නොතීසි නිකුත් කරන ලදී.

මේ වන විට අදාළ අතුරු නියෝගයට විරෝධය පළ කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, එහි අධ්‍යක්ෂක ජනරාල්, නීතිපතිවරයා සහ තවත් වගඋත්තරකරුවන් දෙදෙනෙකු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත විශේෂ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පතක් ගොනු කර ඇති අතර, එය කරුණු තහවුරු කිරීම සඳහා නියමිතව පවතී.

### 46. පංචලිංගම් ඇසෝසියේට්ස් (පුද්) සමාගම එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය SC SPL LA අයදුම්පත් අංක 177/2020 දැන් SC අභියාචනය 40/2024

පෙත්සම්කාර සමාගම වන පන්චලිංගම් ඇසෝසියේට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී සමාගමට අයත්ව තිබූ එච් එන් බී පී.එල්.සී. හි කොටස් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කල යම් නියමයන්ට එරෙහිව සහ එකී නියමයන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටිමින් සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරවා ගැනීම සඳහා අභියාචනාධිකරණය ඉදිරියේ පෙත්සමක් ගොනු කරන ලදී.

මුල්‍ය මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා, බැංකු සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළු සිව් දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස පෙත්සම්කරු විසින් නම් කරන ලදී. අභියාචනාධිකරණ විසින් එකී ඉල්ලා සිටින ලද රිට් ආඥාවන් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අතර, අනතුරුව, පෙත්සම්කරු විසින් එකී නියෝගයට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත විශේෂ අභියාචනයට අවසර ඉල්ලීමේ ඉල්ලුම්පතක් ගොනු කරන ලදී. මෙමගින් පෙත්සම්කරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙතින් කිසිදු සහනයක් ඉල්ලා නොමැත. මෙම නඩුව මේ වන විට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවතී.

### 47. ඉංජිනේරු ජී. කපිල රේණුක පෙරේරා එදිරිව නීතිපති සහ වෙනත් අය: SC/FR/182/2021

පෙත්සම්කරු විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ සෙලෙන්දිව ඉන්වෙට්මන්ට්ස් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (නම්කරන ලද 7 වන වගඋත්තරකරු) ඇතුළු 32 දෙනෙකු වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී. එකී පෙත්සම මගින් පෙත්සම්කරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුරක්ෂිත කර ඇති සිය මූලික අයිතිවාසිකම් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක් වී ඇති බවට ප්‍රකාශනයක් අයැද ඇත. තවද, සෙලෙන්දිව ඉන්වෙට්මන්ට්ස් ලිමිටඩ් පිහිටුවීම සම්බන්ධයෙන් ගන්නා ලද 2020 මාර්තු මස 06 දිනැති කැබිනට් තීරණය ශූන්‍ය සහ බලරහිත කරන ලෙසද පෙත්සම්කරු සිය පෙත්සම මගින් ඉල්ලා සිටින ලදී. එකී සමාගම රජය සතු නව දේපළ සංවර්ධන සමාගමක් වන අතර, රජය සතු සත්කාරක ක්ෂේත්‍ර කළඹ සුදුසු ප්‍රතිව්‍යුහගත කිරීම් තුළින් ප්‍රශස්ත කාර්ය සාධන මට්ටමට පරිවර්තනය කිරීමේ මූලික අරමුණ ඇති එකී සමාගමේ හිමිකාරිත්වය 100% මහා භාණ්ඩාගාරය සතු වේ. පෙත්සම්කරු මෙම නඩුව මගින් එකී සමාගම කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම වළක්වාලීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අතුරු නියෝගයක් ඉල්ලා ඇත. මෙම නඩුව මේ වන විට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවතී.

### 48. වජිර විජේගුණවර්ධන එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: SC/FR/62/2024

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වන පෙත්සම්කරු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය සහ/හෝ 14(1)(උ) වගන්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් සහනයන් ඉල්ලා 2024 පෙබරවාරි මස මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය මෙකී පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස දක්වා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ කරුණු තහවුරු කල පසු 2024 ජූනි මස 24 වන දින ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී පෙත්සම ඉදිරියට ගෙන යාමට අවසර ප්‍රතික්ෂේප කර ඇත.

### 49. ටී. එච්. එදිරිතිලක එදිරිව එල් ටී එල් හෝල්ඩින්ස්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් 17 දෙනෙක්: SC/FR/263/2024

එල් ටී එල් හෝල්ඩින්ස් සමාගම විගණනය කිරීමට සහ ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට විගණකාධිපතිවරයාට නියෝග කරන ලෙස ඉල්ලා සහ එකී විගණනය සිදු කරන තෙක් එල් ටී එල් හෝල්ඩින්ස්හි මූලික මහජන නිකුතුව පැවැත්වීම වැළැක්වීමට නියෝග කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු විසින් මහජන අවශ්‍යතා නඩු පවරන පෙත්සමක් ගොනු කර ඇත. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී පෙත්සම ඉදිරියට ගෙන යාමට අවසර ප්‍රතික්ෂේප කර නිෂ්ප්‍රභා කර ඇත.

### 50. රියාස් මොහොමඩ් සංගානි එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: SC Spl LA 319/2024 (CA/Writ/797/2023 වෙතින් අභියාචනය)

CA/Writ/797/2023 යන රිට් අයදුම්පත සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නියෝගය අභියෝගයට ලක්කරමින් රියාස් සංගානි විසින් මෙම අභියාචනා අවසර අයදුම්පත ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ එකී කොමිෂන් සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස මෙහි දක්වා ඇත.

මෙම නඩුව කරුණු තහවුරු කිරීම සඳහා නියමිතව පවතී.

### 51.රියාස් මොහොමඩ් සංගානි එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ වෙනත් අය: SC Spl LA 318/2024 (CA/Writ/301/2023 වෙතින් අභියාචනය)

CA/Writ/301/2023 යන රිට් අයදුම්පත සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නියෝගය අභියෝගයට ලක්කරමින් රියාස් සංගානි විසින් මෙම අභියාචනා අවසර අයදුම්පත ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ එකී කොමිෂන් සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස මෙහි දක්වා ඇත.

මෙම නඩුව කරුණු තහවුරු කිරීම සඳහා නියමිතව පවතී.

### 52. සෙන්ෆින් සේකියුරිටීස් ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව: RTIC/Appeal/529/2024

අභියාචක සමාගම විසින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කල අයදුම්පතක් මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇතැම් තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අභියාචක සමාගම විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එකී අභියාචනය විමසීම සඳහා නියමිතව පවතී.

### පැමිණිලිවලට විසඳුම් යෙදීමේ ක්‍රමය

ලියාපදිංචි ලැයිස්තුගත මාගම්වලට අදාළව ලැබී ඇති පිමිණිළි සහ ලබා දී ඇති විසඳුම් වල තත්ත්වය පහත දක්වා ඇත. (සංඛ්‍යා සටහන 13)

**සංඛ්‍යා සටහන 13 ලැයිස්තුගත ආයතනවලට අදාළ පැමිණිලි සහ කරුණු හැසිරවීම**

| පැමිණිල්ලේ ස්වභාවය | ලැබුණු පැමිණිලි ගණන | ගන්නා ලද පියවර |
|---|---|---|
| පොදු ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ හැසිරීම | 3 | කරුණු 03ක් නිසි පරිදි අවසන් කරන ලදී. |
| පොදු ලැයිස්තුගත සමාගම්වල හැසිරීම | 8 | කරුණු 05ක් නිසි පරිදි අවසන් කරන ලදී. |
| | | කරුණු 01ක් කොළඹ කොටස් වෙළෙඳපොළට යොමු කරන ලදී. |
| | | කරුණු 01ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට (අදාළ නියාමන ආයතනය) යොමු කරන ලදී. |
| | | කරුණු 01ක් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී. |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති / කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති වලට අනුකූල නොවීම | 5 | කරුණු 05ක් නිසි පරිදි අවසන් කරන ලදී. |
| වෙනත් පරිපාලන කරුණු | 6 | කරුණු 05ක් නිසි පරිදි අවසන් කරන ලදී. |
| | | කරුණු 01ක් සමාගම් ලේකම් වෙත යොමු කරන ලදී. |
| අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල නොවීම | 1 | කරුණු 01ක් නිසි පරිදි අවසන් කරන ලදී. |
| එකතුව | 23 | |

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

### ව්‍යවස්ථාපිත අරමුදල්

#### සෙස් අරමුදල

1991 අංක 26, 2003 අංක 18, 2009 අංක 47 දරන පනත් මගින් සංශෝදිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 15 බී යන වගන්තිය යටතේ මුලිකව පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (සෙස් අරමුදල) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 156(1) වගන්තිය මගින් අවලංගු කර ප්‍රතිස්ථාපනය කරන ලදී.

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 155(1) සහ (2) සභා 156(1) , (2) සහ (3) යන වගන්ති වලට අනුව සස් අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ අරමුදල පහත ආකාරයෙන් සදහන් කොට ඇත.

155(1) බලපත්‍රලාභී කොටස් හුවමාරු වන සටහන් වී ඇති හෝ එහි නීති රීති යටතේ දැනුම දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් මිලදී ගැනීමක් සහ විකිණීමක් සම්බන්දයෙන් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිත සදහන් කරනු ලබන අනුපාතයට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම, අය කිරීම හා ගෙවීම් කිරීම සිදු කල යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අය කිරීම් අනුපාතයක් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

156 (1) සෙස් බදු අරමුදල යනුවෙන් හදුන්වනු ලබන අරමුදලේ පිහිටවනු ලැබිය යුතු වන අතර 156 වගන්තිය යටතේ අය කරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කල යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයක් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදල් බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්යන් සදහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය.

(අ) සුරැකුම්පත් වෙළඳපොල දියුණු කිරීම;

(ආ) මෙම කොටස යටතේ පිහිටවනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය , පරිපාලනය සහ මෙහෙයවීම සදහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියව ගැනීම;

(ඈ) කොමිෂන් සභාව සුදුසු යැයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහනය සහ කාර්ය සදහා නය ලබා දීම.

(ඉ) අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ සහ එහි නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සදහා පිහිටවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසන් විනිශ්චය කරනු ලබන පරිදි යෝගයතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුලදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යනයන්ට අදාල වියදම පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්ය සදහා කොමිෂන් සභාව විසින් නිශ්වය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

#### හිමිකම් සුරැකුම්පත් සදහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බදු ගෙවීම

කොළඹ කොටස් වෙළඳපොල මාර්පගෙ ාපදේශයන්ට අනුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හිමිකම් සුරැකුම්පත් සදහා අය කරන ලද සෙස් බද්ද දෙවන වරටත් 2010 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ගනුදෙනුවකට 0.09% සිට 0.072% දක්වා අඩු කර ඇත. නැවත අඩුකිරීම 2003 දෙසැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වූ අතර ඒ අනුව ගනුදෙනුවකට අදාල සෙස් බද්ද 0.1% සිට 0.09% දක්වා අඩු කරන ලදී.

තවද, 2017 ජූනි 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ගනුදෙනු පරාසය රු. මිලියන 100 දක්වා වන ගනුදෙනු වලට අදාල වන ලෙස සංශෝධනය කරන ලදී. මීට පෙර, 2011 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, රු. මිලියන 50 දක්වා සහ රු. මිලියන 50 ට වැඩි ගනුදෙනු සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් බද්ද පිළිවෙලින් 0.072% සහ 0.045% ලෙස අය කරන ලදී. පසුව, 2017 ජූනි 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, සංශෝධිත සීමාවට අනුව, රු. මිලියන 100 දක්වා සහ රු. මිලියන 100 ට වැඩි ගනුදෙනු සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් බද්ද පිළිවෙලින් 0.072% සහ 0.045% ලෙස අය කෙරේ.

ඊට අමතරව, 2006 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගනුදෙනුකරුවෙකු එකම තැරැව්කරුවෙකු හරහා එකම දිනයේ එකම සුරැකුම (හෝ ප්‍රතිවිරුද්ධව) මිලදී ගෙන විකුණන විට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ගෙවිය යුතු ගනුදෙනු ගාස්තුව, ගනුදෙනුවේ එක් පැත්තකින් අය නොකෙරේ.

මිලදී ගත් මුළු කොටස් ගණන විකුණන ලද මුළු කොටස් ගණනට සමාන නොවන්නේ නම්, ඉහත විස්තර කර ඇති ගනුදෙනු ගාස්තු මිලදී ගත් හෝ විකුණන ලද අඩු කොටස් ප්‍රමාණය සඳහා අය නොකෙරේ. මිලදී ගත් මුළු ප්‍රමාණය විකුණන ලද මුළු ප්‍රමාණයට සමාන නම්, ගනුදෙනු ගාස්තු විකුණුම් ගනුදෙනුවෙන් අය නොකෙරේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ගනුදෙනු ගාස්තුවෙන් නිදහස් කිරීම තීරණය කිරීම සඳහා එකම සුරැකුම මත සේවාදායකයෙකුගේ මුළු මිලදී ගැනීම් සහ විකුණුම් සලකා බලනු ලැබේ. එහෙත්, ගනුදෙනුවල දෙපැත්තෙන්ම 0.30% ක රජයේ කොටස් ගනුදෙනු බද්ද අය කෙරේ.

## සෙස් අරමුදලේ හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 වසර වලදී වසරකට රුපියල් මිලියන 50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් පියවීමේ සහතික කිරීමේ අරමුදලට පවරන ලදී.

තවද රුපියල් මිලියන 276 ක්, රුපියල් මිලියන 380 ක්, රුපියල් මිලියන 94 ක්, රුපියල් මිලියන 52 ක් හා රුපියල් මිලියන 312 ක් වශයෙන් අවස්ථා 5 කදී පිලිවෙලින් 2010,2012,2013,2019 හා 2020 යන වර්ෂයන්හිදී ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

2024 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 5,706.7 ක් වන අතර එයින් රුපියල් මිලියන 725.5 ක් මාස දොළහකට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැදුම්කර වලද රුපියල් මිලියන 4,386.3 භාණ්ඩාගාර බිල්පත් වලද රුපියල් මිලියන 536ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් වලද ආයෝජනය කර ඇත.

2015 වසර සිට 2024 වසර දක්වා සෙස් අරමුදලෙහි වෙනස් වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 04)

රූප සටහන 04: සෙස් අරමුදල




## වන්දි අරමුදල

1987 දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ වන්දි අරමුදල ක්‍රියාත්මක විය. 2021 සැප්තැම්බර් 20 දින සිට බල පැවැත්වෙන පරිදි 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 වන වගන්තිය යටතේ වන්දි අරමුදලක් ස්ථාපිත කිරීම සහ හා පවත්වාගෙන යාමේ ව්‍යවස්ථාපිත වගකීමකි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 සහ 159 වගන්ති අනුව, වන්දි අරමුදල නඩත්තු කිරීම සඳහා වූ පරමාර්ථය සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ.

158 (1) යම් බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවකුට හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැදීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

(2) එම වන්දි අරමුදල -

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්;

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැරකරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සෙස් අරමුදලෙන් බැරකරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්,

සමන්විත විය යුතුය

(3) වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකිය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් 159 වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයින් ලෙස පත් කල යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි මුදල් තක්සේරු කිරීමට සහ ප්‍රදානය කිරීම පිලිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු ඉල්ලීමක් සම්බන්ධයෙන් කමිටුව විසින් ලබා දෙනු ලබන තීරණය මෙම පනතේ කාර්යය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

වන්දි සඳහා ඉල්ලුම් කෙරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විදි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුකරුවෙකු විසින් හිමිකම් පෑමට සහය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිලිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසර දීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

## වන්දි අරමුදලේ හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50 ක් වන්දි අරමුදලට බැර කරන ලදී. 2024 වර්ෂය අවසානය වන විට වන්දි අරමුදලේ ශේෂය රුපියල් මිලියන 764.8 ක් වූ අතර ඉන් රුපියල් මිලියන 254.3 ක් මාස දොළහකට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැදුම්කර වලද රුපියල් මිලියන 464.8 ක් භාණ්ඩාගාර බිල්පත් වලද රුපියල් මිලියන 53ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් වලද ආයෝජනය කර ඇත.

## උපායමාර්ගික අරමුණු 2

# ආයෝජක සුභසිද්ධිය ආරක්ෂා කිරීම

2015 වසර සිට 2024 වසර දක්වා වන්දි අරමුදලෙහි වෙනස් වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 05)

රූප සටහන 05: වන්දි අරමුදල




### පියවීම් සහතික කිරීමේ අරමුදල

පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළඳපොලෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම් සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරිත්වය පහත පරිදි විස්තර කල හැක.

- කොටස් ගනුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළඳපොල විසින් බේරුම් කිරීමේ කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී. එනම් ගැනුම්කරු විසින් ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදුකල දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාල ගෙවීම් සිදු කල යුතු අතර විකුණුම්කරුට ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කල දින දී ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාල දෙවීම් පියවීම් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවන පියවීම් අවදානමක් ඇතිවන බැවින් මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති විය.

- මෙම අරමුදලේ භාරකරුවන් නිල බලයෙන් ඊට පත්වන අතර සුරැකුම්පත්

  සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ,කොළඹ කොටස් හුවමාරුවේ සභාපති, මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම් , ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරීන් යන අය ඊට ඇතුලත් වේ.

- ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 60 ක මුදලක් ප්‍රධානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත් වල සහ ස්ථාවර තනපතු වල ආයෝජන කර ඇත. මෙම අරමුදල ප්‍රතිපූරනය වශයෙන් පරිත්‍යාගය තෑගී සහ ප්‍රදානයන් ලබා ගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැවුකරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවයක් නොමැත.

- කෙසේ වෙතත්, පියවීම සහතික කිරීමේ අරමුදල , පියවීම් අවදානම් ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිලියමක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවෙම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

මූල්‍ය සහ පරිපාලන කණ්ඩායම

## පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි හැසිරීම

අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වර්ෂයන්හි දී රු. මිලියන 50 බැගින් වූ සමාන ප්‍රමාණ දෙකකින් රු. මිලියන 100 ක් සෙස් අරමුදලෙන් පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමව් අරමුදලෙහි හට ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද අරමුදල ශක්තිමත් කිරීම සඳහා රු. මිලියන 100 ක් ලබා දෙන ලදී.

2024 දෙසම්බෙර් අවසානය වන විට පියවීම් සහතික කිරීමේ අරමුදලේ ශේෂය රුපියල් මිලියන 1,389.5 ක් වන අතර එඉන් රුපියල් මිලියන 7.76 ක් මාස දොළහකට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වලද රුපියල් මිලියන 1,268.8 ක් භාණ්ඩාගාර බිල්පත් වලද රුපියල් මිලියන 98ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් වලද ආයෝජනය කර ඇත.

2015 වසර සිට 2024 වසර දක්වා පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි වෙනස් වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 06)

රූප සටහන 06: පියවම් සහතික කිරීමේ අරමුදල



## උපායමාර්ගික අරමුණු 3

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

**සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමකයා ලෙස, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ගෝලීය ආචාර ධර්ම භාවිතයන් සමඟ අනුකූල වෙමින් ශක්තිමත් සහ කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක් බිහි කිරීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එය ආර්ථික වර්ධනයට සහ වෙළෙඳපොළ ස්ථාවරත්වයට මහඟු දායකත්වයක් ලබා දේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නව ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍ය උපකරණ හඳුන්වාදීමට පහසුකම් සපයා ඇත. තවද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ යටිතල පහසුකම් සැපයීමට සහාය වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥතාව ලබා ගැනීම සඳහා බහුපාර්ශ්වික නියෝජිතායතන සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.**

## වෙළෙඳපොළට නව ආයෝජන උපකරණ හඳුන්වාදීමට පහසුකම් සැලසීම

### ෂරියා අනුකූල ණය සුරැකුම්පත් හෝ සුකුක්

ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන (ICMP) යනු ඉස්ලාමීය නීතියට අනුකූලව හඳුන්වාදෙන ලද සුරැකුම්පත් වන අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ ආර්ථිකය සංවර්ධනය කිරීමේදී ICMP ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන උපකරණ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි, මන්ද එය විදේශීය ආයෝජන කළඹ සහ අරමුදල් රැස් කිරීම සඳහා අවස්ථා විවෘත කරන හෙයින් ෂරියා අනුකූල ණය සුරැකුම්පත් හෝ සුකුක් යනු ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන උපකරණ යටතේ වඩාත් ජනප්‍රිය ආයෝජන උපකරණයකි. සුකුක් යනු ෂරියා මූලධර්මවලට අනුකූලව, සාම්ප්‍රදායික බැඳුම්කරවලට සමානව ක්‍රියා කරන මූල්‍ය උපකරණයක් වේ. ෂරියා-අනුකූල විකල්ප ආයෝජන මගින් ආයෝජකයින්ට සුකුක් ආයෝජනයන්ට සහාය වන වත්කම්වල අර්ධ හිමිකාරිත්වය ඇතුළත් ආකර්ශනීය ණය උපකරණයක් මිලදී ගැනීමට අවස්ථාව ලබා දෙන අතරම, ආගමික වශයෙන් පිළිගත හැකි ආකාරයකින් ප්‍රාග්ධනය රැස් කිරීමට ඒවා ආයතනවලට ඉඩ සලසයි.

පසුගිය වසරේදී කොළඹ කොටස් හුවමාරුව තුළ සුකුක් ආයෝජන උපකරණ හඳුන්වාදීමට පහසුකම් සැලසීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. සුකුක් ආයෝජන උපකරණ පාලනය කරන නියාමන රාමුව සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සහ එම ආයෝජන උපකරණ ෂරියා නීතියට අනුකූල බව සහතික කිරීමට භාර දී ඇති පිළිගත් ෂරියා විද්වතුන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම මෙයට ඇතුළත් විය. එවැනි ආයෝජන සොයන ආයෝජකයින්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීම සහ පදනම් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙම පියවර ගන්නා ලදී. ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, ෂරියා විද්වතුන් සඳහා ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව සුදුසුකම් ලත් පුද්ගලයන්, සම්මුඛ පරීක්ෂණයක් තුළින් ෂරියා විද්වතුන් හය දෙනෙකු තෝරා ගන්නා ලදී.

ඊට සමගාමීව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සුකුක් ආයෝජන උපකරණ නිකුත් කිරීමට පෙර එම ආයෝජන උපකරණ ෂරියා අනුකූල බව සහතික කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පිළිගත් ෂරියා විද්වතුන් තිදෙනෙකුගෙන් අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වමින් කොළඹ කොටස් හුවමාරුවට නියෝගයක් නිකුත් කරන ලදී.

### ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර

ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර යනු ආයෝජන මට්ටමේ ඇගයීමකට වඩා අඩු ණය ශ්‍රේණිගත කිරීමක් ඇති ණය සුරැකුම්පත් වේ. අනෙකුත් ලයිස්තුගත සාංගමික ණය සුරැකුම්පත් හා සසඳන විට එහි පවතින ඉහළ අවදානම හේතුවෙන් සහ එයට ආරෝපණය කර ඇති ඉහළ ප්‍රතිලාභය හේතුවෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ජනප්‍රිය ආයෝජන උපකරණයක් ලෙස ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර ආකර්ෂණයක් ලබා ඇත. තවද, ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවෙහි ඇති ආයෝජන වත්කම් පන්ති පුළුල් කිරීමට උපකාරී වන අතර දැඩි ලයිස්තුගත කිරීමේ අවශ්‍යතා සපුරාලීමට නොහැකි

Capital Market Development Team

සමාගම්වලට ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා අරමුදල් රැස් කිරීමට ඉඩ සලසයි.

කොළඹ කොටස් හුවමාරුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව, කොළඹ කොටස් හුවමාරුවෙහි ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර හඳුන්වා දීම සඳහා කොමිසමේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගන්නා ලදී. ඉන්පසුව, නව ආයෝජන උපකරණ සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ කමිටුවේ මඟ පෙන්වීම යටතේ, ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර සඳහා නියාමන රාමුව සකස් කරන ලද අතර, කොමිසමෙන් අනුමැතිය ලබා ගන්නා ලදී. අනුමත නියාමන රාමුවට අනුව, ඉහළ ප්‍රතිලාභයක් සහිත බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවෙහි සාමාන්‍ය ගණුදෙනු පද්ධතියට බාහිරින් ඇති ගණුදෙනු වේදිකාවක් (OTC) හරහා ලයිස්තුගත කර ගණුදෙනු කරනු ලැබේ.

## ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත නව ආයෝජන උපකරණ

වෙළෙඳපොළ වර්ධනය ඉහළ නැංවීම, ප්‍රාග්ධන සම්පාදනය වැඩිදියුණු කිරීම සහ ගෝලීය ආචාරධර්ම භාවිතයන් සමඟ සමපාත වීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහත සඳහන් ආයෝජන උපකරණ හඳුන්වාදීමට කටයුතු කරමින් සිටින්නෙමු. මෙම උපායමාර්ගය මගින් වෙළෙඳපොළ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, තිරසාර මූල්‍යකරණය සඳහා ඇති හැකියාව පුළුල් කිරීම, සහ ආයෝජකයින්ට වඩාත් පුළුල් වූ ආයෝජන අවස්ථා ලබා දීම අපේක්ෂා කෙරේ.

## ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීම

2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීමත් සමඟ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ව්‍යුත්පන්න සුරැකුම්පත් ගණුදෙනු බලපත්‍ර ලබා දීමට සහ නියාමනය කිරීමට බලය පවරා ඇත. මෙම බලය ලබාදීමට අනුකූලව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීමේ කාර්යය ආරම්භ කර ඇති අතර, එහි භාණ්ඩ ඇතුළුව පදනම් වත්කම් උපකරණ රැසක් ඇතුළත් වේ. මෙම ක්‍රියාකාරකම හරහා ජාතික ආර්ථිකය ප්‍රකෘතිමත්භාවයට සහ වඩාත් ස්ථාවර කිරීමට මෙන්ම තිරසාර සංවර්ධන ප්‍රයත්නයන්ට දායක වන අතරම ප්‍රාග්ධන වෙළෙඳපොළේ වර්ධනයටද දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම අරමුණට අනුකූලව, ව්‍යුත්පන්න හුවමාරුව ස්ථාපිත කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සහ ඉදිරි සැළැස්මක් සකස් කරන ලද අතර පසුව කොමිසම විසින් එය අනුමත කරන ලදී. අනුමත ඉදිරි සැළසුම අනුව, බහු-වත්කම් පන්ති ව්‍යුත්පන්න හුවමාරුවක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් ආයතනවලින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අභිලාශ ප්‍රකාශ කිරීම් කැඳවීමක් (EOI) සිදු කරන ලදි.

වර්තමානයේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අභිලාශ ප්‍රකාශ කිරීම් හයක් ලැබී ඇති අතර ඒ හා සම්බන්ධ යෝජනා ඇගයීමේ ක්‍රියාවලියක යෙදී සිටියි. එම යෝජනා ශ්‍රී ලංකාවේ නියාමනය කරන ලද ව්‍යුත්පන්න වෙළෙඳපොළක් හඳුන්වාදීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි.

## සමාජ බැඳුම්කර

සමාජ බැඳුම්කර යනු අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම, දැරිය හැකි මිලකට නිවාස ලබා දීම සඳහා සහාය වීම හෝ ආර්ථික සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම වැනි ධනාත්මක සමාජ ප්‍රතිඵල අත්කර දෙනු ලබනන ව්‍යාපෘති සඳහා අරමුදල් රැස් කිරීම වෙනුවෙන් නිර්මාණය කර ඇති මූල්‍ය උපකරණයකි. මෙම බැඳුම්කර පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම සමඟ සමපාත වන අතර, එය ප්‍රධාන සමාජමය අභියෝගවලට විසඳුම් ලබා දෙන අතරම තිරසාර සංවර්ධනයටද දායක වේ.

ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සහ ආර්ථික වර්ධනය සඳහා ඇති කැපවීම ශක්තිමත් කරමින්, පුළුල් පාරිසරික, සමාජීය සහ පාලන ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස සමාජ බැඳුම්කර හඳුන්වා දීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇත.

ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබා දී ඇති තාක්ෂණික සහාය වැඩසටහන් තුළින් ලබාදුන් උපදේශකයන්ගේ සහයෝගය මත

**ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සහ ආර්ථික වර්ධනය සඳහා ඇති කැපවීම ශක්තිමත් කරමින්, පුළුල් පාරිසරික, සමාජීය සහ පාලන ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස සමාජ බැඳුම්කර හඳුන්වා දීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇත.**

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සමාජ බැඳුම්කර නිකුත් කිරීමේ හැකියාව සොයා බලනු ඇත. තවද එම උපදේශකයන් විසින් පවතින නියාමන රාමුව සංශෝධනය කරමින් සමාජ බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන රෙගුලාසි ඇතුළත් කිරීම සිදු කරන අතරම, සමාජ බැඳුම්කර නිකුත් කිරීම සඳහා හැකියාව හා අභිලාශ ඇති මූල්‍ය ආයතන හා සමාගම් සමඟ සාකච්ඡා කරමින් ඔවුනට නිසි ව්‍යාපෘති තෝරා ගැනීමට සහ බාහිර සමාලෝචන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා මඟ පෙන්වීමද සිදු කරයි.

## තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර

තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර (SLBs) යනු ධනාත්මක දේශගුණික හා පාරිසරික ප්‍රතිඵල ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ඉදිරි දැක්මක් සහිත, කාර්ය සාධනය මත පදනම් වූ මූල්‍ය උපකරණ වේ. මූල්‍ය නියමයන් පූර්ව නිශ්චිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සහ තිරසාරභාවය හා සම්බන්ධිත කාර්ය සාධන ඉලක්ක (SPTs) සමඟ සම්බන්ධ කිරීමෙන් මැනිය හැකි සහ අපේක්ෂා සහිත තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීමට තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර නිකුත් කරන්නන් දිරිමත් කරයි.

තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර (SLBs) හඳුන්වාදීම පිළිබඳ සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඇත. තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, සහ ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය වැඩසටහන හරහා සම්බන්ධ වී සිටින උපදේශකයින් සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර හඳුන්වාදීමට ඇති හැකියාව

## උපායමාර්ගික අරමුණු 3

# ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ක්‍රියාකාරීව සොයාබලමින් සිටී. තිරසාර මූල්‍ය ක්ෂේත්‍රයට සහාය වන පරිසර පද්ධතියක් ඇති කරමින්, 'තිරසාරභාවය පිළිබඳ බැඳුම්කර' යන පුළුල් ක්ෂේත්‍රය යටතේ තිරසාරභාවය හා සම්බන්ධිත බැඳුම්කර සඳහා ඉඩ සැලසීම සඳහා නියාමන රාමුව සංශෝධනය කිරීම සහ වැඩිදියුණු කිරීම මෙම උත්සාහයන්හි අරමුණයි.

### විනිමය හුවමාරු අරමුදල්

විනිමය හුවමාරු අරමුදල් යනු ආයෝජකයින්ට විවිධාංගීකරණය වූ සහ නම්‍යශීලී ආයෝජන විකල්පයක් ලබා දෙමින්, පදනම් වත්කම් කිහිපයක් ඒකාබද්ධව සිදුකරන ආයෝජන සුරැකුම්පත් විශේෂයක් වේ.

සක්‍රිය ආයෝජන කළඹක් කළමනාකරණය කිරීම සහ නව මූල්‍ය උපකරණ සඳහා ආයෝජකයින්ගේ වර්ධනය වන ඉල්ලුම හඳුනා ගනිමින් ශ්‍රී ලංකා වෙළෙඳපොළට විනිමය හුවමාරු අරමුදල් හඳුන්වා දීම සඳහා වන නියාමන රාමුවට සහාය වන, 2021 අංක 19 දරන නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ 2022 සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සංග්‍රහය තුළින් හැකියාව ලබා දී ඇති අතර ශ්‍රී ලංකාව තුළ ප්‍රාග්ධන රැස් කිරීමේ මූල්‍ය ආයෝජන උපකරණයක් ලෙස විනිමය හුවමාරු අරමුදල්වලට ඇති හැකියාව සොයා බැලීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලදී. එය ප්‍රාග්ධන වෙළෙඳපොළ ශක්තිමත් කිරීම සහ ආර්ථික වර්ධනයට සහාය වීම අරමුණු කරගත් ප්‍රධාන ප්‍රතිපත්ති නිර්දේශ සමඟ විනිමය හුවමාරු අරමුදල් හා සම්බන්ධ ප්‍රතිලාභ සහ අවදානම් ගෙනහැර දක්වයි.

විනිමය හුවමාරු අරමුදල් හඳුන්වාදීම තුළින් වෙළෙඳපොළ වර්ධනය සහ විවිධාංගීකරණයට සහාය වෙමින් කොළඹ කොටස් හුවමාරුවෙහි ඇති ආයෝජන උපකරණ පරාසය පුළුල් කරනු ඇත. ඊට අමතරව, එය වෙළෙඳපොළ සාදන්නන් සහ බලයලත් සහභාගිවන්නන් වැනි වෙළෙඳපොළ සහභාගිවන්නන්ට අවස්ථාව උදාකර දෙන අතර ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළඳපොළෙහි ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු සිදු කිරීමට අවකාශ සැළසීමෙන්, ද්‍රවශීලතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි,

### දර්ශක සඳහා නියාමන උපදෙස් නිකුත් කිරීම

ෂරියා අනුකූල කොටස් ආයෝජන සොයන ආයෝජකයින්ගේ සුහසිද්ධිය ආරක්ෂා කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ෂරියා අනුකූල "WHITELIST" කොටස් දර්ශක ගොඩනැගීම සහ ප්‍රකාශයට පත් කිරීම තාර්කික කිරීමේ අරමුණින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව "WHITELIST" දර්ශක ක්‍රියාත්මක කරන වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් වෙත නියාමන උපදෙස් නිකුත් කළේය.

ෂරියා අනුකූල කොටස් යනු ෂරියා නීතියට අනුකූල කොටස් සුරැකුම්පත් වේ. WHITELIST" දර්ශකයක ෂරියා පිරික්සුම් ක්‍රමවේදය මගින්, කොටස් ෂරියා නීතියට අනුකූලවේ ද යන්න තීරණය කරන අතර, මෙය ගුණාත්මක හා ප්‍රමාණාත්මක අංග සමූහයකින් සමන්විත වේ. "WHITELIST" දර්ශක ක්‍රියාකරුවන් සහ ඉස්ලාමීය මූල්‍ය ආයතන සඳහා, ගිණුම්කරණ සහ විගණන සංවිධානය වැනි අනෙකුත් නියාමන ආයතන විසින් අනුගමනය කරන ලද සුරැකුම්පත් පිරික්සුම් ක්‍රමවේදයන් පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙනත් රටවල් සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරන ලද අතර වෙළෙඳපොළේ පවතින "WHITELIST" දර්ශක ක්‍රියාකරුවන් සමඟ රැස්වීම් ද පැවැත්වීය.

ඒ අනුව, මෙම "WHITELIST" දර්ශක සපයන්නන් විසින් භාවිතා කරන සුරැකුම්පත් පිරික්සුම් ක්‍රමවේද අතර විශාල වෙනස්කම් ඇති බව නිරීක්ෂණය විය. ඉන්පසුව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන "WHITELIST" දර්ශක ෂරියා මූලධර්ම සහ රීති සහ පිළිගත් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වන බවට ආයෝජකයින්ට සහතිකයක් ලබා දීම සඳහා සහ විවිධ දර්ශක සපයන්නන් විසින් පරීක්ෂා කරන ලද සුරැකුම්පත් අතර කිසිදු විෂමතාවයක් නොමැති බව සහතික කිරීම සඳහා, වෙළෙඳපොළේ ක්‍රියාත්මක වන සියලුම "WHITELIST" දර්ශක සඳහා පිළිගත් ෂරියා විද්වතුන් විසින් සකස් කරන ලද 'සම්මත ෂරියා අනුකූල සුරැකුම්පත් පිරික්සුම් ක්‍රමවේදයක්' අනුගමනය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තීරණය කළ අතර මෙම ක්‍රමවේදය කොමිසම විසින් අනුමත කරන ලදී.

> විනිමය හුවමාරු අරමුදල් හඳුන්වාදීම තුළින් වෙළෙඳපොළ වර්ධනය සහ විවිධාංගීකරණයට සහාය වෙමින් කොළඹ කොටස් හුවමාරුවෙහි ඇති ආයෝජන උපකරණ පරාසය පුළුල් කරනු ඇත.

ඒ අනුව, සියලුම වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් වෙත නියෝග යක් යවන ලද අතර, සේවාදායකයින් හෝ මහජනතාව අතර "WHITELIST" කොටස් දර්ශකයක් ප්‍රකාශයට පත් කිරීමට හෝ සංසරණය කිරීමට පෙර, ෂරියා විශාරදයින් විසින් සකස් කරන ලද සම්මත ෂරියා අනුකූල සුරැකුම්පත් පිරික්සුම් ක්‍රමවේදය අනුගමනය කරන ලෙසත්, එම විධානයට අනුකූලව ආයතනය සහතික කරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ෂරියා විද්වතුන්ගේ ලයිස්තුවෙන් ෂරියා විද්වතුන් තිදෙනෙකුගේ අනුමැතිය ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. තවද, එම විධානයේ සඳහන් වන්නේ "WHITELIST" දර්ශකයකට දායක වන වෙළෙඳපොළ ආයතනයක් හෝ වෙළෙඳපොළ අතරමැදියෙකු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි පිළිගත් ෂරියා විද්වතුන් තිදෙනෙකු විසින් "WHITELIST" දර්ශකය අනුමත කර ඇති බවට සහතික කළ යුතු බවයි.

### වෙනත් ක්‍රියාකාරකම්

#### ලයිස්තුගත සමාගම් සඳහා XBRL වාර්තාකරණය හඳුන්වා දීම

XBRL යනු ව්‍යාපාර සහ මූල්‍ය දත්ත ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය සඳහා නිර්මාණය කර ඇති ප්‍රමිතිගත භාෂාවකි. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, වාර්තාකරණ ලයිස්තුගත සමාගම් වලින් මූල්‍ය තොරතුරු විද්‍යුත් වශයෙන් ලබා ගැනීමට සහ සැකසීමට ඉඩ සලසන XBRL පාදක මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් (FRS) ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

ඒ අනුව, ලයිස්තුගත සමාගම් සඳහා XBRL වාර්තාකරණ ආකෘති සහ වර්ගීකරණයන් හඳුන්වාදීමට පියවර ගන්නා ලද අතර ඒවා සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ අදහස් දැක්වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) සමඟ කටයුතු කරමින් පවතී. තවද, තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා, පද්ධතිය ප්‍රසම්පාදනය කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් සුදුසුකම් ලත් XBRL විකුණුම් සමාගමක් තෝරා ගන්නා ලදි.

2025 වසර අවසන් වන විට ලැයිස්තුගත සමාගම් XBRL ඉදිරිපත් කිරීම් සඳහා පද්ධතියක් ලබා ගැනීමේ සැලසුම් සමඟ ක්‍රියාවලිය ඉදිරියට යමින් පවතී.

## 2025 රජයේ ජාතික අයවැය සඳහා යෝජනා

ශ්‍රී ලංකා රජයට ඇති ප්‍රාග්ධන රැස්කිරීමේ මාර්ග පුළුල් ලෙස පදනම් කර ගැනීම සහ ආර්ථිකයේ සංවර්ධනය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ මූලික අරමුණ ඇතිව, ආයතනය විසින් 2025 රජයේ ජාතික අයවැය සඳහා අයවැය යෝජනා සකස් කර සලකා බැලීම සඳහා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

## ප්‍රධාන වෙළෙඳපොළ සංවර්ධන ව්‍යාපෘති 12 ක්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතාගේ මඟ පෙන්වීම යටතේ, ශ්‍රී ලංකා රජයේ සංවර්ධන අරමුණු සමඟ සමපාත වන ප්‍රධාන ව්‍යාපෘති 12කට ඇතුළත් කර ඇති සංවර්ධන ක්‍රියාකාරකම් මාලාවක් හඳුනා ගෙන ඇත. ඒ අනුව, අදාළ සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැනට කටයුතු කරමින් සිටී.

## උපායමාර්ගික අරමුණු 4

# ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ උනන්දුව ප්‍රවර්ධනය කිරීම

**පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට අවශ්‍ය ධනය උත්පාදනය සහ ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා සහභාගී වීමට හැකි වන පරිදි හොඳින් ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළඳපොළක් ඇති කිරීමේදී ආයෝජක අධ්‍යාපනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ආයෝජක අධ්‍යාපනය හරහා දැනුම සහ කුසලතාවලින් පිරිපුන් ආයෝජකයින් බිහිකරන අතර ඔවුන්ගේ ආයෝජන තීරණ ගැනීමේ හැකියාව ද වර්ධනය කරයි. එපමණක් නොව වෙළෙඳපොළ විනිවිදභාවය වැඩි දියුණු කිරීම, වැරදි තොරතුරු භාවිතය අඩු කිරීම, මෙන්ම ශකිවයුතු ආයෝජන පිළිවෙත් අනුග මනය කිරීමටද උපකාරී වේ. මෙය හඳුනා ගනිමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉලක්කගත දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් හරහා ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා එහි කැපවී සිටී.**

### ප්‍රජා සත්කාරක වැඩසටහන් - සම්මන්ත්‍රණ සහ වැඩමුළු

සියලුම වයස් කාණ්ඩ සහ තරාතිරම්වලට අයත් විවිධ ප්‍රේක්ෂක පිරිස් දැනුමින් සවිබල ගැන්වීම අරමුණු කරගනිමින්, ආයෝජක අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා ප්‍රජා සත්කාරක වැඩසටහන් රාශියක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලදි. මූල්‍ය වෙළෙඳපොළ තුළ පවතින අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමින් සහ දිගුකාලීන මූල්‍ය ස්වාධීනත්වය සහ වර්ධනය අත්කර ගැනීමට අවශ්‍ය තීරණාත්මක දැනුමෙන් සන්නද්ධ, දැනුවත් සහ විශ්වාසවන්ත ආයෝජක ප්‍රජාවක් බිහිකිරීම අපගේ ඉලක්කය විය.

බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොල අධ්‍යාපන කණ්ඩායම

ගුරුවරුන්ට, ආයෝජකයින්ට, පාසල් සිසුන්ට, උපාධි අපේක්ෂකයින්ට සහ මහජනතාවට වටිනා මූල්‍ය අවබෝධයන් පහසුවෙන් ලබා ගත හැකි බව සහතික කරමින්, අපි වසර පුරා ඩිජිටල් මාධ්‍යයෙන් දුරස්ථව පවත්වන ලද වැඩසටහන් මෙන්ම පිරිස් ඒකාරාශී කරමින් පුද්ගලිකව සංවිධානය කළ වැඩසටහන් යන දෙයාකාරයෙන්ම දැනුම ලබා දුන්නෙමු.

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සංවිධානය කළ ප්‍රාදේශීය ආයෝජක සම්මන්ත්‍රණ

"නැණවත් ආයෝජනයකට සවිමත් අත්වැලක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන්, මෙම ප්‍රාදේශීය ආයෝජක සම්මන්ත්‍රණ පවත් වනු ලැබීය.

මෙවැනි ආයෝජක සම්මන්ත්‍රණ පැවැත්වීමෙහි මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සුළු පරිමාණ ආයෝජකයින් අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම ව්‍යාප්ත කිරීම සහ ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමයි. නගරයට පමණක් සීමා වී තිබූ ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍ය ආයෝජන වලින් ඔබ්බට ගොස් ග්‍රාමීය අඩු පහසුකම් සහිත ආයෝජක ප්‍රජාවන්හි මූල්‍ය සාක්ෂරතාවය ගොඩනැගීමේදී පැවති බාධක මෙම සම්මන්ත්‍රණ පැවැත්වීම තුළින් අවම කර ගැනීමට හැකියාව ලැබේ.

වවුනියාව, නුවරඑළිය සහ මාතලේ, දඹුල්ල, මාතර, ගම්පහ සහ රත්නපුර යන ප්‍රධාන නගර කේන්ද්‍ර කර ගනිමින් වසර පුරා සම්මන්ත්‍රණ 7ක් පවත්වන ලදී.

### පාසල් සිසුන් ඉලක්ක කරගත් වැඩසටහන්

ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නඟා ගැනීමට ජීවිත කාලය පුරාවටම වැදගත්ය. ඒ සඳහා ඕනෑම අයෙකුට තම ජීවිතයේ මුල් අවධියේදීම මූල්‍ය සංකල්පවලට නිරාවරණය වීම ඉතා වැදගත් වේ. මෙය හඳුනා ගනිමින්, දිවයිනේ විවිධ පලාත් වලින් පැමිණි පාසල් හයක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ට මූලික මූල්‍ය වෙළෙඳපොළ සංකල්ප හා ප්‍රාග්ධන වෙළෙඳපොළ මූලධර්ම පිළිබඳව හඳුන්වා දෙමින්, අධ්‍යාපනික සම්මන්ත්‍රණ මාලාවක් අප දියත් කළෙමු.

### විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් ඉලක්ක කරගත් වැඩසටහන්

උපාධි අපේක්ෂකයින් අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සහ සුරැකුම්පත් වෙළෙඳපො තුළ ඔවුන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇති විශේෂිත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම අඛණ්ඩව සිදුකර ගෙන යන ලද අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාව පුරා ජාතික විශ්ව විද්‍යාල සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ විය.

උපාධි අපේක්ෂකයින් අත්‍යවශ්‍ය මූල්‍ය දැනුමෙන් සන්නද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම වැඩසටහන් සංවිධානය කරන ලද අතර එමගින් මූලිකවම අපේක්ෂා කළේ ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ මූලධර්ම සම්බන්ධයෙන් ඔවුන්ගේ අවබෝධය පුළුල් කිරීම මෙන්ම ක්ෂේත්‍රය තුළ කුසලතා වලින් සපිරි ආයෝජක ප්‍රජාවක් අනාගතයේදී බිහි කිරීමයි. වසර පුරාවට, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්

සඳහා වැඩසටහන් පහක් සාර්ථකව පවත්වන ලද අතර, එමගින් සිසුන්ට ආයෝජන උපාය මාර්ග, වෙළෙඳපොළ හැසිරීම සහ මූල්‍ය තීරණ ගැනීම පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන් තුළින් උපාධි අපේක්ෂකයින්ට මූල්‍ය ක්ෂේත්‍රය තුළ පවතින ආයෝජන අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමට දැනුම ලබා දුන්නා පමණක් නොව, ප්‍රාග්ධන වෙළෙඳපොළ අංශය තුළ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳව දැනුවත් වීමටද ද ඔවුන් පෙළඹවීය.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමයේ (CFA) සංගමය එක්ව පවත්වන ලද වැඩමුළුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමයේ (CFA) සංගමය එක්ව, නැගී එන වෙළෙඳපොළවල සහ එහි නියාමන රාමු පිළිබඳව අවබෝධයක් ලබාදීමට ඉහළ වැදගත් කමක් දැක් වූ අධ්‍යාපනික ක්‍රියාකාරකම් දෙකක් සාර්ථකව සිදු කළේය.

"යටිතල පහසුකම් බැඳුම්කර සඳහා වූ නියාමන රාමුව අවබෝධ කර ගැනීම" යන තේමාව යටතේ පැවැත්වූ පළමු වැඩසටහන මගින් යටිතල පහසුකම් කේන්ද්‍ර කරගත් ණය උපකරණ සම්බන්ධ විශේෂිත නියාමන පරිසරය පිළිබඳ පුළුල් අවබෝධයක් සහභාගී වන්නන්ට ලබා දෙන ලදී.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අප "ආයෝජන සුදුකරණය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා එහි ඇඟවුම්" නමින් ඔන්ලයින් වැඩසටහනක් ද පැවැත්වුවෙමු. මෙම ඉදිරි දැක්මක් සහිත සම්මන්ත්‍රණය මගින් සුදුකරණ ප්‍රවණතා වර්තමාන ඩිජිටල් ගණුදෙනු සහිත වාතාවරණය තුළ ආයෝජක හැසිරීම, වෙළෙඳපොළ සහභාගීත්වයේ වෙනස්කම් සහ නියාමන කටයුතු හා සම්බන්ධ වෙනස්කම් පරීක්ෂා කරන ලදී.

මෙම සහයෝගී ක්‍රියාකාරකම් තුළින් ඉලක්කගත වෘත්තීය අධ්‍යාපනය හරහා ස්ථාපිත වෙළෙඳපොළ රාමු සහ නැගී එන ප්‍රවණතා යන දෙකම කෙරෙහි අපගේ කැපවීම පිළිබිඹු කරයි.

### පාසල් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් 100ක් ආරම්භ කිරීම හා සබැඳි වැඩටහන්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය පුරා මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමේ වැදගත් පියවරක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ සහයෝගයෙන් 2023 දී "ප්‍රාග්ධන වෙළඳපොළ සංගම්" වැඩසටහන දියත් කළේය. මෙම වැඩසටහනේ අරමුණ වූයේ පාසල් සිසුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අත්‍යාවශ්‍ය දැනුමක් ලබා දීම, අනාගතයේදී දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට ඔවුන් බල ගැන්වීමයි. වාණිජ විෂය ධාරාවේ ' ලකුණු මත පදනම්ව පළමු පාසල් 100 තෝරා ගන්නා ලද අතර, පළාත් උත්සවවලදී මෙම පාසල් සඳහා අලුතින් පිහිටුවන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම් සඳහා වරලත් සහතික ප්‍රදානය කරන ලදී.

නව ප්‍රාග්ධන වෙළෙඳපොළ සංගම්වලට සහාය වීම සඳහා, ගුරුවරුන්ගේ මූල්‍ය දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් අප ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළෙමු. මෙම පුහුණු වැඩසටහන් තුළින් ගුරුවරුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ සංකල්ප ඔවුන්ගේ පාඩම් වලට ඇතුළත් කිරීමට උපකාරී වූ අතර, ගුරුවරුන්ට සහ සිසුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව තේරුම් ගැනීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පාර්ශවකරුවන් සමඟ ප්‍රායෝගිව සම්බන්ධ වෙමින් දැනුම ලබා ගනීමට උපකාරී විය.

මෙම කාර්යය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා, තෝරාගත් පාසල් 100 පුරා "Capital Market Masters" නමින් ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟයක් පැවැත්විණි. සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන්ම පවත්වන ලද මෙම ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟය, ප්‍රාග්ධන වෙළෙඳපොළ, සාමාන්‍ය දැනුම, ශ්‍රී ලංකා ආර්ථිකය, කාලීන කටයුතු, තොරතුරු තාක්ෂණ සහ නවෝත්පාදන, ක්‍රීඩා, කලාව හා රසාස්වාදය වැනි විවිධ මාතෘකා ආවරණය කළේය. තරඟය අදියර දෙකකින් පැවැත්විණි; මඩකලපුව, අනුරාධපුරය, මහනුවර සහ කොළඹ යන නගර කේන්ද්‍ර කර ගනිමින් මූලික අධියරේ පළාත් මට්ටමේ තරඟ පැවති අතර එම පළාත් මට්ටමේ ජයග්‍රාහකයින් අවසන් මහා තරඟයට සුදුසුකම් ලැබීය. ඒ අනුව පළාත් මට්ටමේ ජයග්‍රාහකයින් අතර අවසන් මහා තරඟය පවත් වන ලද අතර එම ශූරයන් අතරින් තිදෙනෙකු කිරුළු පළඳවන ලදී. මෙම දැනුම මිනුම තරඟය සඳහා සහභාගීවීමට සිසුන් අතර ඉතා දැඩි උනන්දුවක් පැවති අතර හා එකිනෙකා හමුවී අන්තර් ක්‍රියාකාරී ආකාරයකින් කටයුතු කිරීමට ද අවස්ථාව සිසුන්ට උදා විය. මෙමගින් මෙහි මූලික අරමුණ වූ මූල්‍ය සංකල්ප පිළිබඳ ඔවුන්ගේ අවබෝධය තවදුරටත් වැඩි දියුණු කර ගැනීමට හැකිවිය.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO හි ප්‍රතිපත්ති කමිටු 8 හි රැස්වීමට සත්කාරකත්වය සැපයීම

2024 ජුනි 26-28 දක්වා කොළඹදී පැවති ජාත්‍යන්තර සුරැකුම්පත් කොමිෂන් සභා සංවිධානයේ (IOSCO) සුළු පරිමාණ ආයෝජකයින් පිළිබඳ කමිටුවේ (කමිටු 8) රැස්වීම සාර්ථකව පැවැත්වීමෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි ජාත්‍යන්තර සම්බන්ධතාවයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ඉහළ වැදගත්කමක් සහිත මෙම රැස්වීම සඳහා ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, බ්‍රසීලය, ජර්මනිය, ස්පාඤ්ඤය, හොංකොං, ඉන්දියාව, සිංගප්පූරුව සහ සෞදි අරාබිය ඇතුළු විවිධ ආර්ථිකයන්ගෙන් නියාමන අධිකාරීන් නියෝජනය කරන කමිටු සාමාජිකයින් 22 දෙනෙකු එක්රැස් විය.

මෙම ජාත්‍යන්තර සමුළුවට සත්කාරකත්වය සැපයීමෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගෝලීය නියාමන සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම සහ සුරැකුම්පත් නියාමනයේ ලෝක ව්‍යාප්ත ප්‍රමිතීන් හැඩග ැස්වීම සඳහා එහි ක්‍රියාකාරී දායකත්වය පෙන්නුම් කළේය. මෙම සමුළුව සාර්ථකව සංවිධානය කිරීම මගින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නියාමන ප්‍රජාවේ නියැලී සිටින සහභාග ීවන්නෙකු ලෙස ස්ථානගත කරන අතර ආයෝජක ආරක්ෂාව සහ අධ්‍යාපනය සඳහා ගෝලීය ආචාරධර්ම අනුගමනය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කැපවීම අවධාරණය කෙරේ.

### IOSCO හි ලෝක ආයෝජක සතිය සැමරීමේ වැඩසටහන

IOSCO ලෝක ආයෝජක සතිය අතරතුර, අප මාර්ගගත ක්‍රමයට හා ඉලක්කගත කණ්ඩායම්වල පුද්ගලයින් ඒකරාශී කළ වැඩසටහන් හරහා මූල්‍ය දැනුවත්භාවය වැඩි කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළෙමු.

අපගේ සමාජ මාධ්‍ය නාලිකා හරහා වටිනා ආයෝජක අධ්‍යාපන අන්තර්ගතයන් සහිත දැනුමක් ලබා දුන් අතර, එමගින් තීරණාත්මක තේමාවන් තුනක් කෙරෙහි අවධානය යොමු කළේය: එනම් ආයෝජකයින් සතු ඔරොත්තු දීමේ හැකියාව, තිරසාර මූල්‍ය සහ ආයෝජක ආරක්ෂාවයි.

ලෝක ආයෝජක සතියට සමගාමීව අපගේ වැඩසටහන් මාලාව තුළ කැපී පෙනෙන සිදුවීම වූයේ අප විසින් පවත් වන ලද Varsity Battle අන්තර් විශ්ව විද්‍යාල ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම තරඟයයි. මෙම තරඟහෙරහා ආයෝජනය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට සමීප කළ අතර, බුද්ධිමත් ආයෝජන තීරණ ගැනීමට සහ රටේ ආර්ථික වර්ධනයට දායක වීමට සූදානම් වඩාත් මූල්‍යමය වශයෙන් දැනුවත් පරම්පරාවක් නිර්මාණය කිරීමට උපකාරී විය.

ඩිජිටල් අන්තර්ගතයන් සහ ප්‍රායෝගික ඉගෙනීම් සහිත මෙම ඒකාබද්ධ ප්‍රවේශය, මූල්‍ය සාක්ෂරතාවය ගොඩනැගීම සඳහා අපගේ කැපවීම පෙන්නුම් කරයි. වෙළෙඳපොළ අඛණ්ඩතාව සහ ආයෝජක ආරක්ෂාව අවබෝධ කර ගනිමින් මිනිසුන්ට බුද්ධිමත් ආයෝජන තීරණ ගැනීමට මෙවැනි ඉගෙනුම් ක්‍රමවේද උපකාරී වේ.

## උපායමාර්ගික අරමුණු 4

# ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දැනුවත් ආයෝජන තීරණ ගැනීම සහ උනන්දුව ප්‍රවර්ධනය කිරීම

### උපායමාර්ගික ඩිජිටල් තාක්ෂණය භාවිතය: ඩිජිටල් යුගයේ මූල්‍ය සාක්ෂරතාවය දියුණු කිරීම

අපගේ ආයෝජක අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා වැඩි වශයෙන් ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ කර ගනිමින් උපායමාර්ගිකව නැවත ස්ථානගත කර ඇත්තෙමු. මෙම වසරේ, අපගේ Linkedin පිටුව උපායමාර්ගිකව සරල ලෙස දියත් කිරීමත් සමඟ අප ට්විටර්, ෆේස්බුක් සහ ඉන්ස්ටග්‍රෑම් වැනි ස්ථාපිත සමාජ මාධ්‍ය නාලිකා වලින් ඔබ්බට අපගේ සමාජ මාධ්‍ය පැවැත්ම පුළුල් කළ අතර, මූල්‍ය අධ්‍යාපනය සඳහා පුළුල් ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කළෙමු.

අපගේ ඩිජිටල් උපායමාර්ගය සඳහා සමාජ මාධ්‍ය තවදුරටත් යොදා ගනිමින් ජාත්‍යන්තර කාන්තා දිනය සහ ලෝක ආයෝජක සතිය වැනි ප්‍රධාන මූල්‍ය දින දර්ශන දිනයන් සමඟ කාලානුරූපීව භාවිතා කරයි. මෙම සැලසුම්ගත ක්‍රියාකාරකම් තුළින් වැදගත් අරමුණු කෙරෙහි අවධානය යොමු කරන ස්ථාවර අධ්‍යාපනික අන්තර්ගතයන් ලබා දෙයි.

- නවීන ආයෝජන වංචා යෝජනා ක්‍රම හඳුනා ගැනීම සහ වළක්වා ගැනීම
- නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර ඇති ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ පුළුල් අවබෝධයක් ගොඩනැගීම
- කොටස් වෙළෙඳපොළ සහභාගීත්ව මූලිකාංග පිළිබඳ ප්‍රවේශ විය හැකි මග පෙන්වීමක් ලබා දීම
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බහුවිධ ආයෝජක ආරක්ෂණ රාමුව ඉස්මතු කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ YouTube නාලිකාව නව ආයෝජකයින් සඳහා මූලික සංකල්ප ඇතුළත් අධ්‍යාපනික වීඩියෝ සහ පළපුරුදු සහභාගිවන්නන් සඳහා සවිස්තරාත්මක වෙළෙඳපොළ සාකච්ඡා ලබා දීමෙන් මෙම උත්සාහයන්ට සහාය දක්වයි.

විවිධ ඩිජිටල් වේදිකාවල ආයෝජකයින් සමඟ සම්බන්ධ වීමෙන්, අප අනාගත වෙළෙළෙපොළ සහභාගීත්වයට බලපෑම් කරන විවිධ ප්‍රේක්ෂකයින් සඳහා, විශේෂයෙන් තරුණ, තාක්ෂණික දැනුමැති පරම්පරාවන් සඳහා මූල්‍ය අධ්‍යාපනය වඩාත් ප්‍රවේශ විය හැකි සහ ආකර්ශනීය බවට පත් කරන්නෙමු.

### තිරසාර මූල්‍යකරණයක් බිහි කිරීම : හරිත බැඳුම්කර පිළිබඳ සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ හවුල්කාරිත්වයෙන්, ''හරිත ක්ෂිතිජයක් කරා (Towards a Greener Horizon)፡ යන තේමාව යටතේ තිරසාර බැඳුම්කර සමුළුවක් කොළඹදී පැවැත්වීය. මෙම සමුළුව සඳහා රජයේ බලධාරීන්, රජය සතු ව්‍යවසායන්, බැඳුම්කර නිකුත් කිරීමට හැකියාවක් ඇති නිකුත් කරන්නන්, ආයෝජන බැංකු, සාංගමික මූල්‍ය උපදේශකයින්, සත්‍යාපන සැපයුම්කරුවන් (verification Proceders) සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන ඇතුළු මූල්‍ය පරිසර පද්ධතිය පුරා විසිර සිටින ප්‍රධාන පාර්ශවකරුවන් එක් කළේය.

ගෝලීය හරිත බැඳුම්කර ප්‍රවණතා සහ ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් සහභාගිවන්නන්ට ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ තිරසාර බැඳුම්කර වෙළෙඳපොළ ගොඩනැගීම සඳහා මෙම සමුළුව උත්ප්‍රේරකයක් ලෙස යොදා ගැණිනි. ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් විසින් මෙහෙයවන ලද දේශණ මගින් තිරසාර මූල්‍යකරණයේ තීරණාත්මක අංශ ආවරණය කරන ලදී. මෙම සහයෝගීතා මුලපිරීම, රටේ පාරිසරික හා සමාජ සංවර්ධන අරමුණු සඳහා සහාය වන අතරම, වර්ධනය වන ගෝලීය තිරසාර මූල්‍ය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා වැදගත් පියවරක් නියෝජනය කරයි.

### අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරුන්/ සමාගම් ලේකම් වරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

කොළම කොටස් හුවමාරුවේ සංශෝධිත සාංගමික යහපාලනය පිළිබඳ රීතිවලට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරුන්ගේ/ සමාගම් ලේකම්වරුන්ගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදි.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමත විගණකවරුන් සමඟ සම්බන්ධ වේ

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC), ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, 2024 මාර්තු 07 වන දින එහි අනුමත විගණකවරුන්ගේ ලැයිස්තුවේ විගණන සමාගම්වල කළමනාකරණ හවුල්කරුවන් සහ විගණන හවුල්කරුවන් සමඟ රැස්වීමක් පැවැත්වීය. මෙම සැසියේ ප්‍රධාන අරමුණ වූයේ විගණකවරුන්ගේ කාර්යභාරය පිළිබඳ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපේක්ෂාවන් සහ මෑතකදී මතු වූ ගැටළු කිහිපයක් සාකච්ඡා කිරීමයි. ලැයිස්තුගත ආයතන නියාමනය කිරීමේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරී නියාමන ප්‍රවේශය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර විගණන ගුණාත්මකභාවයේ වැදගත්කම සහ විගණකවරුන්ගේ වගකීම් අවධාරණය කරන ලදී

### ජාත්‍යන්තර සම්බන්ධතාවය

#### IOSCO සමඟ සම්බන්ධ වීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, IOSCO හි සාමාන්‍ය සාමාජිකයෙකු වන අතර වර්ධන හා නැගී එන වෙළෙඳපොළ කමිටුවේ (GEMC) සහ ආසියා පැසිෆික් කලාපීය කමිටුවේ (APRC) සාමාජිකයෙකි. IOSCO හි බොහෝ කාර්යයන් එහි ප්‍රතිපත්ති කමිටු මගින් සිදු වන අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒවායින් සමහර කමිටු සඳහා සහභාගී වේ. එනම් බලාත්මක කිරීමේ සහ තොරතුරු හුවමාරු කිරීමේ කමිටුව (කමිටුව 4) සහ සුළු පරිමාණ ආයෝජකයින්ගේ කමිටුව (කමිටුව 8) ඉන් කිහිපයකි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනු IOSCO MMoU හී (අවබෝධතා ගිවිසුමෙහි) අත්සන්කරුවෙකි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනමය කොමිෂන් සභාව ඉහත කී ප්‍රතිපත්ති කමිටු දෙකෙහි රැස්වීම්වලට සහභාගී වී ක්‍රියාකාරීව සහභාගී වන අතර සමීක්ෂණ සහ ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වීම හරහා විවිධ වැඩ කටයුතුවලට දායක වේ.

2023 ජූලි මාසයේදී වැඩිදියුණු කළ බහුපාර්ශ්වික අවබෝධතා ගිවිසුමට (EMMOU) අත්සන් කරන්නෙකු වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් IOSCO වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. අයදුම්පතේ මූලික සමාලෝචනය බහාමාස් හී සුරැකුම්පත් කොමිසම (SC Bahamas) විසින් සිදු කර ඇති බව අපට දන්වා ඇත. IOSCO EMMOU හි අත්සන් කරන්නෙකු වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි අයදුම්පත සම්බන්ධයෙන් හිමියා සමඟ පසු විපරම් පියවර ගන්නා ලදී.

### මාලදිවයිනේ ප්‍රාග්ධන වෙළඳපොළ නියාමකයා සමඟ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සන්ධිස්ථානීය අවබෝධතා ගිවිසුමක් අත්සන් කරයි

2024 ජූලි මාසයේදී මාලේහිදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ මාලදිවයිනේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන අධිකාරිය (CMDA) සන්ධිස්ථානීය අවබෝධතා ගිවිසුමක් අත්සන් කළහ. මෙම විෂය පථය ප්‍රධාන වශයෙන් CSE හි මාලදිවයින් සමාගම් විසින් ද්විතීයික ලැයිස්තුගත කිරීම ආවරණය කරන අතර, අධිකරණ බල ප්‍රදේශ දෙක හරහා නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ නියාමකයින් දෙදෙනා අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව, ධාරිතා ගොඩනැගීමේ සහාය සහ නියාමන තොරතුරු හුවමාරුව දක්වා විහිදේ.

## උපායමාර්ගික අරමුණු 5

# ආයතනික විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම

අපගේ විශාලතම වත්කම අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ය. අපගේ ආයතනය පුරා ඉහළ සහභාගීත්වයක් සහ ඵලදායිතාවයක් ඇතිකරමින් කරමින්, සේවක යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන ධනාත්මක සහ සහාය දක්වන සේවා ස්ථාන පරිසරයක් අපි බිහි කරන්නෙමු. අපගේ මානව සම්පත් රාමුව විසින් උපායමාර්ගිකව අවධානය යොමු කරන්නේ අපගේ මූලික මෙහෙවර හා දැක්ම සමඟ සමපාත වන ශක්තිමත් ආයතනික සංස්කෘතියක් ඇති කරන අතරම සුවිශේෂී දක්ෂතා ආකර්ෂණය කර ගැනීම සහ සංවර්ධනයක් කිරීම කෙරෙහි ය. මෙම ඒකාබද්ධ ප්‍රවේශය මඟින් අපගේ ශ්‍රම බලකායට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පාලනය කරන නියාමන රාමුවට අර්ථවත් දායකත්වයක් ලබා දීමට හැකියාව ලැබේ.

### කාර්ය මණ්ඩය සහ බඳවා ගැනීම්

2024 දී, උපායමාර්ගික බඳවා ගැනීම් හරහා ආයතනයේ විශේෂඥතාව සහ ධාරිතාව ශක්තිමත් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. අපගේ මෙහෙයුම් සහ නියාමන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අපේ විවිධ මට්ටම් හරහා දක්ෂ වෘත්තිකයන් සාර්ථකව බඳවා ගත්තෙමු.

අපගේ කණ්ඩායමට ප්‍රධාන එකතු කිරීමක් වූයේ නීති අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීමයි, එමඟින් අපගේ නීතිමය සහ නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු විශේෂඥතාවයක් ගෙන එන ලදි. ඊට අමතරව, දැඩි පරීක්ෂණ ක්‍රියාවලියකින් තෝරාගත් කළමනාකරණ අභ්‍යාසලාභීන් 10 දෙනෙකු අපි සාර්ථකව බඳවා ගත්තෙමු, එමඟින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා කණ්ඩායමට නැවුම් කුසලතා සහ විවිධ දක්ෂතාවයන්ගෙන් පරිපූර්ණ පිරිසක් එක්කර ගැනීමට හැකි විය.

මෙම උපායමාර්ගික කාර්ය මණ්ඩල එකතු කිරීම් වල එකතුව තුළින්, අපගේ හැකියාවන් තවදුරටත් වැඩිදියුණු කර ඇති අතර, වෙනස්වෙමින් පවතින ප්‍රාග්ධන වෙළෙඳපොළ පරිසරයක අභියෝගවලට මුහුණ දීම සඳහා අප හොඳින් සන්නද්ධ බව සහතික කරයි (රූප සටහන් : 7, 8, 9, 10, 11)

රූපසටහන 07 : සේවා තොරතුරු




රූපසටහන 08 : වයස් විශ්ලේෂණය




රූපසටහන 09 : අධ්‍යාපන සුදුසුකම්




රූපසටහන 10 : වත්මන් කාර්යමණ්ඩල සංයුතිය




රූපසටහන 11 : ස්ත්‍රී පුරුෂ විශ්ලේෂණය



## උපායමාර්ගික අරමුණු 5

# ආයතනික විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම

### සීමාවාසික වැඩසටහන

ඊළඟ පරම්පරාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයන් බිහි කිරීම සඳහා අපගේ අඛණ්ඩ කැපවීම තුළ, 2024 දී විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් 20 දෙනෙකුට අප සීමාවාසික අවස්ථා ලබා දුන්නෙමු. මෙම සීමාවාසික පුහුණුව මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ වටිනා ප්‍රායෝගික අත්දැකීම් ඔවුන්ට ලබා දුන් අතර, සැබෑ ලෝකයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ මෙහෙයුම්, නියාමන රාමු සහ කර්මාන්තයේ ආචාර ධර්ම පිළිබඳ අත්දැකීම්ද ඊට ඇතුළත් විය. එවැනි සීමාවාසික පුහුණුව ලබා දීමෙන්, අධ්‍යයනයත් ඉගෙනීම සහ වෘත්තීය යෙදීම් අතර පරතරය අවම කිරීම අපගේ අරමුණ වන අතර, අනාගත බඳවා ගැනීම් සඳහා කුසලතා වලින් පිරි සංචිතයක් ද නිර්මාණය කරන්නෙමු.

### ඉල්ලා අස්වීම් සහ සේවක රඳවා ගැනීම

වසර තුළ ආයතනයේ ඉල්ලා අස්වීම් කිහිපයක් සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂිකව 13% ක සේවකයින් ඉවත්වයාමේ අනුපාතයක් ඇති වූ අතර එය මධ්‍යම මට්ටමේ කාර්ය මණ්ඩලයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ඉල්ලා අස්වීම් අතර එක් අධ්‍යක්ෂකවරයෙකු, එක් සහකාර අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් 2 දෙනෙකු, සහකාර කළමනාකරුවන් 7 දෙනෙකු සහ කළමනාකරණ අභ්‍යාසලාභීන් එක් අයෙකු ඇතුළත් විය. මෙම ඉල්ලා අස්වීම්වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් විදෙස් රටවලට රැකියා සඳහා පිටත්ව යාම නිසා සිදු විය. බාධා අවම කිරීම සහ දිගුකාලීන සේවක තෘප්තිය වර්ධනය කිරීම සඳහා සේවක රඳවා තබා ගැනීම ශක්තිමත් කිරීමේ උත්සාහයන් අඛණ්ඩව සිදුකරගෙනප යන ලදි.

### කාර්ය මණ්ඩල සුභසාධනය සහ සහභාගීත්වය

කාර්ය මණ්ඩල සුභසාධනය අපගේ මානව සම්පත් උපාය මාර්ගයේ මූලික පදනමක් ලෙස පවතී. 2024 වර්ෂයේ දී, සේවක යහපැවැත්ම සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම, ධනාත්මක සහ හිතකාමී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් විවිධ ක්‍රියාකාරකම් අප සංවිධානය කළෙමු. එහි ප්‍රධාන විශේෂත්වයක් වූයේ 'වාර්ෂික පාඨකයෙකු බිහි කිරීමේ (Annual raise a Reader)' උත්සවය වන අතර, එහිදී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් සාක්ෂරතාවය සහ ඉගෙනීම කෙරෙහි අවධානය යොමු කළ අධ්‍යාපනික ක්‍රියාකාරකමකට සහභාගී විය. මෙම ක්‍රියාකාරකම තුළින් අපගේ සේවකයින්ගේ පවුල්වලට සහාය වීමට අවස්ථාවක් සැළසුන අතර එය අපගේ ආයතනික වගකීමේ කොටසක් ලෙසද සැළකිය හැකිය. එමගින් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනයට ද දායකත්වයක් සපයයි.

ඊට අමතරව, අප කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සුහද හමුවක් සහ ක්‍රීඩා දිනයක් පැවැත්වූ අතර, එම ක්‍රියාකාරකම් දෙකම තුළින් කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීම දිරිමත් කිරීමට සහ ආයතනය තුළ එකම ප්‍රජාවක් ලෙස කටයුතු කිරීමේ හැඟීමක් ඇති කිරීමට හැකි විය. මෙම සිදුවීම් හරහා සේවකයින්ට සැහැල්ලු පසුබිමක සිට කටයුතු කිරීමේ අවස්ථාවක් ලබා දුන් අතර, ආයතනික සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කළේය.

තවද, සේවා ස්ථානයට ආශිර්වාද කිරීම සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ අධ්‍යාත්මික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා, වසර තුළ පිරිත් සජ්ඣායනා කිරීමේ උත්සවයක් සංවිධානය කරන ලදී. මෙම උත්සවය ඉතා භක්තියෙන් පවත්වන ලද අතර සියලුම සහභාගිවන්නන් විසින් එය අතිවිශිෂ්ට සාර්ථකත්වයක් ලෙස සලකනු ලැබීය.

මානව සම්පත් කණ්ඩායම

**අපගේ සේවකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම අරමුණු කරගත් දේශීය පුහුණු වැඩසටහන් මාලාවක් සඳහා අප සාර්ථකව පහසුකම් සැලසුවෙමු.**

### පුහුණුව සහ සංවර්ධනය

2024 දී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තම කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ සංවර්ධනයට පහසුකම් සැලසූ අතර, වත්මන් ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන පරිසරය තුළ දියුණු වීමට අවශ්‍ය දැනුම හා කුසලතා ඔවුන් සතුව ඇති බව සහතික කළේය.

### දේශීය පුහුණුව

අපගේ සේවකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම අරමුණු කරගත් දේශීය පුහුණු වැඩසටහන් මාලාවක් සඳහා අප සාර්ථකව පහසුකම් සැලසුවෙමු. මෙම වැඩසටහන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තුළ ඔවුන්ගේ භූමිකාවන්ට අදාළ තාක්ෂණික විශේෂඥතාව සහ අන් අය සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමට, තම වැඩ කළමනාකරණය කිරීමට සහ තම පරිසරයට අනුවර්තනය වීමට හැකියාව ලබා දෙන අන්තර් පුද්ගල, සමාජීය සහ හැසිරීම් හැකියාවන් යන දෙකම ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කළේය. ඉලක්කගත දේශීය පුහුණුවක් ලබා දීමෙන්, අපගේ කාර්ය මණ්ඩලය ප්‍රාග්ධන වෙළෙඳපොළ රෙගුලාසි වල සංකීර්ණතා හැසිරවීමට හොඳින් සූදානම් බවත් ආයතනයේ අරමුණු සඳහා ඵලදායී ලෙස දායක වීමට බලගන්වා ඇති බවත් අපි සහතික කළෙමු.

### විදේශ පුහුණුව

දේශීය පුහුණුවට අමතරව, අපගේ කාර්ය මණ්ඩලයට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ රෙගුලාසි පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා විදේශ පුහුණු වැඩසටහන් සඳහා ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහසුකම් සපයන ලදී. මෙම අවස්ථාවන් මගින් අපගේ සේවකයින්ට ගෝලීය ආචාරධර්ම ගැන ඉගෙන ගැනීමට, වෙනත් රටවල නියාමන රාමු පිළිබඳව අධ්‍යයනය කිරීමට සහ ආයතනයේ

කළමනාකරණ පුහුණුවන්නන්

ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා එම අවබෝධයන් යොදාගැනීමට ඉඩ සැලසුණි. මෙම ජාත්‍යන්තර ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය අවස්ථා ලබාදීමෙන්, අපගේ සේවකයින්ගේ ගෝලීය දැක්ම පුළුල් කිරීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළවල වෙනස්වන තත්ත්වයන්ට අනුවර්තනය වීමට ඔවුන්ට උපකාර කිරීම අපගේ ඉලක්කය විය.

විශේෂයෙන් IOSCO වාර්ෂික සමුළුව, කමිටු රැස්වීම් සහ විවිධ නියාමන වැඩමුළු හරහා ගෝලීය සුරැකුම්පත් වෙළෙඳපොලවල සහ අනාගත වෙළෙඳපොළවල පැන නගින වඩාත්ම දැවෙන නියාමන ගැටළු සාකච්ඡා කිරීමට වටිනා අවස්ථා නිරන්තරයෙන් ලබා දීම වෙනුවෙන් IOSCO සංවිධානයට අපගේ අවංක කෘතඥතාව පළ කරන්නෙමු. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අපගේ කාර්ය මණ්ඩලයට වත්මන් ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රවණතා සහ වර්ධනයන් පිළිබඳව දැනුවත් භාවයක් ලබා ගැනීමට හැකි වන පරිදි අදාළ පුහුණු සහ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ලබා දීම සම්බන්ධයෙන් ආසියා-පැසිෆික් ආර්ථික සහයෝගීතාව (APEC), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ මැලේසියාවේ සුරැකුම්පත් කොමිසම ඇතුළු අනෙකුත් නියාමන ආයතන සහ සංවිධානවලට ද අපි ස්තූතිවන්ත වෙමු.

මෙම පුහුණු ක්‍රියාකාරකම් හරහා, අඛණ්ඩ ඉගෙනීමේ සංස්කෘතියක් බිහි කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කැපවී සිටින අතර, අපගේ කාර්ය මණ්ඩලයට දේශීය හා ජාත්‍යන්තර නියාමන යන දෙක සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට අවශ්‍ය නිපුනතාවන්ගෙන් සන්නද්ධ කර ඇති බව සහතික කරයි.

සියලුම සේවකයින් සඳහා සහයෝගී සහ වර්ධනයට නැඹුරු පරිසරයක් නිර්මාණය කිරීමට මානව සම්පත් අංශය කැපවී සිටී.

උපායමාර්ගික බඳවා ගැනීම්, පුහුණු කිරීම් සහ සංවර්ධන අවස්ථා සහ කාර්ය මණ්ඩල සුභසාධනය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින්, සමස්ත ආයතනික අත්දැකීම් වැඩිදියුණු කිරීමේදී අප සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත්තෙමු. ඉදිරි වසර දෙස අවධානය යොමු කිරීමේදී , කුසලතා වර්ධනය කිරීම, යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ වෘත්තීය වර්ධනයට සහාය වීම සඳහා අපගේ අඛණ්ඩ උත්සාහයන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අඛණ්ඩ සාර්ථකත්වයට සහ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන රාමුව ශක්තිමත් කිරීමට සැලකිය යුතු ලෙස දායක වනු ඇතැයි අපගේ විශ්වාසයයි.

## තොරතුරු තාක්ෂණය

### අන්තර්ජාල සහ Cloud Base පහසුකම් වැඩි දියුණු කිරීම

Cloud Base අන්තර්ජාල පහසුකම් හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි අභ්‍යන්තර සන්නිවේදනය සහ සහයෝගීතාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇති අතර, එය දැන් ඍකදමා ඊ, ඊ මේල් (විද්‍යුත් තැපැල) සහ කාර්යාල සහයෝගීතා වේදිකාවක් ලෙස කටයුතු කරයි.

### අභ්‍යන්තර යෙදුම් හඳුන්වාදීම

මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර යෙදුම් කිහිපයක් ද යොදාගත් ගන්නා ලදි. මේවාට විධිමත් තොරතුරු තාක්ෂණ සහාය සඳහා උපකාරක පද්ධතියක් සහ අභ්‍යන්තර ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමට සහ වඩා උසස් ආකාරයෙන් පවත්වාගෙනයාමට අවශ්‍ය නව යෙදුම් ඇතුළත් වේ.

### ජංගම පරිගණක ප්‍රතිපත්තියක් හඳුන්වාදීම

නවීන වැඩ පරිසරයන්ට අනුකූල වීම සඳහා ජංගම පරිගණක ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. මෙම ප්‍රතිපත්තිය දත්ත අඛණ්ඩතාව සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගනිමින් ජංගම උපාංගවලින් ආයතනික සම්පත් වෙත ආරක්ෂිත ප්‍රවේශය සහතික කරයි.

මෙම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කාර්යක්ෂමතාව, අභ්‍යන්තර සහයෝගීතාවය සහ සමස්ත ඩිජිටල් පරිවර්තනය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරයි. තොරතුරු තාක්ෂණයත් සමඟ තවදුරටත් ඉදිරියට යමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි මෙහෙවර සහ මෙහෙයුම් විශිෂ්ටත්වයට සහාය වීම සඳහා නව්‍ය විසඳුම් අනුගමනය කිරීමට කැපවී සිටී.

තොරතුරු තාක්ෂණ කණ්ඩායම

# අතිරේක තොරතුරු

## වෙළෙඳපොළ අතරමැදි ආයතන

### 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදී ඇති, ආන්තික ණය සපයන්නන්, ආයෝජන කළමණාකරුවන්, කොටස් ප්‍රාරක්ෂණ ආයතන, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, කොටස් තැරැව්කරුවන්, කොටස් වෙළෙන්දන් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල (CIS) කළමනාකරණ සමාගම් පහත දක්වා ඇත;

### ආන්තික ණය සැපයුම්කරුවන් යන යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ඇක්විටි පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඇසෙට්ලයින් ෆයිනෑන්ස් ලිමිටඩ්
3. බෙන්සෙයි සෙකියුරිටීස් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලැමිටඩ්
5. සිටිසන්ස් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී එල් සී
7. ඩී එෆ් සි සී බැන්ක් පී එල් සී
8. ඩයලොග් ෆයිනෑන්ස් පී එල් සී
9. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
10. එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
11. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
12. ප්‍රොටේජ් කැපිටල් ඇක්සස් ලිමිටඩ්
13. නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී
14. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
15. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
16. පී එම් එෆ් ෆයිනෑන්ස් පී එල් සී
17. ආර් පී සී මාර්ජින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
18. සම්පත් බැන්ක් පී එල් සී
19. සෙන්කඩගල ෆයිනෑන්ස් පී එල් සී
20. සෙලාන් බැන්ක් පී එල් සී

### ආයෝජන කළමනාකරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. ලංකා බැංකුව
5. කැපිටල් එලයන්ස් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ්
6. සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
7. සී ටී සී එල් එස් ඒ ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
8. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
9. ජෝර්ජ් ස්ටුවර්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
10. ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ්
11. ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) ලිමිටඩ්
12. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
13. ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
14. එම් පවර් කැපිටල් සෙකියුරිටීස් ලිමිටඩ්
15. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
16. නැෂනල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්
17. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
18. ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
19. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
20. සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
21. සොෆ්ට් ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
22. වොල්ඩොක් මැකෙන්සි ලිමිටඩ්

### ප්‍රරක්ෂකයන් යන වර්ගීකරණය යටතේ බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ලංකා බැංකුව
2. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී එල් සී
3. ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
4. හැටන් නැෂනල් බැන්ක් පී එක් සී
5. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
6. නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ඔෆ් පී එල් සී
7. සම්පත් බැන්ක් පී එල් සී
8. සෙලාන් බැන්ක් පී එල් සී

### ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන යන වර්ගීකරණය යටතේ බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ෆිච් රේටිංග්ස්
2. ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ්

### කොටස් තැරැව්කරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ACAP ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ACS කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්2
3. ඇක්විටි ස්ටොක්බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. අල්මාස් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
5. ඇම්බියෝන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
6. ආශා සෙකියුරිටීස් ලිමිටඩ්
7. ඒෂියා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. කැපිටල් එලායන්ස් පී එල් සී (ණය සුරැකුම්පත්)
10. කැපිටල් එලායන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
11. කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
12. සී. ටී. සී. එල්. එස්. ඒ. සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
13. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්

14. ඉස්ට් කැපිටල් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
15. ෆස්ට් ගාඩියන් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
16. ජේ.බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
17. ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
18. ලංකා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
19. LOLC සෙකියුරිටීස් ලිමිටඩ්
20. NDB සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
21. නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
22. රිචඩ් පීරිස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
23. SC සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
24. සෙන්ෆින් සෙකියුරිටීස් ලිමිටඩ්
25. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
26. සමර්විල් කොටස් තැරැව්කාර (ප්‍රයිවට්) ලිමිටඩ්
27. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

### කොටස් වෙළෙඳුන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. ACS කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඒෂියා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. කැපිටල් එලායන්ස් පී එල් සී (ණය සුරැකුම්පත්)
5. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
6. ජේබී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
7. නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. එස් සී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
9. සෙලාන් බැන්ක් පී එල් සී (ණය සුරැකුම්පත්)
10. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

### සාංගමික මූල්‍ය උපදේශක කාණ්ඩය යටතේ බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදියන්;

1. ඇක්විටි පාර්ටනර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. අතරා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. කැපිටල් එලයන්ස් පාර්ට්නර්ස් ලිමිටඩ්
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
5. සී ටී සී එල් එස් ඒ කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්
6. එම් පවර් කැපිටල් සෙකියුරිටීස් ලිමිටඩ්
7. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
8. NDB ආයෝජන බැංකුව

### කළමනාකරණ සමාගම් සහ ඔවුන්ගේ සාමූහික යෝජනා ක්‍රම යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

1. **ආර්පිකෝ අටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්**
   - i. ආර්පිකෝ ඇටරක්ෂියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් (CMT)
   - ii. ආර්පිකෝ ඇටරක්ෂියා ඉක්විටි ඉන්කම් ෆන්ඩ්
   - iii. ආර්පිකෝ ඇටරක්ෂියා රිපෝ ඉන්වෙස්ට්මන්ට් ෆන්ඩ්
   - iv. ආර්පිකෝ ඇටරක්ෂියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ්
   - v. ආර්පිකෝ ඇටරක්ෂියා USD ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
2. **ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   - i. ඒෂියා සෙකියුරිටීස් මනි මාර්කට් ෆන්ඩ්
   - ii. ඒෂියා සෙකියුරිටීස් ඉන්කම් ෆන්ඩ්
   - iii. ඒෂියා සෙකියුරිටීස් ගිල්ට් ෆන්ඩ්
   - iv. ඒෂියා සෙකියුරිටීස් ඩයනමික් ගිල්ට් ෆන්ඩ්
   - v. ඒෂියා සෙකියුරිටීස් ඉක්විටි ඔපචුනිටීස් ෆන්ඩ්
   - vi. ඒෂියා සෙකියුරිටීස් ඩයනමික් ඉන්කම් ෆන්ඩ්
3. **ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   - i. ඇස්ට්‍රා ඇක්ටිව් ඉන්කම් ෆන්ඩ්
   - ii. ඇස්ට්‍රා ඇල්ෆා ෆන්ඩ්
   - iii. ඇස්ට්‍රා මනි මාර්කට් ෆන්ඩ්
4. **ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   - i. ඇසෙට්ලයින් ඉන්කම් ෆන්ඩ්
   - ii. ඇසෙට්ලයින් ඉන්කම් ප්ලස් ග්‍රෝත් ෆන්ඩ්
5. **කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්**
   - i. කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ්
   - ii. කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෙෂරි ෆන්ඩ්
   - iii. කැපිටල් එලයන්ස් ෆික්ස්ඩ් ඉන්කම් ඔපොචුනිටීස් ෆන්ඩ්
   - iv. කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
   - v. කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ්
   - vi. කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රෙඩින් ෆන්ඩ්
   - vii. කැපිටල් එලයන්ස් හයියිල්ඩ් ෆන්ඩ්
   - viii. කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ්
   - ix. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ග්‍රේඩ් ෆන්ඩ්
   - x. කැපිටල් එලයන්ස් මීඩියම් රිස්ක් ඩෙබ්ට් ෆන්ඩ්
   - xi. කැපි කැපිටල් එලයන්ස් කොන්ට්‍රේට්වු ඉක්විටි ෆන්ඩ්
   - xii. කැපිටල් එලයන්ස් ශ්‍රී ලංකා ඩොලර් ෆන්ඩ්
   - xiii. කැපිටල් එලයන්ස් පස් අවුරුදු ඔප්ටිමම් ෆන්ඩ්
   - xiv. කැපිටල් එලයන්ස් පස් අවුරුදු ආවෘත අරමුදල
   - xv. කැපිටල් එලයන්ස් දස අවුරුදු ආවෘත අරමුදල
6. **සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
   - i. සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ්
   - ii. සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (A සීරීස්)
   - iii. සීබෑන්ක් හයියීල්ඩ් ෆන්ඩ්
   - iv. සීබෑන්ක් සේවින්ග්ස් ප්ලස් මනි මාර්කට් ෆන්ඩ්
   - v. සීබෑන්ක් සුරැකුම් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - vi. සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ්
7. **සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්★★**
   - i. සිලෝන් ඩොලර් බොන්ඩ් ෆන්ඩ්
   - ii. සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   - iii. සිලෝන් ඉන්කම් ෆන්ඩ්
   - iv. සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   - v. සිලෝන් අයි පී ඕ ෆන්ඩ්
   - vi. සිලෝන් මනි මාර්කට් ෆන්ඩ්
   - vii. සිලෝන් ටුවරිසම් ෆන්ඩ්
   - viii. සිලෝන් ට්‍රෙෂරි ඉන්කම් ෆන්ඩ්
8. **සී ටී සී එල් එස් ඒ ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**
   - i. CT CLSA ඉක්විටි ෆන්ඩ්
   - ii. CT CLSA ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - iii. CT CLSA හයි යීල්ඩ් ෆන්ඩ්
   - iv. CT CLSA ග්‍රෝත් ඉක්විටි ෆන්ඩ්

# අතිරේක තොරතුරු

v. CT CLSA මනි මාර්කට් ෆන්ඩ්
vi. CT CLSA ආදායම් ෆන්ඩ්

**9. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්**

i. ෆස්ට් කැපිටල් ඉක්විටි ෆන්ඩ්
ii. ෆස්ට් කැපිටල් ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
iii. ෆස්ට් කැපිටල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
iv. ෆස්ට් කැපිටල් මනි මාර්කට් ෆන්ඩ්
v. ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්
vi. ෆස්ට් කැපිටල් මනි ප්ලස් ෆන්ඩ්

**10. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
ii. ජේ බී වැන්ටේජ් ෂෝර්ට් ටර්ම් ගිල්ට් ෆන්ඩ්
iii. ජේ බී වැන්ටේජ් වැල්‍යූ ඉක්විටි ෆන්ඩ්

**11. ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. ලීනියර් වෙල්ත් ඩයනමික් ඔපොචුනිටීස් ෆන්ඩ්
ii. ලීනියර් වෙල්ත් ඉන්කම් ෆන්ඩ්
iii. ලීනියර් වෙල්ත් ලික්විඩ් මනි ෆන්ඩ්

**12. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්**

i. නාමල් ග්‍රෝත් ෆන්ඩ්
ii. නාමල් හයියීල්ඩ් ෆන්ඩ්
iii. නාමල් ඉන්කම් ෆන්ඩ්
iv. නැෂනල් ඉක්විටි ෆන්ඩ්

**13. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්**

i. එන් ඩී බී වෙල්ත් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
ii. එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
iii. එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ෆන්ඩ්
iv. එන් ඩී බී වෙල්ත් ඉන්කම් ෆන්ඩ්
v. එන් ඩී බී වෙල්ත් ඉන්කම් ප්ලස් ෆන්ඩ්
vi. එන් ඩී බී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ්
vii. එන් ඩී බී වෙල්ත් මනි ෆන්ඩ්
viii. එන් ඩී බී වෙල්ත් මනි ප්ලස් ෆන්ඩ්
ix. එන් ඩී බී වෙල්ත් ඩයනමික් ට්‍රෂෙරි ෆන්ඩ්

**14. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්**

i. ප්‍රිමියර් ග්‍රෝත් ෆන්ඩ්
ii. ප්‍රිමියර් මනි මාර්කට් ෆන්ඩ්

**15. සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. සෙන්ෆින් ඩයනමික් ඉන්කම් ෆන්ඩ්
ii. සෙන්ෆින් ඩිවිඩන්ඩ් ෆන්ඩ්
iii. සෙන්ෆින් ග්‍රොත් ෆන්ඩ්
iv. සෙන්ෆින් මනි මාර්කට් ෆන්ඩ්
v. සෙන්ෆින් ෂාරියා බැලන්ස්ඩ් ෆන්ඩ්
vi. සෙන්ෆින් ෂාරියා ඉන්කම් ෆන්ඩ්
vii. සෙන්ෆින් ඉන්ෂුරන්ස් සෙක්ටර් ෆන්ඩ්
viii. සෙන්ෆින් ෆයිනෑන්ෂල් සර්විසස් ෆන්ඩ්
ix. සෙන්ෆින් කන්සියුමර් ස්ටෙප්ල්ස් ෆන්ඩ්

**16. සොෆ්ට්ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. සොෆ්ට්ලොජික් ඉක්විටි ෆන්ඩ්
ii. සොෆ්ට්ලොජික් මනි මාර්කට් ෆන්ඩ්

## 2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී

### වෙළෙඳපොළ ආයතන

කොටස් හුවමාරු, මධ්‍යම තැන්පතුගාර සහ නිෂ්කාශනාගාර යන කාණ්ඩ යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා දී ඇති වෙළෙඳපොළ ආයතන පහත දක්වා ඇත;

### බලපත්‍රලාභී කොටස් හුවමාරු

1 කොළඹ ව්‍යාපාරවස්තු හුවමාරුව

### බලපත්‍රලාභී මධ්‍යම තැන්පතුගාර

1 සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම පෞද්ගලික සමාගම

### බලපත්‍රලාභී නිෂ්කාශන ආයතන

1 සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම පෞද්ගලික සමාගම

### අතිරේක සේවා සපයන්නන්

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ

### CIS යෝජනා ක්‍රමයක භාරකරු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබාදී ඇති බැංකුවක් විය යුතුය.

## තොරතුරු පත්‍රිකාව

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වාර්ෂික පිරිවැටුම (රු. මිලි) හිමිකම් කොටස් | 396,882 | 1,173,157 | 686,602 | 410,629 | 537,640 |
| දේශීය (රු. මිලි) | 318,354 | 1,112,817 | 634,426 | 371,360 | 484,387 |
| විදේශීය (රු. මිලි)) | 78,527 | 60,340 | 52,176 | 39,270 | 53,253 |
| වෙළෙඳපොළ දින (සංඛ්‍යාව) | 209 | 240 | 231 | 242 | 240 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම (රු. මිලි) හිමිකම් කොටස් | 3,217 | 4,888 | 2,972 | 1,697 | 2,240 |
| ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) හිමිකම් කොටස් | 21,349 | 59,772 | 29,048 | 16,989 | 23,250 |
| දේශීය (මිලියන) | 19,808 | 57,905 | 28,142 | 15,889 | 21,378 |
| විදේශීය (මිලියන) | 1,541 | 1,866 | 905 | 1,099 | 1,872 |
| ගණුදෙනු සංඛ්‍යාව හිමිකම් කොටස් | 3,070,021 | 8,131,508 | 6,057,233 | 3,618,960 | 3,524,910 |
| දේශීය (සංඛ්‍යාව) | 2,968,092 | 8,009,816 | 5,973,350 | 3,544,022 | 3,445,381 |
| විදේශීය (සංඛ්‍යාව) | 101,929 | 121,692 | 83,883 | 74,938 | 78,529 |
| නව ලයිස්තුගත කිරීම් (සංඛ්‍යාව) | 1 | 17 | 5 | 2 | 4 |
| ලයිස්තුගතභාවයෙන් ඉවත්වීම් (සංඛ්‍යාව) | 7 | 3 | 11 | 1 | 10 |
| ලයිස්තුගත සමාගම් | 283 | 296 | 290 | 290 | 284 |
| ගණුදෙනු වූ සමාගම් සංඛ්‍යාව | 266 | 240 | 283 | 276 | 266 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බි.) | 2,960.65 | 5,489.17 | 3,847.15 | 4,248.93 | 5,695.56 |
| වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතය වසර අවසාන (වාර ගණන) | 11.3 | 13.63 | 5.0 | 11.1 | 8.9 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයට පිරිවැටුම (%) | 13.4 | 21.4 | 17.8 | 9.7 | 10.8 |
| ලාභාංශ ආදායම- වසර අවසානයේ (%) | 2.7 | 2.17 | 4.1 | 3.3 | 3.6 |
| මිල පොත් අගය වසර අවසානයේ (වාර ගණන) | 1.1 | 1.67 | 0.9 | 0.9 | 1.2 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය | 19.7% | 36.7% | 22.9% | 17.6% | 23.6% |
| **මිල දර්ශක** | | | | | |
| සියලු කොටස් මිල දර්ශකය (ASPI) | 6,774.22 | 12,226.01 | 8,489.66 | 10,654.16 | 15,944.61 |
| වසරින් වසරට වෙනස්වීමේ ප්‍රතිශතය | 10.5 | 80.48 | (4.65) | 25.50 | 49.7% |
| ඒ ඇන්ඩ් පී ශ්‍රී ලංකා20 | 2,638.10 | 4,233.25 | 2,635.63 | 3,068.36 | 4,862.10 |
| වසරින් වසරට වෙනස්වීමේ ප්‍රතිශතය | (10.2) | 60.47 | (13.05) | 16.42 | 58.5% |
| **මුළු ප්‍රතිලාභ දර්ශනය** | | | | | |
| සියලු කොටස් මුළු ප්‍රතිලාභ මිල දර්ශකය | 9,078.65 | 16,423.75 | 11,404.60 | 14,617.77 | 23,067.59 |
| වසරින් වසරට වෙනස්වීමේ ප්‍රතිශතය | 10.7 | 80.91 | (4.65) | 28.17 | 35.33 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය | 4,332.84 | 7,241.29 | 4,749.27 | 5,710.45 | 9,480.90 |
| වසරින් වසරට වෙනස්වීමේ ප්‍රතිශතය | (5.9) | 67.13 | (10.71) | 20.24 | 41.11 |

# අතිරේක තොරතුරු

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **ජාතික නොවන ක්‍රියාකාරකම් *** | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රු. මිලියන) | 78,527 | 60,340 | 52,176 | 39,270 | **53,253** |
| මිලදී ගැනීම් (රු. මිලියන.) | 52,889 | 34,016 | 67,488 | 41,451 | **48,013** |
| විකුණුම් (රු. මිලියන) | 104,165 | 86,665 | 36,863 | 37,088 | **58,492** |
| ශුද්ධ විදේශීය ගලාඒම් | (51,275.7) | (52,649) | 30,625 | 4,363 | **(10,479)** |
| ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 1,541 | 1,866 | 905 | 1,099 | **1,872** |
| මිලදී ගැනීම් (මිලියන.) | 928 | 1,308 | 884 | 945 | **1,472** |
| විකුණුම් (මිලියන.) | 2,154 | 2,425 | 927 | 1,254 | **2,271** |
| ගණුදෙනු සංඛ්‍යාව | 101,929 | 121,692 | 83,883 | 74,938 | **78,526** |
| මිලදී ගැනීම් (සංඛ්‍යාව.) | 42,134 | 74,172 | 80,859 | 80,379 | **67,508** |
| විකුණුම් (සංඛ්‍යාව.) | 161,725 | 169,213 | 86,908 | 69,498 | **89,545** |

⋆ සාමාන්‍ය කොටස් පමණි

# මූල්‍ය වාර්තා

## ශක්තියේ උත්ප්‍රේරක

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මූල්‍ය වාර්තාකරණය විනිවිදභාවය, වගවීම සහ වෙළෙඳපොළ අඛණ්ඩතාව සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරයි. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ නිවැරදි හා කාලෝචිත අවබෝධයක් ලබා දීමෙන්, අපි දැනුවත් තීරණ සක්‍රීය කරමු, අවංකභාවය ඉහළ නංවමු, සහ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ කෙරෙහි විශ්වාසය තහවුරු කරමු.

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/G/SEC/FA/24/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 16

සභාපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 සැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගනකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාදාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීයමය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තියමය සැකමුසු බව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එයවැනි වංචා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැළසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විසනන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම, හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින් වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර නොගැනීමෙන් ඇතිවිය හැකි අවදනම වැරැද්දක් නිසා සිදුවූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදනමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිනිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවක් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට කොමිෂන් සභාව විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වා ගෙන ගොස් ඇත.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විදිවිදාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකාර ඇති බව

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍යය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 7 | 39,913,257 | 43,089,001 |
| අස්පෘශ්‍ය වත්කම් | 7.1 | 15,091,703 | 24,679,729 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 8 | 3,024,276 | 2,216,963 |
| ලැබිය යුතු දෑ | 9 | 241,020,182 | 197,806,896 |
| ස්ථාවර තැන්පතු ආයෝජන | 10 | 670,593 | 662,333 |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 11 | 63,945,838 | 63,454,247 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12 | 32,653,786 | 18,112,305 |
| **මුළු වත්කම්** | | 396,319,634 | 350,021,474 |
| | | | |
| **අරමුදල් හා වගකීම්** | | | |
| **යෙදවූ අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 13.1 | 0 | 0 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත ආදායම් - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් ලද ප්‍රදානයන් | 14 | 25,892,374 | 26,281,828 |
| විලම්භිත ආදායම් - ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය මගින් ලද ප්‍රදානයන් | 15 | 22,901,142 | 35,266,382 |
| සේවක ප්‍රතිලාභ වගකීම | 16.1 | 102,897,077 | 97,520,914 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | 17 | 165,913,172 | 147,384,953 |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 18 | 27,263,940 | 37,721,806 |
| පූර්ව ලැබීම් | | 51,451,928 | 5,845,591 |
| **මුළු අරමුදල් හා වගකීම්** | | 396,319,634 | 350,021,474 |

87 සිට 102 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්:

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්

මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර
සභාපති

කොළඹදී
2025 ජූනි 03 දින

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **අදායම්** | | | |
| බලපත්‍ර ගාස්තු | | 25,123,028 | 4,100,649 |
| පරිපාලන බදු | | 8,080,343 | 6,522,148 |
| අධ්‍යාපන වැඩසටහන් | | 12,836,609 | 11,629,061 |
| පොලී ආදායම් | | 672,852 | 72,280 |
| අනෙකුත් ආදායම් | | 1,118,453 | 1,126,302 |
| කාර්ය මණ්ඩල ණය පොලී අදායම් | | 1,826,428 | 944,910 |
| සෙස් අරමුදලෙන් ලද ප්‍රදානයන් හඳුනාගැනීම් | 14 | 18,334,230 | 18,087,517 |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලද ප්‍රදානයන් හඳුනාගැනීම් | 15 | 12,365,239 | 12,365,239 |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිඵල පාදක අරමුදල් | 19 | 0 | 164,073,632 |
| මුළු ආදායම | | 80,357,183 | 218,921,738 |
| **වියදම** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 20 | (431,513,003) | (393,499,169) |
| පරිපාලන හා ආයතනික පිරිවැය | 21 | (256,769,019) | (236,006,969) |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන පිරිවැය | 22 | (37,907,073) | (36,029,791) |
| මූල්‍ය ගාස්තු | | (98,924) | (48,190) |
| **මුළු වියදම** | | (726,288,019) | (665,584,119) |
| **වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම (බදු පෙර)** | | (645,930,836) | (446,662,381) |
| ආදායම් බදු වියදම් | | 0 | 0 |
| **වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම (බදු පසු)** | | (645,930,836) | (446,662,381) |
| **ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම්** | | 645,930,836 | 446,662,381 |

87 සිට 102 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

# ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමුච්චිත අරමුදල රු. | එකතුව රු. |
|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 0 | 0 |
| වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම | (446,662,381) | (446,662,381) |
| ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම් | 446,662,381 | 446,662,381 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 0 | 0 |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 0 | 0 |
| වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම | (645,930,836) | (645,930,836) |
| ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම් | 645,930,836 | 645,930,836 |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 0 | 0 |

87 සිට 102 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | | 0 | 0 |
| **ගැලපීම්:** | | | |
| ක්ෂයවීම් | 7 & 7.1 | 30,708,546 | 30,442,634 |
| සෙස් අරමුදලෙන් ලද ප්‍රදානයන් හඳුනාගැනීම් | 14 | (18,334,230) | (18,087,517) |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලද ප්‍රදානයන් හඳුනාගැනීම් | 15 | (12,365,239) | (12,365,238) |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 16.1 | 9,308,152 | 34,938,816 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ | | (650,278) | (318,034) |
| | | 8,666,951 | 34,610,661 |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (807,312) | 1,942,992 |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (43,213,286) | 67,073,275 |
| තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | | (491,592) | 2,382,999 |
| පූර්ව ලැබීම් වැඩිවීම/(අඩුවීම) | | 45,606,337 | (468,107) |
| ගෙවිය යුතු අදායම් බදු වැඩිවීම/(අඩුවීම) | | 18,528,219 | (98,434,827) |
| ණය හිමියන් හා උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | | (10,457,866) | 14,936,469 |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | | 0 | (50,122,638) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | | 17,831,451 | (28,079,177) |
| වර්ෂය තුල ගෙවූ පාරිතෝෂිත | 16.1 | (3,931,989) | (6,307,108) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | 13,899,462 | (34,386,285) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | 7 | (17,944,776) | (4,170,358) |
| ස්ථාවර තැන්පතු ආයෝජන | | (8,259) | (8,090) |
| දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීමෙන් ලද මුදල් | | 650,278 | 318,034 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (17,302,757) | (3,860,414) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය තුල සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් | 14 | 17,944,776 | 4,211,858 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | 17,944,776 | 4,211,858 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 14,541,481 | (34,034,841) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන (අ)) | | 18,112,304 | 52,147,145 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන (ආ)) | | 32,653,785 | 18,112,304 |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| බැංකුවේ ඇති මුදල් | | 18,072,304 | 52,107,145 |
| අතැති මුදල් | | 40,000 | 40,000 |
| | | 18,112,304 | 52,147,145 |
| **සටහන (ආ)** | | | |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජන | 12 | 30,000,000 | 0 |
| බැංකුවේ ඇති මුදල් | 12 | 2,613,785 | 18,072,304 |
| අතැති මුදල් | 12 | 40,000 | 40,000 |
| | | 32,653,786 | 18,112,304 |

87 සිට 102 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තින් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (ශ්‍රී.ල.සු.වි.කො.ස) ලාභ නොලබන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 අංක 19 දරන නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් අවලංගු කරන ලද පෙර පැවති 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර ඇත.

ශ්‍රී.ල.සු.වි.කො.ස. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි නැගෙනහිර කුළුනෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 03 වන වගන්ති ප්‍රකාරව මේ පනතේ අරමුණ සහ පරමාර්ථය වනුයේ;

(අ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පිහිටුවීම.

(ආ) සාධාරණ, විධිමත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළඳපොළක් ඇති කිරීම, පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම; සහ

(ඈ) සුරැකුම්පත් වෙළඳපොළවල් වලට අදාලව සපයනු ලබන සේවාවන්හි උසස් වෘත්තීමය ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරීව අනුගමනය කර ඇත.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල හා වන්දි අරමුදල සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

වර්තමාන අගය මත පදනම් වූ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම හැරුණුකොට, මූල්‍ය ප්‍රකාශන, උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. වර්ෂය අවසානයේ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී පොලී පිරිවැය, ප්‍රවර්තන සේවා පිරිවැය, ආයු ගණක (ලාභ)/අලාභ, වර්ෂය තුල ඉවත් වූ සේවකයන් හට ගෙවූ/ගෙවිය යුතු පාරිතෝෂිත සඳහා නියමිත ගැලපීම් කර ඇත. එමෙන්ම ඒ හා යෝග්‍ය ගිනුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් මගින් හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළයෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරීව අනුගමනය කර ඇත.

### 1.7 ගිනුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සහ ඒ හා අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම අස්ථාශ්‍ය වගකීම් සම්බන්ධ හෙළිදරවුකිරීම් ද සිදු කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවය ඉදිරි කාලපරිච්ඡේද වල දී අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති කල හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් ඉදිරිකාලීනව හඳුනා ගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගත් අගයන් වලට වඩාත් ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන විනිශ්චයන් පිලිබඳ තොරතුරු නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමට අදාළ සටහනේ පැහැදිලි කර ඇත. නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමෙහි පිරිවැය නිර්ණය කරනුයේ ආයුගණක තක්සේරුව භාවිතා කිරීමෙනි. ආයු ගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කරගැනේ. මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. ආයුගණක තක්සේරුව සඳහා යොදාගන්න උපකල්පනයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 16 හි හෙළිදරව් කර ඇත.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිඳු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ දිනට පසුව සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

### 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ

#### හිමිකම් සහිත දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් හා ඒ හා සම්බන්ධ අනුශාංගික වියදම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ඵලදායී ජීව කාලය පුරා ක්ෂය/ක්‍රම ක්ෂය සිදු කරයි. ප්‍රදානයන් ලෙස ලැබුණු වත්කම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ක්ෂය/ක්‍රම ක්ෂය අදාළ සංචිත ගිණුම් වලට අය කරනු ලැබේ.

දේපල,පිරියත, උපකරණ වල හා අස්පෘශ්‍ය වත්කම් වල පසුකාලීන පිරිවැය ප්‍රග්ධනායනය කරනු ලබන්නේ එය සම්බන්ධව ඇති නිශ්චිත වත්කමෙහි ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ඒ මගින් වැඩි වන විට පමණි. අනෙකුත් සියලුම වියදම් ඒවා දරන ආකාරයට වියදම් ලෙස සටහන් කෙරේ.

ක්ෂය/ක්‍රම ක්ෂය වීම සරල රේඛීය පදනම යොදා ගනිමින් සිදු කරනු ලැබේ. මෝටර් වාහන, ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ සහ මෘදුකාංග ඇතුළු විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ සහ පුහුණු කිරීමේ උපකරණ වල ක්ෂය/ක්‍රම ක්ෂය ඒවායෙහි ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අනුපාතිකයන් යොදා ගනිමින් සිදු කර ඇත.

| | |
|---|---|
| මෝටර් වාහන | 10.00% |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | 12.50% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ (මෘදුකාංග ඇතුළුව)* | |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ - දෘඩාංග | 20.00% |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ - මෘදුකාංග | 20.00 - 33.33% |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ - ජංගම දුරකථන | 33.33% |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ - අනෙකුත් | 20.00 - 25.00% |
| අස්පෘශ්‍ය වත්කම් | 20.00 - 33.33% |

මිලදී ගත් සියලුම වත්කම් සඳහා, භාවිතා කිරීමට අපේක්ෂිත දිනයේ සිට ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලැබේ. වත්කම විකුණන වර්ෂයේදී එය විකුණන දිනය දක්වා ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

* පරිගණක දෘඩාංග වල අභ්‍යන්තර කොටසක් නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක ලෙස පිරිවැයට හඳුනාගැනේ. මුල්වරට හඳුනාගැනීමෙන් පසු අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රම ක්ෂය අඩු අගය කෙරේ.

### 2.2 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.3 තොග

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම පෙර පිවිසුම් පෙර නිකුතු පදනම මත සිදු කෙරේ. ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළඳපොල තත්වයන් හේතුකොටගෙන ප්‍රාග්ධන වෙළඳපොළට අදාළ නීති රීති ද වේගයෙන් වෙනස්වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත්වලට අදාළ අගයන් කපා හැර තිබේ.

### 2.4 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

### 3. වගකීම් හා ප්‍රතිපාදන

### 3.1.1 නිශ්චිත දායකත්ව සැලසුම - සේවක අර්ථ සාධක අරමුදල/ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ආයතනයේ සියලුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකයින් වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සේවකයාගේ වාහන හා ඉන්ධන දීමනාව හැර වේතනයෙන් පිළිවෙලින් 12% හා 3% ක් මේ සඳහා දායක කරනු ලැබේ.

### 3.1.2 නිශ්චිත ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිත

පාරිතෝෂිත යනු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ එහි සේවකයන් හට ගෙවිය යුතු පසු සේවා නියුක්ති ප්‍රතිලාභයකි. ආයතනය හට මෙම වගකීම සේවකයෙකු වෙත පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි. කෙසේ වුවද 2018 ජනවාරි 01 වන දින සිට බලාත්මක වූ ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්දේශයන්ට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීමෙන් නිරූපනය වනුයේ, වාර්තා කරන දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගය වේ. එම වගකීම බාහිර ලෙස මූල්‍යනය කර නැත. හඳුනා නොගත් ආයු ගණන ලාභ හෝ අලාභ, හඳුනා නොගත් අතීත හා ප්‍රවර්තන සේවා පිරිවැය මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශයෙහි එසැනින්ම හඳුනා ගනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ ශුද්ධ වගකීම, ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්ණායකයන්ට

අනුකූලව, සුදුසුකම්ලත් ආයුගණකඥයෙකු විසින් "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිත කර නිර්ණය කර ඇත

### 3.2 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

### 3.3 ප්‍රදාන

සෙස් අරමුදලෙන් මාරු කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාළ වත්කමෙහි ඵලදායී ආයු කාලය පුරා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආදායම, බලපත්‍ර ගාස්තු, පරිපාලන අයබදු, ප්‍රකාශන අලෙවි කිරීම්, අධ්‍යාපන වැඩසටහන් වලින් ලැබෙන ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ගාස්තු වලින් වන ආදායම අදාල සේවාවන් ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුලදීම හඳුනා ගැනේ.

### 4.2 පොලී ආදායම හා වියදම

ආයෝජන වල පොලී අදායම හා පොලී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.4 දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ අලාභ

දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශන හඳුනා ගනු ලබන්නේ අදාළ විකුණුමෙන් ලැබෙන මුදලෙන් අදාළ වත්කමෙහි ධාරණ අගය හා එම විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන අතිරික්තයෙනි.

## 5. වියදම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනුම් මත ආයෝජනවලින් සමන්විත වේ.

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 7 දේපළ, පිරියත හා උපකරණ

| විස්තරය | මෝටර් වාහන රු. | ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ රු. | කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ රු. | විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ (මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති) රු. | පුහුණු කිරීමේ උපකරණ රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 45,165,786 | 54,006,134 | 167,326,062 | 13,886,059 | 3,618,348 | 284,002,390 |
| වර්ෂය තුල එකතුවීම් | 0 | 1,436,705 | 16,508,070 | 0 | 0 | 17,944,776 |
| වර්ෂය තුල විකුණුම් | 0 | (224,863) | (5,044,533) | 0 | (731,807) | (6,001,203) |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 45,165,786 | 55,217,977 | 178,789,599 | 13,886,059 | 2,886,541 | 295,945,962 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 37,708,472 | 44,059,771 | 152,236,468 | 3,299,407 | 3,618,348 | 240,922,467 |
| වර්ෂය සඳහා ක්ෂය | 2,481,345 | 2,994,717 | 12,858,168 | 2,777,212 | 0 | 21,111,442 |
| විකුණන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය | 0 | (224,863) | (5,044,533) | 0 | (731,807) | (6,001,203) |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 40,189,817 | 46,829,626 | 160,050,103 | 6,076,619 | 2,886,541 | 256,032,705 |
| 2024 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 4,975,969 | 8,388,351 | 18,739,497 | 7,809,440 | 0 | 39,913,257 |
| 2023 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 7,457,314 | 9,955,441 | 15,089,594 | 10,586,652 | 0 | 43,089,001 |
| 2024 දෙසම්බර් 31 වන විට පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් (ඉහත සඳහන් පිරිවැයේ අඩංගු වී ඇති) | 23,100,786 | 38,867,519 | 146,820,957 | 0 | 2,886,541 | 211,675,804 |
| ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන) | 10 | 8 | 3-5 | 3-5 | 5 | |

### 7.1 අස්පෘශ්‍ය වත්කම්

| විස්තරය | පරිගණක මෘදුකාංග රු. |
|---|---|
| **පිරිවැය** | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 34,324,005 |
| වර්ෂය තුල එකතුවීම් | 0 |
| වර්ෂය තුල විකුණුම් | 0 |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 34,324,005 |
| **සමුච්චිත ක්‍රම ක්ෂය** | |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 9,644,275 |
| වර්ෂය සඳහා ක්‍රම ක්ෂය | 9,588,027 |
| විකුණන ලද වත්කම් වල සමුච්චිත ක්‍රම ක්ෂය | 0 |
| 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය | 19,232,302 |
| 2024 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 15,091,703 |
| 2023 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 24,679,729 |
| ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන) | 3-5 |

## 8 තොග

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ ද්‍රව්‍ය | 3,024,276 | 2,216,963 |
| එකතුව | 3,024,276 | 2,216,963 |

## 9 ලැබිය යුතු දෑ

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| විවිධ ණයගැතියෝ | 806,375 | 632,846 |
| උත්සව අත්තිකාරම් | 1,395,000 | 1,525,000 |
| ලැබිය යුතු පොලී ආදායම් - ප්‍රති මිලදීගැනුම් හා ස්ථාවර තැන්පතු ආයෝජන | 5,275 | 0 |
| කාර්යමණ්ඩල ණය | 47,836,172 | 38,902,866 |
| සෙස් අරමුදලෙන් ලැබිය යුතු දෑ | 170,782,210 | 114,232,537 |
| වන්දි අරමුදලෙන් ලැබිය යුතු දෑ | 20,195,150 | 26,047,222 |
| පියවීම් සහතික කිරීමේ අරමුදලෙන් ලැබිය යුතු දෑ | 0 | 11,262,760 |
| වැඩ තහනම් කෙරූ සේවකයෙකුගෙන් ලැබිය යුතු දෑ | 0 | 5,212,815 |
| එකතුව | 241,020,182 | 197,806,896 |

## 10 ස්ථාවර තැන්පතු ආයෝජන

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 670,593 | 662,333 |
| එකතුව | 670,593 | 662,333 |

ස්ථාවර තැන්පත් ආයෝජන තුලින් නිරූපනය වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මෙහෙයුම් කටයුතු සඳහා ලංකා බැංකුවෙහි අයිතිය යටතේ තබා ගනු ලබන ස්ථාවර තැනපතු හි අගය වේ.

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 11 තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම්

| | 2024 රු. | 2024 රු. |
|---|---|---|
| ඉන්ධන තැන්පතු | 400,000 | 156,000 |
| මොබිටෙල් - ආයතනික දත්ත පැකේජ | 15,000 | 15,000 |
| මොබිටෙල් - පසු ගෙවුම් චිත්ගල්ස් | 12,000 | 12,000 |
| ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු | 23,125 | 23,125 |
| ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු | 8,500 | 8,500 |
| ෆ්‍රොස්ටි - උණු සහ ශීත ජලය ලැබෙන ස්වංක්‍රීය යන්ත්‍රය | 12,899 | 12,899 |
| ඩී.එච්.එල්. කුරියර් සේවා ගාස්තු | 30,000 | 30,000 |
| ඕවර්සීස් රියල්ටි සමාගම - කුලී තැන්පතු | 42,985,944 | 44,522,736 |
| ඕවර්සීස් රියල්ටි සමාගම - විදුලිය සඳහා තැන්පතු | 60,000 | |
| සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | 20,398,370 | 18,673,987 |
| එකතුව | 63,945,838 | 63,454,247 |

## 12 මුදල් හා මුදල් සමාන දෑ

| | 2024 රු. | 2024 රු. |
|---|---|---|
| ප්‍රති මිලදීගැනීම් මත ආයෝජන | 30,000,000 | 0 |
| බැංකුවේ ඇති මුදල් | 2,613,785 | 18,072,304 |
| අතැති මුදල් | 40,000 | 40,000 |
| එකතුව | 32,653,786 | 18,112,304 |

## 13.1 සමුච්චිත අරමුදල

| | 2024 රු. | 2024 රු. |
|---|---|---|
| වර්ෂයේ ආරම්භයේ ශේෂය | 0 | 0 |
| වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම | (645,930,836) | (446,662,381) |
| වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම | 645,930,836 | 446,662,381 |
| වර්ෂය අවසානයේ ශේෂය | 0 | 0 |

**13.2** 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන අනුව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදලක් වන සෙස් අරමුදලේ සමුච්චිත අරමුදල් ශේෂයන් 2024 දෙසැම්බර් 31 සහ 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 5,706,707,597/- සහ රු. 5,237,847,551/- විය. සෙස් අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර ඇති අතර, 2024 දෙසැම්බර් 31 දිනට,සෙස් අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන පරිදි, එහි ආයෝජනයන්, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රති මිලදී ගැනුම් වල පිළිවෙලින් රු. 725,538,606/-, රු. 4,386,381,119/- සහ රු. 536,037,212/- ලෙස සිදු කර ඇත.සෙස් අරමුදලේ බැර කර ඇති මුදල්, 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 (2) වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති අරමුණු සඳහා පමණක් භාවිතා කළ යුතුය.

**13.3** 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන අනුව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදලක් වන වන්දි අරමුදලේ සමුච්චිත අරමුදල් ශේෂයන් 2024 දෙසැම්බර් 31 සහ 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 764,840,966/- සහ රු. 687,591,834/- විය. වන්දි අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර ඇති අතර, 2024 දෙසැම්බර් 31 දිනට, වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන පරිදි, එහි ආයෝජනයන්, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රති මිලදී ගැනුම් වල පිළිවෙලින් රු. 254,321,001/-, රු. 464,783,947/- සහ රු. 53,000,000/- ලෙස සිදු කර ඇත. 2021 අංක 19 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්තියේ දක්වා ඇති අරමුණ සඳහා වන්දි අරමුදල ස්ථාපිත කර ඇත.

## 14 විලම්භිත අදායම් - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් ලද ප්‍රදානයන්

| | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 26,281,828 | 40,157,488 |
| වර්ෂය තුල සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් | 17,944,776 | 4,211,858 |
| ප්‍රදානයන් හඳුනා ගැනීම් | (18,334,230) | (18,087,517) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 25,892,374 | 26,281,828 |
| | | |
| පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන්හි ආදායම වාර්ෂිකව හඳුනා ගැනේ. | | |
| මෝටර් වාහන | 10% | 10% |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | 12.5% | 12.5% |
| කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ සහ වෙනත් | 20% - 33.33% | 20% - 33.33% |
| පුහුණු කිරීමේ උපකරණ | 20% | 20% |

## 15 විලම්භිත අදායම් - ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය මගින් ලද ප්‍රදානයන්

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | | 35,266,381 | 47,631,620 |
| ප්‍රදානයන් හඳුනා ගැනීම් | 19.2 | (12,365,239) | (12,365,239) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | | 22,901,142 | 35,266,381 |
| | | | |
| පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන්හි ආදායම වාර්ෂිකව හඳුනා ගැනේ. | | | |
| කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ | | 20% - 33.33% | 20% - 33.33% |

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 16 සේවක ප්‍රතිලාභ වගකීම

### 16.1 සේවක ප්‍රතිලාභ වගකීම

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 97,520,914 | 68,889,206 |
| පොලී පිරිවැය | 12,677,719 | 12,400,057 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 7,129,417 | 6,254,212 |
| ශුද්ධ ආයුගණක (ලාභ)/අලාභය | (10,498,984) | 16,284,547 |
| වර්ෂය තුළ ගෙවීම් | (3,931,989) | (6,307,108) |
| වර්ෂය අවසානයේ ශේෂය | 102,897,077 | 97,520,914 |

### 16.2 වර්ෂය තුළ පාර්තෝෂික වියදම

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| පොලී පිරිවැය | 12,677,719 | 12,400,057 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 7,129,417 | 6,254,212 |
| ශුද්ධ ආයුගණක (ලාභ)/අලාභ | (10,498,984) | 16,284,547 |
| එකතුව | 9,308,152 | 34,938,816 |

සේවක ප්‍රතිලාභ වගකීම, වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කර ගනිමින් සිදු කරන ලද ආයුගණක තක්සේරුවක් මත පදනම් වී ඇත. මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. මෙම සියලුම උපකල්පනයන් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලැබේ.

සේවක ප්‍රතිලාභ පිරිවැය නිර්ණය කිරීමේදී යොදාගනු ලැබූ මූලික උපකල්පනයන් වනුයේ:

| | 2024 | 2023 |
|---|---|---|
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |
| වට්ටම් අනුපාතිකය | 10.5% වාර්ෂික | 13% වාර්ෂික |
| අනාගත වැටුප් වර්ධක අනුපාතිකය | 8% වාර්ෂික | 10% වාර්ෂික |

#### යොදාගත් උපකල්පන වල සංවේදීතාවය

උපකල්පනයන්ගේ 1% ක් වෙනස්වීමෙන් සේවක ප්‍රතිලාභ වගකීමට ඇති වනු ලබන බලපෑම:

| | වට්ටම් අනුපාතිකය රු. | අනාගත වැටුප් වර්ධක අනුපාතිකය රු. |
|---|---|---|
| 1% වැඩි වීම | 98,381,195 | 108,396,005 |
| 1% අඩු වීම | 107,829,890 | 97,783,287 |

2020 දෙසැම්බර් 31 දිනට, සේවක ප්‍රතිලාභ වගකීමෙහි ආයුගණක තක්සේරුව වෘත්තීමය ආයුගණකඥයෙකු වන ඇකචුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් සිදු කරන ලදී. මෙම ආයුගණකඥයන් විසින් සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ හි නිර්දේශිත "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කර ඇත.

## 17 ගෙවිය යුතු ආදායම් බදු

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 147,384,953 | 245,819,782 |
| පෙර කාලපරිච්ඡේද සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | (927,032) | (462,344) |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන | 243,300,542 | 287,878,656 |
| පෙර කාලපරිච්ඡේද සඳහා ආදායම් බදු ගෙවීම් | (149,367,378) | (248,266,895) |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීම් | (74,477,913) | (137,584,246) |
| වර්ෂය අවසානයේ ශේෂය | 165,913,172 | 147,384,953 |
| 2020/2021 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | (2,909,457) | (2,909,457) |
| 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | 0 | 150,294,410 |
| 2024/2025 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | 168,822,629 | 0 |
| එකතුව | 165,913,172 | 147,384,953 |

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අරමුදලට කල මාරු කිරීමක් ආදායම් බදු පනත යටතේ සුදුසුකම් ලබන ගෙවීම් සහ සහනයක් ලෙස සලකා අඩු කර තිබූ බැවින්, 2020/2021 තක්සේරු වර්ෂය සඳහා ලැබිය යුතු ආදායම් බදු සම්බන්ධයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුවක් නිකුත් කර ඇත. එම තක්සේරුවට එරෙහිව සු.වි.කො.ස. විසින් පරිපාලන සමාලෝචනයක් ඉල්ලුම් කල අතර, ඒ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් නිකුත් කර නොමැත.

## 18 ණයහිමියන් සහ උපචිත වියදම්

| | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| විද්‍යුත් සන්නිවේදන, දුරකථන සහ අන්තර්ජාල | 886,523 | 784,000 |
| කුලී සහ විදුලිය | 31,138 | 1,650,006 |
| කාර්ය මණ්ඩලය සම්බන්ධ වියදම් | 5,742,989 | 5,236,710 |
| සංග්‍රහ වියදම් සහ ත්‍යාග | 10,051 | 0 |
| ගෙවිය යුතු ගුවන් ගාස්තු | 1,727,300 | 0 |
| බාහිර විගණන ගාස්තු | 750,000 | 600,000 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | 3,055,930 | 3,905,930 |
| නීති හා වෘත්තීමය වියදම් | 106,600 | 82,600 |
| මහජන දැනුවත් කිරීමේ හා සම්මන්ත්‍රණ වියදම් | 7,437,694 | 11,150,881 |
| ගමන් වියදම් - දේශීය | 327,744 | 199,762 |
| ගෙවිය යුතු කුලී තැන්පතු | 0 | 1,536,792 |
| සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු ගෙවීම් | 4,299,676 | 4,176,927 |
| අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | 1,059,116 | 354,314 |
| ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | 447,417 | 190,833 |
| රථවාහන සම්බන්ධ වියදම් | 0 | 21,850 |
| ලිපිද්‍රව්‍ය, පුවත්පත් සහ කුරියර් ගාස්තු | 57,333 | 170,440 |
| සේවක සුබසාධන සහ කාර්යාල නඩත්තු | 7,881 | 351,920 |
| උපදේශක දීමනාව | 0 | 237,500 |
| කොමිෂන් සභා සාමාජික රැස්වීම් ගාස්තු | 0 | 40,000 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 35,177 | 27,794 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 1,055,553 | 0 |
| ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 157,693 | 0 |
| ගෙවිය යුතු මුද්දර බදු | 68,125 | 21,075 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | 0 | 12,500 |
| ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු | 0 | 6,964,972 |
| වෙළඳ බදු | 0 | 5,000 |
| එකතුව | 27,263,940 | 37,721,806 |

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 19 ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිඵල පාදක අරමුදල්

| | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිඵල පාදක අරමුදල් | 19.1 | 0 | 164,073,632 |
| එකතුව | | 0 | 164,073,632 |

ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය මගින් පහත සඳහන් සංරචක ද්විත්වයන් යටතේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට අරමුදල් ලැබෙන ලදී.

### 19.1 I වන සංරචකය - ප්‍රතිඵල පාදක මූල්‍ය සංරචක

විසර්ජනයන් සහ බැඳි ප්‍රතිඵල ලෙස ලෝක බැංකුව විසින් සකස් කරන ලද හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත වෙන් කරන ලද අරමුදල් එය වෙත ලැබෙන ලදී . ඒ අනුව සංරචක 1 යටතේ සඳහන් වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අයිතමයන් සු.වි.කො.ස. විසින් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර ඒ සඳහා වෙන්කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 2 ක අරමුදල් (රු. 533,396,869.32 කට සමාන මුදලක්) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත ලැබුණි (මෙහි අවසන් ගෙවීම වන රු. 164,073,632.20 කට සමාන මුදලක් සු.වි.කො.ස. වෙත ලැබුනේ 2023 මාර්තු 24 වන දිනය).

### 19.2 II වන සංරචකය - ආයෝජන පාදක මූල්‍ය සංරචක

ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති සංරචක II යටතේ සු.වි.කො.ස වෙත හඳුනාගත් භාණ්ඩ සහ උපදේශක සේවා ප්‍රසම්පාදනය කිරීමට සහ කාර්යමණ්ඩල ධාරිතාවය ගොඩනැංවීම සඳහා අරමුදල් තබන ලදී. ව්‍යාපෘතිහි සමාප්ති අවස්ථාවේ, සංරචක II යටතේ ලෝක බැංකුව විසින් ඇමරිකානු ඩොලර් 519,059.54 ක් (රු. 163,324,066.66 ට සමාන මුදලක්) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට විසර්ජනය කරන ලදී. භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා ලැබුණු අරමුදල් ප්‍රදානයක් ලෙස සලකා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විලම්බිත ආදායමක් ලෙස පෙන්වන ලද අතර එහි ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 20 කාර්ය මණ්ඩල පිරිවැය

| | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල වැටුප් | | 250,388,053 | 202,907,059 |
| සභාපතිවරයාගේ දීමනා | | 1,200,000 | 1,053,333 |
| ප්‍රතිපූර්ණ පිරිවැය - නීතිපති දෙපාර්තමේන්තුව | | 6,196,595 | 2,261,652 |
| කොමිෂන් සභා සාමාජික රැස්වීම් ගාස්තු | | 980,000 | 1,290,000 |
| උපදේශක දීමනා | | 2,900,000 | 3,900,000 |
| කාර්යමණ්ඩල සුභසාධන වියදම් සහ අනෙකුත් කායීමණ්ඩල සම්බන්ධ වියදම් | | 48,640,932 | 49,696,830 |
| සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල | | 37,873,255 | 30,147,948 |
| කාර්යමණ්ඩල පාරිතෝෂිත | 16.2 | 9,308,152 | 34,938,816 |
| කාර්යමණ්ඩල වෛද්‍ය වියදම් හා රක්ෂණ | | 16,612,068 | 16,974,080 |
| කාර්යමණ්ඩල නිවාස ණය පොලී සහනාධාර | | 1,638,630 | 1,846,995 |
| කාර්යමණ්ඩල වාහන දීමනා | | 30,296,133 | 25,291,778 |
| විදෙස් ගමන් වියදම් හා පුහුණුවීම් වියදම් | | 15,805,723 | 13,522,257 |
| කාර්යමණ්ඩල පුහුණු වීම් වියදම් - දේශීය | | 2,099,712 | 2,319,608 |
| සාමාජිකත්ව දායක වියදම් | | 1,924,550 | 2,003,525 |
| අධ්‍යයන සඳහා අනුග්‍රාහකත්වයන් * | | 187,379 | 142,123 |
| බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | 1,603,155 | 2,441,499 |
| ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | 3,858,667 | 2,761,667 |
| එකතුව | | 431,513,003 | 393,499,169 |

* ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/- ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධාන වලට යටත්ව ලබාදෙන අතර, එසේ ලබාගත් සේවකයින් අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කල පසු අවුරුදු 2ක කාලයක් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයින් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයින් සම්පූර්ණ කල යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

## 21 පරිපාලන හා ආයතනික වියදම්

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| කුලී හා රථවාහන ගාල් කුලී | | 135,228,165 | 140,069,454 |
| විදුලි ගාස්තු | | 8,943,735 | 8,624,452 |
| කාර්යාල නඩත්තු | | 619,729 | 344,650 |
| කාර්යාල උපකරණ නඩත්තු හා රක්ෂණ | | 1,934,299 | 1,891,059 |
| මෘදුකාංග අලුත් කිරීමේ සහ නඩත්තු වියදම් | | 17,329,882 | 15,202,944 |
| දූරකථන, අන්තර්ජාල, විද්‍යුත් සන්නිවේදන, දත්ත සැකසුම්කරණය සහ ආරක්ෂණය | | 11,777,991 | 10,338,868 |
| මෝටර් වාහන ඉන්ධන, නඩත්තු, බලපත්‍ර හා රක්ෂණ | | 8,920,077 | 10,165,435 |
| වෘත්තීමය ගාස්තු | | 451,272 | 291,367 |
| රැස්වීම් ගාස්තු | | 1,773,235 | 1,813,913 |
| පුවත්පත්, වාරප්‍රකාශන හා පුස්තකාල පොත් | | 844,080 | 720,190 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 5,828,368 | 6,194,704 |
| දේශීය ගමන් වියදම් | | 3,914,005 | 2,591,423 |
| රක්ෂණ - සියලු අවදානම්, පොදු වගකීම්, මාර්ගස්ථ මුදල් සහ ගිනි | | 346,798 | 288,409 |
| තැපැල්, මුද්දර ගාස්තු හා කුරියර් ගාස්තු | | 1,385,197 | 1,136,528 |
| නීති ගාස්තු | | 3,960,015 | 3,368,860 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | | 3,504,200 | 1,850,000 |
| විගණන ගාස්තු - බාහිර | | 684,000 | 564,100 |
| පොදු වියදම් | | 1,832,608 | 0 |
| එකතු කල අගය මත බදු වියදම | | 14,846,924 | 0 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු වියදම | | 1,616,162 | 0 |
| වෙළඳ බදු වියදම | | 5,000 | 5,000 |
| සංග්‍රහ වියදම් සහ ත්‍යාග | | 323,807 | 102,978 |
| ක්ෂය වීම් | 7 & 7.1 | 30,699,469 | 30,442,634 |
| එකතුව | | 256,769,019 | 236,006,969 |

## 22 ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන, බාහිර සම්බන්ධතා, ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපන , ආවේක්ෂණ සහ විමර්ශන කටයුතු වියදම්

| | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන | 17,641,893 | 21,773,762 |
| අධ්‍යාපන වැඩසටහන් | 5,028,430 | 1,959,364 |
| අන්තර්ජාතික සමාජික ගාස්තු - IOSCO | 7,050,360 | 7,000,543 |
| ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු | 802,755 | 0 |
| වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය | 7,381,635 | 5,278,991 |
| විමර්ශන හා පරීක්ෂණ වියදම් | 2,000 | 17,131 |
| එකතුව | 37,907,073 | 36,029,791 |

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 24 සත්‍ය ආදායම හා වියදම අයවැය ලේඛනය සමග සැසඳීම

| | සත්‍ය 2024 රු. | අයවැය 2024 රු. | විචලනය රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| බලපත්‍ර ගාස්තු | 25,123,028 | 3,305,000 | 21,818,028 |
| පරිපාලන බදු | 8,080,343 | 1,864,720 | 6,215,623 |
| අධ්‍යාපන වැඩසටහන් | 12,836,609 | 14,640,000 | (1,803,391) |
| පොලී ආදායම් | 672,852 | 0 | 672,852 |
| අනෙකුත් ආදායම් | 1,118,453 | 13,300,000 | (12,181,547) |
| කාර්යමණ්ඩල ණය පොලී ආදායම් | 1,826,428 | 3,360,000 | (1,533,572) |
| සෙස් අරමුදලෙන් ලැබුණු ප්‍රදානයන් හඳුනාගැනීම් | 18,334,230 | 19,350,111 | (1,015,881) |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියෙන් ලැබුණු ප්‍රදානයන් හඳුනාගැනීම් | 12,365,239 | 12,195,852 | 169,387 |
| ශ්‍රී.සු.වි.කො.ස. මගින් උපයාගත් මුළු ආදායම | 80,357,183 | 68,015,683 | 12,341,499 |
| වියදම් | | | |
| කාර්යමණ්ඩල පිරිවැය | (431,513,003) | (492,536,996) | 61,023,993 |
| පරිපාලන හා ආයතනික පිරිවැය | (256,769,019) | (273,722,134) | 16,953,115 |
| ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන පිරිවැය | (37,907,073) | (81,051,599) | 43,144,526 |
| මූල්‍ය ගාස්තු | (98,924) | (73,373) | (25,551) |
| මුළු අයබාර වියදම | (726,288,019) | (847,384,102) | 121,096,083 |
| ආදායම් බදු වියදම | 0 | 0 | 0 |
| ආදායමට වැඩි අයබාර වියදම | (645,930,836) | (779,368,419) | 133,437,583 |

## 25. ප්‍රාග්ධන බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නැත.

## 26 අසම්භාව්‍ය වගකීම්

2024 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 27. වාර්තා කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදුකිරීමට අවශ්‍ය ආකාරයේ ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසු සිදුවීම් කිසිවක් නැත.

## 28. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

2024 දෙසැම්බර් 31 දිනට පහත දක්වා ඇති පරිදි සභාපති සහ කොමිෂන් සභාවේ සාමාජිකයින් එම ධුරයන් හොබවන ලදී

- මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා - පත්කළ සාමාජික - 2024 ඔක්තෝම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- හේෂණ කුරුප්පු මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- අරවින්දි ද සිල්වා මිය - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- එච්.ඩී.සී.එල්. සිල්වා මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් 2024 නොවැම්බර් 29 දින සිට බලපැවැත්වෙන පරිදි නම් කළ සාමාජික
- නෙලුමානි දවුලුගල මිය - ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2024 ජූලි 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි නම් කරන ලද සාමාජික
- ලක්නාත් ජයවික්‍රම මහතා - පත්කල සාමාජික - 2024 දෙසැම්බර් 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- නෙරන්ජිත් ගමගේ මහතා - පත්කළ සාමාජික - 2024 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි

2024 වර්ෂය තුලදී පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත්කළ සාමාජික - 2023 ඔක්තෝම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික - 2024 වර්ෂය තුලදී ධුර කාලය අවසන් කරන ලදී
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය - පත්කල සාමාජික - 2023 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී

- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් නම් කල සාමාජික - 2024 නොවැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, නම් කල සාමාජික, 2024 ජූනි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී

2024 දෙසැම්බර් 31 දිනට ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා | ශ්‍රී ලංකා මුල්‍ය සංගමය | සභාපති - 2024 දෙසැම්බර් සිට | නැත |
| | මානව හිමිකම් ආරක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2023 වර්ෂයේ සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 04 දින සිට | නැත |
| හේෂණ කුරුප්පු මහතා | ඩේවිඩ් පීරිස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | සමූහ මුල්‍ය අධ්‍යක්ෂ - 2023 ජනවාරි 20 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (පුද්ගලික) සමාගම | සමූහ මුල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් ඔටෝමොබයිල් (පුද්ගලික) සමාගම | සමූහ මුල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 දින සිට 2024 පෙබරවාරි 13 දින දක්වා | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ලංකා) සමාගම | සමූහ මුල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩී පී ඉන්ෆොටෙක් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2020 මැයි 14 වන දින සිට | නැත |
| | අෆිනිටි ඉනොවේෂන් (පුද්ගලික) සමාගම | විධායක නොවන සභාපති - 2021 අගෝස්තු 26 දින සිට 2024 අප්‍රේල් 04 දින දක්වා | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ඩිස්ට්‍රිබියුටර්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජූනි 23 වන දින සිට | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ග්ලෝබල් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජූලි 31 වන දින සිට | නැත |
| | ඩයිනමික් ග්ලෝබල් වෙන්චර්ස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ - 2024 මැයි 16 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | සභාපති - 2021 දෙසැම්බර් 17 දින සිට | නැත |
| | ගණකාධිකාරීවරුන්ගේ දකුණු ආසියානු සම්මේලනය | සභාපති - 2023 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2024 මාර්තු 14 දින සිට | නැත |
| අරවින්දි ද සිල්වා මිය | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 දෙසැම්බර් 30 දින සිට | නැත |
| | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | අධ්‍යක්ෂ - 2022 වර්ෂයේ සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| එච්.ඩී.සී.එල්. සිල්වා මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 29 දින සිට | නැත |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) | අධ්‍යක්ෂ - 2020 ජනවාරි 11 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (IRCSL) | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 07 දින සිට | නැත |
| නෙලුම්මානි දවුලුගල මිය | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සභාපතිනි - 2024 මාර්තු 14 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| ලක්නාත් ජයවික්‍රම මහතා | සියපත ෆයිනෑන්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | කවුන්සිල් සාමාජික - 2022 වර්ෂයේ සිට | නැත |
| නෙරන්ජිත් ගමගේ මහතා | වින්ස්ටේ පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ - 2021 අගෝස්තු 11 වන දින සිට | 1 |
| | පර්ස්ටාෆ් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | ප්‍රධාන මුල්‍ය නිලධාරී/උපදේශක - මුල්‍ය හා මෙහෙයුම් කටයුතු - 2022 පෙබරවාරි 01 දින සිට | නැත |

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2024 වර්ෂය තුළදී ධුර කාලය අවසන් කල කොමිෂන් සභා සභාපති සහ සාමාජිකයින් දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ෆයිසාල් සාලි මහතා | ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය | හිටපු සභාපති - 2023 ජුනි මස සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 01 දින තෙක් | නැත |
| සුජීව මුදලිගේ මහතා | සී.අයි.සී. ෆීඩ්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | එන්.එස්.බී.එම්.ග්‍රීන් යුනිවර්සිටි | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මහීන්ද්‍රා අයිඩියල් ෆයිනෑන්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | කාර්ගෝ බෝට් ඩිවෙලොප්මන්ට්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මැලිබන් බිස්කට් මැනුෆැක්චරර්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ඇම්බියොන් කැපිටල් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 9 (1%) |
| | ඇම්බියොන් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | මිලේනියම් අයි.ටී. ඊ.එස්.පී. (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | ශර්වුඩ් කැපිටල් (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 1.5 (2.5%) |
| | ලංකා වාණිජ මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | වෙළඳ සේවා අර්ථසාධක සංගමය | කමිටු සභාපති | නැත |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| මනිල් ජයසිංහ මහතා | සිලෝන් හොස්පිටල් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | සී.ඩබ්ලිවු. මැකී පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා මිල්ක් ෆුඩ්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ඩෙයරීස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | සහස්‍යා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන්.එම්.ජේ. ලෙෂර් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය | නැත | නැත | නැත |
| ඇන්ටන් ගොඩ්ෆ්‍රී මහතා | නැත | නැත | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ජාතික ණය ඇපකර ආයතනය | සභාපති - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහා බැංකුව | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති - 2024 ජුනි 22 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | කළමනාකරණ මණ්ඩල සාමාජික - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |

# ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් තුන පවත්වාගෙන යනු ලැබේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට ශේෂය (රු.) | 2023.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 0000001694 | 1,850,422 | 17,569,804 |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 0009919753 | 763,363 | 506,000 |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 0083810081 | 0 | (3,500) |

2024 වර්ෂය තුළදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ආයෝජන ශේෂය (රු.) |
|---|---|---|
| ප්‍රති මිලදීගැනුම් මත ආයෝජන | 290,000,000 | 30,000,000 |
| ස්ථාවර තැන්පතු | 0 | 670,593 |

මීට අමතරව, කොමිෂන් සභා සාමාජිකයින් විසින් පාලක මණ්ඩලයෙහි සාමාජිකත්වය දරණ ආයතන සමග සලකා බලන වර්ෂය තුල සිදු වූ ගනුදෙනු පහත සඳහන් වගුවේ සඳහන් කර ඇත.

| ආදායකයාගේ නම | ගෙවීම පිළිබඳ විස්තරය | ගෙවූ අගය (රු.) |
|---|---|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | සාමාජිකත්වය අලුත් කිරීම්, වාර්ෂික ජාතික සමුළුව 2024, පුහුණු වැඩසටහන් | 1,008,500 |
| බැංකු විදු පියස - ශ්‍රී ලංකා මහා බැංකුව | පුහුණු වැඩසටහන් | 249,000 |

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | BAN/G/CESS/FA/24/08 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025 ජූනි 16 |

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ ("අරමුදල") 2024 දෙසැම්බර් 31 දිනට මූලය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 සෙැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේනතුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.1 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යට කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීයමය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තියමය සැකමුසු බව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදි. තවද,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැළසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම, හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින් වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර නොගැනීමෙන් ඇතිවිය හැකි අවදනම වැරැද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදනමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිනිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට අරමුදල විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වා ගෙන ගොස් ඇත.

# සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## විගණකාධිපති වාර්තාව

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

ජී. එච්. ඩී ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 725,538,606 | 48,022,800 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 0 | 2,917,881,550 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | 4,386,381,119 | 2,181,865,396 |
| ලැබිය යුතු පොලී ආදායම | | 185,343,902 | 148,991,107 |
| ලැබියයුතු සෙස් මුදල් | | 42,770,902 | 1,871,698 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | 538,020,457 | 53,711,537 |
| **මුළු වත්කම්** | | 5,878,054,987 | 5,352,344,088 |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | 5,706,707,597 | 5,237,847,551 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ - සු.වි.කො.ස. - ආදායම් බදු | | 170,782,210 | 114,232,537 |
| විගණන ගාස්තු | | 565,180 | 264,000 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | 5,878,054,987 | 5,352,344,088 |

111 සිට 116 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල වෙනුවෙන්;

**නිරෝෂා කොඩිකාර**
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජෙනරාල්

**මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර**
සභාපති

කොළඹදී
2025 ජූනි 03 දින

## සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| වර්ෂය තුල ලද සෙස් මුදල් | | 748,586,108 | 555,368,722 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 135,463,436 | 282,231,921 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 444,822,365 | 363,364,864 |
| පොලී ආදායම - භාණ්ඩාගාර ප්‍රතිමිලදී ගැනුම් | | 14,283,722 | 68,042,515 |
| මුළු ආදායම | | 1,343,155,631 | 1,269,008,022 |
| | | | |
| වියදම | | | |
| මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ශ්‍රී.සු.වි.කො.ස.ට මාරු කල අරමුදල | | (663,875,611) | (450,883,659) |
| විගණන ගාස්තු | | (570,220) | (286,200) |
| බැංකු ගාස්තු | | (588,756) | (371,122) |
| මුළු වියදම | | (665,034,587) | (451,540,980) |
| | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පෙර) | | 678,121,044 | 817,467,041 |
| | | | |
| ආදායම් බදු වියදම | 8 | (209,260,998) | (253,877,766) |
| | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 468,860,046 | 563,589,275 |

111 සිට 116 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 5,237,847,551 | 4,674,258,276 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 468,860,046 | 563,589,275 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 5,706,707,597 | 5,237,847,551 |

111 සිට 116 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

## සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 468,860,046 | 563,589,275 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | | |
| ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩි වීම)/අඩු වීම | | (40,899,204) | 4,183,835 |
| ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | | (36,352,796) | (8,534,243) |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | 56,850,854 | (45,467,419) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් | | 448,458,900 | 513,771,448 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 2,240,365,744 | 193,295,259 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | (2,204,515,723) | (728,500,635) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ජනනය වූ/(භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | 35,850,021 | (535,205,376) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 484,308,920 | (21,433,929) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (අ)) | | 53,711,537 | 75,145,466 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (ආ)) | | 538,020,457 | 53,711,537 |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | | 51,917,248 | 73,757,104 |
| බැංකුවේ ඇති මුදල් | | 1,794,289 | 1,388,362 |
| | | 53,711,537 | 75,145,466 |
| **සටහන (ආ)** | | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 7 | 536,037,212 | 51,917,248 |
| බැංකුවේ ඇති මුදල් | 7 | 1,983,245 | 1,794,289 |
| | | 538,020,457 | 53,711,537 |

111 සිට 116 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 (1) වගන්තියෙන් අවලංගු හා ආදේශ වූ 1987 අංක 36 දරණ, පැරණි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14B(1) වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත.

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 (1) වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන "සෙස් බදු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතු අතර, 155 වන වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

සෙස් අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි නැගෙනහිර කුළුණෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 156 (2) වන වගන්තියට අනුකූලව සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය:

(අ) සුරැකුම්පත් වෙළඳපොල දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටුවනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්ය සඳහා ණය ලබා දීම;

(ඉ) අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයින් විසින් ශ්‍රී ලංකාව තුලදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යනයන්ට අදාළ වියදම් පියවීම.

තවදුරටත්, නව පනතෙහි 156 (3) වගන්ති ප්‍රකාරව, සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, සෙස් අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා සෙස් අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් සෙස් අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව සෙස් අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම නොකඩවා උපයෝගී කරගන්නා ලද අතර කාල පරිච්ඡේදය පුරාවටම ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයකින් යුතුව යොදාගනු ලැබ ඇත.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පෙර පැවති පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, සෙස් අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

සෙස් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් වල හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාල පරිච්ඡේදය පුරාවටම සංගතතාවයකින් යුතුව යොදාගන්න ලදී.

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අනුගාමී හෙළිදරව් කිරීම් වලට සහ අසම්භාව්‍ය වගකීම් වල හෙළිදරව්කිරීම් වලටත් බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම්වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් ඉදිරිකාලීනව හඳුනා ගනු ලැබේ.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ සෙස් අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුළදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිඳු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ඇත්නම් ඒවා ශ්‍රී ලංකා

# සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

### 1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ දිනට පසු සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

### 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

### 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

### 4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 5 වියදම් හඳුනා ගැනීම

සෙස් අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

### 6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

### 7 මුදල් හා මුදල් සමාන දේ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන | 536,037,212 | 51,917,248 |
| බැංකුවේ ඇති මුදල් | 1,983,245 | 1,794,289 |
| එකතුව | 538,020,457 | 53,711,537 |

### 8 ආදයම් බදු වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 0 | (514,193) |
| තක්සේරු වර්ෂ 2023/2024 සඳහා ආදායම් බදු වියදම | (931,050) | 254,391,959 |
| තක්සේරු වර්ෂ 2024/2025 සඳහා ආදායම් බදු වියදම | 210,192,049 | 0 |
| එකතුව | 209,260,998 | 253,877,766 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

## 9 ප්‍රාග්ධන බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 10 අසම්භාව්‍ය වගකීම්

2024 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 11 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදුකිරීමට අවශ්‍ය ආකාරයේ ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසු සිදුවීම් කිසිවක් නැත.

## 12 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

සෙස් අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි.

2024 දෙසැම්බර් 31 දිනට පහත දක්වා ඇති පරිදි සභාපති සහ කොමිෂන් සභාවේ සාමාජිකයින් එම ධුරයන් හොබවන ලදී.

- මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා - පත්කළ සාමාජික - 2024 ඔක්තෝම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- හේෂණ කුරුප්පු මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- අරවින්දි ද සිල්වා මිය - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- එච්.ඩී.සී.එල්. සිල්වා මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් 2024 නොවැම්බර් 29 දින සිට බලපැවැත්වෙන පරිදි නම් කළ සාමාජික
- නෙලුමානි දවුලුගල මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2024 ජූලි 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි නම් කරන ලද සාමාජික
- ලක්නාත් ජයවික්‍රම මහතා - පත්කල සාමාජික - 2024 දෙසැම්බර් 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- නෙරන්ජිත් ගමගේ මහතා - පත්කළ සාමාජික - 2024 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි

2024 වර්ෂය තුලදී පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත්කළ සාමාජික - 2023 ඔක්තෝම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික - 2024 වර්ෂය තුලදී ධුර කාලය අවසන් කරන ලදී
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය - පත්කල සාමාජික - 2023 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් නම් කල සාමාජික - 2024 නොවැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, නම් කල සාමාජික, 2024 ජූනි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී

# සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2024 දෙසැම්බර් 31 දිනට ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා | ශ්‍රී ලංකා මූල්‍ය සංගමය | සභාපති - 2024 දෙසැම්බර් සිට | නැත |
| | මානව හිමිකම් ආරක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2023 වර්ෂයේ සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 01 දින සිට | නැත |
| හේෂණ කුරුප්පු මහතා | ඩේවිඩ් පීරිස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2023 ජනවාරි 20 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2023 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් ඔටෝමොබයිල් (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 දින සිට 2024 පෙබරවාරි 13 දින දක්වා | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ලංකා) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩී පී ඉන්ෆොටෙක් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2020 මැයි 14 වන දින සිට | නැත |
| | අෆිනිටි ඉනොවේෂන් (පුද්ගලික) සමාගම | විධායක නොවන සභාපති - 2021 අගෝස්තු 26 දින සිට 2024 අප්‍රේල් 04 දින දක්වා | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ඩිස්ට්‍රිබියුටර්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජුනි 23 වන දින සිට | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ග්ලෝබල් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජුලි 31 වන දින සිට | නැත |
| | ඩයිනමික් ග්ලෝබල් වෙන්චර්ස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ - 2024 මැයි 16 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | සභාපති - 2021 දෙසැම්බර් 17 දින සිට | නැත |
| | ගණකාධිකාරීවරුන්ගේ දකුණු ආසියානු සම්මේලනය | සභාපති - 2023 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2024 මාර්තු 14 දින සිට | නැත |
| අරවින්දි ද සිල්වා මිය | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 දෙසැම්බර් 30 දින සිට | නැත |
| | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | අධ්‍යක්ෂ - 2022 වර්ෂයේ සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| එච්.ඩී.සී.එල්. සිල්වා මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 29 දින සිට | නැත |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | අධ්‍යක්ෂ - 2020 ජනවාරි 11 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 07 දින සිට | නැත |
| නෙලුමානි දවුලුගල මිය | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සභාපතිනි - 2024 මාර්තු 14 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| ලක්නාත් ජයවික්‍රම මහතා | සියපත ෆයිනෑන්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | කවුන්සිල් සාමාජික - 2022 වර්ෂයේ සිට | නැත |
| නෙරන්ජිත් ගමගේ මහතා | වින්ස්ටේ පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ - 2021 අගෝස්තු 11 වන දින සිට | 1 |
| | පර්ස්ටාෆ් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | ප්‍රධාන මූල්‍ය නිලධාරී/උපදේශක - මූල්‍ය හා මෙහෙයුම් කටයුතු - 2022 පෙබරවාරි 01 දින සිට | නැත |

2024 වර්ෂය තුළදී ධුර කාලය අවසන් කළ කොමිෂන් සභා සභාපති සහ සාමාජිකයින් දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ෆයිසාල් සාලි මහතා | ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය | හිටපු සභාපති - 2023 ජූනි මස සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 01 දින තෙක් | නැත |
| සුජීව මුදලිගේ මහතා | සී.අයි.සී. ෆීඩ්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | එන්.එස්.බී.එම්.ග්‍රීන් යුනිවර්සිටි | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මහින්ද්‍රා අයිඩියල් ෆයිනෑන්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | කාර්ගෝ බෝට් ඩිවෙලොප්මන්ට්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මැලිබන් බිස්කට් මැනුෆැක්චරර්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ඇම්බියොන් කැපිටල් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 9 (1%) |
| | ඇම්බියොන් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | මිලේනියම් අයි.ටී. ඊ.එස්.පී. (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | ශර්වුඩ් කැපිටල් (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 1.5 (2.5%) |
| | ලංකා වාණිජ මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | වෙළඳ සේවා අර්ථසාධක සංගමය | කමිටු සභාපති | නැත |
| මතිල් ජයසිංහ මහතා | සිලෝන් හොස්පිටල් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | සී.ඩබ්ලිව්. මැකී පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා මිල්ක් ෆුඩ්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ඩෙයරීස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | සහස්‍යා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන්.එම්.ජේ. ලෙෂර් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| ඒ. නිලන්ති ජයකී ද අල්විස් මහත්මිය | නැත | නැත | නැත |
| ඈන්ටන් ගොඩ්ෆ්‍රී මහතා | නැත | නැත | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ජාතික ණය ඇපකර ආයතනය | සභාපති - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහා බැංකුව | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති - 2024 ජූනි 22 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි - 2024 ජූනි 20 දින දක්වා | |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි - 2024 ජූනි 20 දින දක්වා | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | කළමනාකරණ මණ්ඩල සාමාජික - 2024 ජූනි 20 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික - 2024 ජූනි 20 දින දක්වා | නැත |
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 දින තෙක් | නැත |

# සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිඳු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිණුම පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට ශේෂය (රු.) | 2023.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල | 0009834430 | 957,698 | 758,577 |

2024 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | 2024 වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 692,999,942 | 741,022,742 |
| භාණ්ඩාගාර බිල්පත් | 6,722,210,098 | 4,386,381,119 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 8,373,000,000 | 522,000,000 |

## වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/G/COM/FA/24/09 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 16

සභාපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ ("අරමුදල") 2024 දෙසැම්බර් 31 දිනට මූලය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 සෙැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

# වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකවීමක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීයමය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තියමය සැකමුසු බව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැළසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම, හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින් වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර නොගැනීමෙන් ඇතිවිය හැකි අවදානම, වැරැද්දක් නිසා සිදුවූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිනිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධින් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධින් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

# වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
# විගණකාධිපති වාර්තාව

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.01 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට අනුව අරමුදල විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වා ගෙන ගොස් ඇත.

2.02 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.03 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 254,321,001 | 0 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 0 | 364,797,021 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | | 464,783,947 | 316,298,243 |
| ලැබිය යුතු පොලී ආදායම | | 12,557,111 | 30,949,350 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | 53,629,549 | 1,792,442 |
| **මුළු වත්කම්** | | 785,291,608 | 713,837,055 |
| **අරමුදල් හා වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | 764,840,966 | 687,591,834 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ - ශ්‍රී.සු.වි.කො.ස. | | 20,195,150 | 26,047,221 |
| විගණන ගාස්තු | | 255,492 | 198,000 |
| **මුළු අරමුදල් හා වගකීම්** | | 785,291,608 | 713,837,055 |

125 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල වෙනුවෙන්;

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්

මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර
සභාපති

කොළඹදී
2025 ජූනි 03 දින

## වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 35,304,039 | 34,993,991 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 45,730,289 | 53,151,838 |
| පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 1,297,310 | 6,051,914 |
| වර්ෂය තුලදී වැරදි සමතයකට පත් කිරීමෙන් ලද වන්දි | | 28,732,781 | 17,900,000 |
| මුළු ආදායම | | 111,064,418 | 112,097,744 |
| වියදම | | | |
| විගණන ගාස්තු | | (291,132) | (223,700) |
| බැංකු ගාස්තු | | (411,642) | (252,622) |
| මුළු වියදම | | (702,774) | (476,322) |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පෙර) | | 110,361,644 | 111,621,422 |
| ආදායම් බදු වියදම | 8 | (33,112,513) | (33,538,275) |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 77,249,132 | 78,083,147 |

125 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 687,591,834 | 609,508,687 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 77,249,132 | 78,083,147 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 764,840,966 | 687,591,834 |

125 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

## වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 77,249,132 | 78,083,147 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | | |
| ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | | 18,392,238 | (10,468,344) |
| ශ්‍රී.සු.වි.කො.ස.ට ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | | (5,852,070) | 10,483,926 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | | 57,492 | (4,000) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | 89,846,791 | 78,094,729 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 110,476,020 | 29,443,357 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | | (148,485,704) | (114,361,332) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | (38,009,684) | (84,917,975) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 51,837,107 | (6,823,245) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (අ)) | | 1,792,442 | 8,615,687 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (ආ)) | | 53,629,549 | 1,792,442 |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | | 1,200,000 | 8,000,000 |
| බැංකුවේ ඇති මුදල් | | 592,442 | 615,687 |
| | | 1,792,442 | 8,615,687 |
| **සටහන (ආ)** | | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 7 | 53,000,000 | 1,200,000 |
| බැංකුවේ ඇති මුදල් | 7 | 629,549 | 592,442 |
| | | 53,629,549 | 1,792,442 |

125 සිට 130 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්තියෙන් අවලංගු හා ආදේශ වූ 1987 අංක 36 දරණ, පැරණි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 38 (1) වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත.

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්ති ප්‍රකාරව යම් බලපත්‍රලත් කොටස් තරව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින්, ''වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

වන්දි අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි නැගෙනහිර කුළුණෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්ති ප්‍රකාරව වන්දි අරමුදලක් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වුයේ යම් බලපත්‍රලත් කොටස් තරව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමයි.

තව දුරටත්, 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 158 (2) වගන්ති ප්‍රකාරව එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්.

ඊට අමතරව නව පනතෙහි 158 (3) වගන්ති ප්‍රකාරව, වන්දි අරමුදලට අයත් මුදල්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකිය.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා වන්දි අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස වන්දි අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් වන්දි අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම නොකඩවා උපයෝගී කරගන්නා ලද අතර කාල පරිච්ඡේදය පුරාවටම ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයකින් යුතුව යොදාගනු ලැබ ඇත.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට වන්දි අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

වන්දි අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් වල හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාල පරිච්ඡේදය පුරාවටම සංගතතාවයකින් යුතුව යොදාගන්න ලදී.

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අනුග ාමී හෙළිදරව් කිරීම් වලට සහ අසම්භාව්‍ය වගකීම් වල හෙළිදරව්කිරීම් වලටත් බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් ඉදිරිකාලීනව හඳුනා ගනු ලැබේ.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ වන්දි අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිඳු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ඇත්නම් ඒවා ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

# වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ දිනට පසු සිදුවීම්.

වාර්තාකරණ දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල අවශ්‍ය පරිදි සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

## 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

## 4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 වන්දි මුදල් ලැබීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව වන්දි අරමුදලට ලැබෙන වන්දි මුදල්, 'මුදල් පදනම' මත හඳුනා ගනු ලැබේ.

### 4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5 වියදම් හඳුනා ගැනීම

වන්දි අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

## 7 මුදල් හා මුදල් සමාන දේ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන | 53,000,000 | 1,200,000 |
| බැංකුවේ ඇති මුදල් | 629,549 | 592,442 |
| එකතුව | 53,629,549 | 1,792,442 |

## 8 ආදායම් බදු වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 0 | 51,849 |
| තක්සේරු වර්ෂ 2023/2024 සඳහා ආදායම් බදු වියදම | 4,019 | 33,486,426 |
| තක්සේරු වර්ෂ 2024/2025 සඳහා ආදායම් බදු වියදම | 33,108,493 | 0 |
| එකතුව | 33,112,513 | 33,538,275 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

## 9 ප්‍රාග්ධන බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 10 අසම්භාව්‍ය වගකීම්

2024 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 11 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදුකිරීමට අවශ්‍ය ආකාරයේ ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසු සිදුවීම් කිසිවක් නැත.

## 12 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

වන්දි අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි.

2024 දෙසැම්බර් 31 දිනට පහත දක්වා ඇති පරිදි සභාපති සහ කොමිෂන් සභාවේ සාමාජිකයින් එම ධුරයන් හොබවන ලදී.

- මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා - පත්කළ සාමාජික - 2024 ඔක්තෝම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- හේෂණ කුරුප්පු මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- අරවින්දි ද සිල්වා මිය - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- එච්.ඩී.සී.එල්. සිල්වා මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් 2024 නොවැම්බර් 29 දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් පත් වූ සාමාජික
- නෙලුමානි දවුලුගල මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2024 ජූලි 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි නම් කරන ලද සාමාජික
- ලක්නාත් ජයවික්‍රම මහතා - පත්කල සාමාජික - 2024 දෙසැම්බර් 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- නෙරන්ජිත් ගමගේ මහතා - පත්කළ සාමාජික - 2024 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි

2024 වර්ෂය තුලදී පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත්කළ සාමාජික - 2023 ඔක්තෝම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික - 2024 වර්ෂය තුලදී ධුර කාලය අවසන් කරන ලදී
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය - පත්කල සාමාජික - 2023 ඔක්තෝම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික - 2024 ඔක්තෝම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය හෙබවීම හේතුවෙන් නම් කල සාමාජික - 2024 නොවැම්බර් 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, නම් කල සාමාජික, 2024 ජූනි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි

# වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2024 දෙසැම්බර් 31 දිනට ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා | ශ්‍රී ලංකා මූල්‍ය සංගමය | සභාපති - 2024 දෙසැම්බර් සිට | නැත |
| | මානව හිමිකම් ආරක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2023 වර්ෂයේ සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 04 දින සිට | නැත |
| හේෂණ කුරුප්පු මහතා | ඩේවිඩ් පීරිස් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2023 ජනවාරි 20 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2023 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩේවිඩ් පීරිස් ඔටෝමොබයිල් (පුද්ගලික) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 දින සිට 2024 පෙබරවාරි 13 දින දක්වා | නැත |
| | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ලංකා) සමාගම | සමූහ මූල්‍ය අධ්‍යක්ෂ - 2019 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ඩී පී ඉන්ෆොටෙක් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2020 මැයි 14 වන දින සිට | නැත |
| | අෆිනිටි ඉනොවේෂන් (පුද්ගලික) සමාගම | විධායක නොවන සභාපති - 2021 අගෝස්තු 26 දින සිට 2024 අප්‍රේල් 04 දින දක්වා | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ඩිස්ට්‍රිබියුටර්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජූනි 23 වන දින සිට | නැත |
| | ඉලෙක්ට්‍රොසෙන් ග්ලෝබල් (පුද්ගලික) සමාගම | විධායක නොවන අධ්‍යක්ෂක - 2021 ජූලි 31 වන දින සිට | නැත |
| | ඩයිනමික් ග්ලෝබල් වෙන්චර්ස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ - 2024 මැයි 16 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | සභාපති - 2021 දෙසැම්බර් 17 දින සිට | නැත |
| | ගණකාධිකාරීවරුන්ගේ දකුණු ආසියානු සම්මේලනය | සභාපති - 2023 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2024 මාර්තු 14 දින සිට | නැත |
| අරවින්දි ද සිල්වා මිය | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 දෙසැම්බර් 30 දින සිට | නැත |
| | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | අධ්‍යක්ෂ - 2022 වර්ෂයේ සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 දෙසැම්බර් 30 වන දින සිට | නැත |
| එච්.ඩී.සී.එල්. සිල්වා මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 29 දින සිට | නැත |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | අධ්‍යක්ෂ - 2020 ජනවාරි 11 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 07 දින සිට | නැත |
| නෙලුමානි දවුලුගල මිය | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සභාපතිනි - 2024 මාර්තු 14 දින සිට | නැත |
| | ශ්‍රී ලංකා මහ බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| ලක්නාත් ජයවික්‍රම මහතා | සියපත ෆයිනෑන්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | කවුන්සිල් සාමාජික - 2022 වර්ෂයේ සිට | නැත |
| නෙරන්ජිත් ගමගේ මහතා | වින්ස්ටේ පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ - 2021 අගෝස්තු 11 වන දින සිට | 1 |
| | පර්ස්ටාෆ් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | ප්‍රධාන මූල්‍ය නිලධාරී/උපදේශක - මූල්‍ය හා මෙහෙයුම් කටයුතු - 2022 පෙබරවාරි 01 දින සිට | නැත |

2024 වර්ෂය තුළදී ධුර කාලය අවසන් කල කොමිෂන් සභා සභාපති සහ සාමාජිකයින් දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ෆයිසාල් සාලි මහතා | ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය | හිටපු සභාපති - 2023 ජුනි මස සිට | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 ඔක්තෝම්බර් 01 දින තෙක් | නැත |
| සුජීව මුදලිගේ මහතා | සී.අයි.සී. ෆීඩ්ස් (පුද්ගලික) සමාගම | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | එන්.එස්.බී.එම්.ග්‍රීන් යුනිවර්සිටි | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මහීන්ද්‍රා අයිඩියල් ෆයිනෑන්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | කාර්ගෝ බෝට් ඩිවෙලොප්මන්ට්ස් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | මැලිබන් බිස්කට් මැනුෆැක්චරර්ස් ලිමිටඩ් | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ | නැත |
| | ඇම්බියොන් කැපිටල් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 9 (1%) |
| | ඇම්බියොන් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | මිලේනියම් අයි.ටී. ඊ.එස්.පී. (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | නැත |
| | ශර්වුඩ් කැපිටල් (පුද්ගලික) සමාගම | සභාපති/අධ්‍යක්ෂ - කමිටු සාමාජික | මිලියන 1.5 (2.5%) |
| | ලංකා වාණිජ මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කමිටු/මණ්ඩල සාමාජික | නැත |
| | වෙළඳ සේවා අර්ථසාධක සංගමය | කමිටු සභාපති | නැත |
| මනිල් ජයසිංහ මහතා | සිලෝන් හොස්පිටල් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | සී.ඩබ්ලිවු. මැකී පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා මිල්ක් ෆුඩ්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ඩෙයරීස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | සහස්‍යා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන්.එම්.ජේ. ලෙෂර් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ | නැත |
| ඒ. නිලන්ති ජයකි ද අල්විස් මහත්මිය | නැත | නැත | නැත |
| ඇන්ටන් ගොඩ්ෆ්‍රී මහතා | නැත | නැත | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ජාතික ණය ඇපකර ආයතනය | සභාපති - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහා බැංකුව | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති - 2024 ජුනි 22 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි - 2024 ජුනි 20 දින දක්වා | |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | කළමනාකරණ මණ්ඩල සාමාජික - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික - 2024 ජුනි 20 දින දක්වා | නැත |
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් - 2024 ජුලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජුලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජුලි 08 දින තෙක් | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2024 ජුලි 08 දින තෙක් | නැත |

# වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන්/ආයතන සමඟ වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිණුම පවත්වාගෙන යන අතර එහි බැංකු ශේෂය පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට ශේෂය (රු.) | 2023.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල | 75433985 | 629,549 | 592,442 |

2024 වර්ෂය තුළදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | 2024 වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 259,999,954 | 259,999,954 |
| භාණ්ඩාගාර බිල්පත් | 713,439,690 | 464,783,947 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 818,200,000 | 53,000,000 |

පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | BAN/G/SGF/FA/24/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025 ජුනි 16 |

සභාපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ ("අරමුදල") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 සැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1998 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස අරමුදල පිහිටුවීමට සම්බන්ධ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11 (ඩී) ඡේදයෙහි විධිවිධාන යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේනතුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

# පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.1 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස වන බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීයමය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තියමය සැකමුසු බව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැළසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම, හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින් වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර නොගැනීමෙන් ඇතිවිය හැකි අවදනම, වැරැද්දක් නිසා සිදුවූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදනමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිනිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විගණකාධිපති වාර්තාව

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2 **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1 2018 අංක 18 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට අරමුදල විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැඩබලන)

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 7,756,754 | 0 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 0 | 90,631,135 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | 1,268,883,107 | 1,146,692,978 |
| ලැබිය යුතු පොලී ආදායම | | 34,361,758 | 81,658,124 |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 | 98,915,156 | 3,783,399 |
| **මුළු වත්කම්** | | 1,409,916,775 | 1,322,765,636 |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| ප්‍රදාන - මහා භාණ්ඩාගාරය | | 50,000,000 | 50,000,000 |
| ප්‍රදාන - සෙස් අරමුදල | | 100,000,000 | 100,000,000 |
| ප්‍රදාන - කොළඹ කොටස් හුවමාරුව | | 100,000,000 | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | 1,139,016,304 | 1,028,305,407 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු අදායම් බදු | 6 | 20,637,544 | 32,999,470 |
| ගෙවිය යුතු දෑ - සු.වි.කො.ස. | | 0 | 11,262,760 |
| විගණන ගාස්තු | | 262,927 | 198,000 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | 1,409,916,775 | 1,322,765,636 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල වෙනුවෙන්

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්

මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර
සභාපති

කොළඹදී
2025 ජූනි 03 දින

## පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ආදායම් | | | |
| ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බැඳුම්කර | | 6,601,897 | 11,612,198 |
| ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බිල්පත් | | 150,285,855 | 153,122,103 |
| ආයෝජන මත පොලී ආදායම් - ස්ථාවර තැන්පතු | | 0 | 13,054,518 |
| ආයෝජන මත පොලී ආදායම් - ප්‍රතිමිලදී ගැනීම් | | 1,988,941 | 18,650,158 |
| මුළු ආදායම | | 158,876,693 | 196,438,976 |
| වියදම් | | | |
| විගණන ගාස්තු | | (294,067) | (225,700) |
| බැංකු ගාස්තු | | (424,200) | (292,036) |
| මුළු වියදම | | (718,267) | (517,736) |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පෙර) | | 158,158,426 | 195,921,240 |
| ආදායම් බදු වියදම | 7 | (47,447,529) | (58,788,983) |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 110,710,897 | 137,132,257 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,028,305,407 | 891,173,149 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 110,710,897 | 137,132,257 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 1,139,016,304 | 1,028,305,407 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

## පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම (බදු පසු) | | 110,710,897 | 137,132,257 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | | |
| අනෙකුත් ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 47,296,367 | 21,228,948 |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | (23,559,759) | 23,289,477 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | 134,447,505 | 181,650,682 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 82,874,381 | 104,229,240 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 0 | 300,000,000 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | (122,190,129) | (591,509,090) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | (39,315,748) | (187,279,850) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 95,131,757 | (5,629,168) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | | 3,783,399 | 9,412,567 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)** | | 98,915,156 | 3,783,399 |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | | 3,200,001 | 9,000,001 |
| බැංකුවේ ඇති මුදල් | | 583,398 | 412,566 |
| **එකතුව** | | 3,783,399 | 9,412,567 |
| **සටහන (ආ)** | | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 5 | 98,000,001 | 3,200,001 |
| බැංකුවේ ඇති මුදල් | 5 | 915,156 | 583,398 |
| **එකතුව** | | 98,915,156 | 3,783,399 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල යනු 1998 වර්ෂයේ අංක 1376 දරන සංශෝධිත භාර ඔප්පුවේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ලාභ නොලබන භාරයකි. එහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම පියවීම සහතික කිරීමේ අරමුදලේ භාරකාර මණ්ඩලය සතු වේ.

### 1.3 පිළියෙළ කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් වල හෙළිදරව් කර ඇත.

### 1.4 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

වාර්තාකරණ දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල අවශ්‍ය පරිදි සිදුකර ඇත.

### 1.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

### 1.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

## 2. වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

රජයේ භාණ්ඩාගාර බැඳුම්කර වලත්, බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා ප්‍රති මිලදී ගැනුම් ආයෝජන වලත්, ආයෝජනයන් සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත

## 3. වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

අරමුදලෙහි සියලුම කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණ කාලීන සේවකයින් නොමැති බැවින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත් ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

### 3.2 ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ දක්වා ඇත.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

### 4.2 වියදම් හඳුනාගැනීම

පියවීම් සහතික කිරීමේ අරමුදල පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම ගෙවීම් උපචිත පදනම මත හඳුනා ගනු ලබන අතර මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ඒවා ආදායමට අය කරනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, මුදල් හා මුදල් සමාන දෑ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකුවේ ඇති මාස තුනට අඩු කල් පිරිමක් ඇති ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන වලින් සමන්විත වේ.

## 5. මුදල් හා මුදල් සමාන දෑ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 98,000,001 | 3,200,001 |
| බැංකුවේ ඇති මුදල් | 915,156 | 583,398 |
| එකතුව | 98,915,156 | 3,783,399 |

## 6. ගෙවිය යුතු ආදායම් බදු

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ගෙවිය යුතු ආදායම් බදු | (101,382) | (101,382) |
| තක්සේරු වර්ෂ 2023/2024 සඳහා ගෙවිය යුතු ආදායම් බදු | 0 | 33,100,852 |
| තක්සේරු වර්ෂ 2024/2025 සඳහා ගෙවිය යුතු ආදායම් බදු | 20,738,926 | 0 |
| එකතුව | 20,637,544 | 32,999,470 |

# පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 7. ආදායම් බදු වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 Rs. | 2023 Rs. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 0 | 12,611 |
| තක්සේරු වර්ෂ 2023/2024 සඳහා ආදායම් බදු වියදම | 1 | 58,776,372 |
| තක්සේරු වර්ෂ 2024/2025 සඳහා ආදායම් බදු වියදම | 47,447,528 | 0 |
| එකතුව | 47,447,529 | 58,788,983 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදයම් බදු පනත් ප්‍රකාරව ආදයම් බදු වගකීම ගණනය කර ඇත.

## 8. ප්‍රාග්ධන බැඳීම්

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 9. අසම්භාව්‍ය වගකීම්

2024 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 10. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

භාරකරුවන් විසින් සියලුම සිදුවීම් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර යෝග්‍ය පරිදි වර්තමාන මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

## 11. සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම

අරමුදලේ භාරකරුවන් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික ලෙස කටයුතු කරන, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාත් ක්‍රියා කරනු ලැබේ.

2024 දෙසැම්බර් 31 දිනට, පහත නම් සඳහන් භාරකරුවන් පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස කටයුතු කරන ලදී.

- මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා - 2024 ඔක්තෝම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති
- චින්තක මෙන්ඩිස් මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්
- දිල්ෂාන් වීරසේකර මහතා - කොළඹ කොටස් හුවමාරුවේ සභාපති
- රජීව් බණ්ඩාරනායක මහතා - කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරි
- එච්.ඩී.සී.එල්. සිල්වා මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් - 2024 නොවැම්බර් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජික.

2024 වර්ෂය තුළදී පහත සඳහන් භාරකරුවන් ධුරකාලය අවසන් කරන ලදී.

- ෆයිසාල් සාලි මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති, 2024 ඔක්තෝම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී
- ආර්.එම්.පී. රත්නායක මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජික සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, 2024 නොවැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ භාරකරුවන් විසින් වර්ෂය තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සභාපති - 2024 ඔක්තෝම්බර් 04 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා මූල්‍ය සංගමය | සභාපති - 2022 දෙසැම්බර් සිට | නැත |
| | මානව හිමිකම් ආරක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික - 2023 වර්ෂයේ සිට | නැත |
| චින්තක මෙන්ඩිස් මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ ජෙනරාල් | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | භාරකරු | නැත |
| රජීව් බණ්ඩාරනායක මහතා | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරි | නැත |
| | ලංකා මූල්‍ය සේවා කාර්යාංශය | අධ්‍යක්ෂ | නැත |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| දිල්ෂාන් වීරසේකර මහතා | කොළඹ කොටස් හුවමාරුව | සභාපති - 2022 ජූනි සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ලිමිටඩ් | කළමණාකරන අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | විධායක නොවන අධ්‍යක්ෂක - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමණාකරන අධ්‍යක්ෂ - 2023 සැප්තැම්බර් මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | කළමණාකරන අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමණාකරන අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රස්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක අධ්‍යක්ෂ - 2017 මැයි මස සිට | නැත |
| එච්.ඩී.සී.එල්. සිල්වා මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | කොමිෂන් සභා සාමාජික - 2024 නොවැම්බර් 29 සිට | නැත |
| | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | අධ්‍යක්ෂ - 2020 ජනවාරි 11 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 07 වන දින සිට | නැත |

2024 වර්ෂය තුළදී ධුර කාලය අවසන් කරන ලද භාරකරුවන් විසින් වර්ෂය තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරිත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| ෆයිසාල් සාලි මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සභාපති - 2024 ඔක්තෝම්බර් 01 දින දක්වා | නැත |
| | ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය | හිටපු සභාපති - 2023 ජූනි සිට | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | කොමිෂන් සභා සාමාජික - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |
| | ජාතික ණය ඇපකර ආයතනය | සභාපති - 2024 නොවැම්බර් 06 දින දක්වා | නැත |

# පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන්/ආයතන සමඟ වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

පියවීම් සහතික කිරීමේ අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම පවත්වාගෙන යනු ලබන අතර එහි ශේෂය පහත දක්වා ඇති පරිදි වේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට ශේෂය | 2023.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 1833 | 915,156 | 583,398 |

2024 වර්ෂය තුලදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු විය.

| ආයෝජන වර්ගය | 2024 වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ආයෝජනයන්ගේ ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 7,999,945 | 7,999,945 |
| භාණ්ඩාගාර බිල්පත් | 1,921,465,419 | 1,268,883,107 |
| ප්‍රතිමිලදීගැනුම් මත ආයෝජන | 1,291,650,000 | 98,000,000 |

# සටහන්

# සටහන්

# සාංගමික තොරතුරු


**කාර්යාලීය ලිපිනය**

28 සහ 29 මට්ටම
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
කොළඹ 1

**දුරකථනය**

+94 11 2143843

**ෆැක්ස්**

+94 11 2439149

**විද්‍යුත් තැපෑල**

mail@sec.gov.lk

**වෙබ්**

www.sec.gov.lk


**ගිණුම්කරණ වර්ෂය**

2023 දෙසැම්බර් 31 අවසන් වර්ෂය විය

**විගණකවරුන්**

විගණකාධිපති

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
සම්පත් බැංකුව පීඑල්සී
කොමර්ෂල් බැංකුව ඔෆ් සිලෝන් පීඑල්සී
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී


Designed & produced by
emagewise
Digital Plates & Printing by Softwave Printing and Packaging (Pvt) Ltd

SECURITIES AND EXCHANGE
COMMISSION OF SRI LANKA